වාර්ෂික වාර්තාව
2011



මධ්‍යම පරිසර අධිකාරිය

පරිසර අමාත්‍යාංශය

දැක්ම

" විශිෂ්ට සේවාවක් තුලින්
පිවිතුරු
හරිත පරිසරයක් "

මෙහෙවර

" මහජන සහභාගිත්වය,
නීති ක්‍රියාත්මක කිරීම,
උසස් තාක්ෂණික මැදිහත්වීම්
සහ
පාරිසරික අධ්‍යාපනය තුලින්
පරිසරයේ ගුණාත්මක බව සුරකින
සහ
හසුරුවන
ජාතියේ පෙර ගමන්කරු"

පෙරවදන

2011 වර්ෂය සඳහා වූ මෙම වාර්ෂික වාර්තාව මෙම අධිකාරියේ අංශ/ ඒකක 15 ක, පළාත් කාර්යාල 08 ක අධ්‍යක්ෂවරුන්, ඒකක ප්‍රධානීන් හා පරිසර සහාව විසින් සපයනු ලැබූ තොරතුරු මත සම්පාදනය කරන ලදි. තවද, මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ විශේෂ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය හා අදාල තොරතුරු මෙහි අන්තර්ගත වී ඇත. මෙම වාර්ෂික වාර්තාවේ ප්‍රධාන කාර්යාලයේ ඒ ඒ ප්‍රධාන අංශ/ ඒකකයන්හි හා පළාත් කාර්යාල වල ප්‍රගතිය පිළිවෙලින් වාර්තා වී ඇත.

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 වන වගන්තිය ප්‍රකාර හා යහ පාලන ගුරු උපදෙස් අනුව මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික ප්‍රගතිය, වාර්ෂික ගිණුම් වාර්තාව හා විගණකාධිපති වාර්තාව ප්‍රසිද්ධියට පත් කළ යුතු අතර, පාර්ලිමේන්තුවට ද ඉදිරිපත් කළ යුතුය.

මෙම වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සඳහා ඒ ඒ අංශ/ ඒකක/ පළාත් කාර්යාල ප්‍රධානීන් හා ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් විසින් අවශ්‍ය තොරතුරු සපයා දෙමින්, දෙනු ලැබූ අගනා සහයෝගය හා දායකත්වය සම්බන්ධයෙන් ඔවුනට ස්තූතිය පිරිනැමීම සඳහා සැලසුම් හා පසුවිපරම් ඒකකය මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගන්නෙමු.

සැලසුම් හා පසුවිපරම් ඒකකය

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිතුමාගේ පණිවුඩය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා විගණනයට භාජනය කරන ලද ගිණුම් සටහන්, විගණකාධිපතිතුමාගේ වාර්තාව ඇතුලත් මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මාගේ සතුටට කරුණකි.

රටේ සීඝ්‍ර සංවර්ධනයට සමගාමීව පාරිසරික මැදිහත්වීම් සිදුකරන ප්‍රධාන ආයතනය ලෙස, මධ්‍යම පරිසර අධිකාරිය විවිධ අංශ හරහා එහි කාර්යයන් සිදු කරමින් පවතී. 2011 වසර තුල එහි 30 වන සංවත්සරය සැමරූ මධ්‍යම පරිසර අධිකාරිය, ආර්ථික සංවර්ධනය, පරිසර දූෂණය අවම කිරීම හා ස්වභාවික සම්පත්හි නිරසාර කළමනාකරණය අරමුණු කරගෙන, "හරිත ආර්ථිකය ඒ මැයින් පාරිසරික වැඩ මුළුවක් පවත්වන ලදි.

ජාතික පාරිසරික පනත අනුව, පරිසර දූෂණය පාලනය කිරීම, පරිසර කළමනාකරණය කිරීම, පාරිසරික දැනවත් කිරීම හා පාරිසරික අධ්‍යාපනය ලබාදීමේ බලය මධ්‍යම පරිසර අධිකාරියට ලැබී ඇත. ඒ අනුව පරිසරය ආරක්ෂා කිරීමට දැනට පවතින පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රමය හා පරිපාලන විධිවිධාන ප්‍රමාණවත් නොවන බව වටහා ගත් මධ්‍යම පරිසර අධිකාරිය, පළාත් පාලන ආයතන, පාසල් ඇතුළු අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන තුල ඇති පරිසරය ආරක්ෂා කිරීමට ඇති නැඹුරුව, දිරි ගැන්වීම හා ඇගයීම උදෙසා ජාතික හරිත සම්මාන වැඩ සටහන හඳුන්වා දෙන ලදි. ඒ අනුව 2011 වසරේ දී රන්, රිදී, ලෝකඩ වශයෙන් ජාතික හරිත සම්මාන අතිගරු ජනාධිපතිතුමා අතින් ප්‍රදානය කරන ලදි.

ජලයේ ගුණාත්මක භාවය එහි වටිනාකම තීරණය කරන අතර, මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර දූෂණ පාලන ඒකකයට අනුබද්ධව ඇති රසායනාගාරය මගින් ලංකාව පුරා ඇති කර්මාන්තශාලා වලින් නිකුත් කෙරෙන අපවහන ජලයෙහි ගුණාත්මක බව පරීක්ෂා කරනු ලබයි. මේ අනුව, 2011 වසර තුල මධ්‍යම පරිසර අධිකාරියෙහි රසායනාගාරය කොරියා පාරිසරික සහයෝග්‍යතා ආයතනයේ ආධාර යටතේ ක්‍රියාත්මක වන ජලයේ ගුණාත්මක භාවය පරීක්ෂා කරන ව්‍යාපෘතියේ සොයා ගැනීම් ඉදිරිපත් කිරීමට අන්තර් ජාතික වැඩ මුළුවක් ද පසුගිය වසර තුල පවත්වන ලදි. තවද, කොරියානු පාරිසරික සහයෝගිතා ආයතනය හා මධ්‍යම පරිසර අධිකාරිය ඒකාබද්ධව, 2011 මාර්තු 04 දින සිලෝන් කොන්ටිනෙන්ටල් හොටෙල් හිදී පවත්වන ලද වැඩ මුළුවක දී අප රටෙහි තෝරාගත් ජල මූලාශ්‍ර 03 ක ගුණාත්මක බව සාකච්ඡා කල අතර, එම ජලාශයන් ආරක්ෂා කරන ක්‍රමෝපායයන් අවධාරනය කරන ලදි. තවද, පරිසර කළමනාකරණයට අදාල කොරියන් රජයේ පළපුරුද්ද දීර්ඝ ලෙස සාකච්ඡා කළ අතර එකී පළපුරුද්ද අප රටට හඳුන්වා දීම පිළිබඳව අවධානය යොමු කරන ලදි.

රට තුල පවතින විද්‍යුත් අපද්‍රව්‍ය කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම අරමුණු කර ගනිමින්, මධ්‍යම පරිසර අධිකාරිය හා තවත් පුද්ගලික ආයතන 14 ක සහභාගිත්වයෙන් ජාතික විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහන හඳුන්වා දීමෙන් ශ්‍රී ලංකාව විද්‍යුත් අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණය කරන රටක් බවට පත් කිරීමට අප බලාපොරොත්තු වේ. මෙයට අදාළව, ජාතික විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහනක් 2011 දෙසැම්බර් 19 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි දී පවත්වන ලදි.

මධ්‍යම පරිසර අධිකාරියෙහි ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය වන පිළිසරු ව්‍යාපෘතිය මගින් ලංකාව පුරා ඇති පළාත් පාලන ආයතන 70 ක් තුල සුළු පරිමාණ කොම්පෝස්ට් අංගන ඉදිකිරීම සඳහා ආධාර සපයා ඇත. මේ යටතේ කළුතර පොහොරවත්ත, හික්කඩුව හා අනුරාධපුර යන පළාත් පාලන ආයතන තුළ විශාල ප්‍රමාණයේ කොම්පෝස්ට් අංගන ඉදිකර ඇත. තවද, පිළිසරු ව්‍යාපෘතිය හරහා මධ්‍යම පරිසර අධිකාරිය ලංකාවේ සෑම පළාත් පාලන ආයතනයකටම ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට මූල්‍ය හා තාක්ෂණික දැනුම ලබාදෙනු ලබයි. 2011 ක්‍රියාකාරී සැලැස්මට අනුව රජයේ රෝහල් වල ආරම්භ කර ඇති සායනික අපද්‍රව්‍ය කළමනාකරණ

වැඩ සටහන වැඩි දියුණු කිරීම සඳහා පිළිසරු ව්‍යාපෘතිය මගින් අප ආයතනයේ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයට මූල්‍යාධාර සපයා එමගින් රෝහල් තුල ව්‍යාපෘති ආකෘතීන් ඇති කිරීමට ආධාර සපයන ලදි.

ඔබ අප සැමගේ අත්දැකීම අනුව ප්ලාස්ටික් / පොලිතීන් දෛනික ජීවිතය තුල ප්‍රධාන ස්ථානයක් ලබා ඇත. රට පුරා ප්ලාස්ටික් සඳහා විශේෂයෙන් ප්ලාස්ටික් ආවරණ සඳහා පවතින ඉල්ලුම වැඩි වෙමින් පවතී. ඒ අනුව, පසුභාවිත ප්ලාස්ටික් / පොලිතීන් අපද්‍රව්‍යයක් ලෙස වැඩි වෙමින් පවතී. මෙකී ප්ලාස්ටික් අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස කළමනාකරණය කිරීම සඳහා 2011 වසර තුළ ද පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි. මෙයට අදාලව මෙම ජාතික ව්‍යාපෘතිය මගින් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රවර්ධන වැඩ සටහන් බුත්තල දැයට කිරුළ ප්‍රදර්ශණයෙහි ප්‍රදර්ශන අංග, කසළ බඳුන් බෙදාදීම වැනි ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

පාරිසරික වශයෙන් වැදගත් ස්ථාන රැකගැනීම, ආරක්ෂා කිරීම හා කළමනාකරණය කිරීම අරමුණු කර ගනිමින් මධ්‍යම පරිසර අධිකාරිය ජාතික පරිසර පනතෙහි 24 සී හා 24 ඩී යන වගන්ති අනුව, එම ස්ථාන පරිසර ආරක්ෂන ප්‍රදේශ ලෙස නම් කර ඇත. ඒ අනුව, 2011 වසර තුළ බෙන්තොට, කොග්ගල, මහනුවර, දැඩිගමුව, ගිං ඔය යන කලාප පරිසර ආරක්ෂන ප්‍රදේශ ලෙස නම් කිරීම සඳහා පියවර ගනිමින් පැවතින.

ඝණ අපද්‍රව්‍ය ඉනා ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ වැදගත් ක්‍රමෝපායයක් ලෙස සනීපාරක්ෂක කසළ රඳවන ක්‍රමය සඳහන් කළ හැක. කොයිකා ආයතනයේ මූල්‍ය ආධාර යටතේ වග ප්‍රදේශයට මුලින් යෝජනා කරන ලද සනීපාරක්ෂක කසළ රඳවන ව්‍යාපෘතිය ජනතාවගේ විරෝධතාවය හේතුවෙන් කොයිකා ආයතනයේ එකඟතාවයෙන් මාළිගාවත්ත, දොම්පේ ප්‍රදේශයට මාරුකරන ලදි.

නාක්ෂණයේ දියුණුවන් සමඟ තොරතුරු වාර්තා කිරීම හා වගඋත්තර කිරීම කාලයක් ගත වන ක්‍රියාවක් නිසා මධ්‍යම පරිසර අධිකාරියේ භූගෝලීය තොරතුරු නාක්ෂණ ඒකකය දිස්ත්‍රික් මට්ටමින් පාරිසරික තොරතුරු ඇතුලත් සංයුක්ත තැටි (CD) සකස් කරමින් පවතී. ඒ අනුව, කළුතර සහ කෑගල්ල දිස්ත්‍රික්ක සඳහා සංයුක්ත තැටි සකස් කිරීම සම්පූර්ණ කර ඇති අතර, 2012 වසර තුළ කිලිනොච්චි දිස්ත්‍රික්කය සඳහා සංයුක්ත තැටි නිෂ්පාදනය කරමින් පවතී.

අවසාන වශයෙන් පසුගිය වසර තුල මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවීමේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා ඉනා කැපවීමෙන් හා උනන්දුවෙන් සිය යුතුකම් නොපිරිහෙලා ඉටුකරමින් ඒ සඳහා සහාය ලබාදුන් අධ්‍යක්ෂ ජනරාල් තුමිය ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි. තවද, අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය හා පාරිසරික සභාව මගින් අධිකාරියේ දියුණුව උදෙසා ලබාදෙන ලද අගනා සහයෝගය, උපදෙස් පිළිබඳව ඉනා කෘතඥ වෙමි. එමෙන්ම පරිසර අමාත්‍යාංශයේ ලේකම්, අතිරේක ලේකම්වරුන් හා සමස්ත නිලධාරීන් විසින් අධිකාරියේ කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා ලබාදෙන සහයෝගය හා උපදෙස් සම්බන්ධයෙන් අධිකාරියේ සමස්ත කාර්ය මණ්ඩලය වෙනුවෙන් මාගේ ඉමහත් කෘතඥතාවය පිරිනමමි. අවසාන වශයෙන් අධිකාරියේ කටයුතු සඳහා ලබාදුන් අගනා උපදෙස් හා මහ පෙන්වීම පිළිබඳව ගරු පරිසර අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමාට මාගේ ප්‍රණාමය පුද කිරීමට කැමැත්තෙමි.

චරිත හේරත්
සභාපති

ආයතනික ව්‍යුහය


පරිසර අමාත්‍යාංශය
මධ්‍යම පරිසර අධිකාරිය
සභාපතිතුමා හා අධ. මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
පළාත් කාර්යාල 09
නි.අ.ප.(ප.දූ.පා.)
නි.අ.ප.(ප.පා.හා ඇ.)
නි.අ.ප.(ප.අ. හා දැ
නි.අ.ප. (මා.ස.සං.පරි. හා මුදල්)
අධ්‍යක්ෂ 05
අධ්‍යක්ෂ 03
අධ්‍යක්ෂ 03
අධ්‍යක්ෂ 01
අධ්‍යක්ෂ 03
අධ්‍යක්ෂ (නීති) 01
නි.අධ්‍යක්ෂ 06
නි. අධ්‍යක්ෂ 04
නි. අධ්‍යක්ෂ 06
නි.අධ්‍යක්ෂ 02
නි. අධ්‍යක්ෂ 02
නි. අධ්‍යක්ෂ (නීති) 01
නි.අ. (සෞ. හා ප.) 01
ස.අධ්‍යක්ෂ 19
ස. අධ්‍යක්ෂ 09
පද්ධති විශ්ලේෂක 1
ස. අධ්‍යක්ෂ 11
ස. අධ්‍යක්ෂ 04
ජේ. පුස්ත. 01
ස. අධ්‍යක්ෂ 05
නීති නිලධාරි 01
ස. අධ්‍යක්ෂ 02
අභ්‍යන්තර විගණක
ජේ.ප.නි. 55
රසඥ 04
ජේ.ප.නි
ජේ.ප.නි. 20
ජේ.ප.අ.හා දැ.කි. 03
ප. නිලධාරි 02
සැප. නිලධාරි 03
ස. නීති නිලධාරි 03
සෞඛ.නිලධාරි 01
ප්‍රා.ප.නි. 396
පරිසර නිලධාරි 06
පරිසර නිලධාරි
පරිසර නිලධාරි 06
ස. පුස්ත. 01
ප්‍රා.ප.නි. 02 සංඛ්‍යා ලේඛන නි. 01
රසායනාගාර සහකාර 04
ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික 02
කළමනාකරණ සහකාර (තාක්ෂණික 01)
ස.අ.වි. 03
රියදුරු, කම්කරු, කා.කා.ස., සනීපාරක්ෂක කම්කරු

මධ්‍යම පරිසර අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

නම	තනතුර	සුදුසුකම්
චරිත හේරත් මහතා	සභාපති	*ශාස්ත්‍රවේදී (විශේෂ), ශ්‍රාස්ත්‍රපති (OhiO)*
රමණි ඇල්ලෙපොල මිය	අධ්‍යක්ෂ ජනරාල්	*විද්‍යාවේදී (විශේෂ), විද්‍යාපති* M.I.chem.c.chtd chemist
කේ.එච්. මුතුකුඩආරච්චි මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිසර දූෂණ පාලන)	*විද්‍යාවේදී, විද්‍යාපති*
පේ.එම්.යූ. ඉන්ද්‍රරත්න මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මා.ස.සං., පරිපාලන හා මුදල්)	*ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය, වරලත් ඉංජිනේරු, FIT (SL), MIE (Aus)*
එම්.පේ.පේ. ප්‍රනාන්දු මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිසර අධ්‍යාපන හා දැ.කි.)	*විද්‍යාවේදී (ව්‍යවහාරික විද්‍යාව)* *විද්‍යාපති (වන විද්‍යාව)* *පශ්චාත් උපාධි ඩිප්ලෝමා (RS ස GIS)*
යූ.කේ.ඩී.ජී. ජයසිංහ මයා	වැ.බ./ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිසර කළමනාකරණ හා ඇගයීම)	*විද්‍යාවේදී, විද්‍යාපති*
කාන්ති ද සිල්වා මිය	අධ්‍යක්ෂිකා (පරිසර බලපෑම් ඇගයීම)	*විද්‍යාවේදී, විද්‍යාපති*
ටී.එම්.ඒ.එස්.කේ. රුදිගු මයා	වැ.බ./ අධ්‍යක්ෂ (ස්වභාවික සම්පත් කළමනාකරණ)	*විද්‍යාවේදී, විද්‍යාපති*
ආචාර්ය ආර්.එම්.එස්. රත්නායක මයා	අධ්‍යක්ෂ (පරිසර දූෂණ පාලන)	*වරලත් රසායනඥ, රසායන විද්‍යා ඩිප්ලෝමාව (ටෝකියෝ නාක්ෂණික ආයතනය - ජපානය), විද්‍යාවේදී (විශේෂ), දර්ශනශූරී (පේරාදෙණිය වි.විද්‍යාලය)*
එම්.ඒ.එ. එන්. හේමකුමාර මහතා	අධ්‍යක්ෂ (පර්යේෂණ හා විශේෂ ව්‍යාපෘති)	*විද්‍යාවේදී , විද්‍යාපති*
එම්.කේ.එස්. නානායක්කාර මයා	අධ්‍යක්ෂ (මුදල්)	*වාණිජවේදී (ගෞරව) උපාධිය* *ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජික, වරලත් ගණකාධිකරණ ආයතනයේ ආවසරික*
ඒ.එම්.පී.ඩබ්. දයාරත්න මිය	අධ්‍යක්ෂිකා (නීත)	*නීතිඥ*
එම්.එස්.ඒ.ඊ. තිස්මල්පොල මයා	අධ්‍යක්ෂ (මා.ස.සං.)	*නීතිඥ*
නීල් පෙරේරා මහතා	අධ්‍යක්ෂ (පරිසර අධ්‍යාපන හා දැ.කි.)	*ශ්‍රාස්ත්‍රවේදී (විශේෂ), ශ්‍රාස්ත්‍රපති (ආර්ථික විද්‍යා), කළමනාකරණ ඩිප්ලෝමාව*
වසන්තා විජේසිංහ මිය	අධ්‍යක්ෂිකා (රසායනාගාර සේවා)	*විද්‍යාවේදී (රසායන විද්‍යාව),* *විද්‍යාපති (විශ්ලේෂණ රසායන විද්‍යාව)* M.I.chem. (chtd chemist)
සරෝජිනී ජයසේකර මිය	වැ.බ./ අධ්‍යක්ෂිකා (අපද්‍රව්‍ය කළමනාකරණ)	*විද්‍යාවේදී (විශේෂ), විද්‍යාපති*
පේ.පී. සුනිල් මයා	වැ.බ./ (අධ්‍යක්ෂ (පරිපාලන)	*පුද්ගල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව*
කුමාරි කුලතිලක මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂිකා (සැලසුම් හා පසුවිපරම්)	*ශ්‍රාස්ත්‍රවේදී*
ඒ.සී.පී. දාබරේ මිය	ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපති	*ශ්‍රාස්තවේදී, විද්‍යාපති,* *වරලත් පුස්තකාලයාධිපති*
යූ. විතානාරච්චි මිය	අභ්‍යන්තර විගණක	*ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජික, වරලත් ගණකාධිකරණ ආයතනයේ ආවසරික*
සුනිල් ද සිල්වා මයා	වැඩ සටහන් සම්පාදක	*විද්‍යාවේදී, පශ්චාත් ඩිප්ලෝමා (පරිගණක නාක්ෂණය)*
එන්.එස්. ගමගේ මයා	අධ්‍යක්ෂ (බස්නාහිර පළාත)	*විද්‍යාවේදී, දර්ශනපති, පශ්චාත් උපාධි ඩිප්ලෝමා (පරිසර විද්‍යා)*
කේ.ජී.ටී.එන්. කිරිඇල්ල මයා	අධ්‍යක්ෂ (මධ්‍යම පළාත)	*විද්‍යාවේදී, විද්‍යාපති*
අජිත් වීරසුන්දර මයා	අධ්‍යක්ෂ (සබරගමුව පළාත)	*විද්‍යාවේදී, විද්‍යාපති*
එම්.සිවකුමාර් මයා	අධ්‍යක්ෂ (නැගෙනහිර පළාත)	*විද්‍යාවේදී, විද්‍යාපති*
සුසන්ත වෙදගේ මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ (දකුණු පළාත)	*විද්‍යාවේදී*
එස්.එම්.ඒ. සේනානායක මයා	නි.අධ්‍යක්ෂ (ඌව පළාත)	*විද්‍යාවේදී, විද්‍යාපති*
ජී.එන්. චන්ද්‍රසිරි මයා	සහකාර අධ්‍යක්ෂ (උතුරු මැද පළාත)	*විද්‍යාවේදී, විද්‍යාපති*
විජිතා සත්‍යකුමාර් මිය	සහකාර අධ්‍යක්ෂ (උතුරු පළාත)	*විද්‍යාවේදී, විද්‍යාපති, පශ්චාත් ඩිප්ලෝමා (පාරිසරික විද්‍යාව)*

පටුන

1.0	මධ්‍යම පරිසර අධිකාරිය	**01**
	1.1. හැඳින්වීම	01
	1.2. අරමුණ	01
	1.3. බලතල කාර්ය සහ රාජකාරී	01
	1.4. අධිකාරියේ සාමාජිකයෝ	02
	1.5. පාරිසරික සභාව	03
2.0	**අධිකාරියේ වගකීම් සහ කාර්යයන්**	**07**
3.0	**පරිසර දූෂණ පාලන අංශය**	**13**
	3.1. පරිසර දූෂණ පාලන ඒකකය	13
	3.2. රසායනාගාරය	22
	3.2.1. වායු තත්ත්ව පසුවිපරම් කටයුතු	22
	3.2.2. ජල තත්ව පසුවිපරම් රසායනාගාරය	24
	3.3. අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය	28
4.0	**පරිසර කළමනාකරණ සහ ඇගයීම් අංශය**	**33**
	4.1. පරිසර බලපෑම් ඇගයීම් ඒකකය	33
	4.2. ස්වභාවික සම්පත් කළමනාකරණ හා පසුවිපරම් ඒකකය	40
	4.3. භූගෝලීය තොරතුරු තාක්ෂණ ඒකකය	43
5.0	**නීති ඒකකය**	**48**
6.0	**පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය**	**54**
	6.12. ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය	60
7.0	**පාරිසරික ආර්ථික සම්බන්ධතා ඒකකය**	**62**
8.0	**සැලසුම් හා පසුවිපරම් ඒකකය**	**64**
	8.4. පැමිණිලි ඒකකය	66
9.	**මධ්‍යම පරිසර අධිකාරියේ විමධ්‍යගතකරණ වැඩපිළිවෙල**	**68**
	9.1. මධ්‍යම පරිසර අධිකාරියේ පළාත කාර්යාල වෙත බලතල විමධ්‍යගත කිරීම	68
	9.2. පළාත් පාලන ආයතන වෙත බලතල විමධ්‍යගත කිරීම	68
	9.3. දිස්ත්‍රික් පාරිසරික නීති බලගැන්වීමේ කමිටුව (DELEC)	69
10.	**මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීයකරණ වැඩපිළිවෙල**	**70**
	10.1.හැඳින්වීම-	70
	10.2.පළාත් කාර්යාල වල කාර්යභාරය-	71
	10.3.පළාත් කාර්යාලයන්හි කාර්ය සාධනය-	72

11. මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති 81

11.1. පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතිය 81
11.2. පරිසර නියමු වැඩ සටහන 85
11.3. පරිසර සංරක්ෂණය සඳහා ශ්‍රී ලංකාවේ පාරිසරික දූෂණ ක්‍රියාකාරකම් අඩංගු දත්ත පද්ධතියක් ගොඩනැංවීම - කුරුණෑගල දිස්ත්‍රික්කය 90
11.4. ජල තත්ව පසුවිපරම් ව්‍යාපෘතිය 91

12. ආයතනික යහපාලන වාර්තාව 92

13. මානව සම්පත් සංවර්ධන, පරිපාලන හා මුදල් අංශය 95

13.1. මානව සම්පත් සංවර්ධන ඒකකය 95
13.2. මානව සම්පත් කළමනාකරණ ඒකකය 96
13.3. මුදල් ඒකකය 97

14. විගණකාධිපති වාර්තාව 125

15. පිළිසරු ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය 138

15.1. හැඳින්වීම 138
15.2. පිළිසරු ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම 138
15.3. ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතපත්තිය 140
15.4. අරමුණු 140
15.5. විෂය පථය 141
15.6. පිළිසරු ක්‍රියාකාරී සැලැස්ම 143
15.7. පිළිසරු ව්‍යාපෘතියේ ප්‍රගතිය 143
15.8. විශාල පරිමාණ කොම්පෝස්ට් අංගන සංකීර්ණ ඉදිකිරීම 143
15.16. මූල්‍ය ප්‍රගතිය - 2011 201
15.17. පිළිසරු ව්‍යාපෘතිය - අවසාන ගිණුම් 202
15.18. පිළිසරු ව්‍යාපෘතිය - විගණකාධිපති වාර්තාව 224

1. මධ්‍යම පරිසර අධිකාරිය

1.1 හැඳින්වීම

1980 අංක 47 දරණ ජාතික පරිසර පනත යටතේ 1981 ස්ථාපිත කරනු ලැබූ මධ්‍යම පරිසර අධිකාරිය 2011 වන විට වසර 30 ක් සම්පූර්ණ කරයි. පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය මගින් ඇති කරනු ලැබූ පරිසර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ආයතනවලින් එකකි. 2011 වාර්ෂික වාර්තාව මගින් 2011 වසර තුල මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය සාධනය හා මහා භාණ්ඩාගාරයේ අරමුදල් හා විදේශ මූල්‍යාධාර යොදවමින් පළාත් කාර්යාල 08 හි, කුරුණෑගල පිහිටි සම්බන්ධීකරන කාර්යාලයෙහි සහ දිස්ත්‍රික් කාර්යාල 11 හි ක්‍රියාකාරකම් සහ 2011 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘතීන්ගේ ළඟා කර ගත් කාර්ය සාධනය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් සපයනු පිණිස එම අවුරුද්ද තුළ සාක්ෂාත් කරගත් සාර්ථකත්වය මෙන්ම අසාර්ථකත්වය පිළිබඳ තක්සේරුවක් ද පෙන්නුම් කරයි.

1.2 අරමුණ

මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය මත 1980 අංක 47 දරන පාරිසරික පනත පිළිවෙළින් 1988 අංක 56 දරන පාරිසරික පනත යටතේ සහ 2000 අංක 53 දරන පනත යටතේ සංශෝධනය කරන ලදි. 1980 ජාතික පරිසර පනත පහත සඳහන් ප්‍රධාන බලතලවලින් සමන්විත වේ.

- ජාතික පරිසර පනත යටතේ පාරිසරික ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පරිසරයේ අනතුරුදායක මෙන්ම අනතුරුදායකවීමට ඉඩ තිබෙන අපද්‍රව්‍ය මුදා හැරීම, තැන්පත් කිරීම හෝ වෙනත් දූෂණ මාර්ගවල ස්වභාවය, ප්‍රමාණය, අන්තර්ග්‍රහණය සහ බලපෑම් විධිමත් කිරීම, පවත්වා ගෙන යෑම හා පාලනය කිරීම.

- පාරිසරික බලපෑම් ඇගයීම් උපයෝගී කරගෙන ක්‍රමවත්ව ඇගයීමට ලක් කරන ලද පාරිසරික ගැටළු මගින් පරිසරයට හිතකාමී සංවර්ධනයන් තහවුරු කරමින් රටේ ස්වභාවික සම්පත් පද්ධතිය ආරක්ෂා කිරීම.

- පරිසරය ආරක්ෂා කිරීමෙහිලා මහජන සහයෝගය සහ සහභාගීත්වය ලබා ගැනීම. විශේෂයෙන් පාසල් ළමුන්ගේ සහයෝගය ලබා ගැනීම අරමුණු කොට දේශීය, ජාතික මෙන්ම ගෝලීය පරිසර ගැටළු පිළිබඳ මහජනයා දැනුවත් කිරීම.

- අනුග්‍රාහක පිරිස් වැඩි දෙනෙකුට සේවය සළසමින් පරිසර ආශ්‍රිත තොරතුරු සහ දත්ත සපයන මධ්‍යම මධ්‍යස්ථානයක් සේ ක්‍රියා කිරීම.

1.3 බලතල, කාර්ය සහ රාජකාරි

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතෙහි සඳහන් බලතල කාර්ය හා රාජකාරිවලින් මධ්‍යම පරිසර අධිකාරියේ දැනට තම අවධානය පහත සඳහන් ප්‍රධානතම බලතල කාර්ය සහ රාජකාරිවලට යොමු කරයි.

- ජාතික පාරිසරික පනත යටතේ විධිවිධාන හා ඒ යටතේ සාදන ලද නියෝග ක්‍රියාත්මක කිරීම.

- දූෂණ ඇගයීම් හේතූන්, එහි ස්වභාවය ප්‍රමාණය සහ එය වැළැක්වීමෙහිලා සමීක්ෂණය හා විමර්ශණ පැවැත්වීම සහ ඊට සමාන සමීක්ෂණ සහ විමර්ශන පවත්නා වූ වෙනත් තැනැත්තන්ට හෝ ආයතනවලට සහායවීම, සහයෝගය දැක්වීම.

- පාරිසරික හානියේ යම් අංශයට අදාළව පරීක්ෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම සහ පරිහානී වැළැක්වීම සහ පරිසරය ආරක්ෂා කිරීමට ද වැඩි දියුණු කරීමට ද උපමානයන් වර්ධනය කිරීම.

- පරිසරය වැඩදායී ලෙස උපයෝගී කර ගැනීම සඳහා ද, එහි තත්ත්වය පවත්වා ගෙන යාම සඳහා ද ප්‍රමිති, නාායන් සහ උපමානයන් නිශ්චය කිරීම.

- පාරිසරික ආරක්ෂාව සහ කළමනාකරණය සම්බන්ධයෙන් වූ අංශ පිළිබඳ වාර්තා සහ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම.

- පරිසරය ආරක්ෂා කිරීම හා වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු සැපයීම හා අධ්‍යාපනය ලබාදීම.

1988 සහ 2000 වර්ෂවලදී ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීමෙන් මධ්‍යම පරිසර අධිකාරියට පුළුල් බලතල පැවරිණි. අනෙකුත් දේ අතර මෙම සංශෝධනය මගින් මධ්‍යම පරිසර අධිකාරියට පැවරුණු ප්‍රධාන බලතල පහත දැක්වේ.

- පරිසරයට දූෂකාරකයන් පිට කිරීම සිදුවන අවස්ථාවලදී එම කටයුතු මධ්‍යම පරිසර අධිකාරිය විසින් නියම කර ඇති ප්‍රමිති හා මිනුම් දඩුවලට අනුකූලව නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය යටතේ එසේ කිරීමට නියම කිරීම

- පරිසරය කෙරෙහි අහිතකර බලපෑම් ප්‍රබල ලෙස ඇති වන්නා වූ යම් නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙරාතුව ඒවා විසින් පාරිසරික බලපෑම් ඇගයීම් කළයුතු යැයි නියම කිරීම

- නිශ්චිත කටයුතු ලෙස පරිසරයට අපද්‍රව්‍ය මුදාහරින, තැන්පත් කරන හෝ පිට කරන කටයුතු ගැසට් කිරීමට සහ මෙම පනතේ සඳහන් උපමාන සහ ප්‍රමිතීන්ට අනුකූලව කටයුත්ත කිරීමටත්, අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍ර නොමැතිව කිසිම පුද්ගලයකු කිසිම නිශ්චිත කටයුත්තක් නොකිරීම තහවුරු කිරීම.

1.4 අධිකාරියේ සාමාජිකයෝ

ජාතික පාරිසරික පනත යටතේ පැවරී ඇති බලතල යටතේ පරිසර විෂය භාර අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් අධිකාරිය සමන්විත වේ. ඉන් දෙදෙනෙක් පරිසර විෂය පිළිබඳ ප්‍රමාණවත් විශේෂඥතාවක් හා සුදුසුකම් ඇත්තන් විය යුතු අතර, ඉන් එක් තැනැත්තෙක් පාරිසරික

කළමනාකරණය පිළිබඳ මනා පරිපාලන කුසලතාවයක් හා ඒ පිළිබඳ පළපුරුද්දක් ඇත්තෙකු විය යුතුය. මේ තිදෙනා අතුරින් එක් අයෙකු අධිකාරියේ සභාපති වන්නේය.

2010.05.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි චරිත හේරත් මහතා මෙම අධිකාරියේ සභාපති වශයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලදි. 2010.05.07 දින සිට බලපැවැත්වෙන පරිදි එම්. ලලිත් ද සිල්වා මහතා හා සමන් ද සිල්වා මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වශයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලදි.

2011 වසරේ දී අධිකාරියේ සාමාජික මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය.

I.	චරිත හේරත් මහතා	-	සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය
II.	එම්. ලලිත් ද සිල්වා මහතා	-	සාමාජික
III.	සමන් ද සිල්වා මහතා	-	සාමාජික

මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වන රමණී ඇල්ලෙපොල මිය අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස පනතින් ලැබී ඇති බලය අනුව කටයුතු කරයි.

ගතවූ වසර තුල පරිසර කළමනාකරණයට අදාලව අධිකාරිය මෙහෙයවමින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වන ලදි.

1.5 පාරිසරික සභාව

1.5.1 හැඳින්වීම

සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසර පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව පරිසර සභාව පිහිටුවා ඇත.

<u>පරිසර සභාවේ කාර්යභාරය</u>

උක්ත සඳහන් පරිසර පනතට අනුව පරිසර සභාවේ ප්‍රධාන කටයුතු පහත පරිදි වේ.

(අ) මධ්‍යම පරිසර අධිකාරියේ වගකීම්, බලතල, කාර්ය සහ කර්තව්‍ය සඳහා අධිකාරියට උපදෙස් ලබාදීම
(ආ) අධිකාරිය විසින් සභාවට යොමු කරන ලද යම් කාරණා පිළිබඳව අධිකාරියට උපදෙස් දීම

පරිසර සභාවේ ව්‍යුහය

සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත අනුව පරිසර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජික කණ්ඩායමකින් පරිසර සභාව සමන්විත වේ. 2011 වසර තුලදී පරිසර සභාවේ 11 වන සැසිය පැවැත්විණි.

11 වන සැසිය

එකොලොස්වන සැසිය සඳහා පහත සඳහන් සාමාජිකයන් ගරු පරිසර අමාත්‍යවරයා විසින් නෝරා පත් කරන ලදි.

කමිටු සාමාජිකත්වය	සාමාජිකයාගේ නම	තනතුර
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය	ඩී. සුරසිංහ මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පළාත් පාලන)
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය	ඩබ්.එම්.ජී.ජී. වික්‍රමසිංහ මහතා	අතිරේක ලේකම්
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය	සී.එන්. විජේසේකර මහතා	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය	ඒ.එම්.කේ.කේ.අත්තනායක මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය	ශාන්ති ප්‍රනාන්දු මිය	අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්)
කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය	ඒ.කේ. සෙනෙවිරත්න මහතා	අතිරේක ලේකම්
අධිවේගී මාර්ග සහ මාර්ග සංවර්ධන අමාත්‍යාංශය	එස්.ඒ.ඩී.එස්. සුහසිංහ මිය	අතිරේක ලේකම් (සංවර්ධන)
නාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය	ජී.එස්. ගුණසේකර මහතා	ගරු ඇමතිතුමාගේ පාර්ලිමේන්තු සම්බන්ධීකරණ ලේකම්
දේශීය සම්පත් හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය	සුමනා ප්‍රේමරත්න මිය	අතිරේක ලේකම්
සම්පත් හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය	ඩී.එම්.එස්.අබේගුණවර්ධන මහතා	අතිරේක ලේකම්
සම්පත් හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය	එම්.ඒ. නාලනී මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යාංශය	ඩී.සී.එන්.ඒ. කුමාරසිංහ මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය	එන්.කේ. අබේරත්න මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ප්‍රවාහන අමාත්‍යාංශය	යූ.එන්. මල්ලවආරච්චි මහතා	සහකාර අධ්‍යක්ෂ

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය	ඉන්ද්‍රානි විතානගේ මිය	අධ්‍යක්ෂ (සංවර්ධන හා සැලසුම්)
සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශය	වෛද්‍ය පියසේන සමරකෝන් මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශය	වෛද්‍ය ආනන්ද ජයලාල් මහතා	අධ්‍යක්ෂ (පරිසර වෘත්තිකයන්ගේ සෞඛ්‍ය)
බාහිර සම්බන්ධතා අමාත්‍යාංශය	සමන්තා ජයසූරිය මහත්මිය	එක්සත් ජාතීන්ගේ හා බහු පාර්ශවීය සම්බන්ධතා අංශය
ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය	ඉන්ද්‍රා රණසිංහ මහත්මිය	වැ.බ. අධ්‍යක්ෂ ජනරාල්
කෘෂිකර්ම අමාත්‍යාංශය	එල්.යූ.එන්. සුමනසේකර මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආයෝජන හා ප්‍රවර්ධන)
ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	හේමා ධර්මවර්ධන මිය	අධ්‍යක්ෂ ජනරාල්
ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	එම්.ඒ.එස්. පෙරේරා මිය	අධ්‍යක්ෂ (පරිසර කළමනාකරණ)
අධ්‍යාපන අමාත්‍යාංශය	බී.එල්.ඩී. බාලසූරිය මිය	අධ්‍යාපන අධ්‍යක්ෂ (කෘෂි)
මධ්‍යම පරිසර අධිකාරිය	රමණී ඇල්ලෙපොල මිය - ලේකම්	අධ්‍යක්ෂ ජනරාල්

පරිසර ආරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ ප්‍රවීණයන්

ජනාධිපති නීතීඥ	පාලිත කුමාරසිංහ මහතා - සභාපති
පේරාදෙණිය විශ්ව විද්‍යාලය	මහාචාර්ය ශාන්ත හෙන්නායක මහතා
කැළණිය විශ්ව විද්‍යාලය	ඒ.ජී. අමරසිංහ මහතා
නීතීඥ	ජගත් ගුණවර්ධන මහතා
සමාජ හා පාරිසරික විශේෂඥ	නන්දසේන මාද්දුගොඩ මහතා
නීතීඥ	බන්දුසේන ලියනගේ මහතා

<u>රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින්</u>

ශ්‍රී ලංකා පාරිසරික පුවත්පත් කලාවේදීන්ගේ සංසදය	ආචාර්ය ධර්මන් වික්‍රමරත්න මහතා
ව්‍යාපෘති අධ්‍යක්ෂ	හේමන්ත ජයසුන්දර මහතා
පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ සැලසුම් සහායක ව්‍යාපෘතිය	
නීතීඥ	නීතීඥ ඉන්දික ජයතිලක මහතා

පැවැත්වූ රැස්වීම්

රැස්වීම් අංකය	දිනය	
218	ජනවාරි	20
219	මාර්තු	03
220	මාර්තු	24
221	ජුනි	24
222	ජූලි	25
223	සැප්තැම්බර්	05
224	ඔක්තෝම්බර්	19
225	නොවැම්බර්	23

සාකච්ඡාවට භාජනය කළ විෂයයන

- පරිසර සංරක්ෂණ බදු
- පරිසර නියමු වැඩ සටහනේ පාසල් හැර ගිය රැකියා විරහිත ජනාධිපති පදක්කම් ලාභීන්ගේ දායකත්වය පරිසර අධිකාරියට ලබාගැනීම
- පරිසර බලපෑම් ඇගයීම් සම්බන්ධයෙන් ජාතික පාරිසරික පනතට යෝජිත නව සංශෝධන
- පරිසර ආරක්ෂණය තුලින් ආපදා කළමනාකරණය
- පරිසර නියමු වැඩ සටහන වැඩි දියුණු කිරීමට මූල්‍ය පහසුකම් ලබාගැනීම
- තෙත්බිම් පිරවීම සම්බන්ධයෙන් වූ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අංක 1692/2 දරණ 2011.02.07 දිනැති ගැසට් පත්‍රය
- වයඹ පළාත් පරිසර ප්‍රඥප්තිය
- මධ්‍යම පරිසර අධිකාරියේ 30 වන සංවත්සර සැමරුම
- උතුරු පළාත සඳහා කළ උපාය මාර්ගික පාරිසරික ඇගයීම
- විදේශ මුදල් ප්‍රතිපාදන පිළිබඳ භාණ්ඩාගාර නීති රෙගුලාසි
- ආසනික් ගැටළුව සහ එහි වර්තමාන තත්ත්වය
- දකුණු අධිවේගී මාර්ගය
- වෙරළබඩ කලාපය කළමනාකරණය සහ වෙරළබඩ සංචාරක ව්‍යාපාරය
- සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධ ගැටළු
- ශ්‍රී ලංකාව තුළ පොලිතීන් පාරිභෝජනය පාලනය

2.0. අධිකාරියේ වගකීම් සහ කාර්යයන්

මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා පහත සඳහන් නාක්ෂණික වශයෙන් විශේෂිත වූ ක්ෂේත්‍ර 04 ක් පාදක කොටගෙන ආයතන ව්‍යුහය සමන්විත වේ.

i. පරිසර දූෂණ පාලන අංශය
ii. පරිසර කළමනාකරණ හා ඇගයීම් අංශය
iii. පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශය
iv. මානව සම්පත් සංවර්ධනය, පරිපාලන හා මුදල් අංශය

පරිසර කළමනාකරණ අංශයෙහි ඉමහත් පළපුරුද්දක් සහිත අධ්‍යාපනික සහ වෘත්තීයමය දැනුමක් ලත් නිලධාරීන් මෙම අංශයන්හි ප්‍රධානීන් ලෙස කටයුතු කරනු ඇත.

පරිසර දූෂණ පාලන අංශය

පරිසර දූෂණ පාලන අංශය යටතේ පිහිටුවන ලද ඒකක 03 හි කාර්යයන් පහත පරිදිය.

i. පරිසර දූෂණ පාලන ඒකකය

- ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා පරිසර එකඟතාවය ලබාදීම (නව පරිසර නිර්දේශ හා පරිසර ආරක්ෂණ බලපත්‍ර)
- විදුල සංදේශ කුළුණු සඳහා පරිසර නිර්දේශ ලබාදීම
- විදුලි සංදේශ කුළුණු සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීම
- ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලියට සහභාගි වීම
- පරිසර දූෂණය සම්බන්ධ මහජන පැමිණිලි විසඳීම
- පරිසර දූෂණය පාලනය සඳහා තාක්ෂණික පහසුකම් සැපයීම
- මානව හිමිකම් කොමිසමේ සහ උසාවියේ ප්‍රවීණ සාක්ෂිකරුවන් ලෙස පෙනී සිටීම හා පාර්ලිමේන්තු කමිටු, මානව හිමිකම් කමිටුව හා උසාවි සඳහා තාක්ෂණික වාර්තා සැපයීම
- දූෂණය පාලනය සඳහා කාර්යක්ෂම, නව උපාය මාර්ග ක්‍රම හා මෙවලම් හඳුන්වාදීම

ii. අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය

- උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ නීති හා රෙගුලාසි හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම
- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික උපදෙස් ලබාදීම
- අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ ප්‍රධාන ව්‍යාපෘති සැලසුම් හා පසුවිපරම් කිරීම
- අනුකූලතා පසුවිපරම් කිරීම
- කසළ කළමනාකරණය සඳහා තාක්ෂණ න්‍යාමන ක්‍රම ප්‍රවර්ධනය කිරීම
- බහු ජාතික පාරිසරික සම්මුතීන් ක්‍රියාත්මක කිරීම (බාසල් සම්මුතිය / රොටර්ඩෑම් සම්මුතිය)
- කර්මාන්ත ගැටළු කළමනාකරණය
- කාර්මික රසායනික ද්‍රව්‍ය කළමනාකරණය

- කසළ කළමනාකරණ ව්‍යාපෘතීන් / ක්‍රියාකාරකම් සඳහා පාරිසරික අනුමැතිය ලබාගැනීමට සහයෝගය ලබාදීම
- නීතිය කයාත්මක කරවීම සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීම
- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නියමු ව්‍යාපෘති ඇති කිරීම
- මහජන පැමිණිල්ල විමර්ශනය
- අපද්‍රව්‍ය කළමනාකරණයට සම්බන්ධ අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීමට සහයෝගය ලබාදීම
- කසළ කළමනාකරණ ව්‍යාපෘති අධීක්ෂණය
- නිකුත් කරන ලද නිර්දේශය පසුවිපරම් කිරීම
- අනෙකුත් ආයතන වල කසළ කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික යෙදවුම් ලබාදීම

iii. වායු තත්ව හා ජල තත්ව රසායනාගාරය

- මධ්‍යම පරිසර අධිකාරියේ අනෙකුත් අංශ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල සඳහා අවශ්‍ය විශ්ලේෂණ සේවා සැපයීම
- පාරිසරික තත්ව/ ප්‍රමිති පසුවිපරම් කිරීම
- තෝරාගත් ස්ථාන වල ජල හා වායු තත්ව පසුවිපරම් කිරීම
- වායු, ශබ්ද, කම්පන හා ජල තත්ව පිළිබඳ පාරිසරික පර්යේෂණ හා සමීක්ෂණ කටයුතු සිදු කිරීම
- ශබ්දය, වායු තත්ව සහ ජල තත්ව පිළිබඳ රෙගුලාසි සකස් කිරීම

පරිසර කළමනාකරණ හා ඇගයීම් අංශය

පරිසර කළමනාකරණ හා ඇගයීම් අංශය ඒකක 03 කින් සමන්විත වේ.

i. පරිසර බලපෑම් ඇගයීම් ඒකකය

- මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම
- පරිසර බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම
- පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය හා මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය හා සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
- පරිසර බලපෑම් ඇගයීම් හා මූලික පාරිසරික පරීක්ෂණයන්ට අදාල ගුරු උපදෙස් සකස් කිරීම
- උපාය මාර්ගික පරිසර බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම

ii. ස්වභාවික සම්පත් කළමනාකරණ ඒකකය

- පරිසර බලපෑම් ඇගයීම හා මූලික පාරිසරික පරීක්ෂණ හා ක්‍රියාවලියට අයත් නොවන ව්‍යාපෘති සඳහා පාරිසරික නිර්දේශ ලබාදීම
- ව්‍යාපෘති පසුවිපරම් කටයුතු සිදු කිරීම
- ස්වභාවික සම්පත් භායනය පිළිබඳ මහජන පැමිණිලි විභාග කිරීම
- ස්වභාවික සම්පත් සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
- පාරිසරික ආරක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම
- ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගුරු උපදෙස් නිකුත් කිරීම

iii. පර්යේෂණ සහ විශේෂ ව්‍යාපෘති ඒකකය

- භූගෝලීය තොරතුරු ආශ්‍රයෙන් දත්ත රැස් කිරීම
- පාරිසරික සංවේදී ප්‍රදේශ කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- දිස්ත්‍රික් පැතිකඩ සඳහා සිතියම් පිළියෙල කිරීම
- පාරිසරික පර්යේෂණ සම්බන්ධීකරණ සහ පර්යේෂණ වල ප්‍රතිඵල ලබාදීම

පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශය

- මුද්‍රිත මාධ්‍ය, ඉලෙක්ට්‍රොනික මාධ්‍ය සහ කණ්ඩායම් සන්නිවේදන මාර්ග හරහා පරිසරය පිළිබඳ අධ්‍යාපනය ලබාදීම හා දැනුවත් කිරීම
- ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් පුහුණු වැඩමුළු සහ ප්‍රදර්ශන පැවැත්වීම
- මහජනතාව වෙත පාරිසරික තොරතුරු ලබාදීම
- රාජ්‍ය නොවන සංවිධාන වෙත අවශ්‍ය සහයෝගය ලබාදීම හා ලබාගැනීම
- පාරිසරික දිනයන් සැමරීම
- සොබා කෙත මධ්‍යස්ථාන ඇති කිරීම හා ක්‍රියාත්මක කිරීම

ii. ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය

- පාරිසරික තොරතුරු රැස් කිරීම හා වැඩි දියුණු කිරීම
- පුස්තකාල ජාලය හා ජාලයට අයත් නොවන පුස්තකාල සම්බන්ධීකරණය
- පාරිසරික තොරතුරු අවශ්‍ය සියළු දෙනාට එම තොරතුරු ලබාදීමට පහසුකම් සැලසීම

iii. ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය

- සියළුම වැඩ සටහන් සම්පාදකයන් සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ සැපයීම
- මධ්‍යම පරිසර අධිකාරිය හා පාරිසරික අමාත්‍යාංශය විසින් පවත්වන ලද සියළු වැඩ සටහන් ශ්‍රව්‍ය දෘෂ්‍ය ආවරණය කිරීම
- අධ්‍යාපනික හා දැනුවත් කිරීම් සඳහා වීඩියෝ පටි සැකසීම
- වීඩියෝ පට සැකසීම සඳහා පහසුකම් සැපයීම

මානව සම්පත් සංවර්ධන, පරිපාලන සහ මුදල් අංශය

මානව සම්පත්, පරිපාලන හා මුදල් අංශය, මානව සම්පත් සංවර්ධන, පරිපාලන හා මුදල් යන ඒකක තුනකින් සමන්විත වේ.

i. මානව සම්පත් සංවර්ධන ඒකකය

- මානව සම්පත් කළමනාකරණ සැලසුම් සකස් කිරීම
- තෝරා ගැනීම, බඳවා ගැනීම සහ උසස්වීම් ලබාදීම
- පුහුණු වැඩ සටහන් වෙත කාර්ය මණ්ඩලය යොමු කිරීම
- පුද්ගල කාර්ය සාධන ඇගයීම
- පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ දේශීය/ විදේශීය පුහුණුවීම් සඳහා සුදුසු නිලධාරීන් යොමු කිරීම
- කාර්ය මණ්ඩල සාමාජිකයන් හට සිදු වූ අසාධාරණකම් සොයා බලා ඒ වෙනුවෙන් කටයුතු කිරීම
- මානව සම්පත් පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම

ii. පරිපාලන ඒකකය

- මිලදී ගැනීම්, අත්පත් කර ගැනීම් සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තුව
- සේවා එකඟතා නිකුත් කිරීම සහ අළුත් කිරීම
- රක්ෂණ පහසුකම් සඳහා ප්‍රවර්ධන පහසුකම් ලබාදීම
- ආයතනික සෞඛ්‍ය ආරක්ෂණය සහ සුභසාධනය
- සාමාන්‍ය පරිපාලන

iii. මුදල් ඒකකය

- වාර්ෂික ආදායම්/ වියදම් සකස් කිරීම හා අවසන් මුදල් වාර්තා ඉදිරිපත් කිරීම
- අවසන් ප්‍රගති වාර්තා සකස් කිරීම හා මාසික ආදායම් / වියදම් පාලන වාර්තාව සකස් කිරීම
- වැටුප් හා වෙනත් ගෙවීම් පිළිබඳ වාර්තා සකස් කිරීම හා ගෙවීම
- ව්‍යාපෘති ගිණුම් පවත්වාගෙන යාම
- ඵලදායී ගෙවීම්

නීති ඒකකය

- ජාතික පාරිසරික පනත යටතේ නීති කෙටුම්පත් සංශෝධනය හා නව නීති රෙගුලාසි පැනවීම
- ජාතික පාරිසරික පනත බලාත්මක කිරීම හා රෙගුලාසි ගැසට් කිරීම
- පරිසර පනත යටතේ 12 වන වගන්තිය සහ 24 වගන්ති යටතේ නියෝග නිකුත් කිරීම
- නිකුත් කරන ලද පරිසර ආරක්ෂණ බලපත්‍ර අත්හිටුවීම/ අවලංගු කිරීම හා ප්‍රතික්ෂේප කිරීම
- ආයතන කසළ බැහැර කිරීම සම්බන්ධයෙන් වගන්ති 23 S යටතේ නියෝග නිකුත් කිරීම
- පරිසර ආරක්ෂණ බලපත්‍ර කොන්දේසි අනුමත කිරීම හා අධිකරණයට වාර්තා ඉදිරිපත් කිරීම
- මධ්‍යම පරිසර අධිකාරිය ගොනුකළ හා මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව ගොනු කළ නඩු කටයුතු සඳහා අධිකරණයේ පෙනී සිටීම
- අමාත්‍යාංශයේ පැවැත්වෙන විමර්ශන හා ඇපැල් විභාග සඳහා පහසුකම් සැපයීම
- අධිකරණ නෛතික කටයුතු සඳහා ලිපිලේඛන සැකසීම
- පාරිසරික ව්‍යවස්ථා නීතිකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම හා සම්පත් දායකයන් ලෙස ද කටයුතු කිරීම
- පාරිසරික නෛතික කටයුතු පිළිබඳ අනෙකුත් අංශ හා ආයතනයන්ට උපදෙස් ලබාදීම
- ගිවිසුම් කෙටුම්පත් කරීම හා අනුමත කිරීම
- පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පොලිස් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කිරීම

සැලසුම් හා පසුවිපරම් ඒකකය

- මූලික දත්ත රැස්කිරීම, අවශ්‍ය දත්ත සහ දත්ත ප්‍රභවයන් හඳුන්වාදීම සහ දත්ත ප්‍රභවයන් හා දත්ත රැස්කරන ක්‍රම සම්බන්ධ කිරීම
- මධ්‍යම පරිසර අධිකාරියේ සංයුක්ත සැලැස්ම සකස් කිරීම
- මධ්‍යම පරිසර අධිකාරියේ සංයුක්ත සැලැස්ම, වාර්ෂික සැලැස්ම හා මධ්‍යකාලීන වැඩ සටහන් මත පදනම්ව ඒ ඒ ප්‍රතිපාදන යටතේ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම
- පසුවිපරම් කිරීම පිළිබඳ සැලසුම් සකස් කිරීම
- මධ්‍යම පරිසර අධිකාරියේ විවිධ අංශ සහ දිසත්‍රික්/ පළාත් කාර්යාල අතර සම්බන්ධීකරණය පවත්වාගෙන යාම
- ඇගයීම් සංවිධානය කිරීම
- ප්‍රගති වාර්තා සකස් කිරීම සහ වෙනත් අදාල ආයතන වෙත ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම
- වාර්ෂික වාර්තාව සකස් කිරීම
- මධ්‍යම පරිසර අධිකාරියේ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය පිළිබඳ දේශීය - විදේශීය මූල්‍යාධාර ආයතන, පුද්ගලික අංශයේ අදාල ආයතන හා වෙනත් අදාල ආයතන දැනුවත් කිරීම

පැමිණිලි ඒකකය

- පාරිසරික ගැටළු, හානි හා උපද්‍රව සම්බන්ධ මහජන හා ආයතනික පැමිණිලි ලබාගැනීම
- එකී ගැටළු අදාල ආයතන වලට යොමු කිරීම හා ඒ සම්බන්ධව කටයුතු කිරීම

අභ්‍යන්තර විගණන ඒකකය

- ගණකාධිකරණ හා අභ්‍යන්තර පාලන ක්‍රියා පිළිවෙල පිළිබඳ සමාලෝචනය
- මූල්‍ය හා මිනුම් තොරතුරු විමර්ශනය කිරීම
- ආයතනයේ මෙහෙයුම් කටයුතු වල ආර්ථික බව, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව පිළිබඳ මූල්‍ය හා මූල්‍ය නොවන පාලනයන් පිළිබඳ ප්‍රගති සමාලෝචනය කිරීම
- ආයතනයේ අභ්‍යන්තර හා බාහිර නීති රෙගුලාසි, කළමනාකරණ ප්‍රතිපත්ති හා මහ පෙන්වීම් ක්‍රියාත්මක කෙරෙන්නේදැයි පරීක්ෂා කිරීම
- කළමනාකරණය විසින් ව්‍යවස්ථානුකූලව පවරන ලද විශේෂ විමර්ෂණ

පළාත් කාර්යාල

පාරිසරික කළමනාකරණය සම්බන්ධ පහත සඳහන් කාර්යයන් පළාත් කාර්යාල වෙත පවරා දී ඇත.

<u>මධ්‍යම පරිසර අධිකාරියේ පළාත්/ දිස්ත්‍රික් කාර්යාල වල කාර්යභාරය</u>

- යෝජිත සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම
- නව කර්මාන්ත ස්ථානගත කිරීම සඳහා පාරිසරික නිර්දේශ ලබාදීම
- කර්මාන්ත සඳහා නියමිත කටයුතු/ පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීම (පළාත් පාලන ආයතන වෙත බලය පවරා නොමැති)

- පළාත් පාලන ආයතන වෙත බලය පවරන ලද ක්‍රියාවලීන් සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරිය සහ පළාත් පාලන ආයතන අතර සම්බන්ධීකරණය, පසුවිපරම් කටයුතු සිදු කිරීම සහ අවශ්‍යතාවය අනුව තාක්ෂණික උපදෙස් ලබාදීම
- ස්වභාවික සම්පත් කළමනාකරණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
- මූලික පාරිසරික පරීක්ෂණයට/ පරිසර බලපෑම් ඇගයීමට ලක් නොවන එනම්, මැණික් ගැරීම, ඉඩම් ගොඩකිරීම, ගස් කැපීම වැනි ව්‍යාපාර සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය ලබාදීම
- පාරිසරික අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
- පරිසරය සම්බන්ධ ප්‍රාදේශීය මට්ටමින් පැවැත්වෙන රැස්වීම් හා කාර්යයන් සඳහා මධ්‍යම පරිසර අධිකාරිය
  නියෝජනය කරමින් සහභාගි වීම
- රජයේ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා මූලික සංවිධාන, වෙනත් ස්වේච්ඡා ආයතන කර්මාන්ත හා
  වෙළෙඳ සංගම්, පාසල් සහ තරුණ සංවිධාන අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම
- දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ, ගම් මට්ටමින් හා පාසල් මහින් ක්‍රියාත්මක වන පාරිසරික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම
- පරිසර කළමණාකරණයට අදාල ප්‍රාදේශීය මට්ටමින් තොරතුරු/ දත්ත රැස්කිරීම, දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම
- මධ්‍යම පරිසර අධිකාරියේ පස් අචුරුදු වැඩ සටහනට අනුකූලව පළාත් හා දිස්ත්‍රික් කාර්යාල සඳහා වාර්ෂික ක්‍රියාත්මක වැඩ සටහන් සකස් කිරීම

අධිකාරියේ කාර්ය සාධනය

පහත පරිච්ඡේදයෙන් ඒ ඒ අංශ, ඒකක හා පළාත් කාර්යාල වලින් 2011 වසර තුල ඉටු කරන ලද කාර්ය සාධනයන් විග්‍රහ කෙරේ.

3. පරිසර දූෂණ පාලන අංශය

3.1 පරිසර දූෂණ පාලන ඒකකය :-

පරිසර දූෂණ පාලන අංශය යටතේ පවතින පරිසර දූෂණ පාලන ඒකකය පරිසර දූෂණය වැලැක්වීම හා පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම දරයි. මෙම ඒකකයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ පරිසර දූෂණ පාලනය කිරීමට යොදා ගන්නා ප්‍රධාන නෛතික උපාය මාර්ගය වන පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අදාල වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හා පරිසර දූෂණ පාලනය සඳහා නව ක්‍රමවේද සකස් කර හඳුන්වාදීමත් මෙම කටයුතු පිළිබඳව විධිමත්ව පසුවිපරම් සිදු කිරීමත් වේ. මෙකී අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා එම කටයුතු වලට අමතරව ආයතන දරීමත් කිරීමක් වශයෙන් කර්මාන්ත හා ආයතන අතර, හරිතමය ක්‍රියාමාර්ග වර්ධනය කිරීමේ අරමුණින් ජාතික හරිත සම්මාන වැඩ සටහන 2011 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

පරිසර දූෂණය වැලැක්වීම, අවම කිරීම හා පාලනය කිරීම සඳහා පහත සඳහන් කාර්යයන් පරිසර දූෂණ පාලන ඒකකය විසින් 2011 වසර තුළ ක්‍රියාත්මක කරන ලදි.

අ. පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම හා එයට අදාල කටයුතු සඳහා පහසුකම් සැපයීම.

ආ. පරිසර දූෂණ පාලනය සඳහා තාක්ෂණික උපදෙස් ලබාදීම.

ඇ. කර්මාන්ත ක්‍රියාකාරකම් වල පරිසර දූෂණ පාලනය සම්බන්ධව තාක්ෂණික පහසුකම් සැපයීම.

ඈ. පරිසර දූෂණ පාලනය සඳහා නව උපාය මාර්ග හා ක්‍රමවේද හඳුන්වාදීම.

ඉ. පරිසර දූෂණ පාලනය සම්බන්ධව දැනට පවතින නීති හා උපාය මාර්ග ප්‍රවර්ධනය කිරීම.

ඊ. පරිසර දූෂණ පාලනය හා සම්බන්ධව වැඩමුළු හා රැස්වීම් වලට සහභාගි වීම හා අදාල නිලධාරීන් පුහුණු කිරීම හා දැනුවත් කිරීම.

ඉහත ක්‍රියාකාරකම් වඩාත් පහසු ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා විෂය පථය ප්‍රධාන කාණ්ඩ හතරකට ගොනු කරන ලදී.

I. නියාමනය සහ පසුවිපරම්
II. ප්‍රතිපත්ති ප්‍රවර්ධනය
III. තාක්ෂණික පහසුකම් සැපයීම
IV. පරිසර දූෂණ පාලනය සඳහා විශේෂ ව්‍යාපෘති හා වැඩ සටහන්.

3.1.1 නියාමන සහ පසුවිපරම්

3.1.1.1 පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම.

1533/16 හා 2008.01.25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ පළකර ඇති නියමිත ක්‍රියාකාරකම් කරගෙන යාම සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් වලංගු පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීමේ ක්‍රමවේදය පරිසර දූෂණ පාලනය අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ. කර්මාන්ත මඟින් සිදුවන පරිසර දූෂණය ප්‍රමාණාත්මකව අධ්‍යනය කිරීමෙන් අනතුරුව පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගතයුතු නියමිත ක්‍රියාකාරකම් ගැසට් නිවේදනයේ කාණ්ඩ "අ", "ආ" හා "ඇ" වශයෙන් ලැයිස්තු ගත කර ඇත.

ඒ අනුව "අ" කාණ්ඩයට අයත් මහා පරිමාණ දූෂකාරක කර්මාන්ත 80 ක් ද "ආ" කාණ්ඩයට අයත් මධ්‍ය පරිමාණ දූෂකාරක කර්මාන්ත 33 ක් ද "ඇ" කාණ්ඩයට අයත් සුධි පරිමාණ දූෂකාරක කර්මාන්ත 25 කින්ද මෙය සමන්විත වේ. "අ" සහ "ආ" කාණ්ඩයට අයත් සුධි කර්මාන්ත සඳහා පාරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල මගින් සිදුකරනු ලබන අතර "ඇ" කාණ්ඩයේ කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය අදාල පළාත් පාලන ආයතන මගින් සිදුකරනු ලැබේ.
පරිසර දූෂණ පාලන අංශය මහා පරිමාණ දූෂකාරක කර්මාන්ත සඳහා විධිමත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලබයි.

3.1.1.2 ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යාපෘතීන් සඳහා පාරිසරික එකඟතාව ලබාදීම.

ආයෝජන මණ්ඩල පනතේ අංක 17 ට අනුව ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යාපෘති සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය ලබාදීමෙන් අනතුරුව අදාල පරිසර ආරක්ෂණ බලපත්‍රය ආයෝජන මණ්ඩලය මගින් නිකුත් කරනු ලැබේ. ඒ අනුව ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ කර්මාන්ත/ ව්‍යාපෘති සඳහා එකඟතාවය ලබාදීමේදී වැදගත් කාර්යභාරයක් පරිසර දූෂණ පාලන අංශය මගින් සිදුකරනු ලබයි.

ඒ අනුව පරිසර දූෂණ පාලන අංශය 2011 වසර සඳහා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යාපෘති / කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දීම සහ ස්ථානගත කිරීමට යෝජිත ව්‍යාපෘතීන් සඳහා එකඟතාවය පහත ආකාරයට ලබාදෙන ලදී.

එකඟතාවය ලබාදුන් කර්මාන්ත ගණන	2011
නව පරිසර ආරක්ෂණ බලපත්‍ර සංඛ්‍යාව	48
අළුත් කරන ලද පරිසර ආරක්ෂණ බලපත්‍ර සංඛ්‍යාව	297
ස්ථාපිත කිරීමට නියමිත නව ව්‍යාපෘතීන්	72
ස්ථාපිත කිරීමට යෝජිත විදුලි සංදේශ කුළුණ	156
පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කරන ලද විදුලි සංදේශ කුළුණු	43

3.1.1.3 පැමිණිලි විමර්ශණය කිරීම සහ පසුවිපරම් කිරීම.

මහජන පැමිණිලි විමර්ශණය කිරීම හා කර්මාන්ත කටයුතු මගින් සිදුවන පරිසර දූෂණ පාලනය පිළිබඳ ඇගයීම් වාර්තා, (අපජල තත්ව වාර්තා, ශබ්දය හා කම්පනය පිළිබඳ රසායනාගාර මිනුම් වාර්තා) පිළිබඳ විමර්ශණය කිරීම පරිසර දූෂණ පාලන අංශය මගින් සිදුකරයි.
ආයෝජන මණ්ඩලයේ අනුමත කර්මාන්ත වලට අදාලව ලැබෙන පැමිණිලි සහ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් විසින් සෘජුවම යොමුකරන අනෙකුත් විශේෂ පැමිණිලි විමර්ශණය කිරීම පරිසර දූෂණ පාලන ඒකකය විසින් සිදුකරනු ලබයි. 2011 වසර තුලදී ආයෝජන මණ්ඩලයේ අනුමත කර්මාන්ත වලට අදාලව ලැබුණු පැමිණිලි 55 ක් විමර්ශණය සිදුකර විසඳීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට යොමුකිරීම හා පසුවිපරම් කටයුතු

සිදුකරන ලදී. ඊට අමතරව මධ්‍යම පරිසර අධිකාරියේ පැමිණිලි අංශය මගින් යොමු කරන ලද පැමිණිලි 138 කත් 21 ක් විමර්ශනය කොට විසඳුම් සඳහා ඔවුන් යොමුකර ඇති අතර, අනෙකුත් පැමිණිලි අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල පළාත් කාර්යාල හා ආයතන වෙත යොමු කොට ඇත.

3.1.1.4 අපනයන කලාප සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ කර්මාන්ත ස්ථානගත කොට ඇති ආයෝජන කලාප 7 ක් ඇත. පරිසර බලපෑම් ඇගයීම් සිදු කොට ඇති මෙම කලාපයන්හි ඇති කර්මාන්ත මහා පරිමාණ දූෂකාරක කර්මාන්ත ලෙස ගැසට් නිවේදනයට අනුව සඳහන් කළහැක. ඒ අනුව මෙම කර්මාන්ත පුරයන් හි පරිසර දූෂණ පාලනය පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රමවේදය හරහා මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර දූෂණ පාලන එකකය මගින් සිදුකරනු ලැබේ. තවද මෙම කර්මාන්ත මගින් පරිසරයට ජනනය වන අපජලය සහ විමෝචනය කරන දූෂ්‍යකාරක පාලනය සහ අවම කිරීමේ අරමුණින් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කරනු ලබන අතර, ඒ සඳහා අඛණ්ඩ පසුවිපරම් කටයුතු සිදුකරයි.

2011 ජනවාරි ආයෝජන කලාප, පාරිසරික බලපත්‍ර අවලංගු වී නව බලපත්‍ර සඳහා ඉල්ලීම් කර ඇත. මේ අනුව වර්ෂය තුල එම ආයෝජන කලාප 4 සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකොට ඇති අතර, එකී කර්මාන්ත පුර වලට අවශ්‍ය පරිසර දූෂණ පාලන උපක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ලබාදී ඇත.

3.1.2 පරිසර දූෂණය පාලනය සඳහා නව උපාය මාර්ග ප්‍රවර්ධනය කිරීම.

3.1.2.1. අපජලය බැහැරලීම සඳහා වූ ප්‍රමිති හා උපමාන රෙගුලාසි සංශෝධනය කිරීම.

ජලයේ දූෂක ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා ජල තත්ව ප්‍රමිති භාවිතා කරනු ලැබේ. මධ්‍යම පරිසර අධිකාරිය මගින් විවිධ වූ ක්‍රියාකාරකම් වෙනුවෙන් අපජලය බැහැරලීම සඳහා අදාල ජල තත්ව ප්‍රමිති සකස් කොට ඇත. දැනට පවත්නා ප්‍රමිති වල තිබෙන ප්‍රධානම අපහසුතාව ලෙස විවිධාකාර පරාමිතීන් හා ඒවායේ අගයන් විශ්ලේෂණය කොට ලබා ගැනීමේ දුෂ්කරතා හැඳින්විය හැක. උදා: වර්ණය සඳහා වූ ප්‍රමිති වලට අනුව මෙය ප්‍රායෝගිකව පරීක්ෂා කිරීමේදී ප්‍රායෝගික ගැටළු වලට මුහුණ දීමට සිදු වේ. මේ අනුව දැනට පවත්නා මෙම ජල තත්ව ප්‍රමිති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී ඇති වී ඇති දුෂ්කරතා හේතුවෙන් නැවත සංශෝධනය කිරීම අත්‍යාවශ්‍ය බව තීරණය කරන ලදී.

දැනට පවත්නා අංක 1534/18 සහ 2008.02.01 දිනැති ගැසට් නිවේදනයට අනුව ක්‍රියාකිරීමේදී මෙම ගැටළුවලට මුහුණ දෙන ලදී. එබැවින් මෙම ගැටළු මගහරවා ගැනීමේ අරමුණින් සහ පවත්නා ජල ප්‍රභවයන්හි තත්වය වඩාත් වැඩිදියුණු කිරීමේ අරමුණින් කාර්මික දූෂණය පාලනය සඳහා මෙම ප්‍රමිති නැවත සකස් කිරීමට ජල කළමනාකරණයට සම්බන්ධ විශේෂඥ ආයතන, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගෙන් සමන්විත විද්වත් මණ්ඩලයක් වෙතින් අදහස් හා යෝජනා ලබාගන්නා ලදී.

2011 වසර තුල අපජලය බැහැරලීමේ ප්‍රමිතිය සම්බන්ධව රැස්වීම් 11 ක් පවත්වන ලදී. 2011 අවසාන වනවිට මූලාශ්‍ර සමීක්ෂණය හා විශ්ලේෂණය පවතින ගැටළු පිළිබඳ විශ්ලේෂණය කර අපජලය බැහැරලීමේ ප්‍රමිති හා උපමාණ සඳහා යෝජනාවක් සකස් කර ඇත.

3.1.2.2. පාරිසරික නිර්දේශ ලබාදීමේ ක්‍රියාවලිය නීතිගත කිරීම සඳහා උපාය මාර්ග සැකසීම.

වර්තමානයේ ක්‍රියාත්මක වන පාරිසරික නිර්දේශ ලබාදීමේ ක්‍රමවේදය පාලක ක්‍රියාදාමයක් මිස නෛතික ක්‍රියාදාමයක් නොවේ. එබැවින් මෙම ක්‍රියාදාමය කර්මාන්ත කරුවන්ට නීතිමය වශයෙන් අත්‍යාවශ්‍ය කියාවලියක් නොවන අතර, ඔවුන් විසින් පාරිසරික නිර්දේශ ලබාගනු ලබන්නේ හුදෙක් කර්මාන්තය සඳහා අවශ්‍ය අනෙකුත් ලේඛන වල අවශ්‍යතාවය සඳහා පමණි. යම් කර්මාන්තයක් ස්ථාපනය කිරීමේදී මෙම පාරිසරික නිර්දේශය ලබා ගැනීම නිත්‍යානුකූල අවශ්‍යතාවයක් ලෙස පවතී නම්, මෙම කර්මාන්තය මගින් සිදුවිය හැකි පරිසර දූෂණය පාලනය කිරීමට ආරම්භක අවස්ථාවේදීම පියවර ගැනීම පහසු වනු ඇත. එය කර්මාන්තකරුට මෙන්ම පරිසරයට ද වාසිදායක වන බැවින් මෙම ක්‍රියාවලිය නීතිගත කිරීම සඳහා දැනට මූලික ක්‍රියාදාමයන් මෙම අංශය මගින් ආරම්භ කර ඇත.

3.1.3. පරිසර දූෂණය පාලනය සඳහා තාක්ෂණික උපදෙස් ලබාදීම.

3.1.3.1. සංවේදී කලාප තුළ මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ දූෂකාරක කර්මාන්ත පිහිටුවීම පිළිබඳ තීරණය කිරීම සඳහා වූ කමිටුව

අපනයන සැකසුම් කලාප සහ කර්මාන්ත පුර වලින් පිටත මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ දූෂකාරක කර්මාන්ත ස්ථානගත කිරීම් තීරණය කිරීම සඳහා තාක්ෂණික කමිටුවක් ස්ථාපනය කරන ලදී. මෙය නව කර්මාන්ත ස්ථානගත කිරීම සම්බන්ධව තීරණ ගන්නා ඉහා විධිමත් තාක්ෂණික කමිටුවකි. මෙම කමිටුව ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, කර්මාන්ත අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය සහ මධ්‍යම පරිසර අධිකාරිය යන ආයතන වල විධායක මට්ටමේ තාක්ෂණික නිලධාරීන්ගෙන් සමන්විත වේ.

කොළඹ ප්‍රදේශයේ 75% ක ජල ඉල්ලුම සපයන අඹතලේ පොම්පාගාරයට ජලය කැලණි ගඟෙන් ලබාගන්නා නිසා කාර්මික අපදියර වලින් කැලණි ගඟට සිදුවන ජල දූෂණය අවම කිරීම මෙම කමිටුවේ ප්‍රධාන අරමුණ විය. නමුත් දැනට මෙම කමිටුව මඟින් කැලණි ගංඟා ද්‍රෝණියට බාහිරින් පිහිටුවා ඇති විශාල අපජල ප්‍රමාණයක් පිටකරන මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ කර්මාන්ත පිළිබඳව ද අවධානය යොමු කර ඒවා සඳහා ද නිර්දේශ ලබාදීම සිදුකරනු ලබයි.

පරිසර දූෂණ පාලන අංශය 2011 වසර තුලදී එවැනි රැස්වීම් 7 ක් පැවැත්වූ අතර, කර්මාන්තකරුවන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා 26 ක් ඇගයීම සිදුකරන ලදී.

3.1.3.2. පරිසර දූෂණ පාලනයට අදාල ව්‍යාපෘති වාර්තා ඇගයීම.

මහා පරිමාණ දූෂකාරක කර්මාන්ත ස්ථාපනය කිරීමේදී එකී කර්මාන්ත මඟින් සිදුවිය හැකි පරිසර දූෂණය පාලනය සඳහා වූ තාක්ෂණික වාර්තා ඉදිරිපත් කරයි. ඒ අනුව එකී ව්‍යාපෘති යෝජකයන් විසින් ලබාදෙනු ලබන තාන්ෂණික වාර්තා ඇගයීම, සුදුසු විශේෂඥ දැනුම සහිත සාමාජිකයන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් සිදුකළ යුතුයි. මීට ප්‍රථම මෙම වාර්තා පිළිබඳ නිසි ඇගයීමක් සිදු නොවූ අතර, එමගින් අතිවිශාල පාරිසරික හා සමාජීය බලපෑමක් සිදුවුණි.

එබැවින් පළාත් කාර්යාල වෙත ලැබෙන මහා පරිමාණ දූෂකාරක කර්මාන්ත වලට අදාල ව්‍යාපෘති යෝජනා ඇගයීම අත්‍යාවශ්‍ය විය. එම නිසා එම ව්‍යාපෘති ඇගයීම සඳහා විශේශඥ දැනුම සහිත කමිටුවක් පරිසර දූෂණ පාලන අංශය මඟින් පිහිටුවනු ලැබීය.

ඒ අනුව 2011 වසර තුලදී කර්මාන්තකරුවන් ඉදිරිපත් කරන ලද එවැනි ව්‍යාපෘති යෝජනා සඳහා කමිටු රැස්වීම් 10 ක් පැවැත්වූ අතර, එහිදී ව්‍යාපෘති යෝජනා 38 ක් ඇගයීමට භාජනය කරන ලදී.

3.1.3.3. පාරිසරික බලපෑම් තක්සේරු කිරීම (EIA) සඳහා තාක්ෂණික සහාය ලබාදීම.

මෙම අංශයේ නිලධාරීන් පරිසර දූෂණ පාලන ක්‍රමවේදයන් සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීමේ කමිටුවේ විශේෂ සාමාජිකයන් ලෙසට කටයුතු කරමින් නියමිත ව්‍යාපෘතීන්හි පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ සහ මූලික පාරිසරික පරීක්ෂණ වාර්තා ඇගයීමේ අදාල රාජකාරී වලද නියැලේ. EIA/IEE ක්‍රියාවලීන්හිදී නිලධාරීන් තම පරිසර දූෂණ පාලන විෂය ක්ෂේත්‍රයට අනුව අදහස් හා නිර්දේශ ලබාදෙමින් රාජකාරී කටයුතු සිදු කරනු ලැබේ.

මේ අනුව පරිසර දූෂණ පාලන ඒකකයේ නිලධාරීන් ව්‍යාපෘති 18 ක් සඳහා තාක්ෂණික කමිටු සාමාජිකයන් ලෙස සහභාගි වී පරිසර දූෂණ පාලන ක්ෂේත්‍රයේ තාක්ෂණික සහය ලබාදී ඇත.

3.1.3.4. කර්මාන්ත ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික පහසුකම් සැලසීම.

අ) තාකෂණික විශේෂඥ උපදේශක ආයතන හා විශ්ලේෂණ රසායනාගාර වාර්ෂිකව ලියාපදිංචි කිරීම

කර්මාන්ත ශාලා වලින් සිදුවන පාරිසරික දූෂණ තත්වයන් මෙම අධිකාරිය මගින් අනුමත තත්වයන්ට අනුකූල වන පරිදි පාලනය කරගැනීමට කර්මාන්ත කරුවන්ට අවශ්‍ය තාක්ෂණික මඟපෙන්වීම් උපදෙස් හා විශේෂඥ සහාය ලබාගැනීමට පහසුකම් සැලසීම සඳහා රසායනාගාර / තාක්ෂණික විශේෂඥ/ උපදේශක ආයතන මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි කර එම ලේඛන වාර්ෂිකව යාවත්කාලීන කරනු ලැබේ.

මෙහි අරමුණ වනුයේ කර්මාන්තකරුවන්ට අඩු වියදමකින් හොඳ තාක්ෂණික සේවාවක් ලබා දීම මගින් පාරිසරික හානිය අවම කර ගැනීමයි. මෙහිදී රසායනාගාර පහසුකම් සලසන ආයතන වලට මෙන්ම උපදේශන සේවා සපයන්නන්ට ද තම ආයතනයේ අඩුලුහුඩුකම් නිවැරදි කර ගනිමින් වඩා පුළුල් සේවාවක් ලබාගත හැකි වේ.

මේ අනුව 2011 වසර සඳහා රසායනාගාර 32 සහ තාක්ෂණික විශේෂඥ ආයතන 52 ක් ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන ලදී. එම ඉලලුම් පත් ඇගයීමෙන් හා ව්‍යාපෘති පසුවිපරම් කිරීමෙන් පසු රසායනාගාර 27 ක් හා තාක්ෂණික විශේෂඥ ආයතන 47 ක් මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි කර ඇත. තවද මෙම ආයතන මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවිය මගින් ප්‍රසිද්ධ කර ඇති අතර, අදාල තොරතුරු සහිත පත්‍රිකා මුද්‍රණය කිරීමට කටයුතු කොට ඇත.

2012 වසරෙහි ලියාපදිංචි වීම සඳහා අදාල පුවත් පත් දැන්වීම මෙම වසරේ ප්‍රසිද්ධියට පත්කරන ලදී.

ආ) අන්තර් රසායනාගාර විශ්ලේෂණ නිපුණතාව පරීක්ෂා කිරීම

මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරය හා ශ්‍රී ලංකා රසායනාගාර පරීක්ෂක සංගමය (Sri Lanka Association of Testing Laboratory) ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙය වාර්ෂික රසායනාගාර ලියාපදිංචි කිරීමේ වැඩසටහනට අදාලව ක්‍රියාත්මක වේ. ඒ අනුව වාර්ෂිකව ලියාපදිංචි කරන ලද රසායනාගාර මේ සඳහා තෝරා ගන්නා ලදී. මෙමගින් මෙම රසායනාගාර මගින් සිදුකරනු ලබන විශ්ලේෂණ, නිකුත් කරනු ලබන වාර්තා වල නිරවද්‍යතාවය මෙන්ම වඩාත් කාර්යක්ෂම ලෙස කටයුතු සිදුකිරීම වැඩිදියුණු කිරීම මෙම වැඩ සටහනේ අරමුණ වේ.

ඒ අනුව ලියාපදිංචි රසායනාගාර 10 ක් මෙම විශ්ලේෂණ නිපුනතාවය පරීක්ෂා කිරීමේ වැඩ සටහනට දායක කරගන්නා ලදී. තවද පරිසර දූෂණ පාලන අංශය සහ මෙම අධිකාරියෙ රසානාගාරය මෙම වැඩසටහන වාර්ෂිකව සිදුකිරීමට අදහස් කොට ඇත.

3.1.3.5. සෞඛ්‍ය ආරක්ෂිත දිවි පැවැත්මක් සඳහා පරිසර හිතකාමී සත්ව ගොවිපලවල් පවත්වාගෙන යාම සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන

සත්ව පාලන ගොවිපලවල් මගින් සිදුවන පරිසර දූෂණය පාලනය දිනෙන් දින උද්ගතවන පාරිසරික ගැටළුවකි. බොහොමයක් පශු පාලන කර්මාන්ත ග්‍රාමීය නේවාසික ප්‍රදේශ වල පිහිටා ඇත. එබැවින් එම කර්මාන්ත මගින් ජනිත වන දුවිලි අංශු, දුර්ගන්ධය මෙන්ම ජල දූෂණය සම්බන්ධව නිරතුරුවම පැමිණිලි ලැබේ. මෙකි පාරිසරික

ගැටළු විසඳා ගැනීමේ අරමුණින් මධ්‍යම පරිසර අධිකාරිය හා පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ උපදේශාත්මක වැඩ සටහන් පැවැත්වීම සඳහා මුළු දිවයිනටම පොදු වූ දිගුකාලීන සැලැස්මක් සැකසීම සඳහා 2011 වසරේ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත් විය.

ඒ අනුව සත්ව ගොවිපලවල් ආශ්‍රිත ගැටළු නිරාකරණය කිරීම සඳහා ජාතික මට්ටමේ උපදේශක කමිටුවක් මධ්‍යම පරිසර අධිකාරිය හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය එක්ව ස්ථාපිත කරන ලදී.

පළමු රැස්වීම 2011.06.09 දින පවත්වන ලදි. ඒ අනුව මූලික ගැටළු හඳුනා ගැනීමේ වැඩ සටහනක් වැඩ සටහන ගම්පහ දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය නිලධාරීන්" මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන් හා මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් සඳහා කොටදෙනියාව සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වනු ලැබිය. මෙහිදී පශු පාලනය පිළිබඳව වර්තමානයේ මුහුණ දෙන්නාවූ ගැටළු සහ ඒවාට පිළියම් සෙවීම පිළිබඳව සාකච්ඡා කරන ලදී.

3.1.4 පරිසර දූෂණ පාලනය සඳහා විශේෂ ව්‍යාපෘති හා වැඩ සටහන්

3.1.4.1 රසායනික අනතුරු වලක්වා ගැනීමේ SAICM ව්‍යාපෘතිය

මධ්‍යම පරිසර අධිකාරිය සෑම විටම රටේ පරිසරයට සැලකියයුතු බලපෑමක් ඇති කළහැකි කාර්මික දූෂණ කාරකයන් පාලනයට විවිධ වූ නව නියාමනයන් හඳුන්වා දීම සිදුකරන ලබයි. නිරන්තර සුපරීක්ෂාව හා නිසි වේලාවට ක්‍රියා කර නිවැරදි ක්‍රමොපායන් අනුගමනය කිරීමෙන් බොහෝ රසායනික විපත් මහහරවා ගතහැක.

ජාත්‍යන්තර නියම වලට අනුකූලව එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩ සටහන (UNEP) විසින් රසායනික අනතුරු වලක්වා ගැනීම හා පෙර සුදානම් වැඩ සටහන (CAPP) ආරම්භ කර මූල්‍යාධාර සපයයි.

ඒ අනුව මෙම අධිකාරිය හා එක්සත් ජාතින්ගේ පාරිසරික සංගමය සමඟ පවත්වන ලද සාකච්ඡාවකට අනුව ජාත්‍යන්තර ප්‍රමිති යටතේ රසායනික අනතුරු වලක්වා ගැනීම හා පෙර සුදානම් වැඩ සටහන (CAPP) ශ්‍රී ලංකාවේ දියත් කිරීමට අදාල මූලික කටයුතු සිදුකොට ඇත.

මේ අනුව අංක 1153/16 හා 2008 .01.25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ පලකර ඇති නියමිත ක්‍රියාකාරකම් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය හා ඒකාබද්ධව රසායනික අනතුරු වලක්වා ගැනීමේ වැඩ සටහන (CAPP) දියත් කිරීමට අපේක්ෂා කෙරේ. මෙමඟින් කර්මාන්ත ක්‍රියාවලිය සඳහා රසායනික ද්‍රව්‍ය භාවිතා කරන්නේ නම් එමඟින් සිදුවන පාරිසරික හානිය අවම කරවීම මධ්‍යම පරසර අධිකාරියේ වගකීමයි.

එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩ සටහනේ (UNEP) ආධාර ලබාගැනීම සඳහා මූලික කාර්යයන් 2011 වසර තුල සිදු කරන ලදි.

3.1.4.2 ජාතික හරිත සම්මාන 2011 වැඩ සටහන

ජාතික පාරිසරික පනත මඟින් පරිසර දූෂණය පාලනය, කළමනාකරණය හා දැනුවත් කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත බලය පවරන ලදී. ඒ අනුව අංක 1533/16 දරණ 2008.01.25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගතයුතු කර්මාන්ත හඳුන්වා දී ඇත. තවද පාසල් ළමුන් සඳහා සහ තරුණ ප්‍රජාව සඳහා පරිසර අධ්‍යාපනය ලබාදීම මෙන්ම දැනුවත් කිරීම් ද මෙම අධිකාරිය මඟින් ඉටු කරනු ලැබේ.

කෙසේ වෙතත් පරිසර දූෂණය පාලනය සඳහා මේ වනවිට අනුගමනය කරනු ලබන ක්‍රමවේදයන් සහ දැනට ක්‍රියාත්මක වන නෛතික හා පාලන උපක්‍රම පමණක්ම මධ්‍යම පරිසර අධිකාරිය අපේක්ෂිත ඉලක්ක කරා යාමට ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය කර ඇත. එමනිසා මධ්‍යම පරිසර අධිකාරිය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පරිසරය සංරක්ෂණය කිරීමේ පණිවිඩය සමාජයට ගෙනයාම මෙන්ම පරිසර දූෂණ පාලනය සඳහාත් ස්වාභාවික සම්පත් කළමණාකරන හා පරිසර අධ්‍යාපනය පුළුල් ලෙස ක්‍රියාත්මක කරමින් කටයුතු කරන ආයතන දිරිගැන්වීම හා ඇගයීමේ අරමුණින් ජාතික හරිත සම්මාන වැඩ සටහන ආරම්භ කර ක්‍රියාත්මක කරන ලදී.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2011 අගෝස්තු 23 වැනි දින ජාතික හරිත සම්මාන ප්‍රධානෝත්සව ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානෝත්සවයෙන් පවත්වන ලදී. මෙහිදී පරිසර හිතකාමී සංවර්ධනය කරා අපගේ මාතෘ භූමිය රැගෙන යාම සඳහා විශිෂ්ඨ සේවාවක් ඉටු කරන ලද පරිසර කළමනාකරණය අතින් ඉතා විශිෂ්ඨ ලෙස කටයුතු කළ පළාත් පාලන ආයතන " කර්මාන්ත හා පාසැල් වෙන රන්" රීදී සහ ලෝකඩ සම්මාන පිරිනමන ලදී.

3.1.4.3 අදාල ආයතනයන්හි නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පුහුණුවීම්/ වැඩමුළු සාකච්ජා සහ ඉදිරිපත් කිරීම්.

සෑම මට්ටමකම නිලධාරියෙකුට තමන්ට පැවරෙන කාර්‍යයන් හා වගකීම් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණුව එක් අත්‍යාවශ්‍යය අංගයකි. පරිසර දූෂණ පාලන අංශය පහත සඳහන් පුහුණුවීම්, වැඩමුළු, රැස්වීම් හා ඉදිරිපත් කිරීම් පවත්වන ලදී.

a. පශු පාලනය සඳහා වූ ගැටළු හඳුනා ගැනීමේ අරමුණින් සත්ව පාලන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව" ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය යන ආයතන වල නිලධාරීන් හා එක්ව මධ්‍යම පරිසර අධිකාරියේ ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පරිසර නිලධාරී හා ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් වැඩ මුළුවක් කොටදෙනියාව සතව පාලන පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වන ලදි.

b. කළුතර, අනුරාධපුර, බදුල්ල සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වල පළාත් පාලන ආයතන නිලධාරීන් හා මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහන් 4 ක් ක්‍රියාත්මක කරන ලදි.

c. කර්මාන්ත ප්‍රජාව සඳහා පරිසර දූෂණ පාලන උපක්‍රම පිළිබඳව සහ මහජනතාව වෙනුවෙන් දේශන 27 ක් පවත්වා ඇත.

d. පරිසර දූෂණ පාලන අංශය මහන් සහභාගී වූ රැස්වීම්, දේශණ සහ වැඩමුළු ගණන 36 කි.

ප්‍රගති සාරාංශය - 2011

පරිසර දූෂණ පාලන ඒකකය.

ක්‍රියාකාරකම	ප්‍රගතිය		වෙනත්
	භෞතික	මූල්‍ය	
1. පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රමය ක්‍රියාත්මක කිරීම. **ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා මධ්‍යම පරිසර අධිකාරිය.**		2011 වසර සඳහා පරිසර දූෂණ පාලන ඒකකය සඳහා වෙන්කළ මූල්‍ය ප්‍රතිපාදන රු. 15,00000/- වේ. ඒ අනුව වෙන්කළ මුළු මුදලින් රු. 969667.90 ක් පරිසර දූෂණ පාලන ඒකකය විසින් වියදම් කර ඇත.	ක්‍රියාත්මක කිරීමේ වියදම් ආයෝජන මණ්ඩලය විසින් දරාගන්නා ලදී.
• නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශය සඳහා එකඟතාවයන් ලබා දීම	72		
• විදුලි සංදේශ සම්ප්‍රේෂණ කුළුණු සඳහා පාරිසරික නිර්දේශ ලබා දීම.	156		
• නව පරිසර ආරක්ෂණ බලපත්‍ර සඳහා එකඟතාවයන්	48		
• පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත් කිරීම් සඳහා	297		
2. පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රමය ක්‍රියාත්මක කිරීම - ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්ත සඳහා			
• විදුලි සංදේශ සම්බන්ධතා කුළුණු සඳහා පරිසර නිර්දේශ ලබාදීම	43		
• පැමිණිලි -ආයෝජන මණ්ඩලයට අයත් නොවන ලැබීම් පරීක්ෂණ කිරීම් යොමු කිරීම්I	138 21		

ක්‍රියාකාරකම	ප්‍රගතිය		වෙනත්
	භෞතික	මූල්‍ය	
-ආයෝජන මණ්ඩලයට අයත් ලැබීම පරීක්ෂණ කිරීම යොමු කිරීම	117 55 18 37		
3. තාක්ෂණික විශේෂඥ ආයතන හා රසායනාගාර ලැයිස්තු යාවත්කාලීන කිරීම.			
• රසායනාගාර ලියාපදිංචිය සඳහා ලද අයදුම්පත් සංඛ්‍යාව	32		
• තාක්ෂණික විශේෂඥ ආයතන ලියාපදිංචිය සඳහා ලද අයදුම්පත් සංඛ්‍යාව	52		
• ලියාපදිංචි කළ රසායනාගාර	27		
• ලියාපදිංචි කළ විශේෂඥ උපදේශන ආයතන	47		
• **ව්‍යාපෘති යෝජනා ඇගයීම් කමිටුව.**			
• පැවැත්වූ රැස්වීම් ගණන • ඇගයීම් සිදුකළ ව්‍යාපෘති යෝජනා	07 38		
• **මහා පරිමාන සහ මධ්‍යම පරිමාණ කර්මාන්ත සඳහා කමිටුව**			
• පැවැත්වූ රැස්වීම්	07		
• ඇගයීම් සිදුකරන ලද ව්‍යාපෘති යෝජනා	26		
6. අපජලය බැහැර කිරීමේ ප්‍රමිති සහ ජල තත්ව ප්‍රමිති විමර්ශනය කිරීම සහ ප්‍රතිශෝධනය කිරීම • පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව	11		
7. පරිසර ආරක්ෂණ බලපත්‍ර අංක කිරීමේ වැඩ සටහන සඳහා අංක ලබා දීම			
• නිකුත් කරන ලද "අ" කාණ්ඩයේ නව පරිසර ආරක්ෂණ බලපත්‍ර අංක සංඛ්‍යාව	886		
• නිකුත් කරන ලද "අ " කාණ්ඩයේ පරිසර ආරක්ෂණ ලිපි ගොනු අංක සංඛ්‍යාව (නව ලිපි ගොනු)	1418		
• අළුත් කරන ලද "අ" කාණ්ඩයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර අංක සංඛ්‍යාව	1509		

ක්‍රියාකාරකම	ප්‍රගතිය		වෙනත්
	භෞතික	මූල්‍ය	
8. පුහුණුවීම්/ වැඩමුළු, රැස්වීම් ඉදිරිපත් කිරීම්.			
• පරිසර දූෂණ පාලන ඒකකය මගින් පැවැත්වූ දේශණ.	27		
• පුහුණු වැඩමුළු	4		
• පරිසර දූෂණ පාලන ඒකකය සහභාගි වූ හා රැස්වීම්.	36		
9. සහභාගි වූ EIA කමිටු රැස්වීම් සංඛ්‍යාව	18		

3.2. රසායනාගාරය

අතීතයේ, වාතයේ ඇති සමස්ත අවලම්බිත අංශ තුලින් අංශුමය ද්‍රව්‍ය (PM) මැනීම සිදු කල අතර, එහි අංශු වල ප්‍රමාණයන් පිළිබඳව සැලකීමක් නොදැක්විය. වර්ෂ 1987 දී එම මූලික සම්මතය PM_{10} යන සම්මතය මගින් ප්‍රතිස්ථාපනය කරන ලදි. මෙම සම්මතයෙහි අංශ වල විශ්කම්බය මයික්‍රෝ මීටර් 10 හෝ ඊට වඩා අඩු අංශු කෙරෙහි අවධානය යොමු කෙරිනි. වර්ෂ 1997 දී PM_{10} යන සම්මතය PM 2.5 ලෙස වෙනස් කරන ලදි. පාරිසරික ආරක්ෂණ නියෝජිතායතනය මයික්‍රෝ මීටර් 2.5 ට අඩු හෙවත් ශ්වාස අංශු පිළිබඳ උනන්දුවක් ඇති වන හෙයින් මෙම මයික්‍රෝ සම්මතය ප්‍රචලිත කරන ලදි. මෙවැනි අංශු ශ්වාස පද්ධතිය තුල තැන්පත් වීමට තරම් කුඩා අංශුය.

3. 2.1. වායු තත්ව පසුවිපරම් කටයුතු

කොළඹ කොටුවේ වායු තත්ත්ව පසු විපරම මධ්‍යස්ථානය භාවිතා කොට 2011 වර්ෂයේ දී අවට වායු ගෝලයේ ක්ෂුද්‍ර අංශූන් (PM 10) මැනීම සිදු කරන ලදි. අනෙකුත් වායූන් මැනීම සඳහා උපයෝගි කොටගත් උපකරණ අවුරුදු 15කට වඩා පැරණි තත්ත්වයේ පවතින හෙයින් හා ඒ සඳහා අවශ්‍ය අමතර කොටස් නිෂ්පාදනය කරනු නොලබන බැවින් එම උපකරණ යථා තත්ත්වයට පත් කරගත හැක විය. එබැවින් වර්තමානයේ අනෙකුත් වායූන් මැනීම සිදු කරනු නොලබයි.

3.2.1.1 ශ්‍රී ලංකාවේ වායු තත්ත්වය

1998 සිට 2011 දක්වා කොළඹ කොටුවේ ක්ෂුද්‍ර අංශූන් (PM 10) හි වාර්ෂික සාමාන්‍ය අගයේ ප්‍රස්ථාරය පහතින් දැක්වේ. මෙම ප්‍රස්ථාරයෙන් පෙනෙන ආකාරයට ක්ෂුද්‍ර අංශූන් (PM 10) හි අවුරුද්දක සාමාන්‍ය අගයේ උපරිම අගය පසුගිය අවුරුදු 14 තුල ඉක්මවා ගිය නමුත් එම කාලය තුලදී ක්ෂුද්‍ර අංශූන් (PM 10) හි අවුරුද්දක සාමාන්‍ය අගය අඩු වීමේ ප්‍රවණතාවයක් ඇති බව පෙන්නුම් කරයි.



මෙයට සමගාමීව හම්බන්තොට නගරයේ ද අවට වාතයේ තත්ත්වය මිනුම් කරන ලදි. සල්ෆර් ඩයොක්සයිඩ්, නයිට්‍රජන් ඩයොක්සයිඩ් සහ කාබන් මොනොක්සයිඩ් සාන්ද්‍රණ ජාතික පාරිසරික සංසරණ වායු තත්ත්ව ප්‍රමිතීන්ට වඩා ඉතාමත් පහල අගයක පවති. ක්ෂුද්‍ර අංශූන් (PM 10 හා PM 2.5) සාන්ද්‍රණ ද ජාතික පාරිසරික සංසරණ වායු තත්ත්ව ප්‍රමිතීන්ට වඩා ඉතාමත් පහල අගයක පවතින බව පහත ප්‍රස්ථාර වලින් පැහැදිලි වේ.

<u>හම්බන්තොට ප්‍රදේශයේ PM 10 හා PM 2.5 සාන්ද්‍රණ වල වෙනස්වීම්</u>



3.2.1.2. අවට වායු තත්ත්ව කළමනාකරණ



ශ්‍රී ලංකාවේ පවතින සංසරණ වායු තත්ත්වයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා ප්‍රභවයන්ගෙන් නොවන විමෝචන පාලනය මෙන්ම ප්‍රභවයන්ගෙන් පිටවන විමෝචනයන් පාලනය කිරීම ද අවශ්‍ය වේ. ප්‍රභවයන්ගෙන් සිදුවන විමෝචනය පාලනය කිරීම උපාය මාර්ගය වශයෙන් මධ්‍යම පරිසර අධිකාරිය ස්ථානීය ප්‍රභව විමෝචන පාලන නියෝග සකසා අවසන් කර ඇත.

මෙම ප්‍රමිතීන් ජාතික පාරිසරික පනත යටතේ ගැසට් කරන තුරු අන්තර් ප්‍රමිති උපමාන වශයෙන් භාවිතා තිරීමට මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇත.

මේ අතර වායු ශබ්ද සහ කම්පන පසු විපරම් අංශයේ නිලධාරීන්ට ප්‍රහව වලින් පිටවන වායු විමෝචනයන් පාලනය කිරීමට අදාලව හා තිරසාර ප්‍රවාහන කළමනාකරණයට අදාලව ජපානයේ පුහුණු ලැබීමට අවස්ථා ලැබිණි.

3.2.1.3. ශ්‍රී ලංකාව සඳහා සංකලිත වායු තත්ත්ව කළමනාකරණ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ පවතින සියළුම වායු දූෂණ ප්‍රශ්න වලට අදාලව වායු තත්ත්ව කළමනාකරණය සඳහා "නිල් අහස 2020" ව්‍යාපෘතිය වායු තත්ත්ව පසු විපරම් ඒකකය මගින් හඳුන්වා දී ඇත.

3.2.1.4. ශබ්දය සහ කම්පනය මැනීම / කර්මාන්ත වලින් නැගෙන ශබ්දය මැනීම

ශබ්ද දූෂණය ප්‍රධාන පාරිසරික ගැටළුවක් වශයෙන් ශ්‍රී ලාංකීය සමාජයේ මහජන පීඩාවක් ඇති කරන ක්‍රියාකාරිත්වයක් ලෙස හඳුනාගෙන ඇත.

කර්මාන්ත ක්‍රියාකාරකම් වලින් සහ මහජන ක්‍රියාකාරකම් වලින් නිකුත් වන ශබ්ද දූෂණ තත්ත්වයන් පිළිබඳ පැමිණිලි රසායනාගාරය වෙත තිරන්තරයෙන් ලැබෙමින් පවති.

රසායනාගාරය මගින් එම පැමිණිලි පරීක්ෂා කිරීමත්, ශබ්ද මිනුම් සිදු කිරීමත් ඊට අදාල වාර්තා ලබා දීමත්, කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දීමේදී ශබ්ද මිනුම් වාර්තා ලබා දීමත් සිදු කරනු ලබයි. මහජන පැමිණිලි සමාලෝචනය කිරීම සඳහා ශබ්ද මිනුම් වාර්තා ලබා දීමද සිදු කෙරේ. කර්මාන්තකරුවන්ගේ ඉල්ලීම පරිදි වාණිජ මට්ටමේ ශබ්ද මිනුම් වාර්තා ලබා දීම ද සිදු කෙරේ. ඒ අතර පවතින ඝෝෂා පාලන නියෝග සංශෝධනය මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති අතර 2011 වර්ෂයේ දී එම කටයුත්ත ආරම්භ කරන ලදි. ඝෝෂා පාලන නියෝග සංශෝධනය සඳහා අවසාන කෙටුම්පත සකසා ඇත.

ක්ෂේත්‍ර මිනුම් කිරීමකින් පසු වාහන වලින් ජනිත වන අමතර නලා හඬ පාලනය සඳහා වාහන නලා ශබ්ද පාලන නියෝග ගැසට් කර ඇත.

3.2.2. ජල තත්ව පසුවිපරම් රසායනාගාරය

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර දූෂණ පාලන අංශය යටතේ ඇති ජල තත්ත්ව පසුවිපරම් රසායනාගාර දිවයින පුරා ඇති කර්මාන්ත අපසන්දන ජලය විශ්ලේෂණය කොට වාර්තා ලබා දීම සඳහා අනුයුක්ත කොට ඇත.

2011 වර්ෂය තුල කර්මාන්ත අපසන්දන ජල සාම්පල 433 ක් රැස් කරන ලද අතර එම සාම්පල භෞතික, රසායනික සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරාමිතීන් සඳහා විශ්ලේෂණය කරන ලදි.

එම ප්‍රතිඵල පහත සඳහන් වගුව පරීදි වේ.

විශ්ලේෂණය කිරීමේ අරමුණු	රැස් කරන ලද සාම්පල ගණන
1. පරිසර ආරක්ෂණ බලපත්‍ර සඳහා	161
2. නීතිමය කටයුතු සඳහා	26
3. පැමිණිලි සඳහා	20
4. පසුවිපරම් සඳහා	112
5. වාණිජ්‍යමය කාර්මික අපසන්දන	114
මුළු සාම්පල ගණන	**433**



2011 වසර තුල කාර්මික අපසන්දන ජලය විශ්ලේෂණය කිරීම ප්‍රස්ථාරයක නිරූපණය

මතුපිට ජල දේහයන්	රැස් කරන ලද සාම්පල ගණන
1. කැළණි ගඟ	156
2. මා ඔය	88
3. තලංගම	12
4. බොරලැස්ගමුව	32
5. බොල්ගොඩ	16
6. දඩුගම් ඔය	60
7. බෙන්තොට	61
8. වාණිජ්‍ය අරමුණෙන් රැස් කරන ලද භූතල ජලය	91
මුළු සාම්පල ගණන	**516**



2011 වසර තුල තුල කරන ලද මතුපිට ජලය විශ්ලේෂණයෙහි ප්‍රස්ථාර ගත නිරූපනය

2011 වසර තුල භූතල ජල සාම්පල 516 ක් රැස් කරන ලද අතර ඒවා පරාමිතීන් 16 ක් සඳහා විශ්ලේෂණය කරන ලදි. පසුගිය 2010 වසරේ කරන ලද කාර්යයන් ඉදිරියට ගෙන යාමක් ලෙස බොල්ගොඩ වැව, තලංගම වැව සහ බෙන්තොට ගඟේ ඉහල කොටසේ ජල තත්ත්ව පසුවිපරම් කටයුතු 2011 පෙබරවාරි දක්වා සිදු කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා සංවිධානය (KECO) මගින් මූල්‍යමය අනුග්‍රහය දක්වන ලදි.

Regular අවශ්‍යතාවයක් ලෙසට සලකා කැළණි ගඟ බොරලැස්ගමුව වැවේ ජල තත්ත්වය වසර පුරාවටම පසු විපරම් කරන ලදි.

මා ඔය සහ දඩුගම් ඔයේ ජල තත්ත්වය පසුවිපරම් කිරීම භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් සිදු කරන ලදි.

2011 වසර තුල විශ්ලේෂණය කරන ලද මතුපිට ජල නියැදි සංඛ්‍යාව

වාණිජ්‍යමය වශයෙන් සහ සේවා වශයෙන් 2011 වසර තුල මතුපිට ජලය පසුවිපරම් කිරීම



2011 වසර තුල කරන සියළු කාර්යයන් සැලකීමේ දී 78% රසායනාගාර විශ්ලේෂණ කටයුතු සිදුකර ඇත්තේ සේවා පදනම මත වේ. 22% කාර්යයන් කොට ඇත්තේ වාණිජ පදනම මත වේ. මෙම වාණිජ්‍යමය පදනම මත බාහිර සේවාදායකයින්ට සිදු කරන ලද සේවාව තුළින් රු. මිලියන 1.6 ක ආදායමක් ලබා ගැනීමට අප රසායනාගාරයට හැකි විය.

අනෙකුත් අංශ සඳහා සේවා සැපයීම

පරිසර දූෂණ පාලන අංශය මගින් පරිසර උපදේශකයන් සහ රසායනාගාර වාර්ෂිකව ලියාපදිංචි කිරීමේ සේවාවක් ආරම්භ කර ඇති අතර මෙමගින් කර්මාන්තකරුවන් පරිසර නීති වලට සහ උපමාන වලට අනුගත වීම සඳහා පහසුකම් සැපයීම සිදු කෙරේ.

මේ සම්බන්ධයෙන් ලියාපදිංචි රසායනාගාර සහ පරිසර උපදේශකයින් පසුවිපරමට සහ ඇගයුමට ලක් කිරීම රසායනාගාර නිලධාරීන් සහ පරිසර දූෂණ පාලන අංශ නිලධාරීන් සහභාගිත්වයෙන් මනාව 2011 වසර තුලද සිදු කොට ඇත.

මීට අමතරව 2011 වසර තුල මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි වී ඇති රසායනාගාර වල විශ්ලේෂණ කුසලතාව ඉහල නැංවීමේ අරමුණින් කාර්ය සාධන ඇගයීමේ වැඩ සටහනක් සංවිධානය කරන ලදි. මෙම කාර්යය පරිසර දූෂණ පාලන අංශය මගින් ආරම්භ කරන ලද නව වැඩ පිළිවෙලකි. මෙම වැඩසටහනේ ප්‍රධාන කාර්යභාර්ය රසායනාගාර නිලධාරීන් විසින් ඉටු කරන ලදි.

මේ යටතේ ඇති අවසාන වැඩසටහන 2012 දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. වෙනත් රටවල් මගින් වායු ගෝලයට මුදාහරින දූෂකාරක මගින් ලංකාවට සිදුවන බලපෑම පිළිබඳ සොයාබැලීම සඳහා වූ මාලේ ව්‍යාපෘතියකට අදාලව දොරමඩලාව හා දුටවැව ප්‍රදේශයේ වැසි ජල සාම්පල වල භෞතික හා රසායනික තත්ත්වයන් විශ්ලේෂණය කිරීම මෙම වසර තුල සිදු කරන ලදි.

කොරියානු පාරිසරික සහයෝගිතා පදනමේ ආධාර මත ක්‍රියාත්මක කළ ජල තත්ව පසුවිපරම් කිරීමේ ව්‍යාපෘතියේ අන්තර් ජාතික සමුළුව

කොරියානු පාරිසරික සහයෝගිතා සංවිධානය (KECO) මූල්‍ය දායකත්වය මගින් සිදු කරන ලද ජල තත්ත්ව පසු විපරම් ව්‍යාපෘතියේ සොයා ගැනීම් ඉදිරිපත් කරමින් ජාත්‍යන්තර ජල තත්ත්ව සමුළුවක් 2011 වසර තුල රසායනාගාරය මගින් සිදුකරන ලදි. 2011 වසර තුල තෝරා ගන්නා ලද ජල දේහ තුනක ජල තත්ත්වය මාස හයක කාලයක් සඳහා පසුවිපරම් කරන ලද අතර එමගින් සොයාගත් කරුණු මෙම සමුළුවේ දී ඉදිරිපත් කරන ලදි.මෙම ව්‍යාපෘතිය අවසානයේදී ජල තත්ත්ව විශ්ලේෂණ ප්‍රතිඵල ඇතුලත් වාර්තා තුනක් මෙම සමුළුවේ දී එළි දක්වන ලදි.



3.3. අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය

2011 වර්ෂයේ ක්‍රියාත්මක සැලසුමෙන් හඳුනාගත් උපද්‍රවකාරී අපද්‍රව්‍ය සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාලව

I උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයට අදාලව රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ කාර්යය
II අන්තර්ජාතික සම්මුතීන්ට අදාල කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හා
III ඝන අපද්‍රව්‍ය හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල ව්‍යාපෘති/ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යන කටයුතු කිරීමේ වගකීම මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර දූෂණ පාලන අංශයේ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය වෙත පැවරී ඇත.

3.3.1. ශ්‍රී ලංකාව තුල උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.

උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ රෙගුලාසි (අංක 1534/18 දරණ 2008 පෙබරවාරි 01 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය) ක්‍රියාත්මක කිරීමේ එක් කොටසක් ලෙස 2011 වසර තුල නිකුත් කරන ලද මුළු බලපත්‍ර සංඛ්‍යාව 58කි.

3.3.2. බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම

3.3.2.1. කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ලෙස බාසල් සම්මුතියේ B ලැයිස්තුගත අපද්‍රව්‍ය ආනයනය කිරීම.

ශ්‍රී ලංකාව 1992-08-28 දින සිට උපදුවකාරී අපද්‍රව්‍ය ප්‍රවාහනය හා අපහරණය සඳහා වූ බාසල් සම්මුතියට එළඹ ඇති අතර එතැන් පටන් මධ්‍යම පරිසර අධිකාරිය ශ්‍රී ලංකාව තුල මෙම සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ බලය ලත් ආයතනය ලෙස පත් කොට ඇත. බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික සම්බන්ධීකරණ කමිටුව (NCC) එතෙක් මෙරට උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය තාක්ෂණික කරුණු වල අදාලව නිසි තීරණ ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියට අවශ්‍ය සහය ලබා දීම සඳහා තාක්ෂණික ප්‍රවීනයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් තර ඇත.

මෙම කමිටුව විසින් ප්‍රධාන ලෙස බාසල් සම්මුතියෙන් B ලැයිස්තුගත අපද්‍රව්‍ය ආනයනය කොට අමුද්‍රව්‍ය ලෙස යොදා ගනිමින් ආරම්භ කිරීමට යෝජිත කර්මාන්ත සඳහා නිර්දේශයන් ලබා දීම සිදු කරනු ලබයි. (බාසල් සම්මුතියේ A ලැයිතුගත අපද්‍රව්‍ය මෙරටට ආනයනය කිරීම කැබිනට් අමාත්‍ය තීරණයක් විසින් තහනම් කොට ඇත.)

මෑත භාගයේ සිට ශ්‍රී ලංකා රේගුව හරහා මෙරටට ආනයනික පොලිතීන්, ජී වී සි, පොලියුරෙතින් ෆෝම් වැනි අපද්‍රව්‍ය / ප්‍රතිචක්‍රීකරණ ලද ද්‍රව්‍ය රේගුවෙන් නිදහස් කිරීමට ප්‍රථම ඒ පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරිය මගින්

විමසුමක් සිදු කරනු ලබයි. මෙසේ ආනයනය සිදු කරනු ලබන ඇතැම් අපද්‍රව්‍ය බාසල් සම්මුතියෙන් B ලැයිස්තුගත ඒවා වන අතර මෙම ක්‍රියා පිළිවෙත තවදුරටත් විදිමත් කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් අදාල අනුමැතීන් ලබා දීම සඳහා මාර්ගෝපදේශ මාලාවක් සකස් කරනු ලදුව ජාතික සම්බන්ධීකාරක කමිටුව විසින් ඊට අනුමැතිය ලබා දෙන ලද අතර ආනයනික අපද්‍රව්‍යවල පිරිසිදුභාවය හා මුළු ආනයනික අපද්‍රව්‍ය ප්‍රමාණයම නිෂ්පාදනය සඳහා යොදා ගන්නේද යන්න තහවුරු කරගනු වස් මෙම මාර්ගෝපදේශ මාලාව දැනට අනුගමනය කරමින් පවති. මේ සම්බන්ධයෙන් 2011 වසරේදී අදාල කර්මාන්ත සහ ආනයනික බහාලුම් පිළිබඳ ක්ෂෙත්‍ර පරීක්ෂණ 41ක් සිදු කර ඇති අතර ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ විරෝධතා නොමැති බවට ලිපි නිකුත් කර ඇත.

2011 වසරේ දී අපද්‍රව්‍ය ආනයනය පිළිබඳ ඉල්ලීම් 15ක් කර්මාන්ත විසින් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදි. මෙම ඉල්ලීම් / යෝජනා තාක්ෂණික කමිටු රැස්වීම් 4කදී සාකච්ඡාවට ගනු ලැබූ අතර තාක්ෂණික කමිටුවේ දී ගනු ලැබූ තීරණ අනුව අදාල නිර්දේශයන් ලබාදෙන ලදි.

3.3.2.2. දේශාන්තර උපද්‍රවකාරී අපද්‍රව්‍ය ප්‍රවාහනය

බාසල් සම්මුතියේ ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කිරීමේ බලයලත් ආයතනය ලෙස මධ්‍යම පරිසර අදධිකාරිය විසින් 2011 වසරේ දී බාසල් සම්මුතියේ A ලැයිස්තුගත අපද්‍රව්‍ය මෙරට දේශ සීමා හරහා ප්‍රවාහනයට 10 ක් සහ මෙරටින් අපනයනය සඳහා අනුමැතීන් 4ක් ලබා දී ඇත. මීට අමතරව, බාසල් සම්මුතියෙහි ඇති B කාණ්ඩයේ එක් අපද්‍රව්‍යයක් ගෙන්වීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

3.3.3. රොටර්ඩෑම් සම්මුතිය ක්‍රියාත්මක කිරීම.

3.3.3.1. ශ්‍රී ලංකාව තුල රොටර්ඩෑම් සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා කාර්මික රසායන කළමනාකරණය පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටු රැස්වීම

කාර්මික රසායන කළමනාකරණය පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටු රැස්වීම් 03ක් 2011 වසරේ දී පැවති අතර එහිදී ශ්‍රී ලංකාව තුල ඇස්බැස්ටස් භාවිතය පාලනය කිරීම තුලින් ඇස්බැස්ටස් ආශ්‍රිත රෝග වැලැක්වීම සඳහා ජාතික පාරිසරික ප්‍රතිපත්තියක් සැකසීමට අදාලව හා ශ්‍රී ලංකාව තුල භාවිතා වන තීන්ත තුල අඩංගු ලෙඩ් ප්‍රමාණය පාලනය කිරීමට අදාල තීරණ ගනු ලැබිය.

ශ්‍රී ලංකාව තුල ඇස්බැස්ටස් ආශ්‍රිත රෝග පාලනය.

කාර්මික රසායන කළමනාකරණය පිළිබඳ තාක්ෂණික කමිටුව විසින් මීට අදාලව කටයුතු කිරීම සඳහා අදාල පාර්ශවයන්ගෙන් සැදුම් ලත් උප කමිටුවක් පත් කරන ලදුව එමගින් ඇස්බැස්ටස් ආශ්‍රිත රෝග වැළැක්වීම සඳහා අදාල යෝජනාවන් පිළියෙල කරන ලදි.

කාර්මික රසායන කළමනාකරණය පිළිබඳ තාක්ෂණික කමිටුවේ තීරණය පරිදි ශ්‍රී ලංකාව තුල ඇස්බැස්ටස් භාවිතය පිළිබඳ තත්ත්ව වාර්තාවක් සහ ඊට අදාල නිර්දේශිත ප්‍රතිපත්ති ඇතුලත් වාර්තාවක් මෙම ක්ෂේත්‍රය තුල කටයුතු කරනු ලබන විශේෂඥයකු විසින් පිළියෙල කරන ලදි.

මෙම පත්‍රිකාවේ අතුලත් නිර්දේශයන්ට අනුව දිගු කාලීන විසඳුම් ඇතුලත් වන සේ මෙම ප්‍රතිපත්තිය පිළියෙල කිරීම සඳහා මේ සඳහා පවත්වන ලද ජාතික සම්බන්ධීකාරක කමිටුවේ දී තීරණය විය.

3.3.4 විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය

ශ්‍රී ලංකාව තුල ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය සාර්ථක හා කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා (අදාල සමාගම් 14ක් සමඟ) ජාතික ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් හඳුන්වා දී ඇත. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අදාල සමාගම් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම හා වැඩසටහන එළිදැක්වීම 2010 නොවැම්බර් මස 14 දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත් විණ. මෙම වැඩසටහන එක් තේමාවක් හා පොදු ලාංඡනයක් යටතේ ක්‍රියාත්මක කිරීමට අදාල සමාගම් එක්ව කටයුතු කරනු ලබයි.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් අදාල පාර්ශව සමාගම් සමඟ එක්ව ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ දින සංවිධානය කරනු ලැබිය. මෙම වැඩසටහන් මඟින් ටොන් ගණනින් ඉවතලන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කර ගැනීමට හැකි විය. මහජනතාවගෙන් මෙම වැඩසටහන් ඉතා සාර්ථක කර ගැනීම සඳහා ලද සහයෝගය තුලින් ඔවුන්ගේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වල උපද්‍රවකාරීත්වය පිළිබඳ අවබෝධයක් ඇති බවත් ඒවා පරිසර හිතකාමී ලෙස බැහැර කිරීමට උද්‍යෝගයක් ඇති බවත් මනාව පැහැදිලි විය.

දීප ව්‍යාප්ත ලෙස ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කර ගැනීමේ ක්‍රමවේදයක් සකසා ගැනීම මධ්‍යම පරිසර අධිකාරියට ඇති වූ අභියෝගාත්මක ගැටළුවක් විය. දිවයින පුරා පවතින සිංගර්, ඩයලොග් හා මෙට්‍රොපොලිටන් ආයතන සතුව පවතින වෙළඳ මධ්‍යස්ථාන මෙම කාර්ය සඳහා යොදා ගැනීමට හැකි වීම මෙම ගැටළුව සාර්ථක ලෙස විසඳා ගැනීමට පිටුවහල් විය. මහජනතාවට අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ආසන්නතම ස්ථානය පිළිබඳ තොරතුරු ජාතික තොතුරු මධ්‍යස්ථානයේ 1919 දුරකථන අංකය ඇමතීමෙන් ලබාගත හැකිය.

මහජනතාව තුල ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව දැනුවත් භාවය වැඩි කිරීමට ඉතා වැදගත් ක්‍රියා මාර්ගයක් ලෙස හඳුනාගන්නා ලදි. ඒ අනුව දැනුවත් කිරීමේ කටයුතු පුවත්පත්, රූපවාහිනිය හා ගුවන් විදුලිය මඟින් සිදු කිරීමට ද කටයුතු කරන ලදි.

3.3.4.1 ප්‍රති දීප්ත විදුලි පහන් ප්‍රතිචක්‍රීකරණය සඳහා අවශ්‍ය පහසුකමක් ඇති කරලීම සඳහා පද්ගලික අංශය යොමු කිරීම

විදුලි බලශක්ති සම්පත් ආරක්ෂා කර ගැනිම සඳහා ශ්‍රී ලංකා රජය විසින් කාර්යක්ෂම ලෙස විදුලිය දැල්වීමේ ක්‍රම ප්‍රවර්ධනය කිරීමේ කටයුතු සිදු කරනු ලබයි. මෑත කාලීන සංඛ්‍යා ලේකන අනුව සංයුක්ත ප්‍රතිදීප්ත පහන් භාවිතය සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගොස් ඇත. මෙම විදුලි පහන් හි රසදිය අඩංගු බැවින් ඒවා අවිධිමත් ලෙස බැහැර කිරීම තුලින් මනුෂ්‍ය සෞඛ්‍යට හා පරිසරයට ඉතා ප්‍රබල ලෙස බලපෑම් ඇති කල හැකිය.

අංක 1534/18 හා 01-02-2008 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ රෙගුලාසි වලට අනුව රසදිය අඩංගු විදලි පහන් ද උපද්‍රවකාරී අපද්‍රව්‍ය ලෙස ලැයිතුගත කර ඇත.

සංයුක්ත ප්‍රතිදීප්ත පහන් බොහොමයක් නිවෙස්වල භාවිතා වන බැවින් ඒවා නාගරික අපද්‍රව්‍ය සමඟ බැහැර කිරීම සිදු කරනු ලබයි. මීට හේතුව වී ඇත්තේ ශ්‍රී ලංකාව තුල උපද්‍රවකාරී අපද්‍රව්‍ය බැහැර කරලීම සඳහා කසළ රැඳවුමක් හෝ විදුලි බල්බ ප්‍රතිචක්‍රීකරණය සඳහා පහසුකම් නොමැති වීමය.

මෙම තත්ත්වය යටතේ ජාතික අවශ්‍යතාවයක් වශයෙන් සැලකෙන මෙම ගැටළුවට විසඳුමක් සෙවීම වශයෙන් සලකා මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම විදුලි බල්බ ආනයනය හා නිෂ්පාදනය සිදු කරනු ලබන ප්‍රධාන සමාගම් සමඟ සාකච්ඡාවක් පවත්වන ලද අතර එහිදී ශ්‍රී ලංකාව තුල මෙම ප්‍රතිදීප්ත පහන් බැහැර කරලීම සඳහා සුදුසු ක්‍රමයක් ආරම්භ කරන ලෙස ආරාධනා කරනු ලැබීය.

එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒෂියා රිසයික්ලින් නමින් ශ්‍රී ලංකාවේ ඔරේන්ජ් ආයතනය හා ස්විඩනයේ නෝර්ඩික් ආයතනයත් එක්ව භාවිතයෙන් පසු ඉවතලන ප්‍රතිදීප්ත විදුලි පහන් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයක් පිටිපන, හෝමාගම ආරම්භ කරන ලදි. මෙම පහසුකම දකුණු ආසියාතික කළාපයේ ස්ථාපිත කරන ලද දැනට ඇති එවැනි එකම පහසුකම ලෙස හැඳින්විය හැකිය.

<u>ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික පරිසර සම්මන්ත්‍රණය 2011 දෙසැම්බර් 19 බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව</u>

ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික මට්ටමේ සම්මන්ත්‍රණයක් 2011 දෙසැම්බර් 19 වන දින මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවත්වන ලදි. මෙම අවස්ථාවට මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිතුමා, රාජ්‍ය හා පුද්ගලික ආයතන වල ප්‍රධානීන් හා නියෝජිතයින්, ජනමාධ්‍ය ආයතන නියෝජිතවරුන්ද සහභාගි විය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආසියාතික කලාපයේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් උපදේශකවරයෙකු වශයෙන් කටයුතු කරනු ලබන ඔස්ට්‍රේලියාවේ ග්‍රිනිත් විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂඨ කථිකාචාර්ය ආචාර්ය සුනිල් හේරත් මහතා මෙහි විශේෂ ආරාධිතයා විය. මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන අරමුණු ලෙස, පුද්ගලික අංශයේ ආයතන 04 ක් සම්බන්ධ කර ගනිමින් 2010 නොවැම්බර් මස ආරම්භ කරන ලද ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනේ අත්දැකීම් හා ප්‍රගතිය පිළිබඳව තොරතුරු බෙදා ගැනීම හා මෙරට හා ගෝලීය වශයෙන් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව සන්සන්දනාත්මක විග්‍රහයක යෙදීමෙන් අන්තර්ජාතික අත්දැකීම් බෙදා ගැනීම හැඳින්විය හැකිය. මෙම අවස්ථාවේදී ඩයලොග් ආයතනය, සිංගර් ශ්‍රී ලංකා ආයතනය, වඩුසා, ජියෝසයකල්, මෙට්‍රොපොලිටන් යන ආයතන විසින් ඔවුන්ගේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් වල ප්‍රගතිය ඉදිරිපත් කරන ලදි. ඔරේන්ජ් ඉලෙක්ට්‍රොනික් ආයතනයට අනුබද්ධව ආරම්භ කරන ලද ඒෂියා රිසයිකල් පුද්ගලික ආයතනය විසින් ද ඔවුන් විසින් ආරම්භ කරන ලද ප්‍රතිදීප්ත විදුලි පහන් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය පිළිබඳවද දේශනයක් ඉදිරිපත් කරන ලදි.

අනෙකුත් රාජ්‍ය හා පුද්ගලික ආයතන සමඟ එක්ව ක්‍රියාත්මක කළ ක්‍රියාකාරකම් / වැඩසටහන්

රජයේ රෝහල් තුල දැනට පවත්නා අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතීන්වල තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් 2011 වර්ෂය සඳහා පිළිසරු ජාතික අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ මූල්‍ය ප්‍රතිපාදන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය සඳහා ලබා දෙන ලදි.

ඒ අනුව සාර්ථකව අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන කුරුණෑගල ශික්ෂණ රෝහලට අපද්‍රව්‍ය ගබඩා කිරීමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.1,351,752ක මූල්‍ය ප්‍රතිපාදන 2011 වර්ෂයේදී ලබා දෙන ලදි.

දැනුම හා අත්දැකීම් යොදා ගැනීම.

අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය අනෙකුත් පරිබාහිර ආයතන මගින් දියත් කරන ලද ව්‍යාපෘති / දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය සපයන ලදි. එවැනි පරිබාහිර ආයතනයන් අපද්‍රව්‍ය කළමනකරණයට අදාලව

ඉලක්ක කණ්ඩායම් සඳහා පුහුණු සැසි හා විශේෂඥ උපදෙස් ලබා දෙන ලදි. පහත සඳහන් ආයතන වල ඉල්ලීමට අනුව එවැනි වැඩසටහන් 2011 වර්ෂයේ දී සිදු කරන ලදි.

I බොඩිලයින් පුද්ගලික ආයතනය, හොරණ
II හැටන් නැෂනල් බැංකුව, තලවතුගොඩ ශාඛාව
III කුරුණෑගල ශික්ෂණ රෝහල
IV අංගොඩ රෝහල
V වයඹ ගුරුපුහුණු විද්‍යාලය

දැනුවත් කිරීමේ පත්‍රිකා පිළියෙල කිරීම අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය මගින් ක්‍රියාත්මක කරනු ලබන අන්තර් ජාතික සම්මුතීන් පලිබෝධනාශක කළමනාකරණය හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල දැනුවත් කිරීමේ පත්‍රිකා පිටපත් 40,000 ක් ඉංග්‍රීසි හා සිංහල මාධ්‍යයෙන් පිළියෙල කරන ලදි.



සකස් කරන ලද අත් පත්‍රිකා

4. පරිසර කළමනාකරණ සහ ඇගයීම් අංශය

4.1. පරිසර බලපෑම් ඇගයීම් ඒකකය

පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ ප්‍රධාන නියාමක කාර්ය භාරය වනුයේ සැලකිය යුතු පාරිසරික බලපෑම් අවම කිරීමේ අදහසින් නියමිත ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ පරිපාලන ක්‍රියාදාමය පවත්වාගෙන යාමයි. මෙම කාර්ය භාරයට විෂය ප්‍රමාණය කිරීමේ රැස්වීම් හා තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම්, පරිසර බලපෑම් ඇගයීම් වාර්තා සඳහා නිර්ණේය විෂයයන් සැකසීම, පරිසර බලපෑම් ඇගයීම් වාර්තා ඇගයීම, මහජන සහභාගිත්වය සඳහා අවකාශ ලබා දීම හා ඉන් අනතුරුව ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දීම හා පසුවිපරම් කිරීම යන කරුණු ඇතුලත් වේ.

2011 වසර තුලදී ව්‍යාපෘති 54 ක් සඳහා ජාතික පාරිසරික පනතේ iv ඇ වගන්තිය යටතේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය වූ අතර, එම ව්‍යාපෘති පරිසර බලපෑම් ඇගයීමේ නියෝග යටතේ ක්‍රියාත්මක කරනු ලැබිය. ඒ අනුව ව්‍යාපෘති අටක් ක්‍රියාත්මක කිරීම සඳහා පාරිසරික අනුමැතිය ලබා දුන් අතර, එක් ව්‍යාපෘතියක් සඳහා අනුමැතිය ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලැබිය. ව්‍යාපෘති 45 ක් අනුමැතිය අපේක්ෂාවෙන් ක්‍රියාත්මක වෙමින් පවති.

2011 වසරේ පරිසර බලපෑම් ඇගයීම් නියෝග යටතේ, පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මගින් අනුමැතිය ලබා දුන් / ප්‍රතික්ෂේපිත ව්‍යාපෘති නාමලේඛනය .

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ/මූ.පා.ප.
1.	උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය	ප.බ.ඇ.
2.	කිතුල්ගල කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	ප.බ.ඇ.
3.	අක් වෙරළ වැලි කැණීමේ ව්‍යාපෘතිය, කෙරවළපිටිය	ප.බ.ඇ.
4.	කෘෂිකාර්මික ඉඩම් සංවර්ධන ව්‍යාපෘතිය, ලෝරාවත්ත, දොළුව	ප.බ.ඇ.
5.	Forest Rock Garden හෝටලය නොච්චියාගම, අනුරාධපුරය	ප.බ.ඇ.
6.	මහනුවර නගර සභාව සඳහා යෝජිත ගුහාගොඩ කසළ අපහරණ භූමිය පුනරුත්ථාපනය කිරීමේ සහ ඒකාබද්ධ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය	ප.බ.ඇ.
7.	හසලක වැල්ගහවාඩිය මැණික් ගැරීමේ ව්‍යාපෘතිය අදියර II	මූ.පා.ප.
8.	යෝජිත මීගමුව, මාරිස්ටෙලා විද්‍යාලයේ ශාඛා පාසල	මූ.පා.ප.

ප්‍රතික්ෂේපිත

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ/මූ.පා.ප.
1.	යෝජිත ෆයිනස් ගස් හෙලීමේ සහ නැවත වගා කිරීමේ ව්‍යාපෘතිය, වාරියගලවත්ත, ඉහළ කොටස, නිල්ලඹේ	ප.බ.ඇ.

පරිසර බලපෑම් ඇගයීම් අංශය මගින් ක්‍රියාත්මක වෙමින් පැවති ව්‍යාපෘති නාම ලේඛනය

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ/මූ.පා.ප.
1.	යෝජිත මාතර - කතරගම දුම්රිය මාර්ගය විස්තීර්ණය කිරීමේ ව්‍යාපෘතිය අදියර III - හම්බන්තොට - කතරගම දක්වා කෙටිය	ප.බ.ඇ
2.	යෝජිත කුරුණෑගල හබරණ (දඹුල්ල හරහා) දුම්රිය පාර විස්තීර්ණය කිරීමේ ව්‍යාපෘතිය	ප.බ.ඇ

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ/මූ.පා.ප.
3.	යෝජිත හොරණ සිට දුම්රිය මාර්ගය	ප.බ.ඇ
4.	බදුල්ල - නුවර දක්වා සම්බන්ධ වන යෝජිත පාර	ප.බ.ඇ
5.	නැත්නේ කුඹුර - රාගල මාර්ගය අළුත්වැඩියා/වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය	ප.බ.ඇ
6.	කොළඹ නගරයට පිටත වටරවුම් මාර්ගයේ කෙරවලපිටිය අතුරු මාරුව සඳහා යෝජිත වෙනස්කම් පිළිබඳ ව්‍යාපෘතිය	අතිරේක ප.බ.ඇ
7.	මාලඹේ නැගෙනහිර අතුරු මාර්ගය සංවර්ධනය	මූ.පා.ප.
8.	මාලඹේ - ලෝ ලෙවල් මාර්ගය සංවර්ධනය	මූ.පා.ප.
9.	හෝමාගම බටහිර අතුරු මාර්ගය සංවර්ධනය	මූ.පා.ප.
10.	ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර කි.වො. 400 සබ්මැරීන් සම්ප්‍රේෂණ මාර්ගය	ප.බ.ඇ.
11.	යෝජිත මෙ.වො. 2X250 ගල් අඟුරු බලාගාරය, ත්‍රිකුණාමලය	ප.බ.ඇ.
12.	මාවනාන කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	ප.බ.ඇ
13.	හපුගස් කුඹුර කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	ප.බ.ඇ
14.	මහ ඔය කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	මූ.පා.ප.
15.	මාලිම්බොඩ කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	මූ.පා.ප.
16.	බිබිල සීනි සංවර්ධන ව්‍යාපෘතිය, රීදී මාලියද්ද	ප.බ.ඇ.
17.	ක්ෂාලක ද්‍රව්‍ය නිපදවීමේ ව්‍යාපෘතිය, මතුගම	ප.බ.ඇ.
18.	පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා - 2018 සඳහා යෝජිත ක්‍රීඩා සංකීර්ණ ව්‍යාපෘතිය, හම්බන්තොට	ප.බ.ඇ.
19.	එඩේරමුල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය	ප.බ.ඇ.
20.	යෝජිත ක්‍රීඩා සංකීර්ණ ව්‍යාපෘතිය, නුවර එළිය	මූ.පා.ප.
21.	යෝජිත කර්මාන්ත පුරය, අච්චුවේලි, යාපනය	මූ.පා.ප.
22.	' Pet Resin' නිෂ්පාදනය කිරීමේ කර්මාන්තායතනය, හම්බන්තොට, වරාය පරිශ්‍රය	මූ.පා.ප.
23.	සීනි පිරිපහදු කිරීමේ කර්මාන්තායතනය, හම්බන්තොට, වරාය පරිශ්‍රය	මූ.පා.ප.
24.	ගස් හෙලීමේ හා නැවත සිටුවීමේ ව්‍යාපෘතිය, අලකොලේ රාජ්‍ය වතුයාය, අලකොලේ, පන්විල	ප.බ.ඇ.
25.	ගස් හෙලීමේ හා නැවත සිටුවීමේ ව්‍යාපෘතිය, කැලේබොක්ක රාජ්‍ය වතුයාය, කැලේ බොක්ක, පන්විල	ප.බ.ඇ.
26.	ගස් හෙලීමේ හා නැවත සිටුවීමේ ව්‍යාපෘතිය, "වුඩ් සයිඩ්" රාජ්‍ය වතු යාය, මැද මහ නුවර	ප.බ.ඇ.
27.	ගස් හෙලීමේ හා නැවත සිටුවීමේ ව්‍යාපෘතිය, කොට ගහ, රාජ්‍ය වතු යාය, තෙල්දෙනිය	මූ.පා.ප.
28.	ගෝල්ඩන් සන්රයිස් සමාගම විසින් යෝජිත කර්දියාන අපද්‍රව්‍ය මඟින් බලශක්තිය නිපදවීමේ ව්‍යාපෘතිය	ප.බ.ඇ.
29.	යෝජිත මෙ.වො. 40 මිශ්‍ර නාගරික ඝණ අපද්‍රව්‍ය මඟින් බල ශක්තිය නිපදවීමේ ව්‍යාපෘතිය, කෙරවල පිටිය, මුතුරාජවෙල	ප.බ.ඇ.
30.	ගාල්ල මහ නගරසභා සීමාවෙහි අපජලය බැහැර කිරීමේ ව්‍යාපාතිය	ප.බ.ඇ.
31.	මීගමුව මහ නගර සභා සීමාවෙහි අපජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය	ප.බ.ඇ.
32.	අපද්‍රව්‍ය මඟින් බලශක්ති නිපදවීමේ ව්‍යාපෘතිය, මීතොටමුල්ල	ප.බ.ඇ.
33.	හම්බන්තොට නව නගරය සඳහා යෝජිත අපජලය එකතු කිරීම, ප්‍රතිකර්ම කිරීම හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය	ප.බ.ඇ.
34.	ෆන්ලේ සමාගම විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිස්ථාපනය කිරීම සඳහා යෝජිත සායනික අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය	ප.බ.ඇ.
35.	වවුනියා දිස්ත්‍රික්කයේ පඅරු ජලාශය හරහා වේල්ලක් බැඳ මතුපිට ජලය ලබාගැනීමේ ව්‍යාපෘතිය	ප.බ.ඇ.
36.	මහා පරිමාණයෙන් අපද්‍රව්‍ය මඟින් බලශක්ති නිපදවීමේ ව්‍යාපෘතිය, කොරතොට, කඩුවෙල	ප.බ.ඇ.
37.	යාපනය, කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය	ප.බ.ඇ.
38.	යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය	ප.බ.ඇ.
39.	බදුල්ල, හාලිඇල සහ ඇල්ල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	මූ.පා.ප.
40.	සීතාවක කර්මාන්ත පුරයට කැළණි ගඟෙන් ජලය ලබා ගැනීම සඳහා වේල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය	මූ.පා.ප.
41.	යෝජිත කාමර 70 හෝටල් ව්‍යාපෘතිය, කොග්ගල	ප.බ.ඇ.
42.	යෝජිත ' Eco - Golf Resort ' හෝටල් ව්‍යාපෘතිය, බෙරගල, හල්දුමුල්ල	ප.බ.ඇ.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ/මූ.පා.ප.
43.	' Beira City ' හෝටල් ව්‍යාපෘතිය	ප.බ.ඇ.
44.	යෝජිත කාමර 60 හෝටල ව්‍යාපෘතිය, කොලොම්බුතුරෙයි, යාපනය	මූ.පා.ප.
45.	වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අක් වෙරළ වැලි කැණීමේ ව්‍යාපෘතිය	මූ.පා.ප.

මීට අමතරව තෝරාගත් නියමිත ව්‍යාපෘති සඳහා මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල වෙත බලය පවරා ඇත. මෙම ව්‍යාපෘති කරගෙන යාමේදී අවශ්‍ය සහාය සහ මහ පෙන්වීම පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මගින් ලබාදෙනු ලැබේ.

මීට අමතරව අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන වෙත පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය තාක්ෂණික සහය ලබාදෙනු ලැබේ.

පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන වෙත දායකත්වය ලබා දුන් ව්‍යාපෘති.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ/මූ.පා.ප.
1.	යෝජිත නව නගර ව්‍යාපෘතිය, වටවන්දනා පාර, අනුරාධපුරය	මූ.පා.ප.
2.	දැව හෙලීමේ ව්‍යාපෘතිය, හෙයාරිපාරික් රාජ්‍ය වතුයාය	මූ.පා.ප.
3.	ෆයනස් ගස කපා හෙලීමේ ව්‍යාපෘතිය, තලවකැලේ	මූ.පා.ප.
4.	ගල් කැඩීමේ ව්‍යාපෘතිය, කඩවර කැලේ, හම්බන්තොට	මූ.පා.ප.
5.	යෝජිත යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, ගොන්නොරුව කැලය, හම්බන්තොට	මූ.පා.ප.
6.	යෝජිත යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, ඔඩ්ඩුසුඩාන්	මූ.පා.ප.
7.	යෝජිත යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, ඕමන්තේ, වව්නියා	මූ.පා.ප.
8.	යෝජිත යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, පාවට්ටකුලම්, වව්නියා	මූ.පා.ප.
9.	යෝජිත යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, ඇත්කඩුව රක්ෂිත වනාන්තරය, පදවිය	මූ.පා.ප.
10.	යෝජිත යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, පදවිය	මූ.පා.ප.
11.	යෝජිත යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, වෙල්ලසින්නකුලම්, වව්නියා	මූ.පා.ප.
12.	යෝජිත යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, චමලකුලම් රක්ෂිත වනාන්තරය, ඔඩ්ඩුසුඩාන්	මූ.පා.ප.
13.	යෝජිත යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, චෙට්ටිකුලම්, වව්නියා	මූ.පා.ප.
14.	යෝජිත යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, කන්තලේ	මූ.පා.ප.
15.	යෝජිත යන්ත්‍රානුසාරයෙන් කියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, තට්ටයාකුලම් රක්ෂිත වනාන්තරය, වව්නියා	මූ.පා.ප.
16.	යෝජිත යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, මඩුකන්ද රක්ෂිත වනාන්තරය, වව්නියා	මූ.පා.ප.
17.	මාගා ඉන්ජිනියර්ස් විසින් යෝජිත යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, කැබිතිගොල්ලෑව, අනුරාධපුරය	මූ.පා.ප.
18.	Opulent Metal work විසින් යෝජිත යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, කැබිතිගොල්ලෑව, අනුරාධපුරය	මූ.පා.ප.
19.	Thudawa Brothers විසින් යෝජිත යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, කැබිතිගොල්ලෑව, අනුරාධපුරය	මූ.පා.ප.
20.	යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, නාදන්කුලම්,	මූ.පා.ප.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ/මූ.පා.ප.
	වව්නියා	
21.	යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, කොඩ්ඩලිකල්ලි, මුලතිව්	මූ.පා.ප.
22.	බුලත්වත්ත කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	මූ.පා.ප.
23.	මැණික් ගඟ කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	මූ.පා.ප.
24.	කුඩා පාන කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	මූ.පා.ප.
25.	කරපලගම කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	මූ.පා.ප.
26.	දෙමෝදර II කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	මූ.පා.ප.
27.	උමතැන්න කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	මූ.පා.ප.
28.	පොත්තවෙල කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	මූ.පා.ප.
29.	දිගිලි ඔය ජලාශ ව්‍යාපෘතිය, මාතර දිස්ත්‍රික්කය	මූ.පා.ප.
30.	කළුගල් ඔය ජලාශ ව්‍යාපෘතිය, අම්පාර දිස්ත්‍රික්කය	මූ.පා.ප.
31.	ගාල්ල - මාතර දක්වා එලීමට යෝජිත 132 KV සම්ප්‍රේෂණ මාර්ගය	මූ.පා.ප.
32.	කිලිනොච්චි - චුන්නකම් දක්වා එලීමට යෝජිත 132 KV සම්ප්‍රේෂණ මාර්ගය	මූ.පා.ප.
33.	උතුරු - නැගෙනහිර සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය	මූ.පා.ප.
34.	රන්ටැඹේ සිට මහියංගනය දක්වා 132 KV සම්ප්‍රේෂණ මාර්ගය	මූ.පා.ප.
35.	හබරණ - වාලච්චේන දක්වා එලීමට යෝජිත 132 KV සම්ප්‍රේෂණ මාර්ගය	මූ.පා.ප.
36.	හබරණ - වේයන්ගොඩ දක්වා එලීමට යෝජිත 220 KV සම්ප්‍රේෂණ මාර්ගය	මූ.පා.ප.
37.	පුත්තලම - අනුරාධපුරය දක්වා එලීමට යෝජිත කි.වො. 220 සම්ප්‍රේෂණ මාර්ගය	මූ.පා.ප.
38.	හබරණ - සාම්පූර් දක්වා එලීමට යෝජිත කි.වො. 220 සම්ප්‍රේෂණ මාර්ගය	මූ.පා.ප.
39.	යෝජිත වික්ටෝරියා ජල විදුලි බලාගාරය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය	ප.බ.ඇ
40.	කෘෂිකාර්මික ගොවිපොල සංවර්ධනය, මහවැලි කලාපය බී, සෙවන පිටිය, වැලිකන්ද	ප.බ.ඇ.
41.	ගැටඹේ කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	ප.බ.ඇ.
42.	කිවුල කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය, මාතලේ	ප.බ.ඇ.
43.	චන්ද්‍රිකා වැව කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	මූ.පා.ප.
44.	දිග්ගල කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	ප.බ.ඇ.
45.	අංකන්ද කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	ප.බ.ඇ.
46.	ඕවල කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	ප.බ.ඇ.
47.	යෝජිත ෆෙල්ස්පා කැණීමේ ව්‍යාපෘතිය, සමනලතැන්න, දෙහිඅත්තකණ්ඩිය	මූ.පා.ප.
48.	යෝජිත යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, සිංහාරගම, අනුරාධපුර	මූ.පා.ප.
49.	දැව හෙලීමේ ව්‍යාපෘතිය, වත්තෙගොඩ වත්ත, වත්තෙගොඩ	මූ.පා.ප.
50.	Evasion Hideaway හෝටල් ව්‍යාපෘතිය	ප.බ.ඇ.
51.	යෝජිත Centuria පරිසර හිතකාමී භාවනා අසපුව, උඩවලව	ප.බ.ඇ.
52.	ඉහළ රත්ගහ කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය, රත්නපුර	ප.බ.ඇ.
53.	දෙමෝදර කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	ප.බ.ඇ.
54.	කුඩව කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	මූ.පා.ප.
55.	උඩකන්ද I කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	මූ.පා.ප.
56.	උඩකන්ද II කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය	මූ.පා.ප.
57.	බඩ ඉරිහු වගා කිරීමේ ව්‍යාපෘතිය, කන්තලේ	මූ.පා.ප.
58.	ජීව වායු විදුලි බලාගාර ව්‍යාපෘතිය, දඹදෙණිය	මූ.පා.ප.
59.	කෘෂිකාර්මික අවශ්‍යතා සඳහා විල්පත්තු අභය භූමිය අද්දර ඉඩම් නිදහස් කිරීම	මූ.පා.ප.
60.	යෝජිත හෝටල් ව්‍යාපෘතිය, නයිදුව මාදුගහ, බලපිටිය	ප.බ.ඇ.
61.	රාවණාඇල්ල ආසන්නයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම	මූ.පා.ප.
62.	නාගරික උද්‍යානය, පොළොන්නරුව	මූ.පා.ප.
63.	මින්නේරිය ජාතික උද්‍යානය ආසන්නයේ භාවනා කුටි ඉදිකිරීම	ප.බ.ඇ.
64.	යෝජිත ජලය ලබාගැනීමේ හා පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය	මූ.පා.ප.
65.	උඩතැන්න - මහියංගනය පාර සංවර්ධනය සහ පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය	මූ.පා.ප.
66.	මන්නාරම් බොක්ක ආශ්‍රිත මුහුදු තීරයේ බණිජ තෙල් ගවේෂණ ව්‍යාපෘතිය	මූ.පා.ප.
67.	යෝජිත කාමර 428 හෝටල් ව්‍යාපෘතිය, කටුනායක	මූ.පා.ප.
68.	යෝජිත කාමර 200 හෝටල් ව්‍යාපෘතිය, කටුනායක	මූ.පා.ප.
69.	ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාවෙහි අප ජලය බැහැර කිරීමේ යටිතල පහසුකම් සැලසීම	ප.බ.ඇ.
70.	සනීපාරක්ෂක බිම් පිරවුම් ව්‍යාපෘතිය, ගෝනදිකවත්ත, උඩුනුවර	ප.බ.ඇ.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ/මූ.පා.ප.
71.	කාමර 230 හෝටල් ව්‍යාපෘතිය, ආනන්ද කුමාරස්වාමි මාවත	මූ.පා.ප.
72.	හෝටල් ව්‍යාපෘතිය, ධර්මපාල මාවත	මූ.පා.ප.
73.	යෝජිත හෝටල් ව්‍යාපෘතිය, Topaz Tower, කොළඹ 3	මූ.පා.ප.
74.	යෝජිත කාමර 144 හෝටල් ව්‍යාපෘතිය, Clifford place, කොළඹ 04	මූ.පා.ප.
75.	කොක්දුව / උරුදුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, පානදුර	මූ.පා.ප.
76.	යෝජිත නිවාස ව්‍යාපෘතිය, හල්දුම්මුල්ල, කොටිකාවත්ත	මූ.පා.ප.
77.	ඉඩම් කට්ටි කිරීමේ ව්‍යාපෘතිය, ගොරකාන, පානදුර	මූ.පා.ප.
78.	යෝජිත තට්ටු 40 මිශ්‍ර ව්‍යාපෘතිය, සෙත්සිරිපාය	මූ.පා.ප.
79.	යෝජිත කාමර 151 හෝටල් ව්‍යාපෘතිය, කුඩා වස්කඩුව, කළුතර	ප.බ.ඇ.
80.	ෆැන්ග්‍රිලා හෝටල් ව්‍යාපෘතිය, කොළඹ	ප.බ.ඇ.
81.	ෆැන්ග්‍රිලා හෝටල් ව්‍යාපෘතිය, හම්බන්තොට	ප.බ.ඇ.
82.	යෝජිත හෝටල් ව්‍යාපෘතිය, කල්පිටිය	ප.බ.ඇ.
83.	වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය, ගාලු මුවදොර	ප.බ.ඇ.
84.	යෝජිත ධීවර වරාය, සුදුවැල්ල	මූ.පා.ප.
85.	යෝජිත හෝටල් ව්‍යාපෘතිය, මහපලාන, කොස්ගොඩ	මූ.පා.ප.
86.	යෝජිත හෝටල් ව්‍යාපෘතිය, පැලෑත, වැලිගම	මූ.පා.ප.
87.	යෝජිත සංචාරක හෝටල් ව්‍යාපෘතිය, පාසිකුඩා	මූ.පා.ප.
88.	හෝටල් ව්‍යාපෘතිය, මීගමුව	මූ.පා.ප.
89.	යෝජිත ධීවර වරාය, නිල්වැල්ල	මූ.පා.ප.
90.	යෝජිත ධීවර වරායන්, සිලාවතුර, ගුරු නගර්, ගනදොර	මූ.පා.ප.
91.	මන්නාරම් ආසන්නයේ වැලි කැණීම් ව්‍යාපෘතිය	මූ.පා.ප.
92.	ගල් කැඩීමේ ව්‍යාපෘතිය, මිල්ලනියවත්ත, බණ්ඩාරගම	මූ.පා.ප.
93.	යෝජිත යන්ත්‍රානුසාරයෙන් ගල් කැඩීමේ ව්‍යාපෘතිය, නුරානි වත්ත, පාදුක්ක	මූ.පා.ප.
94.	යෝජිත යන්ත්‍රනුසාරයෙන් ගල් කැඩීමේ ව්‍යාපෘතිය, ලීනවත්ත, පාදුක්ක	මූ.පා.ප.
95.	ගල් කැඩීමේ ව්‍යාපෘතිය, හල්බරාව, පාදුක්ක	මූ.පා.ප.
96.	ගල් කැඩීමේ ව්‍යාපෘතිය, කොරතොට, කඩුවෙල	මූ.පා.ප.
97.	ගල් කැඩීමේ ව්‍යාපෘතිය, හඟවත්ත, මදතියාවල, දිවුලපිටිය	මූ.පා.ප.
98.	යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, Torwood වත්ත, තෙබුවන, කළුතර	මූ.පා.ප.
99.	යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, තුඩුගල කන්ද, කළුතර	මූ.පා.ප.
100.	යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, ගල්පාත, කළුතර	මූ.පා.ප.
101.	යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, සීනි මෝදර, තංගල්ල	ම.පා.ප.
102.	යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, නවගමුව	මූ.පා.ප.
103.	යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන ගල් කැඩීමේ ව්‍යාපෘතිය, පලුදෙනිය, සිරිපුර	මූ.පා.ප.

4.1.1. අනුමැතිය ලද ව්‍යාපෘති පසු විපරම් කිරීම

ව්‍යාපෘති අනුමත කිරීමේදී දෙනු ලබන කොන්දේසි වලට යටත්ව ව්‍යාපෘති නිසි අයුරින් ක්‍රියාත්මක වන්නේ දැයි සහතික කිරීම සඳහා පරිසර බලපෑම් ඇගයීම් ඒකකය දැනටමත් අනුමැතිය ලබා දුන් ව්‍යාපෘති පසු විපරම් කරනු ලැබීය. පහත සඳහන් ව්‍යාපෘති පසු විපරම් කිරීම, ද්විමාසික රැස්වීම් සහ ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් නොකඩවා සිදු කරනු ලැබීය.

2011 වසර තුළදී පසු විපරම් කරන ලද ව්‍යාපෘති පහත දැක්වේ.

1. දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය
2. කොළඹ කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය
3. කොළඹ පිටත වටරවුමේ මහා මාර්ග ව්‍යාපෘතිය (කොට්ටාව සිට කඩුවෙල දක්වා)

4. මොරගහකන්ද කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘතිය
5. කළු ගඟ ජලාශ හා කෘෂිකර්ම ව්‍යාප්ති ව්‍යාපෘතිය
6. "Water Gel" පිපිරුම් කාරක නිෂ්පාදනය කිරීමේ යෝජිත කර්මාන්ත ශාලාව, හේනේගම, මීරිගම
7. කෙරවලපිටිය මෙ.වො. 300 බහු ඉන්ධන තාප බලාගාර ව්‍යාපෘතිය
8. ගුරුගොඩ ඔය කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය
9. කෙහෙල්ගමු ඔය කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය
10. මානකොල කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය
11. සියඹලාගස්තැන්න කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය
12. පූනාගල කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය
13. බාකේපල් කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය
14. ගුවන්තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය, මත්තල

4.1.2. පරිසර බලපෑම් ඇගයීම් / මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම

- **නියමිත ව්‍යාපෘති ලැයිස්තුව වැඩි දියුණු කිරීම**

1993 ජුනි 24 දින 772/22 දරන ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන ලද නියමිත ව්‍යාපෘති ලැයිස්තුව අදාල ආයතනයන්ගේ උපදෙස් ලබාගැනීමෙන් පසු සංශෝධනය කරනු ලැබිය. මෙම සංශෝධිත ලැයිස්තුව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදි.

- **පරිසර බලපෑම් ඇගයීම් වාර්තා පිළියෙල කිරීම / තාක්ෂණික මාර්ගෝපදේශ ලබාගැනීම සඳහා උපදෙස් ලබාගැනීමේ ආයතන ලියාපදිංචි කිරීම**

තාක්ෂණික මාර්ගෝපදේශ / පරිසර බලපෑම් ඇගයීම් වාර්තා පිළියෙල කිරීම සඳහා වූ විශේෂඥයන් / උපදේශකයින් ලැයිස්තුව යාවත්කාලීන කරනු ලැබිය. උපදෙස් ලබාගැනීමේ ආයතන ලියාපදිංචි කිරීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කරන ලදි. එම පුවත්පත් දැන්වීමට අනුව ලැබුණා වූ ඉල්ලුම්පත් වලින් විවිධ අංශයන්හි පළපුරුදු විශේෂඥයින් ඇතුලත් උපදේශන ආයතන ලියාපදිංචි කිරීමට කටයුතු කෙරේ.

4.1.3. උපාය මාර්ගික පරිසර ඇගයීම ක්‍රියාත්මක කිරීම

- **උතුරු පළාතේ සංවර්ධන සැලැස්ම සඳහා උපාය මාර්ගික පරිසර ඇගයීම**

පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මෙම අධ්‍යයනය සිදු කරනු ලබන්නේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි සහයෝගිත්වයෙනි. මේ සඳහා මූල්‍යමය අනුග්‍රහය ලබාදෙනුයේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන මඟිනි.

මෙම අධ්‍යයනයේ මූලික අවධානය යොමුව ඇත්තේ වසර 30 ක කුරිරු යුද්ධයෙන් පසු දැනට ඉතිරිව පවතින පාරිසරික අතින් වැදගත්කමක් ඇති ස්ථාන / ප්‍රදේශ හඳුනා ගැනීමත්, ඒවා ආරක්ෂා කර ගැනීමත් සංවර්ධන කටයුතු සඳහා පහසුකම් සැලසීමත් ය.

මෙම උපාය මාර්ගික පරිසර ඇගයීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් කණ්ඩායම් නායකයෙක් පත් කරන ලද අතර, එම අධ්‍යයන කණ්ඩායමෙහි සාමාජිකයන් වශයෙන් කටයුතු කිරීමට ආයතන හඳුනා ගන්නා ලදි. උතුරු පළාතේ සංවේදී පරිසර පද්ධති හා සම්පත් හඳුනා ගැනීම සඳහා විශේෂ අධ්‍යයනයක් කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, ජල සම්පත් මණ්ඩලය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය සහ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම් අත්සන් කරන ලදි. මෙම විශේෂ අධ්‍යයනය සඳහා කාර්ය නිර්දේශය සකස් කර මෙම ආයතනය වෙත භාර දෙන ලදි.

පරිසර සංවේදී ප්‍රදේශ සහ තව දුරටත් සංවර්ධන කටයුතු කිරීම සඳහා සුදුසු ප්‍රදේශ හඳුනාගෙන සිතියම්ගත කරන ලදි. ප්‍රදේශයෙහි පවතින සම්පත් (ජලජ සහ ඛණිජ) හඳුනා ගන්නා ලදි.

මෙම නිර්දේශයන් අනාගත සංවර්ධන ව්‍යාපෘති සැලසුම් සඳහා ප්‍රයෝජනවත් වේ.

- **ගම්පහ දිස්ත්‍රික්කය සඳහා උපාය මාර්ගික පරිසර ඇගයීම**

මධ්‍යම පරිසර අධිකාරිය, මෙම අධ්‍යයනය සිදු කරනු ලබන්නේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි සහභාගිත්වයෙනි. මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වනුයේ ගම්පහ දිස්ත්‍රික්කයේ කර්මාන්ත වලින් වන පරිසර දූෂණය සහ ගංතුර තර්ජනය සඳහා විසඳුම් ලබාදීමය. උපාය මාර්ගික පරිසර ඇගයීමේ කොටස් වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කය සඳහා කර්මාන්ත සංඝණනයක් පවත්වනු ලැබිය. බීම සංඝණනයෙන් ලබාගත් දත්ත සහ අනෙකුත් අදාල තොරතුරු විශ්ලේෂණය කිරීමෙන්, කර්මාන්ත මඟින් වන පරිසර දූෂණය සඳහා විසඳුම් සොයා ගැනීම අරමුණ වේ.

- **පරිසර බලපෑම් ඇගයීම / උපාය මාර්ගික පරිසර ඇගයීම් පුහුණු වැඩ සටහන්**

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව, පරිසර බලපෑම් ඇගයීම් අංශය විසින් එම අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා පරිසර කළමනාකරණය පිළිබඳ තෙදිනක පුහුණු වැඩ සටහනක් පැවැත්විය.

මූලිකවම මෙම වැඩමුළුව දැනට පවතින පාරිසරික රෙගුලාසි සහ වර්තමාන උපාය මාර්ග පරිසර ඇගයීම් පිළිබඳව කරුණු හැදෑරීම සඳහා වූ එකක් විය.

මීට අමතරව ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරීන් සඳහා පස්දින ජාත්‍යන්තර පුහුණු වැඩ සටහනක් හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂි පර්යේෂණ හා පුහුණු ආයතනයේ දී 2011 අප්‍රේල් මස පවත්වන ලදි.

4.1.4. අනෙකුත් ක්‍රියාකාරකම්

ඉහත ක්‍රියාකාරකම් වලට අමතරව පහත දක්වා ඇති රැස්වීම් / ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා ද 2011 වර්ෂයේ දී පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ සහභාගිත්වය ලබාදෙන ලදි.

- ජාතික මහා මාර්ග ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටු රැස්වීම
- පිටත වටරවුම් මහා මාර්ග ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටු රැස්වීම
- දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු රැස්වීම
- කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු රැස්වීම

- උතුරු පළාත් මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටු රැස්වීම
- පළාත් මාර්ග පුනරුජ්ථාපන ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටු රැස්වීම
- මොරගහකන්ද සහ කළුගඟ කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටු රැස්වීම
- වවුනියා ජල සැපයුම් ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටු රැස්වීම
- ගම්පහ දිස්ත්‍රික්කය සඳහා උපාය මාර්ගික පරිසර ඇගයීම
- " Cauvery Basin " උපාය මාර්ගික පරිසර ඇගයීම සඳහා ව්‍යාපෘති කමිටු රැස්වීම
- සංචාරක ව්‍යාපාර අංශයේ ව්‍යාපෘති සඳහා " One stop shop " රැස්වීම

4.2. ස්වභාවික සම්පත් කළමණාකරන හා පසුවිපරම් ඒකකය

ස්වාභාවික සම්පත් කළමනාකරණ හා පසු විපරම් ඒකකය මඟින් සිදු කරන ප්‍රධාන කාර්යභාරය වනුයේ ජාතික පාරිසරික පනතෙහි ප්‍රතිපාදන වලට අනුකූලව ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාලව රෙගුලාසි හා ගුරු උපදෙස් සකස් කිරීම, පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සහ කළමනාකරණය කිරීම, පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ තුල අනුමත කල හැකි භාවිතයන්ට අදාල ක්‍රියාකාරකම් සඳහා අනුමැතිය ලබා දීමේ පටිපාටිය ක්‍රියාත්මක කිරීම, ජාතික තෙත් බිම් ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම සහ ස්වභාවික සම්පත් සහ තෙත් බිම් කළමනාකරණය සම්බන්ධව දැනුවත් කිරීම හා අදාල අත් පත්‍රිකා, සඟරා ආදිය සම්පාදනය කිරීම යනාදිය වේ.

ස්වභාවික සම්පත් කළමනාකරණය හා අදාල ක්‍රියාකාරකම්

අනෙකුත් අදාල ආයතන සමඟ සම්බන්ධීකරණය තුලින් රටේ ස්වභාවික සම්පත් කළමනාකරණය කිරීමේ වගකීම මෙම ඒකකය විසින් දරණු ලැබේ. ඒ සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල සඳහා උපදෙස් ලබා දම හා සම්බන්ධීකරණ කටයුතු මෙම ඒකකය මඟින් සිදු කරනු ලැබේ.

2011 වසර තුලදී ස්වභාවික සම්පත් කළමනාකරණය සඳහා වන අන්තර් ආයතන කමිටුවක් ස්ථාපනය කරන අතර, එම කමිටු රැස්වීමේදී ජල සම්පත සඳහා ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව වැදගත් තීරණ කිහිපයක් ගන්නා ලදි. (ජල දෙහයන් සඳහා රක්ෂිත පවත්වා ගැනීම, ජල ප්‍රතිපත්තියක් සකස් කිරීම, ජල සම්පත කළමනාකරණය සඳහා දැනට පවතින රෙගුලාසි ක්‍රියාවට නැංවීම සහ ස්වභාවික සම්පත් සම්බන්ධව පසු විපරම් කටයුතු සිදු කිරීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම මෙම තීරණ වේ.)

1997 දී ප්‍රකාශයට පත් කරන ලද ස්වභාවික සම්පත් කළමනාකරණය සඳහා වන ගුරු උපදෙස් ග්‍රන්ථයෙහි අඩංගු ගුරු උපදෙස්, අනුමැතින් ලබා දීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටින් යනාදිය සංශෝධනය විය යුතු බැවින් වර්තමානයේ පවතින තත්ත්වයන්ට අනුකූල යාවත්කාලීන කිරීමේ අරමුණින් අදාල සියළු ආයතන සමඟ රැස්වීම් වාර 04 පවතිවා ඒ ඒ විෂය පථය සම්බන්ධව එම අදාල ආයතන වෙතින් නිර්දේශ ලබාගෙන ස්වභාවික සම්පත් කළමනාකරණ සඳහා වන ගුරුඋපදෙස් පොත් යාවත්කාලීන කර නැවත මුද්‍රණය සඳහා කටයුතු සිදු කර ඇත.

දිය ඇලි වල, කුඩා ජල විදුලි බලාගාර ඉදිකිරීමේ ප්‍රවනතාවය වැඩි වී ඇති බැවින්, ඒ සම්බන්ධව කරුණු අධ්‍යනය කර ප්‍රතිපත්තියක් සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා සුනීතා බලශක්ති අධිකාරිය වෙතද ඒ සම්බන්ධව දැනුවත් කිරීමට පියවර ගෙන තිබේ.

4.2.1 පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම

ශ්‍රී ලංකාව කුඩා භූමි ප්‍රමාණයකින් යුතු වුවද එය ස්වභාවික හා සංස්කෘතිමය වත්කම් වලින් පොහොසත් වන අතර සුවිශේෂී පාරිසරික පද්ධතින් පරිසර විද්‍යාත්මක වශයෙන් වැදගත් ස්ථාන මෙන්ම අලංකාර භූමි දර්ශන වලින්ද සමන්විත රටකි. එහෙත් නිසි සැලසුමක් රහිතව මෙන්ම අනවසර ලෙස සිදු කරන සංවර්ධන ක්‍රියාවලි හේතුවෙන් රටෙහි පවතින පාරිසරික වශයෙන් සුවිශේෂී ස්ථාන හායනයට ලක්වීම සහ විනාශ වීම සිදු වේ. මෙවැනි කරුණු සැලකිල්ලට ගෙන පාරිසරික වශයෙන් වැදගත් සුවිශේෂී ස්ථාන සංරක්ෂණය කිරීමේ අරමුණින් ජාතික පාරිසරික පනතෙහි 24 ඇ සහ 24 ඈ වගන්ති වල ප්‍රතිපාදන වලට අනුව එවැනි ප්‍රදේශ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය පියවර ගෙන ඇත.

2011 වර්ෂය තුලදී එසේ හඳුනාගන්නා ලද ප්‍රදේශ 4ක් පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් කටයුතු සිදු කරන ලදි.

- යෝජිත බෙන්තොට ගඟ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය

අදාල ගැසට් නිවේදනය කෙටුම්පත් කර අවසන් කර ඇති අතර යෝජිත ප්‍රදේශයේ සීමාවන් වෙන් කිරීම සම්බන්ධව අමාත්‍යාංශ මණ්ඩලය වෙත දැනුම් දී ඇත.

- යෝජිත කොග්ගල පරිසර ආරක්ෂක ප්‍රදේශය

මූලික තොරතුරු එක්රැස් කිරීම අවසන්කර ඇති අතර විද්වත් මණ්ඩලයක් වෙත යොමු කර ඇගයීමකට ලක් කිරීම පිණිස අදාල වාර්තාව සකස් කර ඇත.

- යෝජිත දැඩිගමුව කන්ද පාරිසරික ආරක්ෂක ප්‍රදේශය

මූලික තොරතුරු එක්රැස් කිරීමෙන් අනතුරුව වාර්තාවක් සකස් කර විද්වත් මණ්ඩලයක් විසින් එය ඇගයීමකට ලක් කර අදාල ගැසට් නිවේදනය කෙටුම්පත් කර ඇත.

- යෝජිත ගිං ඔය පාරිසරික ආරක්ෂක ප්‍රදේශය

මූලික තොරතුරු එක්රැස්කර අවසන් කර ඇති අතර ජෛව විවිධත්වය සම්බන්ධව අධ්‍යනය සිදු කෙරෙමින් පවති.

4.2.1.1 ප්‍රකාශයට පත් කරන ලද පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණය කිරීම

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ද සහයෝගය ලබා ගනිමින් හන්තාන ආරක්ෂක ප්‍රදේශය සඳහා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමට මූලික පියවර ගෙන ඇත. බොල්ගොඩ සහ හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශවල තිරසාර කළමනාකරණය උදෙසා ගුරු උපදෙස් මාලාවක් සකස් කර අදාල සියළු ආයතන ඒ සම්බන්ධව දැනුවත් කිරීමට පියවර ගෙන ඇත.

සැණකෙලි සමයේදී ග්‍රෙගරී වැව පාරිසරික ආරක්ෂක ප්‍රදේශය තුළ සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම පිණිස අදාල අනෙකුත් ආයතන වල දායකත්වයෙන් යුතුව විශේෂ වැඩසටහන් පවත්වන ලදි. මුතුරාජවෙල පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ නැගෙනහිර මායිම සලකුණු කිරීමේ සහ බොල්ගොඩ පරිසර ආරක්ෂක ප්‍රදේශයේ සීමා සලකුණු කිරීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවති. බොල්ගාඩ පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ පවතින ගැටළු සාකච්ඡා කර තීරණයක් ගැනීම, නිසි කළමනාකරණය සහ ආයතන අතර සම්බන්ධීකරණය උදෙසා අදාල ආයතන වලින් සැදුම්ලත් කළමනාකරණය කමිටුවක් ස්ථාපනය කරන ලදි.

4.2.1.2 පාරිසරික ආරක්ෂක ප්‍රදේශ පසු විපරම් කිරීම

පාරිසරික ආරක්ෂක ප්‍රදේශ වල පසු විපරම් කටයුතු සිදු කිරීමත්, ප්‍රකාශයට පත් කරන ලද පාරිසරික ආරක්ෂක ප්‍රදේශවල සහ පැවැත්ම සහ තිරසාර පරිහරණය සම්බන්ධව කටයුතු කිරීම පිණිස සියළු පාරිසරික ආරක්ෂක ප්‍රදේශ වල පසු විපරම් කිරීම සහ අවශ්‍ය කටයුතු සිදු කරන ලදි.

4.2.2 තෙත් බිම් කළමනාකරණය

දිවයිනේ පිහිටි තෙත්බිම් පාරිසරික පද්ධති වල තිරසාර කළමනාකරණය සඳහා සකස් කරන ලද ජාතික තෙත්බිම් ප්‍රතිපත්තිය සහ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමේ වගකීම දරනු ලබන්නනේ, පාරිසරික කළමනාකරණ හා ඇගයීම් අංශය යටතේ පවතින ස්වභාවික සම්පත් කළමනාකරණ හා පසුවිපරම් ඒකකය විසිනි. 2011 වර්ෂය තුලදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදි.

4.2.2.1 ජාතික තෙත් බිම් මෙහෙයුම් කමිටුව

තෙත්බිම් සම්බන්ධ ජාතික ප්‍රතිපත්තියේ සඳහන් ආකාරයට සංරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධ මධ්‍යම පරිසර අධිකාරිය හා අදාළ අනෙකුත් ආයතන සම්බන්ධීකරණය කිරීම හා උපදෙස් ලබා දීම සිදු කරනු ලබන්නේ පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුතු ජාතික තෙත්බිම් මෙහෙයුම් කමිටුව විසිනි. 2011 වර්ෂය තුලදී ජාතික තෙත්බිම් මෙහෙයුම් කමිටු රැස්වීම් වාර 02ක් පවත්වන ලදි.

4.2.2.2. ලෝක තෙත්බිම් වැඩසටහන

සෑම වසරකම පෙබරවාරි 02 වන දිනට යෙදෙන ලෝක තෙත්බිම් දිනය වෙනුවෙන් පවත්වන ජාතික වැඩසටහන, ස්වභාවික සම්පත් කළමනාකරණ ඒකකයේ හා වන ජීවී සංරක්ෂණ දෙපාර්තුමේනතුව එක්ව සංවිධානය කරනු ලබන අතර 2011 වසරේදී ලෝක තෙත් බිම් දිනයට සමගාමීව පාරිසරික ඡායාරූප තරඟයක් පවත්වන ලදි. එහි ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග ප්‍රධානෝත්සවය ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත රම්සා තෙත් බිමක් වන ආනවිලුන්දාව තෙත්බිම් පරිශ්‍රයේදී පවත්වන ලදි. මධ්‍යම පරිසර අධිකාරියේ සියළුම පළාත් කාර්යාල මගින් සෑම පළාතකම ලෝක තෙත් බිම් දිනය සැමරීම උදෙසා විවිධ වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය සිදුකරන ලදි.

2012 වර්ෂයේදී ලෝක තෙත් බිම් දිනය සඳහා සමස්ථ ලංකා පාසල් දැනුම මිනුම තරඟයක් පැවැත්වීම සඳහා මූලික වැඩකටයුතු සංවිධානය 2011 වර්ෂයේදී අරඹන ලදි.

4.2.2.3 තෙත්බිම් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම

තෙත්බිම් කළමනාකරණය සඳහා උපයෝගි කර ගැනීම පිණිස තෙත්බිම් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර පළාත් පහක එම වැඩකටයුතු නිමකර ඇත.

4.2.2.4 ග්‍රාමීය තෙත් බිම් කමිටු ස්ථාපනය කිරීම

තෙත් බිම් කළමනාකරණය සඳහා අත්‍යවශ්‍ය වන සක්‍රිය ප්‍රජා සහභාගිත්වය තබා ගනු පිණිස මුතුරාජවෙල හා තලංගම වැව පාරිසරික ආරක්ෂක ප්‍රදේශ වල ග්‍රාමීය තෙත් බිම් කළමනාකරණ කමිටු පිහිටු වන ලදි.

4.2.3 තාක්ෂණික උපදෙස් ලබාදීම සඳහා සහභාගී වූ රැස්වීම්

2011 වසර තුලදි පහත සඳහන් ජාතික මෙහෙයුම් කමිටු තාක්ෂණික කමිටු රැස්වීම් වලදි මෙම ඒකකය විසින් තාක්ෂණික උපදෙස් ලබා දෙමින් මධ්‍යම පරිසර අධිකාරිය නියෝජනය කරන ලදි.

ව්‍යාපෘති කමිටු රැස්වීම් සහ තාක්ෂණික ඇගයීම් කමිටු

- හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය (නව කර්මාන්ත ස්ථාපිත කිරීම)
- ත්‍රිකුණාමලය වරාය සංවර්ධන ව්‍යාපෘතිය (නව කර්මාන්ත ස්ථාපිත කිරීම)
- ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය
- මහගම ධවනි තිරුවාණා නිධිය සංවර්ධනය
- ගැඹුරු මුහුදේ ධීවර කටයුතු සඳහා විශේෂිත / පයිබර් ග්ලාස් බෝට්ටු නිෂ්පාදනය ව්‍යාපෘතිය
- "සෙත්සිරිපාය", පරිපාලන සංකීර්ණය පියවර II ව්‍යාපෘතිය
- ජලජීවී වගා සංවර්ධන ව්‍යාපෘති (තාක්ෂණික ඇගයීම් කමිටුව)
- ජාතික පසුවිපරම් කමිටුව (මනම්පිටිය වැලි ගොඩදැමීම)
- ජාතික ජෛව තාක්ෂණික කමිටුව - NSF
- පාරිසරික සමුළු රැස්වීම
- නීති උපදෙස්

4.2.4 අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම්

බොල්ගොඩ සහ හන්නාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශ සම්බන්ධව අත්පත්‍රිකා නිර්මාණය කර මුද්‍රණය සඳහා යොමු කරන ලදි.

4.3. භූගෝලීය තොරතුරු තාක්ෂණ ඒකකය

4.3.1. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා භූගෝලීය තොරතුරු තාක්ෂණය භාවිතයෙන් දත්ත පද්ධතියක් ගොඩනැංවීම.

<u>මූල්‍ය ප්‍රගතිය</u>

මුළු ප්‍රතිපාදන - මිලියන 4.0

මුළු වියදම් - මිලියන 3.962

<u>භෞතික ප්‍රගතිය</u>

මේ යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රා.ලේ. කොට්ඨාශ 12ක හා වවුනියාව දිස්ත්‍රික්කයේ ප්‍රා.ලේ. කොට්ඨාශ 04ක පාරිසරික හා සමාජ ආර්ථික තොරතුරු ද ශ්‍රී ලංකාවේ සියළුම පළාත් පාලන ආයතන (340) වල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ස්ථානීය දත්ත එක්රැස් කර දත්ත පද්ධතියක් ගොඩනංවමින් පවතී.



කළුතර දිස්ත්‍රික්කයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ස්ථානීය දත්ත වල අවකාශීය ව්‍යාප්තිය දක්වන සිතියම

4.3.2 භූගෝලීය තොරතුරු තාක්ෂණය භාවිතයෙන් ගොඩනංවා යාවත්කාලීන කරනු ලබන පාරිසරික තොරතුරු පද්ධතිය

<u>මූල්‍ය ප්‍රගතිය</u>

මුළු ප්‍රතිපාදන - මිලියන 1.0

මුළු වියදම් - මිලියන 1.0

<u>භෞතික ප්‍රගතිය</u>

මෙම දත්ත පද්ධතියට පාරිසරික වශයෙන් වැදගත් මූලික දත්ත වන, පාරිසරික තොරතුරු (ජල, වන, වනජීවී, භූමි සම්පත් ආදී) සාමාජීය හා ආර්ථික තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමෙන් ඇතුලත් කර තිබේ. මෙම දත්ත පද්ධතිය, පාරිසරික කළමනාකරණය, සැලසුම්කරණය, ඇගයීමේ හා දැනුවත් කිරීමේ කාර්යයන් හා පාරිසරික ආදර්ශ නිර්මාණකරනය සඳහා මහඟු පිටුවහලක් වේ.

ඒ අනුව උතුරු පළාතේ - මුලතිව්, කිලිනොච්චිය දිස්ත්‍රික්ක හැර දිවයිනේ අනෙක් පළාත සඳහා අදාල දත්ත ඒකරාශි කර එම දත්ත පද්ධතිය සතස් කරමින් පවතී. පහත දැක්වෙන පාරිසරික තොරතුරු හා දත්ත ග්‍රාම නිලධාරී මට්ටමින් යෝජිත දත්ත ගබඩාව තුල රැස්කරනු ඇත.

- ජල සම්පත් - ජල උල්පත්, කුඩා ජල මාර්ග, ගංගා, පතහ, වැව් ජලාශ හා තෙත්බිම්
- වන සම්පත් - රක්ෂිත වනාන්තර, යෝජිත රක්ෂිත, වනවගා හා වෙනත් වනාන්තර වර්ග
- වන ජීවී උද්‍යාන - වන ජීවී රක්ෂිත (අභය භූමි, දැඩි රක්ෂිත, ජාතික වනෝද්‍යාන)
- ස්වභාවික ආපදා - ගංවතුර, සුනාමි, නායයෑම්
- පුරාවිද්‍යා රක්ෂිත හා ස්මාරක
- A,B,C කාණ්ඩ යටතේ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කරන ලද කර්මාන්ත
- පරිසර බලපෑම් ඇගයීමකට යටත් වූ ව්‍යාපෘතීන් - උද්‍යා - කුඩා ජලවිදුලි බලාගාර
- ඝණ අපද්‍රව්‍ය බැහැරලන ස්ථාන - ක්‍රියාත්මක, අත්හැර දමන ලද හා යෝජිත
- භූමි සම්පත් (භූමි පරිහරණ, පාංශු බාණ්ඩ, කෘෂි පාරිසරික කලාප)

සමාජීය හා ආර්ථික තොරතුරු

යටිතල පහසුකම්	- මාර්ග, විදුලි සංදේශ, විදුලිබල
අධ්‍යාපනික	- පාසල්

අවසානයේ දිස්ත්‍රික්ක මට්ටමෙන් පාරිසරික පැතිකඩයන් නිර්මාණය කරන අතර කළුතර හා කෑගල්ල දිස්ත්‍රික්ක සඳහා මෙම වසරේ සංයුක්ත තැටි නිර්මාණය කර අවසන් කර ඇත. මෙම තොරතුරු රැස් කිරීම 2012 වසර සඳහා උතුරු පළාතේ කිලිනොච්චි දිස්ත්‍රික්කය තෝරාගෙන ඇත.

කළුතර දිස්ත්‍රික් පැතිකඩයේ සංයුක්ත තැටියේ මුල් පිටුව පහත දැක්වේ



4.3.3 උපායමාර්ගික පාරිසරික ඇගයීම - ගම්පහ දිස්ත්‍රික්කය

කර්මාන්ත සංගණනය සඳහා විශේෂිත වූ ප්‍රශ්නාවලියක් ගොඩනංවා දිස්ත්‍රික්කයේ කර්මාන්ත සංගණනය සිදුකරන ලද අතර එම දත්ත භාවිතාකර කර්මාන්ත වලින් සිදු වන පාරිසරික හානි ඇගයීම සඳහා දත්ත විස්ලේෂණ කටයුතු සිදු කරමින් පවතී.

4.3.4 භූගෝලීය තොරතුරු තාක්ෂණ ඒකකයේ වැඩි දියුණුව හා කුසලතා වර්ධනය

- ඒකකයේ නිලධාරීන්ගේ සිතියමකරණය (Cartography) පිළිබඳ කුසලතා වර්ධනය සඳහා දියතලාවේ මිනුම් දෙපාර්තුමේන්තුවේදී පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
- පරිසර අධිකාරියේ සියළුම ප්‍රාදේශීය පරිසර නිලධාරීන් සඳහා පළාත් මට්ටමින් භූගෝලීය මං සෙවීමේ උපකරණ (GPS) භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් මාලාවක් පවත්වන ලදි.
- පහත සඳහන් දත්ත සහ උපකරණ මෙම ඒකකය සඳහා මිලදී ගන්නා ලදී.

- භූගෝලීය මං සෙවීමේ උපකරණ (GPS) - 26
- නැවත ආරෝපණය කළ හැකි බැටරි සමඟ චාර්ජ් - 35
- 1:10,000 අංකිත සිතියම් - මිනුම් දෙපාර්තුමේන්තුව
- ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනයෙන් නායයෑමට ලක්විය හැකි ප්‍රදේශ ඇතුලත් අංකිත සිතියම්

4.3.5 දිස්ත්‍රික්ක මට්ටමින් සකසන ලද පාරිසරික සංවේදී කලාප අඩංගු සිතියම් 83 ක් මුද්‍රණය කිරීම.



4.3.6 අනෙකුත් කාර්යයන්

ආදායම් ඉපයීම සඳහා සපයන ලද සේවාවන්

- වෙරළ සංරක්ෂණ දෙපාර්තුමේන්තුවේ ව්‍යාපෘතියක් සඳහා අත්තනගළු ඔයේ පෝෂක ප්‍රදේශයට අයත් සමෝච්ඡ රේඛා අංකනයකර (Digitized) අංකිත සිතියමක් නිර්මාණය.
- පාරිසරික සංවේදී කලාප අයත් ප්‍රදේශ විස්ලේෂණය කර සිතියම් සැකසීම - සූරියවැව පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා ගම්මානය හා කරදියාන අපද්‍රව්‍ය මහින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘති.
- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සඳහා පරිසර සංවේදී කලාප විස්ලේෂිත සිතියම් සැකසීම.
- මධ්‍යම ඉංජිනේරු පර්යේෂණ කාර්යාංශය සඳහා මහගොන වැව වාරි ව්‍යාපෘතියේ පාරිසරික සංවේදී කලාප විශ්ලේෂණය කර අංකිත සිතියමක් සැකසීම.
- කැස්බෑව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ව්‍යාපෘතියක් ස්ථානගත කිරීම සඳහා විශ්ලේෂණය කර සිතියමක් සැකසීම.

අධිකාරියේ අනෙකුත් අංශ සඳහා සපයන ලද සේවාවන්

- අටබාගේ ඔය කුඩා පරිමාණ ජලව්‍යාපෘතියේ වේල්ල හා බලාගාරය ස්ථානගත කරන ලද සිතියම .
- බොල්ගොඩ, බෙන්තොට සහ තලංගම ආරක්ෂණ කලාප වල කළමනාකරණ සැලසුම් සඳහා වූ ව්‍යාපෘති වාර්තාවන්හි පිටකවර නිර්මාණය
- දඩුගම් ඔයේ ජල තත්ත්ව නිරීක්ෂණය සඳහා නියැදි ලබා ගන්නා ස්ථාන ඇතුලත් සිතියම සැකසීම.
- හන්තාන පරිසර ආරක්ෂණ කලාපය තුළ පේරාදෙණිය විශ්ව විද්‍යාලය දැක්වෙන සිතියම සැකසීම.
- දඩුගම් ඔය, බොල්ගොඩ, බෙන්තොට හා කැළණි ගඟ නියැදි ලබාගන්නා ස්ථාන සලකුණු කරන ලද සිතියම් සැකසීම.
- කැගල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පාරිසරික සංවේදී කලාප විශ්ලෙෂණය කර සිතියම සැකසීම.
- හිං ඔය සඳහා ක්ෂේත්‍ර සිතියමක් සැකසීම.
- බෙන්තොට ඉහළ ජලධාරා හා කැළණි ගඟ නියැදි දැක්වෙන සිතියම.
- කොම්පෝස්ට් නිෂ්පාදනය සම්බන්ධයෙන් අත්පත්‍රිකාවක සැකසීම.
- ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන ඇතුලත් සිතියමක් සැකසීම.
- කර්මාන්ත අවකාශීයව ව්‍යාප්ත වී ඇති ආකාරය දැක්වෙන සිතියමක් සැකසීම.
- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ස්ථානීය දත්ත ඇතුලත් සිතියමක් සැකසීම.
- සෝමාවතියේ කෙසෙල් වගාව සඳහා යෝජිත ප්‍රදේශය විශ්ලේෂණය කර සිතියමක් සැකසීම.
- පට්ටිවිල ඇල පෝෂක ප්‍රදේශයේ යෝජිත ක්‍රියාකාරකම් ඇතුලත් සිතියම සකස් කිරීම.
- ඉහළ කොත්මලේ ජල තත්ත්වයන් ඇගයීම සඳහා සුදුසු ස්ථානයන් සලකුණු කරන ලද සිතියම.
- කළු ගඟ සහ ඒ ආසන්නයේ පාලම තෙක් වැලි කැණීමේ ස්ථාන සිතියම්කරණය.

5.0 නීති ඒකකය

මෙහෙවර ප්‍රකාශය

අප එකිනෙකාගේ පැවැත්ම උදෙසා නීතිමය යාන්ත්‍රණය බලාත්මක කිරීම තුළින් පරිසරය සංවර්ධනය කිරීමෙන්ද දැනුම ලබාදීමෙන් ද පරිසරයේ සුවදායී පැවැත්ම නහවුරු කරමු.

5.1. ජාතික පාරිසරික පනත යටතේ ගන්නා ලද නීතිමය ක්‍රියාමාර්ග

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ බලාත්මක වන නීති හා රෙගුලාසි ඔස්සේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ 2011 වසර තුළ නීති අංශය මඟින් සිදුකරන ලද නෛතික කාර්යයන් පහත පරිදි වේ.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් ගොණු කොට පවත්වාගෙන යනු ලබන සහ අවසන් කරන ලද නඩු කටයුතු රාශියකි. ඒ අතර 2011 වසර තුළදී මෙම අධිකාරිය විසින් ගොණු කරන ලද සහ මෙම අධිකාරියට එරෙහිව පවත්වාගෙන යන ලද නඩු සංඛ්‍යාව 307 ක් පමණ වේ. මෙම අධිකාරිය විසින් නඩු 165 කට වැඩි ප්‍රමාණයක් අලුතින් පවරා ඇත.

බස්නාහිර පළාත තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය

2011 වර්ෂය තුළදී බස්නාහිර පළාත තුළ ගොණු කරන ලද නඩු සංඛ්‍යාව 58 ක් වන අතර ඉන් 25 ක් වර්තමානයේ කොළඹ දිස්ත්‍රික්කය තුළ පවත්වා ගෙන යන නඩු කටයුතු වේ.

කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 10 ද මොරටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 04 ක්ද ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 05 ක්ද කැස්බෑව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 04 ක්ද කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 02 ක්ද හෝමාගම මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු 06 ක්ද 2011 වර්ෂයේ පවරා පවත්වාගෙන ගොස් ඇත. 2011 වර්ෂය තුළ අවසන් වූ නඩු වලින් රු.214,000/= ක මුදලක් දඩ මුදල් වශයෙන් අය කරගෙන ඇත.

ගම්පහ දිස්ත්‍රික්කය තුළ නඩු 22 ක් පවරා පවත්වාගෙන ගිය අතර ඉන් 20 ක් 2011 වර්ෂය තුළ අළුතින් පවරා පවත්වාගෙන ගොස් ඇති අතර අවසන් කරන ලද නඩු වලින් දඩ මුදල් ලෙස අයකර ගෙන ඇති මුදල රු.185,000/=කි. කළුතර දිස්ත්‍රික්කය තුළ නඩු 07ක් පවරා පවත්වාගෙන ගොස් ඇත.

ඝනකමින් මයික්‍රෝන 20 ට අඩු පොලිතින් භාවිතා කිරීම/ විකිණීමට අදාළව පවතින නියෝග උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කොළඹ දිස්ත්‍රික්කය තුළ පවරන ලද නඩු සංඛ්‍යාව 16 කි.

මධ්‍යම පළාත තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය

මධ්‍යම පළාත තුළ පසුගිය වසරේ නඩු 50 ක් පවරා නුවර, මාතලෙ, දඹුල්ල, ගම්පොල, තෙල්දෙණිය, නුවරඑළිය, ලග්ගල, හැටන්, හෙල්බොඩ, පන්විල සහ මහියංගනය යන මහේස්ත්‍රාත් අධිකරණවල පවත්වාගෙන ගිය අතර ඉන් 45 ක් අළුතින් පවරන ලද ඒවා වේ. නඩු 26 ක් ජාතික පාරිසරික පනතේ IVඇ කොටසේ විධිවිධාන උල්ලංඝනය

කිරීම සම්බන්ධව පවරා ඇති අතර අය කර ගත්නා ලද දඩ මුදල් ප්‍රමාණය රු.94,500/=ක් පමණ වේ. මෙම නඩු කටයුතු අතර මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 3ක් ද නුවරඑළිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 01 ක්ද මාතලේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 01 ක්ද වලපනේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 01 ද ගම්පොල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 07 ක්ද මහියංගනය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 02 ක්ද පන්විල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 02 ක්ද ලග්ගල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 4 ක්ද නාවලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 01 ක්ද තෙල්දෙණිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 01 ක්ද පවරා පවත්වාගෙන යන ලදි. මධ්‍යම පළාත තුළ නඩු කටයුතුවලින් අයකරගත් දඩ මුදල රු.376,500/=

ඌව පළාත තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය

ඌව පළාත තුළ නඩු 08 ක් පවරා පවත්වාගෙන යන ලදි. බදුල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 01 ක්ද වැලිමඩ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 01 කද බණ්ඩාරවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 04 ද තිස්සමහාරාම මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 02 ක්ද ලෙස පවරා පවත්වාගෙන යන ලදි. ඝනකමින් මයික්‍රෝන 20 ට අඩු තුනී පොලිතින් භාවිතා කිරීම/ විකිණීමට අදාළ රෙගුලාසි උල්ලංඝනය කිරීමට අදාළව නඩු කටයුතු 04 ක් පවරා පවත්වාගෙන යන ලද අතර ඉන් 01 අලුතින් පවරන ලද නඩුවකි. ඌව පළාත තුළ නීතිය බලාත්මක කිරීමෙන් රු 21,000/= ක මුදලක් දඩ වශයෙන් ලබා ගෙන ඇත

දකුණු පළාත් තුළ නීති බලත්මක කිරීමේ ප්‍රගතිය

දකුණු පළාත තුළ නඩු 36 ක් පවරා හම්බන්තොට, තංගල්ල, ගාල්ල, මාතර, බලපිටිය යන මහේස්ත්‍රාත් අධිකරණවල පවත්වාගෙන යන ලද අතර ඉන් 29 ක් අළුතින් පවරන ලද ඒවා වේ. පසුගිය වසරේ ගාලු දිස්ත්‍රික්කය තුළ නඩු කටයුතු 19 අවසන් කර ඇති අතර දකුණු පළාත තුළ නීතිය බලාත්මක කිරීමෙන් රු.1,55,000/= මුදලක් දඩ වශයෙන් ලබා ගෙන ඇත.

නැගෙනහිර පළාත තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය

නැගෙනහිර පළාත තුළ මධ්‍යම පරිසර අධිකාරිය විසින් නඩු 06 ක් පවරන ලද අතර, අම්පාර අක්කරේපත්තුව, දෙහිඅත්තකණ්ඩිය සහ කල්මුනේ යන මහේස්ත්‍රාත් අධිකරණයන්හි එකී නඩු පවත්වාගෙන ගිය අතර එයින් නඩු 04 ක් අලුතින් පවරන ලද ඒවා වේ. නැගෙනහිර පළාත තුළ නඩු 05 ක් අවසන් කොට ඇති අතර නීතිය බලාත්මක කිරීමෙන් රු.25,000/= මුදලක් දඩ මුදල් වශයෙන් ලබා ගෙන ඇත.

සබරගමුව පළාත තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය

සබරගමුව පළාත තුළ නඩු කටයුතු 67 ක් පවරා පවත්වාගෙන ගිය අතර ඉන් 11 ක් 2011 වසර තුළ දී අලුතින් පවරන ලද ඒවා වේ. එම නඩු කටයුතු අතර ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 22 ද රුවන්වැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 15 ද මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 06 ද රත්නපුර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 06 ක්ද වරකාපොල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 03 ක් ද, අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු 4 ක් ද, කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 9 ක් ද, පැල්මඩුල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 01 ක්ද ඇහැලියගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු 01 ක්ද වශයෙන් පවත්වාගෙන යන ලදි.

උතුරු මැද පළාත තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය

උතුරු මැද පළාත තුළ අනුරාධපුර, පොලොන්නරුව, හිඟුරක්ගොඩ සහ තඹුත්තේගම මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරා පවත්වාගෙන ගිය නඩු සංඛ්‍යාව 09 ක් වන අතර ඒවා අතුරින් 07 ක් අළුතින් පවරන ලද නඩු වේ.

නීතිමය ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව කර්මාන්තශාලා කිහිපයක් වසා දමන ලදි. සමහර කර්මාන්තශාලා පරිසර අධිකාරියේ ප්‍රමිතියට අනුකූලව අපජල පිරිපහදු පද්ධති සකස් කිරීමෙන් ද සමහර කර්මාන්තශාලා ජාතික පාරිසරික පනතේ ප්‍රකාශිත ප්‍රමිති හා උපමානවලට අනුකූලව ශබ්දය පාලනය කිරීමෙන් ද සහ අනෙකුත් නෛතික අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් ද අනතුරුව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගන්නා ලදි.

මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව මෙම වසර තුළ නඩු 19 ක් පවත්වාගෙන යන ලද අතර ඉන් නඩු 13ක් එම වසර 2011 වසර තුළ ගොණු කරන ලද නඩුවේ.

5.2. ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ නඩු කටයුතු

නීති ඒකකයට අනුයුක්තව සේවය කරනු ලබන නිලධාරීන් මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ පවරන ලද නඩු කටයුතු වලට සම්බන්ධව කටයුතු කරන ලදි. ඉන් වැඩි නඩ කටයුතු සංඛ්‍යාවකට නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ලබාගත් අතර නඩු 03ක් සඳහා පෞද්ගලික නීතිඥවරුන් පත් කරන ලදි.

තවද නීති ඒකකයේ නිලධාරීන් නීතිපති දෙපාර්තමේන්තුවට ලබාදීම සඳහා වූ ලිපිලේඛන කෙටුම්පත් කිරීම, අධිකරණ කටයුතු හා උපදේශන කටයුතු සඳහා ද සහභාගි වී ඇත.

5.3. කම්කරු අධිකරණයේ නඩු කටයුතු

අත්තිඩිය සොබාකෙත මධ්‍යස්ථානයේ කම්කරුවකු විසින් මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව රත්මලාන කම්කරු අධිකරණයේ නඩුවක් පවරන ලද අතර, එකී නඩුව නීති අංශයේ නිලධාරිනියක විසින් මෙහෙයවන ලද අතර මධ්‍යම පරිසර අධිකාරියේ වාසියට එහි තීන්දුව ලැබුණි.

5.4. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීම / නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම අවලංගු නොකිරීමට හේතු විමසීම

කර්මාන්තශාලාවලින් සිදුවන පරිසර දූෂණය සලකා බලා නිකුත් කොට ඇති පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීම සඳහා කර්මාන්තශාලා 03 ක් වෙතද, පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් කර්මාන්තශාලා 42 ක් වෙත ද ලිපි යවා ඇත. පරිසර ආරක්ෂණ බලපත්‍රය අත්හිටුවීම සඳහා එක් කර්මාන්තශාලාවක් සම්බන්ධව ලිපියක් නිකුත් කර ඇත.

මෙම අධිකාරිය මගින් පරිසර ආරක්ෂණ බලපත්‍ර අවලංගු නොකිරීමට හේතු දැක්වීමට අවස්ථාව ලබා දෙමින් කර්මාන්තශාලා 08ක් වෙතින් හේතු විමසීමේ ලිපි යවා ඇත.

තවද කර්මාන්තශාලා සම්බන්ධව නඩු පැවරීමට අදාළ පියවර ගැනීම සඳහා ශබ්ද මට්ටම් වාර්තා, අපදියර විශ්ලේෂණ වාර්තා හා ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා කැඳවීම සඳහා ලිපිගොණු ගණනාවක් පරිසර දූෂණ පාලන අංශය සහ අදාළ පළාත් කාර්යාල වෙත සහ අධිකාරියේ රසායනාගාර වෙත යොම කොට ඇත. තවද අනුමත නොකරන ලද සංවර්ධන ක්‍රියාකාරකම්වලට එරෙහිව නීතිමය පියවර ගැනීමට සිදුවන අවස්ථාවලදී පාරිසරික බලපෑම් හා ඇඟයීම් අංශයෙන් පසුවිපරම් වාර්තා ලබා ගැනීමට කටයුතු කර ඇත.

5.5. පරිසර ආරක්ෂණ බලපත්‍ර කොන්දේසි

නව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ දී එහි කොන්දේසි මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාලවලට අනුයුක්ත කොට ඇති බලාත්මක නිලධාරීන් විසින් පරීක්ෂා කරනු ලබයි.

අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ බලපත්‍ර නිකුත් කිරීමේදී ඊට ආදළ පරීක්ෂා කිරීම් ප්‍රධාන කාර්යාලයේ නීති ඒකකයේ නිලධාරීන් විසින් සිදු කරනු ලබයි.

5.6. විධාන නිකුත් කිරීම

කාර්මික කටයුතු මගින් වන පරිසර හානි හා කර්මාන්තශාලා මගින් වන පරිසර දූෂණය වැලැක්වීම සම්බන්ධව කටයුතු නොකිරීමට අදාළව සහ අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම වැලැක්වීමට විධානය කරමින් දිවයින පුරා පළාත් පාලන ආයතන සඳහා ජාතික පාරිසරික පනතේ 12 වගන්තිය යටතේ විධාන 05 ක් නිකුත් කොට ඇත.

පරිසර කළමනාකරණ හා ඇඟයීම් තක්සේරු කිරීමේ අංශය හා පළාත් කාර්යාල මගින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු අනුව සංවර්ධන කටයුතු ජාතික පාරිසරික පනතේ විධි විධාන අනුව සිදු කරන ලෙස සඳහන් වූ ව්‍යාපෘති යෝජකයින් පහක් (05 ක්) වෙත ජාතික පාරිසරික පනතේ 24ආ වගන්තිය ප්‍රකාරව විධාන නකුත් කර ඇත.

5.7. ජාතික පාරිසරික පනත යටතේ ඉදිරිපත් කර ඇති අභියාචනා (පාරිසරික හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය)

නීති අංශයේ නිලධාරීන් විසින් පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මෙහෙයවනු ලද අභියාචන විභාග 30 කට සහභාගි වී ඇත. ඊට අදාළ ලිපිගොණු 15 ක් අමාත්‍යාංශය වෙත යොමු කිරීමද නීති අංශය මගින් සිදු කෙරිණ.

5.8. නොතාරිස් කටයුතු

මධ්‍යම පරිසර අධිකාරියේ කාර්යයන් ඉටු කිරීමේ දී විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ගොඩනැඟිලි බදු දීම් හා සේවා ලබා ගැනීම සඳහා බාහිර අංශ සමඟ එළඹෙන්නා වූ එගහතා සහ ගිවිසුම්පත්‍ර පිළියෙල කිරීම සහ එකී ගිවිසුම් පත්‍ර සඳහා අනුමැතිය ලබා දීම සිදු කෙරිණ.

5.9. පැමිණිලි

පරිසර දූෂණය පාලනය හා මහජන පීඩා සම්බන්ධව මහජනතාව, පළාත් පාලන ආයතන ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා වෙනත් ආයතන මගින් ඉදිරිපත් කර ඇති මහජන පැමිණිලි සම්බන්ධව පියවර ගෙන අදාළ උපදෙස් ලබා දෙන ලදි. සමහර පැමිණිලි අපරාධ නඩ විධාන සංග්‍රහ පනතේ 98 වගන්තිය සහ පොලිස් ආඥා පනත යටතේ නීතිමය කටයුතු සිදු කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පොලිස් ඒකකය හරහා අදාළ පොලිස් ස්ථානවලට හා පළාත් පාලන ආයතනවලට යොමු කරන ලදි.

5.10. බල ශූන්‍ය බව දැනුම්දීමේ ලිපි

ජාතික පරිසරික පනත යටතේ පළාත් පාලන ආයතන මගින් නිකුත් කරන ලද පරිසර ආරක්ෂණ බලපත්‍ර 07 ක් බල ශූන්‍ය බව දැනුම් දෙමින් පළාත් පාලන ආයතන වෙත ලිපි නිකුත් කොට ඇත.

5.11. උපදේස ලබාගැනීම්

මධ්‍යම පරිසර අධිකාරියට විරුද්ධව ගොණු කර ඇති නඩු සඳහා විරෝධතා ගොණු කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීමට නීත අංශයේ නිලධාරීන් විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා ගණනාවකට සහභාගි වී ඇත. තවද මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවරා ඇති නඩු සම්බන්ධයෙන් ද නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා සඳහා සහභාගි වී ඇත.

5.12. රෙගුලාසි

පහත සඳහන් නව රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම කටයුතු කර ඇත.

අංක 1738/37	2011.12.29	ජාතික පාරිසරික පනතේ 23 ව සමඟ කියවිය යුතු 32 වගන්තිය අනුව සකසන ලද වාහන නළා ශබ්දය පිළිබඳ රෙගුලාසි

පරිසර බලපෑම් තක්සේරු කිරීමේ රෙගුලාසි

නීති අංශය මගින් පරිසර බලපෑම් තක්සේරු කිරීමට අදාළ රෙගුලාසි සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන නව අනුමත ව්‍යාපෘති හඳුන්වා දෙමින් පරිසර අමාත්‍යාංශය හරහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

5.13. උපදෙස්

පාරිසරික කටයුතු හා අනෙකුත් අදාළ කාරණාවලදී පුද්ගලයින්, පළාත් පාලන ආයතන වෙත සහ මෙම අධිකාරියේ අනිකුත් අංශ වෙත නීති උපදෙස් ලබාදී ඇත.

තවද නීති අංශයේ නිලධාරීන් ජාතික පාරිසරික පනතෙහි IVඇ කොටස යටතේ අනුමැතිය ලබාදීමේ කටයුතුවලදී නීති විශාරදයන් වශයෙන් තාක්ෂණික ඇහයීම කමිටුවලට සහභාගි වී ඇත.

5.14. නීති නිවේදන

පරිසර දූෂණකාරී කර්මාන්ත 50 කට එරෙහිව නීති නිවේදන යවා ඇත.

5.15. ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා

අධිකරණ නියෝගවලට අදාළව අධිකරණයට ඉදිරිපත් කිරීම සහ පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉදිරියේ පවත්වනු ලබන අභියාචන විභාගවලට ඉදිරිපත් කිරීමට නියමිත නිලධාරීන් විසින් කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා රාශියකට නීති අංශයේ අනුමැතිය ලබාදී ඇත.

5.16. දැනුවත් කිරීම

නීති අංශයේ නිලධාරීන් විසින් ජාතික පාරිසරික පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීමට අදාළව විවිධ සංසඳයන්හි දේශන ගණනාවක් පවත්වා ඇත. **තවද නීති අංශයේ නිලධාරීන් වැඩමුළු රාශියකට සහභාගි වී ඇත.**

නීති අංශය විසින් ආරක්ෂණ අමාත්‍යාංශය මහින් ස්ථාපිත පොලිස් පරිසර ආරක්ෂණ ඒකකවල ප්‍රධාන පොලිස් පරීක්ෂක වරුන් දැනුවත් කිරීම සඳහා වැඩසටහනක් මධ්‍යම පරිසර අධිකාරියේ පොලිස් ඒකකය හා එක්ව පවත්වන ලදි.

තවද නීති ශිෂ්‍යයන් සහ අනෙකුත් විශ්ව විද්‍යාල සිසු සිසුවියන්ගේ ඉල්ලීම් අනුව පරිසර නීතිය හා පාරිසරික නියෝගයක් පිළිබඳව දැනුවත් කිරීම් සිදු කරන ලදි.

5.17. මානව හිමිකම් කොමිෂන් සභාවේ විමසීම්

මානව හිමිකම් කොමිෂම මහින් කරනු ලබන පරිසරයට අදාළ කාරණා හා සේවක ගැටළු සම්බන්ධ විමසීම් කිහිපයකට නීති අංශයේ නිලධාරීන් සහභාගිවී ඇති අතර අවශ්‍ය වාර්තා ලබාදීමට කටයුතු කර ඇත.

5.18. ජාතක පාරිසරික පනත සංශෝධනය කිරීම්

"Polluter Pays` මූලධර්මය වැනි නව නෛතික මූලධර්ම ජාතික පාරිසරික පනතට හඳුන්වාදීමේ අරමුණින් සහ පවතින නීතියේ දුර්වලතා මහහැරීමේ අපෙක්ෂාවෙන් ජාතික පරිසරික පනත සංශෝධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නීති අංශය මහින් ගෙන ඇති අතර ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මූලික සංශෝධිත පාරිසරික පනතේ මූලික කෙටුම්පත සකස් කර ලදුව නීතිපති දෙපාර්තමේන්තුව මහින් අනුමත කරන ලද එකී ජාතික පාරිසරික පනතේ සංශෝධිත කෙටුම්පත, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව මහින් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත. එය අදහස් හා යෝජනා සහිතව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යැවීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය මහින් පරිසර අමාත්‍යාංශය වෙත යවා ඇත.

6.0 පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය

දැක්ම

සමාජයේ විවිධ ඉලක්කගත කණ්ඩායම් සඳහා කොටස් සඳහා අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අරමුණු ඇතිව ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වයත් සුවදායී පරිසරයක් සුකීම සහ ඇති කිරීම වෙනුවෙනි.

සමාජයේ වෙසෙන ජනතාව දැනුවත් කිරීම හා අධ්‍යාපනය දීම මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශයේ යුතුකමකි. ඒ සඳහා ඔවුන්ගේ ක්‍රියාකාරී මැදිහත් වීම පරිසරය සුරැකීම පරිසර හිතකාමී කළමනාකාරීත්ව මැදිහත් වීම ඉවහල් වේ. මෙම කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීමට සමාජයේ විවිධ කොටස් සඳහා පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශය පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. හාරකාර අරමුදල් ප්‍රතිපාදන මේ සඳහා යොදා ගනී.

6.1. ප්‍රාථමික පාසල් වැඩසටහන් (ශ්‍රේණි 1-5 ළමා පරිසර සමාජ වැඩ සටහන්)

ළමා පරිසර සමාජ පාසල් සිසුන් අතර හඳුන්වා දෙන ලද්දේ ඔවුන්ගේ අගයන් ආකල්ප හා මතවාදයන් වෙනස් කිරීම වෙනුවෙනි. මෙම පරිසර සමාජ ශ්‍රේණි 1-5 දක්වා සිසුන්ගෙන් සමන්විතය. මෙම පරිසර සමාජ ශ්‍රේණි 1-5 දක්වා සිසුන්ගෙන් සමන්විතය.

පහත ක්‍රියාවන් මෙම වැඩසටහනට ඇතුලත්ය

I. පරිසර සමාජ ලියාපදිංචිය
II. පදක්කම් ප්‍රදානය
III. ඇගයීම් වැඩසටහන්
IV. ගුරුවරුන් සහ ප්‍රාදේශීය පරිසර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්
V. ගුරු අත්පොත ගුරුවරුන් අතර බෙදා දීම

6.1.1. පරිසර සමාජ ලියාපදිංචිය

පරිසර සමාජ පරසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය යටතේ ලියාපදිංචි කිරීම. 2011 වර්ෂය සඳහා පරිසර සමාජ 12 ක් ලියාපදිංචි වී ඇත.

6.1.2. පදක්කම් ප්‍රදානය

පදක්කම් ප්‍රදානය - ප්‍රාථමික වැඩ සටහනේ පදක්කම් ප්‍රධානය ප්‍රාථමික අංශයේ ක්‍රියාකාරීත්වයන් යටතේ ප්‍රදානය මේ වැඩසටහන යටතේ පදක්කම් හා සහතික 8986 ළමුන් සඳහා ඔවුන්ගේ පරිසර හිතකාමී ක්‍රියා වෙනුවෙන් ප්‍රධානය කරන ලදී.

2011 වර්ෂය සඳහා ප්‍රදානය කරන ලද පදක්කම් විස්තර මෙසේය.

අවුරුද්ද	තුරුලතා	විහග	සොබා	සහතික
2011	3722	2964	2300	102

6.1.3. පරිසර සමාජ අමුද්‍රව්‍ය නිෂ්පාදනය

2011 වර්ෂය සඳහා පරිසර සමාජ වැඩසටහන සඳහා නිපදවන ලද අමුද්‍රව්‍ය මෙසේය

අවුරුද්ද	තුරුලතා	විහග	අත් පොත්
2011	6600	6600	5000

6.2. ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය වැඩි දියුණු කිරීම

6.2.1. මාධ්‍ය ආවරණය

මධ්‍යම පරිසර අධිකාරියේ අරමුණු අතර ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය ව්‍යාපෘති වැඩසටහන් සහ අවස්ථාවලට ඉඩ සලසයි. 2011 වර්ෂය සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය ඒකකය මෙවැනි අවස්ථා 99 ක් ආවරණය කරන ලදී.

6.3. මාධ්‍ය වැඩසටහන්

පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධය සමාජයේ විවිධ කොටස් සඳහා පාරිසරික මතයන් දුරු කිරීමට යොදා ගනී.

6.3.1. ඉලෙක්ට්‍රෝනික මාධ්‍ය - රූපවාහිනී වැඩසටහන්

සොබා කෙත හා ශ්‍රීන් මහත්තයා පවතින පාරිසරික ගැටළු මහජනයා අතර සාර්ථකව ගෙන යාමට ප්‍රබල විද්‍යුත් මාධ්‍යක් වේ.

සොබා කෙත රූපවාහිනී වැඩසටහන

සොබා කෙත රූපවාහිනී වැඩසටහන 4 වන බදාදා රූපවාහිනියෙන් විසුරුවා හරී 2011 වර්ෂය සඳහා වැඩසටහන් 13 ක් විසුරුවා හරින ලදී.

ශ්‍රීන් මහත්තයා රූපවාහිනී වැඩ සටහන

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය විසින් විකාශනය වන ශ්‍රීන් මහත්තයා ප්‍රහසන වැඩ සටහන කාලීන මාතෘකා යටතේ ශ්‍රී ලාංකික සමාජයේ ඉතා බලවත් රූපමය මාධ්‍යකි. 2011 වර්ෂයේ කොටස් 36 ක් ශ්‍රීන් මහත්තයා රූපවාහිනී වැඩසටහන විකාශනය විය.

ගුවන් විදුලි පණිවිඩ

2012 වර්ෂය වෙනුවෙන් 2011 වර්ෂය සඳහා ගුවන් විදුල පණිවිඩ දෙකක් නිෂ්පාදනය කරන ලදී.

6.4. මුද්‍රිත මාධ්‍යය

මුද්‍රිත මාධ්‍යය වශයෙන් කාර්තු හතර සඳහා දිස්ත්‍රික් පරිසර නියම පුවත්පත පෝස්ටර් හා අත්පත්‍රිකා ඇතුළු ද්‍රව්‍ය නිර්මාණය කරන අතර ඒවා ආයතන විශ්ව විද්‍යාල සහ පාසල් අතර හුවමාරු කරන ලදී.

6.4.1. පරිසර පුවත් ලිපි

පරිසර නියමු පුවත් පත ජාතික මට්ටමින් භාරකාර මුදල් මගින් පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය මගින් පරිසර නියමු පුවත් පත මුද්‍රණය කරන ලදී.

2011 වර්ෂය සඳහා මෙම පුවත් පත සයමාසික සඟරාවක් වශයෙන් මුද්‍රණය කිරීමට නියමිතය. මේ හේතුවෙන් පිටපත් 5000 මුද්‍රණය සඳහා මුද්‍රණ කරුවනට පුවත් සහ විශේෂාංග භාරදෙන ලදී.

6.4.2. මාධ්‍ය සඳහා පුවත් සහ ලිපි සැකසීම

මාධ්‍ය සමාජය වෙත පණිවිඩ ගෙනයාම බොහෝ සේ සිදුවේ. මධ්‍යම පරිසර අධිකාරියේ පුවත් සහ ලිපි එහි ක්‍රියාදාමය බොහෝ සෙයින් ගුවන් විදුලිය රූපවාහිනිය හා පුවත් පත් ඇසුරින් ක්‍රියාත්මක වේ. මේ සම්බන්ධයෙන් තොරතුරු මාධ්‍ය සඳහා පත්‍රය මුද්‍රණය හා රූපවාහිනිය මගින් විකාශය වේ.

පත්‍ර සඳහා	පත්‍ර ලිපි	රූපවාහිනී පුවත්
85	46	09

6.4.3. අධ්‍යාපන මෙවලම් - අත් පත්‍රිකා

සමාජයේ එදිනෙදා ඇති වන සාමාජීය ප්‍රශ්න සම්බන්ධයෙන් පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශයේ වාර්ෂිකව අත් පත්‍රිකා නිෂ්පාදනය කර බෙදා හරී. 2011 වර්ෂයේ දී වර්තමාන අභියෝගයන් අත්පත්‍රිකා පහත සඳහන් මාතෘකා ඔස්සේ පාසැල්, විශ්ව විද්‍යාල හා අනෙකුත් ආයතන වෙත ඔවුන්ගේ අවශ්‍යතාවය මත මුද්‍රණය කර බෙදා හරී.

මාතෘකාව		2011 පිටපත් සංඛ්‍යාව
01	දේශගුණික විපර්යාස හා විකාශය	1500
02	මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදුවන පරිසර බලපෑම්	1500
03	ජෛව විවිධත්වය	1500

6.5. මාධ්‍ය හමුව සංවිධානය කිරීම.

මධ්‍යම පරිසර අධිකාරියේ විස්තර බෙදා හැරීමට මාධ්‍ය හමුවක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඇති කරන ලදී. 2011 වර්ෂයේ එවැනි මාධ්‍ය හමුවන් දෙකක් වඩාත් පුළුල්ව දැන ගැනීම සඳහා පවත්වන ලදී

6.6. විරිඳු වැඩසටහන

ගීත ගායනා වැඩ සටහන විරිඳු තරගය සමාජය හා පාසැල් ළමුන්ගේ පාරිසරික තේමා ඔස්සේ යෝජිතය එමගින් ඉතාමත් හොඳ රචනාව තෝරා ගනී.

6.7. ප්‍රදර්ශන

6.7.1. ප්‍රදර්ශණ සඳහා සහභාගී වීම

පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය මගින් එදිනෙදා සිදුවන පාරිසරික බලපෑම් පිළිබඳව ප්‍රදර්ශණ ඒකකය අවධානය යොමු කරයි . මධ්‍යම පරිසර අධිකාරිය ප්‍රදර්ශන 12 ක් සඳහා ජාතික හා දේශීය මට්ටමින් සහභාගී වේ.

I. EDEX අධ්‍යාපනික ප්‍රදර්ශනය (බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව)
II. දැයට කිරුල ජාතික ප්‍රදර්ශනය
III. ශාන්ති මේරි විද්‍යාලයේ විද්‍යාව හා වෛද්‍ය ප්‍රදර්ශනය
IV. වෛද්‍ය ප්‍රදර්ශනය වෛද්‍ය පීඨය කැළණිය
V. සංදීපනී මාධ්‍ය හමුව මාධ්‍ය පීඨය කැළණිය විශ්ව විද්‍යාලය
VI. ROYEX ප්‍රදර්ශනය රාජකීය විදුහල
VII. උසස් අධ්‍යාපන ආයතනය, නයිවල
VIII. ශ්‍රී අරුණළු 50 අධ්‍යාපන ප්‍රදර්ශනය මධ්‍යමහා විද්‍යාලය කිරිඳිවැල ගම්පහ
IX. ස්ත්‍රී ප්‍රදර්ශනය බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව
X. පවුල් දිනය වැඩ සටහන බොඩිලයින් කර්මාන්ත ශාලාව
XI. ආබාධිත රණවිරුවන් සඳහා සේවා වනිතා ආයතනය මගින් ජාඇල පොදු ක්‍රීඩාංගණය ප්‍රදර්ශනය

6.7.2. ප්‍රදර්ශන පුවරු සැකසීම

සමාජය දැනුවත් කිරීම සඳහා ප්‍රදර්ශන පුවරු සැකසීම ඉතා බලවත් මාධ්‍යක් වේ. පරිසර දූෂණය කෙසේ සෞඛ්‍ය සඳහා බලපානුයේද යන්න පළාත් කාර්යාල පාසල් හරහා සාකච්ඡා කරනු ලැබේ.

6.7.3. ප්‍රදර්ශන පුවරු නිර්මාණය

ප්‍රදර්ශණය සඳහා පහත මාතෘකා ඔස්සේ ප්‍රදර්ශණ පුවරු 56 ක් සකසන ලදී

- ජෛව විවිධත්වය

- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
- වායු දූෂණය
- කාළගුණය වෙනස්වීම
- පරිසර ඇගයීම් ක්‍රියාවලිය
- පරිසර ආරක්ෂණ බලපත්‍ර
- පරිසර නියමු වැඩ සටහන
- ජලය

6.7.4. බැනර් සැකසීම

බැනර් ප්‍රදර්ශණය සඳහා සකසනු ලැබිය. ප්‍රදර්ශණය සඳහා බැනර් 5ක් සකසනු ලැබිය.

6.8. දිවයින පුරා පරිසර වැඩසටහන් ශක්තිමත් කිරීම

දිවිනැගුම වැඩසටහනට සමගාමීව පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශය ගෙවතු වගා වැඩසටහන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා ගන්නා ලද ගෘහණියන් සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ආශ්‍රයෙන් ඇති කරන ලදී.

ගෘහණියන් සඳහා දැනුවත් කිරීම් හා ප්‍රායෝගික වැඩසටහන්

කොළඹ දිස්ත්‍රික්කයේ දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් ප්‍රායෝගික ගෙවතු වගා ඇති කිරීමේ වැඩ සටහන් ලෙස දියත් කරන ලදී. මේ සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ පහත සඳහන් ප්‍රාදෙශීය ලේකම් කොට්ඨාශ වල ගෙවතු වගා නිර්මාණය කරන ලදී.

- මොරටුව
- හංවැල්ල
- දෙහිවල
- කඩුවෙල
- මහරගම
- හෝමාගම
- පාදුක්ක
- කැස්බෑව
- ශ්‍රී ජයවර්ධනපුර
- අත්තිඩිය



6.9. ජාතික පාරිසරික කඳවුර

ජාතික කඳවුර ජාතික පරිසර අවස්ථාවන් සඳහා පරිසර ක්‍රියාදාමයන් සඳහා පරිසර ව්‍යාපෘති දියත් කරන ලදී.

ලෝක පරිසර දිනය



6.10. කාලීන පාරිසරික ගැටලු සම්බන්ධ ජාතික මට්ටම් දැනුවත් කිරීමේ වැඩසටහන් හා කඳවුරු

දිවයින පුරා දියත් වන උසස් පෙළ සිසුන් සඳහා සිංහල හා දෙමළ මාධ්‍ය රචනා තරඟයක් ඇති කරන ලදී. පින්නවල ජාතික පාසලේදී ජාතික මට්ටමේ ජයග්‍රාහකයන්ට ත්‍යාග පිරිනමන ලදී. දිස්ත්‍රික් මට්ටම් වල ජයග්‍රාහකයන් සඳහා සහතික පත්‍ර හා ත්‍යාගයන් පිරිනමන ලදී.

කාලීන මාතෘකා වැඩසටහන යටතේ දැනුවත් කිරීම්

පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශය කාලීන මාතෘකා ඔස්සේ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. මේ කර්තව්‍ය වෙනුවෙන් ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ඩෙංගු මර්ධන වැඩසටහන

බත්තරමුල්ල උතුර ග්‍රාම නිළධාරී වසමේ එනෙකුත් සංවිධාන වලද සහයෝගය ඇතිව ඩෙංගු මර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.මේ පෙදෙස් වල වසන ජනතාව දැනුවත් කිරීම සඳහා සංවිධාන 125 ක්‍රියාත්මක වීම.එම ආයතන මෙසේය.

- විදේශ සේවා නියුක්ති කාර්යාංශය
- පොල් සංවර්ධන මණ්ඩලය
- සමුපකාර අමාත්‍යාංශය
- කඩුවෙල මහ නගර සභාව
- ජල මණ්ඩලය
- තලංගම ප්‍රාදේශීය රෝහල
- කළාප අධ්‍යාපන කාර්යාලය
- සෞඛ්‍ය දෙපාර්තමේන්තුව



6.11. ප්‍රායෝගික වැඩසටහන් සඳහා අනුගත වීම

සොහා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන 5 ක් ප්‍රායෝගික දැනුම වර්ධනය සඳහා පිහිටවන ලදී. මෙම ඉලක්කයන් සපුරා ගැනීම මෙන්ම ඉතාමත් හොඳ දැන්වත් කිරීමේ වැඩසටහන් කරගෙන යාමට ඉවහල් වේ. දැනුවත් කිරීමේ වැඩ සටහන් සහ ප්‍රායෝගික වැඩ සටහන් ක්ෂේත්‍රය තුල සිදු කිරීමට අවශ්‍ය පහසුකම් මෙම මධ්‍යස්ථාන වලින් ලබා දේ.

බෙල්ලන්විල අත්තිඩිය සොහා ක්ෂේත්‍ර මධ්‍යස්ථානය

විවිධ වැඩසටහන් රාශියක් සොහාකෙත ළමුන්ගේ සමාජය ,පෙර පාසල් සිසුන්, පාසල් සිසුන්, දෙමාපියන් සහ සමාජයේ ජීවත් වන්නන් සඳහා ඔවුන් දැනුවත් කිරීම අධ්‍යාපනය දීම හා පුහුණු කිරීම, පරිසර අවබෝධය දීම වෙනුවෙන් කුරුල්ලන්, පැළෑටි, වගුරු බිම්, මාළුන් හා ජලජ සම්පත්, ජෛව විවිධත්වය,කාබනික වගාව, ඕසෝන් තලය, සංගීතය, නැටුම්, හැකියා වර්ධනය, පිරිවැය කළමණාකරණය , තරු හා ලෝකය, ළමා අයිතීන් ආදී කතිකාවන්ගේන් සමන්විතය.

විශේෂ දින වැඩසටහන් අතර ගස් සිටුවීම, පොසොන් උත්සවය, අවුරුදු උත්සවය, වගුරු බිම් දිනය,ලෝක පරිසර දිනය, ළමා දිනය, ඩෙංගු මර්ධනය, මධ්‍යම පරිසර අධිකාරිය යටතේ ක්‍රියාත්මක වින.

	ඉලක්ක කණ්ඩායම්	වැඩසටහන් ගණන	සහභාගී වන්නන් ගණන
01	සොහාකෙත ළමා සමාජය	01	31
02	ගෘහණියන්	01	56
03	පාසල් සිසුන්	30	2304
04	ක්ෂේත්‍ර පරීක්ෂණ	11	726

6.12. ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය

ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාවේ පාරිසරික තෙරතුරු ලබාදෙන නාහික මධ්‍යස්ථානය වේ. මෙම මධ්‍යස්ථානයේ අරමුණ නම්,

- පාරිසරික තොරතුරු මූලාශ්‍ර සංවිධානය කිරීම මගින් පාඨකයින්ගේ පාරිසරික තොරතුරු අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම.
- පාරිසරික තොරතුරු විශ්ලේෂණය සහ සම්පිණ්ඩනය කිරීම.
- දේශීය, විදේශීය තොරතුරු මධ්‍යස්ථාන හා පුස්තකාල සමඟ තොරතුරු හුවමාරුව හා තොරතුරු බෙදාහැරීම.

2011 වර්ෂයේ පාරිසරික තොරතුරු මධ්‍යස්ථානයේ ප්‍රගතිය පහත පරිදි වේ.

6.12.1. පුස්තකාල එකතුව ගොඩනැගීම

පාරිසරීක පොත් 395 ක් සහ පාරිසරික සඟරා 25 ක් මිලදි ගෙන ඇත. පොත් 4420 ක් පරිහරණය හා වර්ගීකරණය කිරීම සහ දත්ත පදනමට ඇතුලත් කිරීම.

6.12.2. පුස්තකාල ප්‍රකාශන

සඟරා පටුන පිටු ඇතුලත් "සඟරා පරිවර්තනය" කලාප 06ක්, "පාරිසරික පුවත්පත් ලිපි හා සඟරා ලිපි අනුක්‍රමණිකාව" කලාප 04ක්, "පාරිසරික ඇගයීම් වාර්තා/ මූලික පාරිසරික පරීක්ෂණ වාර්තා" අනුක්‍රමණිකාව සහ "ජාතික පාරිසරික පනත සහ නියෝග" අනුක්‍රමණිකාව, 2011 වර්ෂය සඳහා සම්පාදනය කර ඇත.

6.12.3. පාරිසරික තොරතුරු හුවමාරු කිරීම

දේශීය, විදේශීය පුස්තකාල හා වෙනත් සංවිධාන වල තොරතුරු හුවමාරු කර ගැනීම - 1600

පුස්තකාලයට පැමිණ තොරතුරු ලබාගත් පාසැල් සිසුන් හා බාහිර පාඨක සංඛ්‍යාව - 575

මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය මණ්ඩලය 3455 ක පොත් සහ සඟරා භාරදීම සිදුකර ඇත.

6.12.4. අනෙකුත් ක්‍රියාකාරකම්

- ප්‍රගති වාර්තා, මාසික හා කාර්තු වශයෙන් සකස් කිරීම.
- ම.ප.අ. යේ කාර්ය මණ්ඩලයට සාමාජික පත් නිකුත් කිරීම.
- කවුන්සිල් පුස්තකාලයේ සාමාජිකත්වය 2011/2012 ට ලබාගැනීම හා සාමාජිකපත් කාර්යාල මණ්ඩලයට බෙදාහැරීම.
- ප්‍රබන්ධ ලැයිස්තුගත කිරීම හා රාක්කගත කිරීම - 415
- EIA/ IEE වාර්තා සඳහා නව දත්ත පදනමක් සකස් කිරීම.
- CEA Repository වෙබ් අඩවිය නිර්මාණය කිරීම.
- ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානයේ ව්‍යාපෘති වාර්තාව සකස් කිරීම.

ආදායම

පාරිසරික ප්‍රකාශන විකිණීම - 568 (පොත්, පෝස්ටර්, අත්පත්‍රිකා සහ CDs)	රු. 39,830.00
ඡායා පිටපත් ගැනීම - පිටපත් 19362	රු. 86,910.00

7.0. පාරිසරික ආර්ථික සම්බන්ධතා

ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමට අනුබල දීම පාරිසරික ආර්ථික විද්‍යාත්මක මැදිහත් වීම පරිසර කළමනාකරණයට සමෝධානය කිරීම පාරිසරික ආර්ථික සම්බන්ධතාවයි.

ප්‍රධාන වගකීම්

7.1. 2008 අංක 26 දරණ පරිසර සංරක්ෂණ බදු පනත ක්‍රියාත්මක කිරීම.

පරිසර අමාත්‍යාංශය වෙනුවෙන් මෙම ඒකකය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය සමඟ පරිසර බදු පනත ක්‍රියාත්මක කරයි. මෙම පනත පරිසරයට අහිතකර බලපෑම් ඇති කරන භාණ්ඩ හා සේවා මත පරිසර සංරක්ෂණ බදු පැනවීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සපයයි. කෙසේ වුවද එම පනත යටතේ පනවනු ලැබූ විධාන මේ වන විට ක්‍රියාත්මක නොවේ.

ශ්‍රී ලංකාවේ කසළ පොලිතින් සහ ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියේදී තුනී ආහාර දවටන හා සිලි සිලි කවර විශාල ගැටළුවක්ව ඇති හෙයින් එම කසළ ජනනය වන ප්‍රමාණයන් අඩු කර ගැනීමේ අවශ්‍යතාවයක් ඇති බව මධ්‍යම පරිසර අධිකාරිය හඳුනාගෙන ඇත. එබැවින් සිලි කවර පරිභෝජනය පාලනය කිරීමට ඒවා නොමිලයේ නිකුත් කිරීම වලක්වනු පිණිස ඒ මත පරිසර සංරක්ෂණ බද්දක් පැනවීමේ සැලසුමක් සකස් කෙරෙමින් පවතී. මේ සඳහා ව්‍යාපෘති යෝජනාව කෙටුම්පත් කර ඇති අතර මීට අදාල නීති උපදෙස් මේ වන විට ලබාගෙන ඇත.

7.2. 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම

2008 අංක 26 දරණ පරිසර සංරක්ෂණ බදු පනතේ වගන්ති උල්ලංඝනය කිරීමවලට එරෙහිව නීතිමය පියවර ගැනීම, බදු අරමුදල කළමනාකරණය ඇතුළු පරිසර සංරක්ෂණ බදු පනත වඩා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීති ප්‍රතිපාදන සලසා ගැනීමට ජාතික පරිසර පනත සංශෝධනය කෙරේ. එම කෙටුම්පත, නීති කෙටුම්පත්වරයා විසින මධ්‍යම පරිසර අධිකාරිය වෙත අවශ්‍ය කටයුතු සඳහා යොමු කර ඇති අතර එම කටයුතු නීති ඒකකය විසින් මෙහෙයවනු ලැබේ.

7.3. ශ්‍රී ලංකාව තුල පාරිසරික අවශ්‍යතා පිළිබඳ කර්මාන්තකරුවන් සහ ආයෝජකයන් සඳහා වැඩමුළුව

පරිසර කළමනාකරණය පිළිබඳ ව පුහුණු කිරීම මූලික අවශ්‍යතාවයක් ලෙස මධ්‍යම පරිසර අධිකාරිය විසින් හඳුනාගෙන ඇත. මෙහි මූලික පියවරක් ලෙස කර්මාන්තකරුවන් සහ ආයෝජකයන් ශ්‍රී ලංකාවේ පාරිසරිකමය අවශ්‍යතා පිළිබඳව දැනුවත් කිරීමේ අරමුණින් මෙම වැඩමුළුව සංවිධානය කෙරිණි. ව්‍යාපෘතිවල පරිසර බලපෑම් ඇගයීම, කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමේ ක්‍රමවේදය හා පමිණින්, කසළ කළමනාකරණය හා සුපිරිසිදු තාක්ෂණය ආදි විෂයයන් මෙහිදී ආවරණය කෙරිණි.

මෙම වැඩමුළුව 2011 මාර්තු 31 දින පෙ.ව. 8.30 සිට ප.ව. 5.00 තෙක් කොළඹ ගලදාරි හෝටලයේ, ඔකිඩ් ශාලාවේදි සාර්ථකව පැවැත්විණි. වැඩසටහන දේශන හතකින් සමන්විත වූ අතර ඉන් පස්දෙනෙකු මධ්‍යම පරිසර අධිකාරියට පරිබාහිර සම්පත් දායකයින් විය. වැඩමුළුවේ සමස්ත ආදායම රු. 350,000.00 වූ අතර ශුද්ධ ලාභය රු. 147,955.00 ක් විය.

7.4. ආර්ථිකය හරිතකරණය කිරීම යන මැයෙන් පැවැත් වූ සම්මන්ත්‍රණය සංවිධානය කිරීමට දායක වීම.

තිරසාර සංවර්ධනය අත්පත් කර ගැනීමෙහිලා රටක ආර්ථිකය පරිසර හිතකාමී වීම අත්‍යවශ්‍ය සාධකයකි. එබැවින් මධ්‍යම පරිසර අධිකාරියේ 30 වන සංවත්සරය සැමරීම වෙනුවෙන් කාලීන මාතෘකාවක් වන ආර්ථිකය හරිතවත් කිරීම යන මැයෙන් විද්වත් මණ්ඩල සාකච්ඡාවක් සංවිධානය කෙරුණි. මෙම පාරිසරික සම්මන්ත්‍රණය 2011 අගෝස්තු මස 18 වන දින සවස 5 සිට 7 දක්වා බත්තරමුල්ල වෝටර්ස් එජ් හි දී පැවැත්විණි. හරිත ආර්ථිකයක් අත්කර ගැනීමේ උපාය මාර්ග, ක්‍රමවේදයන් හා ප්‍රායෝගික විසඳුම් මෙහිදී සාකච්ඡාවට බඳුන් වූ අතර තිරසාර සංවර්ධනයේ කොටස්කරුවන් අතර තම අදහස් හා අත්දැකීම් හුවමාරුකර ගැනීමද මෙහිදී සිදු විය.

මීට අමතරව පරිසර දූෂණ පාලන ඒකකය සංවිධානය කල හරිත සම්මාන 2011 සංවිධාන කටයුතු සඳහා ද දායකත්වය ලබා දුණි.

8.0. සැලසුම් හා පසුවිපරම් ඒකකය

ජාතික පරිසරික පනත යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ඒ ඒ අංශ සහ ඒකකයන්හි, පළාත් කාර්යාලයන්හි අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි, අවශ්‍ය සැලසුම් සම්පාදනය හා ඒවා ක්‍රියාත්මක කරවීම සැලසුම් හා අධීක්ෂණ ඒකකයේ ප්‍රධාන වගකීම වේ.

රජයේ පාරිසරික ප්‍රතිපත්තීන්ට අදාලව ප්‍රමුඛතාවයන් හඳුනා ගැනීම, වාර්ෂිකව මහා භාණ්ඩාගාරයෙන් සපයන්නා වූ ප්‍රතිපාදන එම ප්‍රමුඛතාවයන් සඳහා යෙදවීම, පරිසර අංශය තුල වූ පුද්ගලික අංශයට අදාල ප්‍රමුඛතාවන් හඳුනා ගැනීම සහ විදේශ අධාර කාර්යක්ෂම ලෙස යෙදවීම මෙම ඒකකය මගින් නිසි පරිදි සිදු කෙරේ.

පරිසර අංශයෙන් ප්‍රමුඛතා ක්ෂේත්‍ර සඳහා සම්පාදනය කරන ලද ක්‍රියාකාරී සැලසුම් මධ්‍යම රජයේ ආයතනයක් ලෙස ප්‍රධාන කාර්යාලය මගින් ද, ප්‍රාදේශීය වශයෙන් ප්‍රාදේශීය කාර්යාල හරහා සාර්ථක ලෙස ක්‍රියාත්මක කරවීමට මෙම අංශයට හැකිවිය.

මෙම ඒකකය මගින් සැලසුම් ක්‍රියාවලියට අනුකූලව විවිධ ක්‍රියාකාරී සැලසුම්, අධීක්ෂණ සැලසුම්, කාලීන ක්‍රියාකාරී සැලසුම් සම්පාදනය හා ඒවා සම්බන්ධීකරණය කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම සිදු කරන අතර විවිධ ආයතනයන්ට අවශ්‍ය ප්‍රගති වාර්තා නියමිත දිනයන්ට සකස් කර ඉදිරිපත් කරනු ඇත.

අධිකාරිය මගින් සිදු කරන ක්‍රියාකාරකම් ක්‍රමානුකූලව සම්බන්ධීකරණය, අධීක්ෂණය, ඒ ඒ විෂයානුබද්ධ සහ ප්‍රාදේශීය වශයෙන් පවතින ගැටළු/ ප්‍රශ්න සාකච්ඡා කිරීම සඳහා කළමණාකාරීත්වය සහ ප්‍රාදේශිය කාර්යාල සමඟ මාසික රැස්වීම් ද සංවිධානය කරනු ඇත. මෙමගින් සැලසුම් නිසිලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහාය ලබාදීමට මෙම අංශයට හැකි විය.

8.1. සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීම

මහා භාණ්ඩාගාරයෙන් නිකුත් කරන ලද යහපාලන ගුරු උපදෙස් අනුව සියළුම ව්‍යවස්ථාපිත මණ්ඩල තමන්ගේ ඉදිරි දැක්ම ඇතුලත් උපාය මාර්ග අන්තර්ගත කරන ලද සංයුක්ත සැලැස්මක් තිබිය යුතුය.

ඒ අනුව, ජාතික පාරිසරික පනත අනුව නාමාන ආයතනයක් වන මධ්‍යම පරිසර අධිකාරිය 2008 - 2012 දක්වා කාලය සඳහා වූ සංයුක්ත සැලැස්ම පිළියෙල කරන ලදි.

මෙම සංයුක්ත සැලැස්ම පරිසර අංශයට වඩා ඵලදායක ලෙස නව කර්තව්‍යයන් හා ඉලක්ක ඇතුලත් කරමින් 2010 වසරේ යාවත්කාලීන කරන ලද අතර, ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදි.

8.2. පළාත් කාර්යාල සමඟ සම්බන්ධීකරණය

මධ්‍යම පරිසර අධිකාරියේ කටයුතු විමධ්‍යගත කිරීමේ අරමුණෙන් පරිසරයේ ගුණාත්මක බව ආරක්ෂා කිරීම, පරිසර දූෂණ වැලැක්වීම, පාලනය සහ අවම කිරීම සඳහා ප්‍රමාණවත් බලතල ලබා දෙමින් ප්‍රදේශීය පරිසර කළමණාකරණය උදෙසා පළාත් කාර්යාල පිහිටුවා ඇත.

මෙම පළාත් කාර්යාල මගින් ප්‍රදේශීය වශයෙන් වූ රාජ්‍ය ආයතන, ව්‍යාපාරයන්, කර්මාන්තකරුවන්, රාජ්‍ය නොවන සංවිධාන ප්‍රජා මූලික සංවිධාන සහ පොදු මහජනතාව ආදී පුළුල් කොටස්කරුවන් සංඛ්‍යාවක් සඳහා පරිසර කළමනාකරණය ආශ්‍රිත සේවාවන් සපයන ලැබේ.

එයට අමතරව, ප්‍රාදේශිය කාර්යාල සඳහා වූ ක්‍රියාත්මක සැලසුම් සම්පාදනය, පරිසරය සුරකීමට අදාල ව්‍යාපෘති යෝජනා කැඳවීම සහ ඒවා ක්‍රියාත්මක කරවීම, සම්බන්ධීකරණය මෙම ඒකකය මගින් සිදුකෙරේ.

දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් කාර්යාල පිහිටුවීමේ ප්‍රාදේශීය ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම පිණිස මධ්‍යම පරිසර අධිකාරිය මගින් තෝරාගත් දිස්ත්‍රික්ක කීපයක දිස්ත්‍රික් කාර්යාල පිහිටු විය. දිස්ත්‍රික් පරිසර නිලධාරීන් විසින් පලාත් පාලන ආයතන, අදාල ආයතන සමඟ ක්‍රියාත්මක කරන්නාවූ වැඩසටහන් සම්බන්ධීකරණය සහ අධීක්ෂණය දිස්ත්‍රික් කාර්යාල පිහිටුවීමේ මූලික අරමුණ විය.

දැනට අම්පාර, මඩකලපුව, හම්බන්තොට, නුවරඑළිය, රත්නපුර, ගම්පහ සහ කළුතර ඇතුළුව දිස්ත්‍රික් කාර්යාල 07 ස්ථාපිත කර ඇත.

8.3. ව්‍යාපෘති සම්බන්ධීකරණය අධීක්ෂණය සහ ඇගයීම

මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන සහ විදේශ ආධාර නිසි පරිදි භාවිතා කිරීම හා ඉන් බලාපොරොත්තු වූ ඉලක්ක සපුරා ගැනීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති / වැඩ සටහන් සැලසුම්කරණය හා සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය මගින් සිදු කෙරේ.

මහා භාණ්ඩාගාර අරමුදල් මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති

- පිළිසරු ව්‍යාපෘතිය (රු.මි. 637.3)
- පසුගාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය (රු. මි. 100)
- ලංකාවේ පරිසර දූෂකාරක කර්මාන්ත සඳහා දත්ත පද්ධතියක් සැකසීම (රු.මි. 1.5)
- පරිසර නියමු වැඩ සටහන (රු. මි. 5)
- ලංකාවේ ගංගා කීපයක ජල තත්ව පසුවිපරම් කිරීමේ වැඩ සටහන (රු.මි. 0.5)

විදේශාධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති

- KOICA (රු.මි. 21)

8.4. පැමිණිලි ඒකකය

මධ්‍යම පරිසර අධිකාරියට ලැබෙන මහජන පැමිණිලි පිළිබඳ විධිමත් ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණින් 2007 වර්ෂයේ නොවැම්බර් මාසයේදී පරිසර පැමිණිලි ඒකකය ආරම්භ කරන ලදි.

පහත සඳහන් මාර්ග ඔස්සේ පැමිණිලි විශාල සංඛ්‍යාවක් දෛනිකව පැමිණිලි ඒකකය වෙත ලැබේ.

- පරිසර අමාත්‍යාංශයේ හදිසි දුරකථන ඇමතුම් ඔස්සේ ලැබෙන පැමිණිලි
- මධ්‍යම පරිසර අධිකාරියේ හදිසි දුරකථන ඇමතුම් ඔස්සේ ලැබෙන පැමිණිලි
- සභාපති කාර්යාලය වෙත ලැබෙන පැමිණිලි
- අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය වෙත ලැබෙන පැමිණිලි
- අංශ ප්‍රධානීන් වෙත ලැබෙන පැමිණිලි
- පරිසර අමාත්‍යතුමාගේ මහජන දිනයේදී ලැබෙන පැමිණිලි
- මහජනතාව එදිනෙදා පැමිණ කරන පැමිණිලි
- තැපැල් මගින් දෛනිකව ලැබෙන පැමිණිලි

පැමිණිලි ඒකකය වෙත පැමිණිලි ලැබුණු විට ඒ එක් එක් පැමිණිල්ලක් සඳහාම ලියාපදිංචි අංකයක් ලබාදී ඒවා ලියාපදිංචි කර අදාළ ආයතන වෙත යොමු කරනු ලැබේ.

මෙම පැමිණිලි වලින් බොහොමයක් ජාතික පාරිසරික පනතේ වගන්තීන් උල්ලංඝනය කරන ඒවාය.

එම පැමිණිලි මධ්‍යම පරිසර අධිකාරියේ අදාළ ඒකක හෝ පළාත් කාර්යාලවල නිලධාරීන් මගින් පරීක්ෂා කර විසඳුම් ලබාදීමට කටයුතු කරනු ඇත.

පාරිසරික පනතට අදාළ නොවන පැමිණිලි අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ පළාත් පාලන ආයතන, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වැනි ආයතන වෙත යොමුකරනු ඇත.

2011 වර්ෂයේ මෙම ඒකකය වෙත ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 1960 කි. එය පහත සඳහන් පරිදි අවශ්‍ය කටයුතු සඳහා අදාළ ආයතන වෙත යොමු කර ඇත.

	අදාළ ආයතන	පැමිණිලි ගණන
1.	කොළඹ දිස්ත්‍රික් කාර්යාලය ම.ප.අ.	364
2.	ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය ම.ප.අ.	233
3.	කළුතර දිස්ත්‍රික් කාර්යාලය ම.ප.අ.	78
4.	පරිසර බලපෑම් ඇගයීම් ඒකකය ම.ප.අ.	01
5.	ස්වභාවික සම්පත් කළමනාකරණ හා මෙහෙයුම් ඒකකය ම.ප.අ.	04
6.	ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය, ම.ප.අ.	08

	අදාළ ආයතන	පැමිණිලි ගණන
7.	පරිසර දූෂණ පාලන අංශය, ම.ප.අ.	31
8.	නීති ඒකකය, ම.ප.අ.	01
9.	පොලිස් ඒකකය, ම.ප.අ.	47
10.	අම්පාර දිස්ත්‍රික් කාර්යාලය, ම.ප.අ.	38
11.	මඩකලපුව දිස්ත්‍රික් කාර්යාලය, ම.ප.අ.	10
12.	මධ්‍යම පළාත් කාර්යාලය, ම.ප.අ.	137
13.	නැගෙනහිර පළාත් කාර්යාලය, ම.ප.අ.	18
14.	හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය, ම.ප.අ.	32
15.	මාතර දිස්ත්‍රික් කාර්යාලය, ම.ප.අ.	59
16.	උතුරුමැද පළාත් කාර්යාලය, ම.ප.අ.	79
17.	වයඹ පළාත් කාර්යාලය, ම.ප.අ.	133
18.	සබරගමුව පළාත් කාර්යාලය, ම.ප.අ.	100
19.	දකුණු පළාත් කාර්යාලය, ම.ප.අ.	94
20.	ඌව පළාත් කාර්යාලය, ම.ප.අ.	50
21.	අදාළ පළාත් පාලන ආයතන	312
22.	ඉඩම් ගොඩ කිරීම් හා සංවර්ධනය කිරීමේ සංස්ථාව	12
23.	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය	19
24.	විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව	01
25.	වෙනත් අදාළ ආයතන	99
	එකතුව	**1960**

9.0. මධ්‍යම පරිසර අධිකාරියේ විමධ්‍යගතකරණ වැඩ පිළිවෙල

9.1. මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල වෙත බලතල විමධ්‍යගත කිරීම

මධ්‍යම පරිසර අධිකාරිය ප්‍රධාන කාර්යාලය වශයෙන්, ජාතික ප්‍රමිතීන්, මිනුම් දඩු ප්‍රකාශයට පත් කිරීම හා අවශ්‍ය මාර්ගෝපදේශ පිළියෙල කිරීම ජාතික වශයෙන් සිදු කරන අතර ප්‍රාදේශීය වශයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා 2002 වසරේ දී මධ්‍යම හා දකුණු පළාත සඳහා ප්‍රාදේශීය කාර්යාල දෙකක් පිහිටුවිය.

2002 වසරේ එසේ ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීමෙන් ලබා ගන්නා ලද අත්දැකීම මත එම වැඩපිළිවෙල මුළු දිවයින පුරා ව්‍යාප්ත කරන ලද අතර, 2007 වසර වන විට වයඹ පළාත තුල හැර අනෙක් සියළුම පළාත් පාදක කොට ගෙන පළාත් කාර්යාල පිහිටුවා, පරිසර කළමනාකරණය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ ක්‍රියාත්මක වැඩපිළිවෙලක් ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාවට නංවා ඇත.

ඒ අනුව, ජාතික පාරිසරික පනත යටතේ පැවරී ඇති බලතල වලින් කොටසක් මෙම පළාත් කාර්යාල ප්‍රධානීන් වෙත මධ්‍යම පරිසර අධිකාරිය වෙතුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා පවරන ලදි.

9.2. පළාත් පාලන ආයතන වෙත බලතල විමධ්‍යගත කිරීම

උප ප්‍රාදේශීය මට්ටමෙන් මධ්‍යම පරිසර අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බලය පවරාදීමේ වගන්ති ජාතික පාරිසරික පනත මඟින් සම්පාදනය කොට ඇත.

ඒ අනුව, එකී පනතේ 26 වන වගන්තිය අනුව, මධ්‍යම පරිසර අධිකාරිය සතු බලතල, කාර්යය හෝ කර්තව්‍යය කිසිවක් ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකට, සංස්ථාවකට, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට පළාත් පාලන ආයතනයකට හෝ රජයේ යම් නිලධාරියෙකුට පවරා දෙනු ලැබිය හැකිය. 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතින් පවරා ඇති බලතල අනුව අධිකාරියේ කටයුතු ප්‍රාදේශීය මට්ටමින් විමධ්‍යගත කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත.

මෙම වගන්තිය අනුව 1993 වසරේ දී මධ්‍යම පරිසර අධිකාරියේ බලතලවලින් යම් කොටසක් පළාත් පාලන ආයතනවලට පවරාදීමේ මූලික කටයුතු සිදුකරන ලද අතර, 1994.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි සුළු පරිමාණ කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලතල හා තවත් කටයුතු 12 ක් සඳහා බලතල පළාත් පාලන ආයතන වෙත එනම් මහ නගර සභා, නගර සභා හෝ ප්‍රාදේශීය සභා වෙත පවරන ලදි.

1993 වසරේ දී සුළු පරිමාණ කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා විමධ්‍යගත කරන ලද බලතල නැවත පවරාගෙන, 2000 අංක 53 දරන සංශෝධිත පනතින් ප්‍රකාශයට පත් කරන ලද, 1159/22 දරන ගැසට් නිවේදනයට අනුව එම ගැසට්

නිවේදනයේ 'ආ' ඛාණ්ඩයට අයත් කර්මාන්ත/ කටයුතු 45 ක් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලතල එම පළාත් පාලන ආයතන වෙත පවරා දෙන ලදි.

ඉන්පසු, නැවතත් අංක 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයෙන් බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නියමිත කටයුතු 'අ', 'ආ' සහ 'ඇ' වශයෙන් බාණ්ඩ 3 ක් යටතේ ප්‍රකාශයට පත් කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස 2008 පෙබරවාරි 14 දින පළාත් පාලන ආයතන වෙත පවරා තිබූ බලතල නැවතත් මධ්‍යම පරිසර අධිකාරියට පවරා ගන්නා ලද අතර, 2008.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත ගැසට් නිවේදනයේ 'ආ' බාණ්ඩයට අයත් නියමිත කටයුතු සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලතල නැවතත් පළාත් පාලන ආයතන වලට පවරා දෙන ලද අතර, එම ආයතන ඒ අනුව කටයුතු කරන ලදි.

9.3. දිස්ත්‍රික් පාරිසරික නීති බලගැන්වීම් කමිටුව (DELEC)

1995 වසරේ දී දිස්ත්‍රික් පාරිසරික නීති බලගැන්වීමේ කමිටුව නමින් කමිටු සෑම දිස්ත්‍රික්කයක් පාසාම පිහිටුවීමේ පරිපාලනමය ක්‍රමයක් ක්‍රියාවට නංවන ලද අතර, මෙම කමිටුවේ සභාපති වශයෙන් අදාල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කටයුතු කරයි.

මෙම කමිටුවේ අනිකුත් සාමාජිකයන් වනුයේ ;

- සෞඛ්‍ය සේවා පළාත් අධ්‍යක්ෂ
- ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී
- දිසා වන නිලධාරී
  පළාත් පාලන සහකාර කොමසාරිස්
- වනජීවී දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ප්‍රධානී
- දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරු
- එම පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන ප්‍රධානීන්
- එම පරිපාලන දිස්තික්කයේ රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින්
  මෙම කමිටුවේ ලේකම් වශයෙන් ප්‍රාදේශීය පරිසර නිලධාරියෙක් කටයුතු කරනු ඇත.
  එසේම අවශ්‍යතාවය මත මෙම කමිටුව සඳහා වෙනත් සාමාජිකයන් හා නියෝජිතයන් පත් කල හැකිය.

මෙම කමිටුවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ, මහජනයාගෙන් ලැබෙන්නා වූ පාරිසරික වැරදි හෝ අක්‍රමිකතා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කර, ඊට අදාල ක්‍රියාත්මක කළ යුතු නිර්දේශයන් අදාල ආයතන වන පොලිසිය, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ පළාත් පාලන ආයතන ලවා සිදුකරවීමය

මෙම කමිටුවේ මූලික කර්තව්‍යය වනුයේ, මහජනයාගෙන් ලැබෙන්නා වූ පාරිසරික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීමය.

10. මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීයකරණ වැඩපිළිවෙල

10.1. හැඳින්වීම

මධ්‍යම පරිසර අධිකාරිය ජාතික පාරිසරික පනත යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි පළාත් කාර්යාල 08 ක් පිහිටුවා එම පළාත් කාර්යාලවලින් පාරිසරික කළමනාකරණය හා ආරක්ෂාව සඳහා වූ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. (1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ වයඹ පළාතේ පළාත් පරිසර අධිකාරියක් වෙනම පිහිටුවා පවත්වාගෙන යනු ලැබේ.)

2011 වසර වන විට මධ්‍යම පරිසර අධිකාරිය යටතේ පවත්වාගෙන යන පළාත් කාර්යාල පහත පරිදි වේ.

බස්නාහිර පළාත් කාර්යාලය
මධ්‍යම පළාත් කාර්යාලය
දකුණු පළාත් කාර්යාලය
නැගෙනහිර පළාත් කාර්යාලය
උතුරුමැද පළාත් කාර්යාලය
උතුරු පළාත් කාර්යාලය
සබරගමුව පළාත් කාර්යාලය
ඌව පළාත් කාර්යාලය

ගතවූ වසර තුලදී ඉහත දැක්වෙන පළාත කාර්යාලයන් වෙත පවරා දී ඇති කර්තව්‍යයන් කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා මෙම කාර්යාල ඉමහත් ප්‍රයත්නයක් ගන්නා ලදි. මෙම කාර්යාල අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය මත ඒ ඒ අංශයන්හි නාක්ෂණික උපදෙස් මත ක්‍රියාත්මක වේ.

වයඹ පළාත තුල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, පරිසර අධ්‍යාපන හා දැනුවත් කරීම් ආදිය පවත්වාගෙන යාමේ හා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අරමුණින් වයඹ පළාතේ ද ප්‍රාදේශීය කාර්යාලයක් ස්ථාපනය කරන ලදි. මෙම ප්‍රාදේශීය කාර්යාලයෙන් වෙනත් පළාත් වල මෙන් ජාතික පාරිසරික පනතේ නියාමන කටයුතු සිදු නොවේ.

වයඹ පළාත් කාර්යාලයෙන් පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වේ.

- මහජනතාවට ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සමීප සේවාවක් ලබාදීම
- නිසි පරිදි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමෙන් සෞඛ්‍යදායී හා පිරිසිදු පරිසරයක් පවත්වාගෙන යාම
- ප්‍රදේශයේ පරිසර හිතකාමී ජනතාවක් ඇති කිරීම
- පරිසරය පිළිබඳ උද්යෝගිමත් කණ්ඩායම් ඇති කිරීම
- පරිසර හිතකාමී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් පරිසරයේ ගුණාත්මක තත්වය නංවාලීම
- පරිසරය සම්බන්ධ මහජන ගැටළු විසඳීම

10.2. පළාත් කාර්යාලවල කාර්යභාරය

මෙම පළාත් කාර්යාල තම බල ප්‍රදේශය තුල පරිපාලනමය කටයුතු හා පාරිසරික කටයුතු වශයෙන් තම කාර්යයන් ගොඩ නැංවීම සිදු කරන ලදි.

10.2.1. පරිපාලනමය කටයුතු

(අ) කාර්යාලයේ සාමාන්‍ය පරිපාලනමය කටයුතු
(ආ) පළාත් කාර්යාලයට අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලයේ පරිපාලනමය කටයුතු
(ඇ) ප්‍රාදේශීය පරිසර නිලධාරීන්ගේ පරිපාලනමය කටයුතු
(ඈ) මානව සම්පත් සංවර්ධන කටයුතු
(ඉ) පළාත් කාර්යාල ස්ථාපනය කිරීමේ සාමාන්‍ය කටයුතු
(ඊ) මූල්‍යමය කටයුතු
(උ) ප්‍රාදේශීය වශයෙන් මධ්‍යම පරිසර අධිකාරිය නියෝජනය කරමින් රැස්වීම්වලට සහභාගී වීම

10.2.2. පාරිසරික කටයුතු

(අ) පාරිසරික ආරක්ෂාව

- පරිසර දූෂණ පාලනය
  (කාර්මික අපද්‍රව්‍ය, ඝණඅපද්‍රව්‍ය, වායු විමෝචනය, ශබ්ද දූෂණය පාලනය කිරීම ආදී වශයෙන්)
- පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම
- නව කර්මාන්ත සඳහා ස්ථානීය නිර්දේශ නිකුත් කිරීම
- පාරිසරික කටයුතු සම්බන්ධයෙන් ලැබෙන්නා වූ මහජන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීම
- පළාත් පාලන ආයතන වෙත බලය පවරන ලද පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම
- පාරිසරික නීති කඩකරන්නන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම

(ආ) පාරිසරික කළමනාකරණය

- ස්වභාවික සම්පත් කළමනාකරණය
- මූලික පාරිසරික පරීක්ෂණ කටයුතු (IEE)
- පරිසර බලපෑම් ඇගයීම් නිර්දේශ කරන ලද ව්‍යාපෘතීන් අධීක්ෂණය කිරීම
- පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලියට යටත් නොවන ව්‍යාපෘතීන් සඳහා ස්ථානීය නිර්දේශ ඉදිරිපත් කිරීම

(ඇ) පාරිසරික අධ්‍යාපනය හා දැනුවත් කිරීම්

- පාසල් පරිසර නියමු වැඩ සටහන ශක්තිමත් කිරීම
- මහජනයා, රාජ්‍ය නොවන ආයතන, ප්‍රජා සංවිධාන සහ කර්මාන්තකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම සංවිධානය කිරීම
- පාරිසරික ප්‍රදර්ශන පැවැත්වීම/ සංවිධානය කිරීම

10.3. පළාත් කාර්යාලයන්හි කාර්ය සාධනය

10.3.1. පාරිසරික ආරක්ෂණය

10.3.1.1. පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය

පළාත් කාර්යාල වෙත පවරා ඇති බලතල අතරින් ප්‍රධානතම නෛතික ක්‍රියාවලිය වනුයේ අංක 1533/16 දරන ගැසට් නිවේදනය යටතේ ප්‍රකාශයට පත් කරන ලද නියමිත කටයුතු සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය වේ. මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී ජාතික වශයෙන් පනවා ඇති, අපද්‍රව්‍ය පිටකිරීම සඳහා වූ ප්‍රමිතීන් හා උපමාන, වායු විමෝචන හා ශබ්ද මට්ටම් අනුව ක්‍රියාත්මක කිරීම තුලින් පාරිසරික ආරක්ෂාව මෙම බලපත්‍ර ක්‍රමය තුලින් තහවුරු කෙරේ.

වර්තමානය දෙස බැලීමේ දී පෙනීයන්නේ මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රමය හඳුන්වාදීමට ප්‍රථම එනම්, මීට දශක දෙකකට හෝ තුනකට පෙර ස්ථානගත කරන ලද කර්මාන්ත වලින් විශාල වශයෙන් පාරිසරික ගැටළු ඇති වී තිබෙන බවය. එමෙන්ම, මෙම කර්මාන්තවලින් ජනනය වූ අපදියර හෝ අපද්‍රව්‍ය කිසිදු ප්‍රතිකර්මයකට යටත් නොකර නිදහසේ පරිසරයට මුදාහැර ඇති බව නිරීක්ෂණය වී ඇත. සමහර ජල ප්‍රභවයන්හි බීමට ජලය ලබා ගන්නා වූ ස්ථානයන් ආසන්නයේ ද කැලි කසල බැහැර කර තිබූ බව බොහෝ අවස්ථාවලදී නිරීක්ෂණය වී ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් මහජනතාවගේ නෑම, සේදීම වැනි අවශ්‍යතාවන් උදෙසා ජලය ලබාගැනීම නිසා ගංගා වල ජලය ලබාගැනීම විශාල ප්‍රශ්ණයක් බවට පත්ව ඇත.

එබැවින්, මෙම බලපත්‍ර ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුලින් මෙම තත්ත්වය පාලනය කිරීමට විශාල වශයෙන් හැකි වී තිබෙන බව වාර්තා අනුව පැහැදිලි වේ.

පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් තුලින් නිකුත් කරන්නා වූ කොන්දේසි කඩකිරීම ජාතික පාරිසරික පනත අනුව දඩුවම් ලැබිය හැකි වරදකි.

ලංකාවේ කර්මාන්ත ස්ථානගත වී ඇති ආකාරය දෙස බැලීමේ දී මුළු ප්‍රමාණයෙන් 60% ක් පමණ කර්මාන්ත බස්නාහිර පළාත තුල ස්ථානගත වී ඇති අතර, මධ්‍යම පළාත තුල එම ප්‍රමාණය 13% ක් පමණ වන අතර, දකුණු පළාත තුල 17% ක් පමණ වේ. ඉතිරි 10% අනිකුත් පළාත් වන සබරගමුව, නැගෙනහිර, උතුරු මැද, ඌව හා උතුරු පළාත් වල ස්ථානගත වී ඇත. වර්තමානයේ විශේෂ ව්‍යාපෘති හා පර්යේෂණ ඒකකය විසින් ඒ ඒ පළාත් වල කර්මාන්ත ස්ථානගත වී ඇති ආකාරය පිළිබඳ සමීක්ෂණයක් පවත්වන අතර, ඒ අනුව පළාත් වල කර්මාන්ත ස්ථානගත වී ඇති ආකාරය පිළිබඳ නිවැරදි දත්ත ඉදිරිපත් කළ හැකි වේ.

නිර්දේශිත ක්‍රියාකාරකම් සඳහා නිකුත් කරන පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අඒත් කළ යුතු වේ. එමෙන්ම, යම් කර්මාන්ත කරුවෙක් තම බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට පටහැනි ලෙස ක්‍රියාකර ඇති බව ඔප්පු වුවහොත් එම බලපත්‍රය අවලංගු කිරීමේ බලතල ද අධිකාරිය සතු වේ. එම අවලංගු කිරීමකින් පසු යම් කෙනෙක් අභියාචනාවක් ඉදිරිපත් කරන්නේ නම්, පාරිසරික අමාත්‍යාංශයේ ලේකම්වරයාට එය ඉදිරිපත් කළ යුතු අතර, එතුමාගේ තීරණය ඒ සම්බන්ධයෙන් වූ අවසාන තීරණය වේ. පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් තුලින් නිකුත් කරන්නා වූ කොන්දේසි කඩකිරීම ජාතික පාරිසරික පනත අනුව දඩුවම් ලැබිය හැකි වරදකි.

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම හා අළුත් කිරීම 2009 - 2011

පළාත	දිස්ත්‍රික්කය	පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කරන ලද ප්‍රමාණය						පරිසරආරක්ෂණ බලපත්‍ර අළුත් කරන ලද ප්‍රමාණය					
		2009		2010		**2011**		2009		2010		**2011**	
		"අ"	"ආ"	"අ"	"ආ"	"අ"	"ආ"	"අ"	"ආ	"අ"	"ආ"	"අ"	"ආ"
බස්නාහිර	කොළඹ	135	211	223	236	148	210	166	-	427	-	512	20
	ගම්පහ	110	212	142	227	168	166	137	-	218	-	260	14
	කළුතර	43	112	91	134	69	103	68	-	174	-	200	21
මධ්‍යම	නුවර	49	63	83	121	74	88	22	3	54	1	81	4
	මාතලේ	23	58	37	49	32	33	14	3	35	2	64	5
	නුවරඑළිය	8	13	4	7	13	9	3	-	16	-	7	
දකුණ	ගාල්ල	30	111	34	100	63	129	37	23	63	15	79	11
	මාතර	15	91	53	74	23	96	36	18	31	22	79	6
	හම්බන්තොට	22	48	27	41	39	45	5	7	20	-	26	1
සබරගමුව	කෑගල්ල	37	108	38	91	36	69	5	-	32	1	39	3
	රත්නපුර	32	94	56	89	40	79	-	-	31	12	39	7
උතුරුමැද	අනුරාධපුර	21	90	39	151	38	55	12	-	26	1	64	3
	පොළොන්නරු	11	21	11	27	5	18	8	-	155	4	22	1
නැගෙනහිර	ත්‍රිකුණාමලය	18	61	19	48	21	28	8	-	10	9	23	4
	අම්පාර	24	46	13	58	7	62	4	-	7	7	15	
	මඩකලපුව	12	34	17	58	2	37	1	-	-	-	3	8
	වවුනියාව	-	2	8	1	14	3	-	-	-	-	7	
	මන්නාරම	-	6	1	3		5	2	-	14	16	1	
ඌව	බදුල්ල	13	31	11	36	17	37	3	26	13	9	26	6
	මොනරාගල	14	21	6	24	2	33	7	-	13	-	4	1
උතුර	යාපනය	5	3	5	35	12	24	2	6		-	25	1
	කිලිනොච්චිය	-	-	-	-	-	-	-	-	-	-	0	-
	මුලතිව්	-	-	-	-	-	-	-	-	-	-	0	-
එකතුව		**622**	**1,436**	**918**	**1610**	**823**	**1329**	**540**	**86**	**1204**	**100**	**1576**	**116**

10.3.1.2. නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම

මධ්‍යම පරිසර අධිකාරිය 1981 වසරේ ස්ථාපනය කරන ලද දින පටන් යම් ස්ථානයක නව කර්මාන්තයක් ස්ථානගත කිරීමට ප්‍රථම අධිකාරියේ නිර්දේශය ලබා ගැනීම මූලික අවශ්‍යතාවයකි. පළාත් පාලන ආයතන විසින් එම කර්මාන්තය ස්ථානගත කිරීම සඳහා ඔවුන්ගේ අවසාන නිර්දේශය නිකුත් කිරීමට ප්‍රථම මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික නිර්දේශ නිකුත් කරනු ලැබේ.

මෙම පාරිසරික නිර්දේශ නිකුත් කිරීම තුලින් නුසුදුසු ස්ථානයන්හි නුසුදුසු කර්මාන්ත ස්ථානගත කිරීම වලක්වාගත හැකි වී තිබෙන අතර මේ නිසා කර්මාන්තකරුවන්ට නියම ස්ථානයේ නියම කර්මාන්තය අදාල පරිසර දූෂණ පාලන පිරිවිතරයන් අනුගමනය කිරීම තුලින් ස්ථානගත කිරීමට හැකියාව ලැබී ඇති නිසා ඔවුන්ට ද විශාල වශයෙන් ප්‍රතිලාභ අත්වී තිබේ. එමෙන්ම සුදුසු ස්ථානයන්හි සුදුසු කර්මාන්ත ස්ථානගත කිරීම තුලින් අසල්වාසන්ට ද පරිසර දූෂණයෙන් හෝ මහජන පීඩාවන්ගෙන් තොරව වාසය කිරීමේ හැකියාව ලැබී ඇත.

කෙසේ වෙතත්, 2000 වසරේ දී නව කර්මාන්ත සඳහා කර්මාන්ත 80 ක් පමණ ප්‍රමාණයකට නිර්දේශ නිකුත් කළ ද 2011වසරේ එම ප්‍රමාණය කර්මාන්ත 1523 ක් දක්වා සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කෙරේ. මෙම ප්‍රමාණයෙන් කර්මාන්ත 1395 ක් සඳහා අනුමැතිය ලබා දී ඇති අතර, කර්මාන්ත 128 ක් ප්‍රතික්ෂේප කර ඇත. 2004 වසරේ දී මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල ස්ථාපනය කිරීමෙන් පසු නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ ලබාදීම එම කාර්යාල මගින් සිදුකරනු ලැබේ.

පළාත	දිසත්‍රික්කය	ලැබුණු අයදුම්පත්‍ර						අනුමත කරන ලද සංඛ්‍යාව			ප්‍රතික්ෂේප කරන ලද		
		200	2010	2011	200	2010	2011	2009	2010	2011	2009	2010	2011
බස්නාහිර	කොළඹ	81	111	136	84	108	192	65	83	82	9	1	
	ගම්පහ	82	119	154	62	116	110	38	112	58	3	17	15
	කළුතර	69	86	135	42	77	125	57	64	102	5	4	8
මධ්‍යම	මහනුවර	59	56	155	63	44	91	33	50	77	7	7	10
	මාතලේ	23	17	72	15	50	61	34	27	54	1		8
	නුවරඑළිය	7	6	19	8	9	18	4	14	14	0		
දකුණු	ගාල්ල	34	69	102	47	73	118	46	43	67	11	10	19
	මාතර	46	47	80	28	44	79	23	34	59	3	8	21
	හම්බන්තොට	22	33	58	23	31	54	21	23	39	0	2	6
සබරගමුව	කෑගල්ල	49	31	96	42	27	56	38	15	58	4	1	5
	රත්නපුර	49	59	83	38	50	34	31	18	48	5	3	15
උතුරුමැද	අනුරාධපුර	102	172	164	93	113	126	67	112	81	4	6	2
	පොළොන්නරුව	31	18	16	20	15	14	14	9	11	1		
නැගෙනහිර	ත්‍රිකුණාමලය	16	48	98	10	39	66	10	15	91	0	2	7
	අම්පාර	51	61	28	34	55	34	19	27	60	1		3
	මඩකලපුව	44	37	89	40	35	92	32	18	88	0		
	මන්නාරම	0	9	56	0	8	47	0	6	69	0		2
	වවුනියාව	0	6	37	0	7	37	0	13	26	0		
ඌව	බදුල්ල	54	63	117	69	68	98	75	48	79	0	1	1
	මොණරාගල	24	38	44	23	27	30	21	24	28	6	2	
උතුර	යාපනය	31	276	155	23	152	120	20	161	97	6	16	3
	කිලිනොච්චිය	0	14	117	0	24	107	0	6	99	0	2	3
	මුලතිව්	3		11	1		9	1		8	0		
එකතුව		**877**	**1376**	**2022**	**765**	**1172**	**1718**	**649**	**952**	**1395**	**66**	**82**	**128**

2009 - 2011 කාලය තුල පළාත් කාර්යාල මඟින් අනුමත කරන ලද හා ප්‍රතික්ෂේප කරන ලද නව කර්මාන්ත ස්ථානගත කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

ඉහත වගුව දෙස බැලීමේ දී පෙනී යන්නේ කොළඹ, කළුතර, ගම්පහ සහ අනුරාධපුර යන දිස්ත්‍රික්කයන්හි නව ආයෝජන සඳහා කර්මාන්ත කරුවන් වඩාත් කැමැත්තක් දක්වන බවය. එමෙන්ම යාපනය දිස්ත්‍රික්කයේ නව කර්මාන්ත ස්ථානගත කිරීම වාර්තාගත අයුරින් විශාල ලෙස වැඩි වී ඇත.

10.3.1.3. පාරිසරික ගැටළු සම්බන්ධයෙන් වූ මහජන පැමිණිලි

2011 වසරේදී කර්මාන්ත වලින් සිදුවන්නා වූ දූෂණයට අදාල පැමිණිලි 1676 ක් හා ස්වභාවික සම්පත් අනිසි ලෙස පරිහරණය කිරීමට අදාල පැමිණිලි 341 ක් වශයෙන් පැමිණිලි 2017 ක් සඳහා පළාත් කාර්යාල විසින් පහත සඳහන පරිදි පියවර ගන්නා ලදි.

දිස්ත්‍රික්කය	ලැබුණු පැමිණිලි සංඛ්‍යාව		විසඳන ලද පැමිණිලි		නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කිරීම	වෙනත් ආයතන සඳහා යොමු කිරීම		පරිසර ආරක්ෂණ බලපත්‍ර
	කර්මාන්ත මඟින්	ස්ව.සම. කළ.	කර්මාන්ත මඟින්	ස්ව.සම. කළ.	කර්මාන්ත මඟින්	කර්මාන්ත මඟින්	ස්ව.සම. කළ.	
කළුතර	359	7	325	6	3	6		5
කොළඹ	225		96		6	15		14
ගම්පහ	243	53	55	13	8	54	27	20
මහනුවර	80	24	7	7		7		
මාතලේ	31	7	2	1	2			4
නුවරඑළිය	39				11			
ගාල්ල	178	94	37	17	1	1	13	7
මාතර	143	24	111	24				
හම්බන්තොට	39	2	23	26	1	2	1	
කෑගල්ල	42	50	16	39	6	5	19	4
රත්නපුර	59	57	26		1	14	23	2
පොළොන්නරුව	56				4	3		2
අනුරාධපුර	125		4	1		4		10
අම්පාර	17	2	2	1		6		
මඩකලපුව	9	2	2			1		
මන්නාරම								
වවුනියාව								
ත්‍රිකුණාමලය	6	1	1					1
මොණරාගල	2	3						
බදුල්ල	29	15						
කිලිනොච්චිය	1							
මුලතිව්								
යාපනය	25		8					
එකතුව	**1676**	**341**	**715**	**135**	**43**	**118**	**83**	**71**

ඒ ඒ පළාත් කාර්යාල බල ප්‍රදේශය තුල සිටින්නා වූ මහජනයාගෙන් ලංබෙන පාරිසරික පැමිණිලි සම්බන්ධයෙන් එනම්, කර්මාන්තයක් පවත්වාගෙන යාමෙන් ඇති වන්නා වූ පාරිසරික දූෂණ හෝ වෙනත් යම් කටයුත්තක් පවත්වාගෙන යාමෙන් ඇති වන්නා වූ පාරිසරික දූෂණ හෝ ස්වභාවික සම්පත් අනිසි ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් ලැබෙන්නා වූ මහජන පැමිණිලි සම්බන්ධයෙන් පළාත් කාර්යාල විසින් කටයුතු කරනු ලැබේ.

මෙසේ ලැබෙන්නා වූ පාරිසරික පැමිණිලි බොහෝ විට සුදුසු පියවර ගැනීම සඳහා අදාල ආයතනවලට යොමු කරන ලද අතර, මධ්‍යම පරිසර අධිකාරියට ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කිරීමට අවශ්‍ය යැයි හැඟේ නම්, ඒ පිළිබඳව සිදු කරන්නා වූ ස්ථානීය පරීක්ෂණයකින් පසු අදාල පරිසර දූෂණය හෝ මහජන පීඩාව අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදි.

10.3.2. පාරිසරික කළමනාකරණය

10.3.2.1. මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය (IEE)

1993 වසරේ සිට පාරිසරික බලපෑම් අංගයීම් ක්‍රියාවලියට යටත් වන්නා වූ ව්‍යාපෘති සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලය විසින් කටයුතු සිදුකරනු ලබන අතර, මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලියට යටත් වන්නා වූ ව්‍යාපෘති සම්බන්ධයෙන් ඒ ඒ පළාත් කාර්යාල විසින් අදාල ක්‍රියාවලිය ක්‍රියාත්මක කරනු ලැබේ. යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති, කර්මාන්ත, උද්‍යාන වැඩි දියුණු කිරීම ආදී මහා පරිමාණ නියමිත කටයුතු මෙම ක්‍රියාවලියට අයත් වේ. පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලියේ දී මහා පරිමාණ ව්‍යාපෘතීන් පරිසර බලපෑම් මුල් අවදියේ ම හඳුනාගෙන, එම බලපෑම් අවම කිරීමේ අවශ්‍ය නිර්දේශ සපයනු ලැබේ. මේ නිසා ව්‍යාපෘති යෝජකට ව්‍යාපෘතියේ මුල් අදියරේම පරිසර බලපෑම් අවම කර ගැනීමට හැකි වේ.

පළාත	දිසත්‍රික්කය	ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව			අනුමත කළ සංඛ්‍යාව			ප්‍රතික්ෂේප කරන ලද සංඛ්‍යාව		
		2009	2010	2011	2009	2010	2011	2009	2010	2011
බස්නාහිර	කොළඹ	2		2	1					
	ගම්පහ	1	9	4			2			
	කළුතර	0		1	3					
දකුණ	ගාල්ල	1	2	11	1		5		1	
	මාතර	1	3	9		3			3	
	හම්බන්තොට	2	5	1					2	
මධ්‍යම	මහනුවර	275	303	237	192	302	226	1	9	17
	මාතලේ	51	30	42	86	197	175	1	3	2
	නුවරඑළිය	94	34	97	11	35	115			
සබරගමුව	කෑගල්ල	45	07	23		4	4			
	රත්නපුර	14	20	5	1	3	4	1		
ඌව	බදුල්ල		10	2	1	1	4	1		
	මොණරාගල		1	3						
නැගෙනහිර	ත්‍රිකුණාමලය		20			14				
	අම්පාර		4			3	1			
	මඩකලපුව	01	2			2				
	මන්නාරම		2			1				
	වවුනියාව					4				
උතුරුමැද	අනුරාධපුර			1						
	පොළොන්නරුව									
උතුරු	යාපනය	14	47		2	19			1	
	කිලිනොච්චිය			2						
	මුලතිව්			3						
එකතුව		501	499	443	296	581	536	4	19	19

10.3.2.2. පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලියට යටත් නොවන ව්‍යාපෘති සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම

පාරිසරික බලපෑම් අංගයීම් ක්‍රියාවලියට හෝ මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලියට යටත් නොවන ව්‍යාපෘති සම්බන්ධයෙන් නිර්දේශ නිකුත් කිරීම පළාත් කාර්යාල මගින් සිදු කරනු ලංබේ.

ඒ ඒ ව්‍යාපෘති යෝජකයන් විසින් ඉදිරිපත් කරන්නා වූ ඉල්ලුම්පත්‍ර අනුව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුලින් පරිසරයට සිදු වන්නා වූ අහිතකර බලපෑම් අවම කිරීමට අදාල කොන්දේසි සමඟ මෙම පාරිසරික නිර්දේශ නිකුත් කරනු ලැබේ. ඒ අනුව ගත වූ වසර තුල හෝටල්, දැව හෙළීම්, විදුල සංදේශ කුළුණු ඉදිකිරීම් හා ඉඩම් කට්ටි කිරීම් ආදී වශයෙන් වූ ව්‍යාපෘතීන් 3530 ක් සඳහා පහත දැක්වෙන පරිදි පාරිසරික නිර්දේශ පළාත් කාර්යාල විසින් නිකුත් කරන ලදි.

පළාත	දිස්ත්‍රික්කය	ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව	අනුමත කළ සංඛ්‍යාව	ප්‍රතික්ෂේප කරන ලද සංඛ්‍යාව	පසුවිපරම් කරන ලද සංඛ්‍යාව
බස්නාහිර	කොළඹ	72	17	1	
	ගම්පහ	269	71		
	කළුතර	327	650	18	22
දකුණ	ගාල්ල	61	124	3	10
	මාතර	8	33	6	
	හම්බන්තොට	41	90	2	30
මධ්‍යම	මහනුවර	258	439	5	7
	මාතලේ	61	240		2
	නුවරඑළිය	31	20		
සබරගමුව	කෑගල්ල	107	279	19	
	රත්නපුර	129	217	3	
ඌව	බදුල්ල	466	380	4	1
	මොණරාගල	252	164	1	
නැගෙනහිර	ත්‍රිකුණාමලය	205	216	1	
	අම්පාර	87	137	3	
	මඩකලපුව	94	103		
	මන්නාරම	102	97		
	වවුනියාව	40	38		
උතුරු මැද	අනුරාධපුර	279	158		1
	පොළොන්නරුව	123	47		
උතුර	යාපනය	36	2		
	කිලිනොච්චිය	59	6		
	මුලතිව්	91	2		
එකතුව		**3198**	**3530**	**66**	**73**

10.3.3. පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම

10.3.3.1. පරිසර නියමු වැඩ සටහන

මෙම බලකාය 1984 වසරේ සිට ක්‍රියාත්මක වන ක්‍රියාකාරී වැඩ පිළිවෙලකි.

මෙම වැඩ සටහනේ මූලික අරමුණ වනුයේ පරිසරයට හිතකර අයුරින් පරිසර දැනුවත් කිරීම් වර්ධනය කිරීම හා ඊට අදාල නිපුනතාවන පාසල් ළමුන් තුල ඇති කරවමින් පාරිසරික හිතකර ජන කොට්ඨාශයක් බිහි කිරීම වේ.

මෙම වැඩ සටහන යටතේ, ගුරු පුහුණු වැඩ සටහන්, විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ වැඩ සටහන්, පදක්කම් ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහන්, පරිසර නියමු කඳවුරු ආදී වැඩ සටහන් ප්‍රධාන කාර්යාලයේ ද අනුග්‍රහය ඇතිව පළාත් කාර්යාල විසින් පවත්වාගෙන යන ලදි.

10.3.3.2. විශේෂ වැඩ සටහන්

පළාත් කාර්යාල විසින් විවිධ සේවාවන් යටතේ පහත දැක්වෙන වැඩ සටහන් ගතවූ වසර තුලදී ක්‍රියාත්මක කරන ලදි.

- කලාපීය පරිසර නියමු කඳවුර පැවැත්වීම
- පාසල් පාරිසරික අධ්‍යාපන වැඩ සටහන් පැවැත්වීම
- ගුරුපුහුණු වැඩ සටහන් පැවැත්වීම
- විවිධ කණ්ඩායම් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම
- විශ්ව විද්‍යාල සිසුන් සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්වීම
- ඩෙංගු මර්ධන වැඩ සටහන් පැවැත්වීම
- පාරිසරික ප්‍රදර්ශන පැවැත්වීම
- විශේෂිත දින සැමරීම (ජාතික පාරිසරික දනය සැමරීම හා ලෝක පරිසර දින සැමරීම, හරිත මාසය සැමරීම වැනි)
- සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථානයන්හි වැඩ සටහන් පැවැත්වීම
- විශේෂිත අධ්‍යාපන වැඩ සටහන් පැවැත්වීම
- හරිත මාසය තුල (ඔක්තෝම්බර් 15 - නොවැම්බර් 15) විශේෂිත වැඩ සටහන් පැවැත්වීම

පළාත	ආදායම			වියදම		
	2009	2010	2011	2009	2010	2011
බස්නාහිර	21,111,655	30,993,000	33,070,444	6,988,566	10,695,000	15,267,719
මධ්‍යම	6,702,240	9,549,000	9,872,672	3,765,026	5,169,000	5,430,070
දකුණ	6,455,015	8,300,000	9,558,090	5,683,694	6,691,000	7,854,991
සබරගමුව	5,777,339	8,361,000	9,021,319	3,438,751	3,970,000	6,103,985
උතුරු මැද	4,459,628	8,616,000	8,657,640	2,241,553	2,804,000	3,092,921
නැගෙනහිර	5,493,750	8,784,000	9,718,908	3,373,736	3,858,000	3,815,073
ඌව	3,970,639	6,230,000	8,305,522	1,650,571	2,378,000	2,228,682
උතුර	708,400	2,573,000	4,060,139	589,128	717,000	927,773
එකතුව	**54,678,666**	**85,416,000**	**92,264,734**	**27,731,025**	**38,291,000**	**44,721,214**

මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල



11. මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති

11.1. පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතිය

ශ්‍රී ලාංකීය පොදු ජනතාව වෙනුවෙන් පොලිතින්/ ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කොට හරිත පරිසරයක් රට තුළ ඇති කරවීමේ අරමුණින් පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතිය පරිසර අමාත්‍යාංශයේ මෙහෙයවීම හා මධ්‍යම පරිසර අධිකාරියේ අධීක්ෂණය මත අරඹන ලද අතර වර්ෂය පුරාවටම උපායශීලිව දැනුවත් කිරීම, මාර්ගෝපදේශනය, ප්‍රමිතිකරණය හා රට තුළ පසු භාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය එකතු කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රමවේදය අංශ 3ක් ඉලක්ක කර ගනිමින් සිදු කරනු ලැබේ. එනම් ප්‍රාදේශියව ප්ලාස්ටික් අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් හඳුන්වා දීම හා සංවර්ධනය කිරීම, ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ ජාලයක් ඇති කිරීම හා ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවත් වැඩපිළිවෙල පිළිබඳ ජනතාව දැනුවත් කිරීම වේ. ඒ අනුව, බලංගොඩ නගර සභාව හා කුරුණෑගල මහ නගර සභාව යන පළාත් පාලන ආයතන දෙක පොලිතින්/ ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ හා ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ නියමු මධ්‍යස්ථාන ලෙස ශකතිමත් කොට පවත්වාගෙන යාම සඳහා දැනට ඉදිවෙමින් පවතී. තවද, එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහාම අඹගමුව ප්‍රාදේශිය සභාවෙහිද සහයෝගය ඇතුව ශ්‍රී පාදයේ නල්ලතන්නියේ අපද්‍රව්‍ය වෙන් කිරීමේ අංගනයක් ඉදිවෙමින් ද පවතී. 2011 ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘතියේ ඇති අංශ තුන මඟින් (පුහුණු සංවර්ධන හා දැනුවත් කිරීමේ අංශය, අපද්‍රව්‍ය එකතු කිරීම හා ප්‍රතිචක්‍රීකරණ අංශය හා ප්‍රවර්ධන අංශය) පහත සඳහන් අරමුණුගත වැඩසටහන් නිර්මාණය කරමින් ක්‍රියාත්මක කර ඇත.

I. පොදු ජනතාව සඳහා දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් (පාසැල් ළමුන්, පළාත් පාලන ආයතන)
II. ප්ලාස්ටික්/ පොලිතින් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ බැනර දර්ශනය කිරීම හා ව්‍යාපෘතිය පිළිබඳ අත්පත්‍රිකා බෙදාහැරීම.
III. වියන ලද පොලි පොපිලින් මළු (තැඹිලි - ප්ලාස්ටික්, නිල් - කඩදාසි, රතු - වීදුරු) හා එකතු කිරීමේ බඳුන් බෙදා හැරීම (තැඹිලි - ප්ලාස්ටික්/ පොලිතින්, නිල් - කඩදාසි, රතු - වීදුරු, කොළ - දිරායන ද්‍රව්‍ය)
IV. කසළ කළමනාකරණය හා ප්‍රතිචක්‍රීකරණය පිළිබඳ ශ්‍රමදාන වැඩසටහන් පාසැල් ළමුන් හා ජනතාව සමඟ පැවැත්වීම
V. පරිසර හිතකාමී වැඩසටහන් විකාශනය කිරීම. (රූපවාහිනී නාලිකාවේ සොබා කෙත, මිස්ටර් ශ්‍රීන් වැඩසටහන්)
VI. සැමරුම් සටහන්වල ප්‍රචාරන දැන්වීම් පල කිරීම හා තාක්ෂණික ඇමතුම් අංකය ප්‍රවර්ධනය කරමින් දැන්වීම් තීරු පල කිරීම (0773-909090)
VII. 2011.08.23 දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවති ජාතික හරිත සම්මාන උත්සවය සඳහා ප්‍රචාරන අනුග්‍රහය ලබා දීම. 2011 ජූලි 19 සිට 21 දක්වා කන්දලම හෝටලයේ පැවති ගොඩනැගිලි ඉදිකිරීම අන්තර්ජාතික සම්මේලනය සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දීම. ජාතික හා ප්‍රාදේශීය පූජා භූමිවල අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ශ්‍රමදාන ව්‍යාපාර පැවැත්වීම. පුහුණු වැඩසටහන් හා ප්‍රදර්ශන ආදි ප්‍රවර්ධන කටයුතු පැවැත්වීම. උදා - ශ්‍රී පාද, කතරගම, තිස්සමහාරාමය, අනුරාධපුරය, මිහින්තලේ, මහනුවර ඇසළ පෙරහැර, ත්‍රිකුණාමලය

ප්‍රදර්ශන කුටි හා ප්‍රචාරන වැඩසටහන් ඇති කිරීම.

(අ) දැයට කිරුළ ජාතික උත්සවය - 2011 පෙබරවාරි 4 සිට 10 දක්වා, බුත්තල ගම්උදා භූමිය

(ආ) රඹුක්කන පින්නවල ජාතික පාසලේ 2011 ජුනි 17 සිට 19 දක්වා පැවති ලෝක පරිසර දිනය

(ඇ) බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්තර ශාලාවේ 2011 ජුනි 17 සිට 19 දක්වා පැවති "ෆියුචර් මයින්ඩ්" (Future Mind) ප්‍රදර්ශනය

(ඈ) බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ 2011 අගෝස්තු 11 සිට 14 දක්වා පැවති සුනිත්‍ය බල ශක්ති අධිකාරිය මගින් පැවැත්වූ විදුල්කා ප්‍රදර්ශනය

(ඉ) කොළඹ රාජකීය විදුහලේ 2011 සැප්තැම්බර් 27 සිට 28 දක්වා පැවති "Royex" ප්‍රදර්ශනය

(ඊ) ලෝක ළමා දිනයට සමගාමීව 2011 ඔක්තෝබර් 10 සිට 13 දක්වා වලිසිංහ හරිස්චන්ද්‍ර විද්‍යාලයේ පැවති අධ්‍යාපනික ප්‍රදර්ශනය

(උ) "ශ්‍රී ලාංකීය කාන්තාවන්ගේ හඬ" සංගමය මගින් 2011 දෙසැම්බර් 8 සිට 10 දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති "ස්ත්‍රී මේලා" ප්‍රදර්ශනය

(ඌ) ශ්‍රී ලංකා යුධ හමුදා කාලතුවක්කු බලකායේ සේවා වනිතා ඒකකය සංවිධානය කළ 2011 දෙසැම්බර් 21 සිට 23 දක්වා පැවති නත්තල් සැනකෙලිය

(එ) කිරිඳිවෙල මධ්‍ය මහා විද්‍යාලයේ 2011 දෙසැම්බර් 25 සිට 31 දක්වා පැවති අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනය

(ඒ) www.asian mirror.lk හි අන්තර්ජාල දැන්වීමක් පල කිරීම

VIII. 2011 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක ළඟාකර ලබා ගැනීම සඳහා ක්‍රියාවට නංවන ලද වැඩසටහන් පහත පරිදි වේ.

වැඩසටහන	ප්‍රමාණය
පාසැල් හා ගුරුවරුන් සඳහා පුහුණු වැඩමුළු	33
පළාත් පාලන ආයතන සඳහා පුහුණු වැඩමුළු	2
දැනුවත් කිරීමේ වැඩසටහන් (පාසැල්, ගුරුවරුන්, දහම් පාසැල්, රාජ්‍ය නොවන ආයතන, ප්‍රජාමූල සංවිධාන, නේවාසික පුහුණු කඳවුරු හා වෙනත් පුහුණු වැඩසටහන්	54
නේවාසික පුහුණු/දැනුවත් කිරීමේ වඩසටහන්	8
අන්තර් ජාතික වර්ණික කසළ මළු බෙදා හැරීම	23225
අන්තර් ජාතික වර්ණික කසළ මළු බෙදා හැරීම	1000
කසළ එකතු කිරීමේ ට්‍රේලරය	01
ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රවර්ධන වැඩසටහන් - ජාතික මට්ටමින්	09
ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රවර්ධන වැඩසටහන් - ප්‍රාදේශීය මට්ටමින්	06
විකාශය කරන ලද පාරිසරික වැඩසටහන් - සොබා කෙත (රූපවාහිනිය)	14
විකාශය කරන ලද පාරිසරික වැඩසටහන් - මිසටර් ග්‍රීන් (රූපවාහිනිය)	40

ප්ලාස්ටික් එකතු කරන්නන් හා ප්‍රතිචක්‍රීයකරණය කරන්නන්ගේ වැඩිවීම

වර්ෂය	සංඛ්‍යාව
2007	38
2008	62
2009	78
2010	103
2011	148



වර්ෂය තුළ සිදු කරන ලද වැඩසටහන් කීපයක ඡායාරූප පහත දැක්වේ.

පරිසර අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා හා මධ්‍යම පරිසර අධිකාරියේ ගරු සභාපති චරිත හේරත් මහතා විසින් 2011 පෙබරවාරි බුත්තල පැවති දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයේ ව්‍යාපෘතියේ ප්‍රදර්ශන කුටිය නරඹන අවස්ථාව



කොකා කෝලා ආයතනය හා ව්‍යාපාතිය ඒකාබද්ධව රද්දොළුගම ජාතික නිවාස සංකීර්ණයේ පැවැත් වූ ප්‍රවර්ධන වැඩසටහන - 2011 ජූනි



නාත්තන්ඩිය දම්මිස්සර මහා විද්‍යාලයේ පැවති දැනුවත් කිරීමේ වැඩ සටහනක දී ප්ලාස්ටික් බඳුන් බෙදා හැරීම - 2011 ජූනි



ගාල්ල කුරුඳුවත්ත රුහුණු ජාතික විද්‍යා පීඨයේ පැවති පරිසර නියමු කඳවුර - 2011 අගෝස්තු



බලංගොඩ නගර සභාවේ බැංකියවත්තේ, ප්‍රථම ප්ලාස්ටික් / පොලිතීන් අපද්‍රව්‍ය කළමනාකරණය මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු - 2011 දෙසැම්බර්



කුරුණෑගල මහ නගර සභාවේ සුන්දරාපොලෙහි, ඉදි කෙරෙන දෙවන ප්ලාස්ටික්/පොලිතීන් අපද්‍රව්‍ය කළමනාකරණය මධ්‍යස්ථානයේ කටයුතු - 2011 දෙසැම්බර්



මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථය වන්නේ ශ්‍රී ලාංකීය ජනතාව තුළ ප්ලාස්ටික්/පොලිතීන් අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කිරීමේ විධිමත් ක්‍රම ඇති කරමින් පසුභාවිත ප්ලාස්ටික්/පොලිතීන් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය මඟින් ආර්ථික වාසි ලබා ගනිමින් ජීනව තත්ත්වය උසස් කිරීම වේ.

11.2. පරිසර නියමු වැඩ සටහන

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය අධ්‍යාපනය ඇති කිරීම හා වැඩි දියුණු කිරීම පිළිබඳ වගකිව යුතු අතර සහ පරිසරය සුරැකීම සඳහා සමාජයේ ක්‍රියාකාරී සහභාගීත්වය අපේක්ෂා කරන අතර ඔවුන් පරිසරය සඳහා බෝහෝ අවධානය යෙදිය යුතු වේ. මේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය පහත සඳහන් වැඩසටහන් සමාජයේ බෝහෝ ඉලක්ක කණ්ඩායම් යටතේ ක්‍රියාත්මක වේ. පරිසර අමාත්‍යාංශය මේ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සපයනු ලැබේ.

11.2.1. පෙර පාසල් සඳහා අධ්‍යාපන වැඩසටහන් ඇති කිරීම

පෙර පාසැල් වල පරිසර වැඩසටහන් ක්‍රියාත්මක වන්නේ විවිධ පරිසර පැතිකඩ ඔස්සේ කුතුහලය වැඩි දියුණු කිරීම මෙන්ම විවිධ පරිසරය හා සම්බන්ධ ක්‍රියාකාරකම් ඔස්සේය. මෙම වැඩසටහන බාළ කාලයේම ඔවුන්ගේ මතවාද වෙනස් කිරීමට සමත් වේ.

11.2.2. පෙර පාසල් උපදෙස් පොත ඇගයීම

මෙම වැඩසටහන යටතේ පෙර පාසල් ගුරු අත්පොත ඇගයීම, සංශෝධනය, පූර්ව ළමාවිය සංවර්ධනය කරන විශේෂඥවරුන්ගේ කරුණු ඇතුලත්ය මෙම වැඩසටහනේ පෙර පාසල් ගුරුවරුන් සඳහා වැඩමුළු වලින් ඇගයීමට ඉඩ සැලසේ එබැවින් 2011 වර්ෂය සඳහා පිටපත් 3000 ක් මුද්‍රණය කරන ලදී.

11.2.3. ද්විතියක පාසැල් සිසුන් සඳහා (ශ්‍රේණි 6 - 13) වැඩසටහන්

ද්විතියක පාසැල් නියමු වැඩ සටහන (පරිසර නියමු වැඩ සටහන) 1984 මධ්‍යම පරිසර අධිකාරිය ඇති කිරීමේදී පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශයේ අරමුණු අතර ප්‍රධාන වේ. මෙම වැඩසටහනේ අරමුණු වනුයේ පරිසර ගැටළු සම්බන්ධයෙන් පාසල් සිසුන් තරුණ වයසේදීම සංවේදී කිරීමය. පරිසර අමාත්‍යාංශය හා සමගාමීව ද්විතීක පාසැල් 6936 ක් පරිසර නියමු වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. පාසල් පද්ධතිය තුළ පරිසර නියමු වැඩසටහන

ශක්තිමත් කිරීමට පරිසර නියමු නියෝජිතයන් විදුහල්පතිවරුන් ගුරුවරුන් හා පාසැල් සිසුන් දිවයින පුරා පුහුණුව හා දැනුවත් කිරීම කරන ලදී.

11.2.4. පරිසර නියමු ගුරු භවතුන් පුහුණු කිරීම

පාසල් පද්ධතිය තුල පරිසර නියමු කණ්ඩායම් වෙනුවෙන් පරිසර නියමු ගුරු භවතුන් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ දැනුවත් කිරීමේ වැඩසටහනක් මෙම වැඩසටහන හරහා ක්‍රියාත්මක වේ. පරිසර නියමු ගුරු භවතුන් සඳහා ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 8 ක් 2011 වර්ෂය සඳහා උතුරු මැද පළාතේ කලාප 8 ක් සඳහා පවත්වන ලදී.

අනු අංකය	කලාපයේ නම	සහභාගීවුවන්ගේ ගණන
01	ගිරිඋල්ල	64
02	නිකවැරටිය	74
03	කුලියාපිටිය	100
04	කුරුණෑගල	87
05	ඉබ්බාගමුව	77
06	මාතර	94
07	කුරුණෑගල	64
08	හලාවත	77
	එකතුව	**639**

11.2.5. පාසැල් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්

වැඩ සටහන් ගණන	10
සහභාගී වූ පාසල සිසුන් ගණන	2562
සහභාගී වූ ගුරුවරුන් ගණන	47

(ශ්‍රවණාගාරය මධ්‍යම පරිසර අධිකාරිය)

පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය මගින් නවතම පරිසර බලපෑම් සම්බන්ධයෙන් පාසැල් සිසුන් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ශ්‍රවණාගාරය වෙන් කරන ලදී.

11.2.6. පදක්කම් ලාභීන් සහ සාමාජිකයින් වැඩි කිරීම

පරිසර නියමු වැඩ සටහන පාසැල් සිසුන් අතර ප්‍රචලිත කිරීම පිණිස පරිසර නියමු වැඩසටහන පුළුල් කරන ලදී. පුහුණු ප්‍රාදේශීය පරිසර නිලධාරීවරුන් පළාත් හා දිස්ත්‍රික් කාර්යාල වල පරිසර නියමු වැඩ සටහන් පාසල් පද්ධතිය තුල ප්‍රචලිත කිරීම සිදු කෙරේ. 2011 වර්ෂය සඳහා දිවයින පුරා පිහිටි පාසල් තුල 10,230 ක් පරසර නියමුවන් පාසල් පද්ධතිය තුල ප්‍රාදේශීය පරිසර නිලධාරීන් ස්ථාපිත කරන ලදී.

11.2.7. පරිසර නියමු මෙවලම් නිෂ්පාදනය

පරිසර නියමු වැඩසටහන සඳහා 2011 වර්ෂය වෙනුවෙන් පහත සඳහන් ද්‍රව්‍ය නිෂ්පාදනය කරන ලදී.

අනු අංකය	පරිසර නියමු අමුද්‍රව්‍ය	2011 වර්ෂය තුල නිපදවූ ද්‍රව්‍ය ප්‍රමාණයන්
01	පරිසර නියමු පදක්කම්	18000
02	හරිත - කොළ	2000
03	රජත - සිල්වර්	1000
04	ස්වර්ණ - රත්‍රං	500
06	සහතික	1500
07	පරිසර නියමු හිස්වැසුම්	4500
09	පරිසර නියමු අත්පොත	6000

11.2.7.1. පදක්කම් හා සහතික පත්‍ර නිෂ්පාදනය

මෙම වැඩසටහන අවසානයේදී පදක්කම් හා සහතික පත්‍ර ප්‍රදානය කරනු ලබන්නේ පරිසර ක්‍රියාකාරකම් වෙනුවෙනි. මේ ක්‍රියාවේදී පහත සඳහන් පදක්කම් 2011 වසරේදී ප්‍රදානය කරන ලදී.

අනු අංකය	පරිසර නියමු අමුද්‍රව්‍ය	පදක්කම් ප්‍රමාණය
01	පරිසර නියමු පදක්කම්	11036
02	හරිත - කොළ	2756
03	රජත - සිල්වර්	1250
04	ස්වර්ණ - රත්‍රං	123
05	ජනාධිපති	--
06	සහතික	250
07	පරිසර නියමු	4500

11.2.7.2. ද්‍රව්‍ය නිකුත් කිරීම

පහත සඳහන් අමුද්‍රව්‍ය 2011 වසර සඳහා පරිසර නියමු වැඩසටහන වෙනුවෙන් නිකුත් කරන ලදී

අනු අංකය	පදක්කම්	ද්‍රව්‍ය ප්‍රමාණය
01	පරිසර නියමු අත්පොත	4718
02	පරිසර නියමු කැසට්පට	775
03	පරිසර නියමු සීඩී පට්	339
04	පරිසර නියමු කොඩි	460

11.2.8. සංස්කෘතික දිනයන් සඳහා වැඩසටහන්

පරිසර නියමුවන් විවිධ සංස්කෘතික දිනයන් සඳහා සහභාගී වන්නේ සැදැවතුන් පරිසරය සුරකිමු යන විශේෂ පරිසර හිතකාමී කසල බැහැර කිරීමේ පුරුදු රැගත් පිරිසිදු පරිසරයකට ඉඩ කඩ සලසයි.

1. කතරගම ඇසළ පෙරහැර
2. නුවර ඇසළ පෙරහැර
3. අනුරාධපුර පොසොන් වැඩසටහන

11.2.9. ජාතික පරිසර නියමු කඳවුර

පරිසරනියමු වන් අතරින් සිල්වර්,රන්ං සහ ජනාධිපති පදක්කම් ලාභීන් ජාතික පරිසර නියමු කඳවුරේ එකට එක්වී ඉගෙනීමට මග සලසයි. මෙය පළමු පෙළ අත්දැකීමක් වනවා මෙන්ම විවිධ සංස්කෘතීන් හා එක්ව අත්වැල් බැඳ ගැනීමට හා විවිධ සංස්කෘතීන් හා ක්‍රියාකාරී වනවා මෙන්ම පාසැල් අතර සබැඳියාව ඇතිවනවා මෙන්ම සංස්කෘතික හා සීමාන්තර බැඳීම් ක්‍රියාත්මක කළ හැක. පරිසර නියමු කඳවුර නියමුවන් ගුරුවරුන් විදුහල්පතිවරුන් නියමු කොමසාරිස්වරුන් සඳහා පළමු පෙළ අත්දැකීමක් වේ. මෙම කයා ඔවුන් එකිනෙකා හඳුනා ගන්නා අතර පරිසර හිතකාමී ක්‍රියා වැඩි දියුණු වීමට ඉවහල් වේ. මෙම කඳවුර ඔවුන්ගේ අදහස් හා යෝජනා නුවමාරුකරගත හැකිය ආගම් හා ජාතිය නොසලකා ඔවුන් එකිනෙකා අතර සබැඳියාව වැඩිදියුණු කරගන්නා මෙන්ම සබැඳියාව තවදුරටත් ඉවහල් වේ. පරිසර නියමුවන් කඳවුරු වැඩසටහන සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය වෙයන්ගොඩ 2011 සැප්තැම්බර් 1,2,3 යන දිනවල පාසැල් 37 ක් සහභාගීත්වයෙන් සිදු කරන ලදී. සහභාගිවූවන් පිළිබඳ පහත සඳහන් වේ.

අනු අංකය	විස්තරය	සහභාගීවූවන්ගේ ගණන
01	පරිසර නියමු	375
02	ගුරුවරු	50
එකතුව		425

11.2.10. පරිසර නියමු ප්‍රගති අධීක්ෂණය

පරිසර නියමු කොමසාරිස්වරුන් පරිසර නියමු වැඩසටහන පාසැල් පද්ධතිය හරහා දිස්ත්‍රික් කලාප කොට්ඨාශ අධ්‍යාපන මට්ටම් සඳහා ක්‍රියාත්මක කෙරේ. මේ සම්බන්ධයෙන් කලාප හා කොඨාශ කොමසාරිස් වරුන් දිස්ත්‍රික් 9 ක් සඳහා පරිසර නියමු වැඩසටහන ශක්තිමත් කිරීම වෙනවෙන් පත්කර ඇත. පත් කරන ලද විස්තර පහත පරිදිය.

අනු අංකය	විස්තරය	සහභාගීවූවන්ගේ ගණන
01	කලාප කොමසාරිස්වරුන්	99
02	කොට්ඨාශ කොමසාරිස්වරුන්	277
එකතුව		376



11.2.11. දිස්ත්‍රික් මට්ටමින් පරිසර නියමු වැඩසටහන සම්බන්ධයෙන් දිස්ත්‍රික් නියමු පුවත් පත හා මුද්‍රණය

	දිස්ත්‍රික්කය
01	හම්බන්තොට
02	නුවරඑළිය
03	ගාල්ල
04	ගම්පහ
05	කළුතර
06	මොණරාගල
07	කුරුණෑගල
08	මඩකලපුව
09	මන්නාරම
10	වවුනියාව
11	ත්‍රිකුණාමලය
12	යාපනය
13	මාතර
14	කොළඹ

දිස්ත්‍රික් පරිසර නියමු පුවත් පත පරිසර නියමුවන් අතර ශක්තිමත් මාධ්‍යක් වන්නෙ පරිසර දැනුම වැඩි දියුණු කිරීමට ඉවහල් වීමයි. පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශය දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් පරිසර නියමු පුවත් පත මුද්‍රණය කෙරේ.

11.2.12. සුවසර තක්සලාව (හොඳම පරිසර හිතකාමී පාසැල තේරීමේ වැඩසටහන)

2008 වර්ෂයේදී දිස්ත්‍රික්ක 23 සඳහා හොඳම පරිසර හිතකාමී පාසල තේරීම සඳහා වැඩසටහනේදී පාසල් පද්ධතිය තුල හොඳ පරිසරයක් ඇති කිරීම අරමුණ වේ. පාසැල් මට්ටමින් පාසැල් සිසුන්ගේ ක්‍රමානුකූලව හැසිරීම් රටා ඇගයීම සිදුවේ.

මේ සඳහා මූලික පියවර වශයෙන් 2009 වර්ෂයේ දිවයින පුරා දිස්ත්‍රික් 23 ක පාසැල් ප්‍රශ්නාවලියන් මාර්ගයෙන් තීරණය කරනු ලැබිය. මේ අනුව අවසාන ඇගැයීම 2010 දී ක්‍රියාත්මක කල අතර 2011 දී හොඳම පාසැල් 03 සෑම දිස්ත්‍රික්කයකට නෝරා ගන්නා ලද පාසල් 138 අතුරින් (දිස්ත්‍රික්ක 23) නෝරා ගන්නා ලදී.

11.2.13. ජාතික රුක් රෝපණ වැඩසටහන (දැයට සෙවන - ජාතික සෙවණ)

රුක් රෝපණ වැඩසටහන දැයට සෙවණ වැඩසටහන යටතේ ජනකලා කේන්ද්‍රය බත්තරමුල්ල යාබඳව සිදුකරන ලදී. කොළඹ දිස්ත්‍රික්කයේ පරිසර නියමුවන් 500 ක් සහභාගී වන



11.3. පරිසර සංරක්ෂණය සඳහා ශ්‍රී ලංකාවේ පාරිසරික දූෂණ ක්‍රියාකාරකම් අඩංගු දත්ත පද්ධතියක් ගොඩනැංවීම - කුරුණෑගල දිස්ත්‍රික්කය

මූල්‍ය ප්‍රගතිය

මුළු ප්‍රතිපාදන - මිලියන 1.5

මුළු වියදම - මිලියන 1.475

භෞතික ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30ක පාරිසරික, සමාජීය හා ආර්ථික තොරතුරු ග්‍රාම නිලධාරී මට්ටමෙන් එක්රැස් කර එම දත්ත කර්මාන්ත දත්ත පද්ධතියට හා පාරිසරික තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම හා යාවත්කාලීන කිරීම භූගෝලීය තොරතුරු තාක්ෂණ ඒකකය මගින් සිදු කරනු ලැබේ. ඒ අනුව දැනට කුරුණෑගල දිස්ත්‍රික්කයේ කර්මාන්ත 4,502 (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04ක හැර) සංගණනය කර ඇත.

මෙය ශ්‍රී ලංකාවේ එකම මධ්‍යගත පාරිසරික දත්ත පද්ධතය වන අතර එමඟින් පරිසර සැලසුම්කරණයේදී, කළමනාකරණයේදී ඇගයීම් කටයුතු වලදී හා පාරිසරික විශ්ලේෂණයේදී ව්‍යාපෘති යෝජකයන්ට හා කර්මාන්ත ස්ථානගත කිරීමේ දී වඩාත් සුදුසු ස්ථාන සොයා ගැනීමේ දී හා උපාය මාර්ගික පාරිසරික අධ්‍යනන්ට, පාරිසරික ඇගයීම් වාර්තා සැකසීමේදී, පූර්ව ආපදා කළමනාකරණ සැලසුම් සැකසීමේදී හා පාරිසරික දැනුවත් කිරීමේ කාර්යයන් හිදී මහඟු පිටුවහලක් ලැබේ.

11.4. ජල තත්ව පසුවිපරම් ව්‍යාපෘතිය

මා ඔය, දඬුගම් ඔය, බෙන්තොට ගඟ සහ මහවැලි ගඟේ ජල තත්ත්වය පසුවිපරම් කටයුතු සඳහා රු. 500,000.00 ක මුදලක් 2011 වසර සඳහා වෙන් කරන ලදි.

මෙම ව්‍යාපෘතිය යටතේ ඉහත සඳහන් ජල දේහ වල තෝරා ගත් ස්ථාන වල ලබාගත් ජල නියැදි භෞතික, රසායනික සහ
ක්ෂුද්‍ර ජීවී විද්‍යාත්මක පරාමිතීන් සඳහා මාසිකව විශ්ලේෂණය කරන ලදි.

මෙම විශ්ලේෂණ ප්‍රතිඵල වලට අනුව බොහෝ ජල දේහ වල දූෂක ප්‍රභවය ලෙස මල අපද්‍රව්‍ය මඟින් සිදුවන දූෂණය ලෙසට අනාවරණය විය.

අනෙකුත් පරාමිතීන් සලකා බැලිමේදි බොහෝ අවස්ථා වලදී ජල තත්ත්ව දූෂණය වීම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් නොපෙන්වයි.

12.0. ආයතනික යහපාලන වාර්තාව

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ ස්ථාපනය කරන ලද මධ්‍යම පරිසර අධිකාරිය, වාර්ෂිකව සපයනු ලබන මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත පවත්වාගෙන යනු ලැබේ.

2011.12.31 වන දිනට අනුමත කාර්ය මණ්ඩලය 802 ක් වන අතර, දැනට 683 ක කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

12.1. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය (සාමාජිකයින්) අමාත්‍යවරයා විමසා ජනාධිපතිතුමා විසින් පත්කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

සෑම මසකටම වරක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලබන අතර, 2011 වසර තුල මෙවැනි රැස්වීම් 12 ක් පවත්වා ඇත. මෙම රැස්වීම් වලදී පාරිසරික කළමනාකරණයට අදාල ප්‍රධාන ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය මහ පෙන්වීම් කරනු ලබන අතර, ආයතනයේ මුදල්මය හා පරිපාලනමය ව්‍යුහය කෙරෙහි අවධානය යොමු කරනු ලැබිය.

12.2. විගණන කමිටු රැස්වීම්

රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක PF/ PE 03 හා 1999.11.19 හා අංක PF/PE 10 හා 2000.10.30 දිනැති චක්‍රලේඛ හා 2003 ජූනි මස ප්‍රකාශයට පත් කරන ලද යහපාලන ගුරු උපදෙස් මාලාවට අනුව විගණන කමිටු රැස්වීම් පවත්වන ලදි.

මෙම කමිටුව මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු වශයෙන් මුදල් අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වරයෙකුගේ සහභාගිත්වයෙන් අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, මානව සම්පත්, මුදල් හා පරිපාලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ (මුදල්), අධ්‍යක්ෂ (පරිපාලන) හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම් හා අධීක්ෂණ) යන අයගෙන් සමන්විත වන අතර, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන පරීක්ෂකවරයෙකු ද සහභාගී වේ. අධිකාරියේ අභ්‍යන්තර විගණන ඒකකය කමිටුවේ කැඳවුම්කරු වශයෙන් ක්‍රියා කරනු ලැබේ.

මෙය සාමාන්‍යයෙන් මාස 03 කට වරක් රැස්වන අතර, 2011 වසර තුල එවැනි කමිටු 4 ක් පවත්වන ලදි. එම කමිටුව පහත සඳහන් කාර්යයන්හි නිරත විය.

- ගණකාධිකරණ හා අභ්‍යන්තර පාලනය ක්‍රියාපිළිවෙල පිළිබඳව සමාලෝචනය
- මූල්‍ය හා මෙහෙයුම් තොරතුරු විමර්ශනය
- ආයතනයේ මෙහෙයුම් කටයුතු වල ආර්ථික බව කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව පිළිබඳව මූල්‍ය හා මූල්‍ය නොවන පාලනයන් පිළිබඳ සමාලෝචනය කිරීම
- ආයතනයේ අභ්‍යන්තර හා බාහිර නීති රෙගුලාසි, කළමනාකරණ ප්‍රතිපත්ති හා මහපෙන්වීම් ක්‍රියාත්මක කෙරේ දැයි පරීක්ෂා කිරීම
- කළමනාකරණය විසින් අවස්ථානුකූලව පවරන ලද විශේෂ විමර්ශන

12.3. අධිකාරියේ කාර්ය සාධන හා අධීක්ෂණ ක්‍රියාවලිය

මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, සංයුක්ත සැලැස්ම පාදක කොට ගෙන සකසක අතර, එය අනුමැතිය සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පිළිගන්වනු ලැබීය. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු එම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ඒ ඒ අංශවලට ඉදිරිපත් කරනු ලැබේ. ඉන්පසු ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සහ අරමුණු සපුරාගත හැකි වන පරිදි එය ක්‍රියාත්මක කරන්නේ ද යන්න මාසිකව ප්‍රගතිය විමසන ලද අතර, ත්‍රෛයිමාසික ප්‍රගති වාර්තා සහ විචලාය්‍යන් අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය උපදෙස් සඳහා ඉදිරිපත් කරන ලැබේ.

මේ ආකාරයේ මාසික, ත්‍රෛයිමාසික, වාර්ෂික ප්‍රගති වාර්තා, මුදල් සංසරණ වාර්තා, මූල්‍යමය ප්‍රගතිය, මිලදී ගැනීම් පිළිබඳ විස්තරාදිය අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් හා අනුමැතිය පිණිස ඉදිරිපත් කරනු ලැබේ.

මෙම කාර්ය සාධන ඇගයීමේ ප්‍රධාන අරමුණ වන්නේ, ආයතනයේ මානව සම්පත් සංවර්ධනය තුලින් ආයතනයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩි දියුණු කිරීම වේ.

තවද, අධිකාරියේ කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම සඳහා ගරු පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සෑම මසකටම වරක් ප්‍රගති සමාලෝචන රැස්වීමක් පවත්වන අතර, මෙහිදී සෑම ඒකකයකම, සෑම පළාත් කාර්යාලයකම ප්‍රගතිය සියුම් ලෙස සමාලෝචනයට ලක් කෙරේ.

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අධ්‍යක්ෂ ජනරාල් හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සහභාගිත්වය ඇතිව මසකට වරක් කළමනාකාරීත්ව කමිටු රැස්වීම පවත්වන අතර, මෙම රැස්වීමේ දී අධිකාරියේ සැබෑ ප්‍රගතිය පිළිබඳ විමසීමට හාජනය කරන අතර, ඒ ඒ මාසයේ ඉලක්කයන්ට එරෙහිව ලබාගත් ප්‍රගතිය හා යම් ආකාරයකින් ඉලක්කයන් සපුරාගත නොහැකි වී තිබේ නම්, ඊට හේතු සොයා බලා, එම බාධකයක් මඟ හැරීම සඳහා විසඳුම් යෝජනා කෙරේ.

12.4. කාර්ය සාධන ප්‍රගතිය

අධිකාරියේ සෑම නිලධරයෙකු හා සේවකයෙකුම වාර්ෂිකව කාර්ය සාධන ඇගයීමට ලක් කෙරෙන අතර, මෙම ඇගයීම හුදෙක් ඒ ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ වාර්ෂික වැටුප් වර්ධකය ලබාදීමේ අරමුණින් ක්‍රියාත්මක වන්නකි. මේ සඳහා නිර්නායකයන් කිහිපයක් එනම් දැනුම, ආකල්ප, කුසලතා, ඉලක්ක සපුරා ගැනීම, මහජන සම්බන්ධතාවය, පැමිණීම හා අවංක භාවය යන නිර්නායකයක් සැලකිල්ලට හාජනය වන අතර, ඒ ඒ අංශයේ අධ්‍යක්ෂ හෝ ප්‍රධානී විසින් මෙම ඇගයීම සිදු කෙරේ.

මෙම කාර්ය සාධන ඇගයීමේ අනෙක් අරමුණ වනුයේ ආයතනයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩි කිරීම හා මානව සම්පත් සංවර්ධනය කිරීම වේ.

12.5. සංයුක්ත සැලැස්ම

2008 පෙබරවාරි මාසයේ දී ආයතනයේ 2008 - 2012 දක්වා වූ සංයුක්ත සැලැස්ම ප්‍රසිද්ධියට පත් කරන ලදි. මෙම සංයුක්ත සැලැස්මේ පස් අවුරුදු සැලැස්ම අඩංගු වන අතර, ඒ ඒ වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අඩංගු වී ඇත. එමෙන්ම, මේ කාලය තුල සැලසුම් කර ඇති ප්‍රධාන ව්‍යාපෘති, මානව සම්පත් සංවර්ධන සැලසුම්, මුදල්මය

හා භෞතික සැලසුම් සියල්ල අන්තර්ගත වී ඇත. මෙම සංයුක්ත සැලැස්ම 2011 වසර සඳහා යාවත්කාලීන කරන ලදි.

2011 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා ද සංයුක්ත සැලැස්ම පාදක කර ගන්නා ලද අතර, එය මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදි.

13.0 . මානව සම්පත් සංවර්ධන, පරිපාලන සහ මුදල් අංශය

මෙම අංශය ඒකක 03 කින් සමන්විත වේ.

i. මානව සම්පත් සංවර්ධන හා මානව සම්පත් කළමනාකරණ ඒකකය

ii. පරිපාලන ඒකකය

iii. මුදල් ඒකකය

13.1. මානව සම්පත් සංවර්ධන ඒකකය

මානව සම්පත් සංවර්ධන ඒකකය ප්‍රධාන වශයෙන් සේවක පුහුණුව හා සංවර්ධනය කිරීමේ කාර්යයයේ නියැලී සිටියි. ඊට අමතරව අභ්‍යන්තර විනය පරීක්ෂණ කටයුතු ද මෙම අංශය විසින් කරගෙන යනු ලැබේ.

2011 වර්ෂය තුලදී පහත සඳහන් දේශීය හා විදේශීය පුහුණු කිරීම් සිදු කර ඇත.

(1) **දේශීය පුහුණුවීම් :-**

(අ) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ නිලධාරීන්, මධ්‍යම කළමනාකරණ නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරීන්, ප්‍රාදේශීය පරිසර නිලධාරීන්, කළමනාකරණ සහකාරවරුන්, පුස්තකාල කාර්යය මණ්ඩලය, නීති ඒකකයේ කාර්යය මණ්ඩලය සහ අභ්‍යන්තර විගණන ඒකකයේ කාර්යය මණ්ඩලය ද ඇතුළුව නිලධාරීන් පුහුණු පාඨමාලා 45 කට යවා ඇත.

(ආ) 2011 වර්ෂය තුලදී ලබා දෙන ලද මෙම පුහුණු වැඩසටහන් අතර, පහත සඳහන් කණ්ඩායම් පුහුණු කිරීම් හා වෙනත් වැඩමුළුද ඇතුල්ව ඇත.

අනු අංකය	පුහුණු වැඩ සටහන / වැඩමුළුවේ නම	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව
01	ඉදිරිපත් කිරීමේ හැකියාවන් වර්ධනය කිරීමේ එක් දින පුහුණු වැඩ සටහන	40
02	උත්සව සංවිධානය කිරීම පිළිබඳ එක් දින වැඩ සටහන	32
03	පරිසර බලපෑම් ඇගයීම් සම්බන්ධ ඉංදියාවේ විද්‍යා හා පාරිසරික ආයතනය සමඟ පැවැත්වූ දින 05 වැඩ මුළුව	46
04	විද්‍යාත්මකව හා සුරක්ෂිතව වාහන පාවිච්චි කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව	10
05	ජාත්‍යන්තර පෙව විද්‍යාත්මක දින වැඩ සටහන	10
06	විශ්‍රාම පූර්ව පුහුණු වැඩ සටහන	26
07	ප්‍රාථමික මට්ටමේ සේවකයින් සඳහා එක් දින පුහුණු වැඩ සටහන	16
08	කර්මාන්ත පරීක්ෂා කිරීම හා වාර්තා ලිවීම සම්බන්ධව උඟව හා උතුරුමැද පළාත් කාර්යාල වල ප්‍රාදේශීය පරිසර නිලධාරීන් සඳහා පැවැත් වූ තෙදින පුහුණු වැඩ සටහන	43
09	දෙමළ භාෂාව පිළිබඳ පුහුණු වැඩ සටහන	29
10	පරිසර බලපෑම් ඇගයීම් සම්බන්ධ ඉංදියාවේ විද්‍යා හා පාරිසරික ආයතනය සමඟ පැවැත්වූ දින 04 වැඩ මුළුව	40
11	කර්මාන්ත පරීක්ෂා කිරීම හා වාර්තා ලිවීම සම්බන්ධව බස්නාහිර පළාත් කාර්යාලයේ ප්‍රාදේශීය පරිසර නිලධාරීන් සඳහා පැවැත් වූ තෙදින පුහුණු වැඩ සටහන	50

ඉහත සඳහන් කණ්ඩායම් පුහුණු කිරීම් සහ අනෙකුත් පුහුණු කිරීම් මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන යටතේ සිදුකර ඇත.

(1I) විදේශීය පුහුණු කරීම් :-

පරිසර කළමනාකරණය, පරිසර දූෂණ පාලන, අන්තරායක අපද්‍රව්‍ය කළමණාකරණය සහ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය, වායුව සහ ජල තත්ත්ව, භූගෝල තොරතුරු පද්ධතීන්, පරිසර අධ්‍යයනය, දේශගුණික විපර්යාසයන් හා

සෞඛ්‍ය ආදී ක්ෂේත්‍රයන්ට අදාලව 2011 වර්ෂය තුලදී නිලධාරීන් 118 දෙනෙකු කෙටිකාලීන විදේශ පුහුණු වැඩ සටහන් සඳහා යෝජනා කර යවා ඇති අතර, ඉන් 84 දෙනෙකු අදාල පුහුණුවීම් සඳහා තෝරාගෙන ඇත.

(1II) අභ්‍යන්තර විනය පරීක්ෂණ :-

2011 වර්ෂය තුලදී ආයතන කාර්යය මණ්ඩලයේ 19 දෙනෙකු සඳහා මූලික විනය පරීක්ෂණ කටයුතු මෙම ඒකකය විසින් සිදුකර ඇත.

13.2. මානව සම්පත් කළමනාකරණ ඒකකය

2011.01.01 දිනට අනුමත සේවක සංඛ්‍යාව 802 ක් විය.

ඒ අනුව, 2011.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 802 ක් වන අතර, ස්ථිර සේවයේ යෙදී සිටි මුළු සේවක සංඛ්‍යාව 683 ක් විය.

2011 වර්ෂයේ සේවයට බඳවා ගැනීම්, උසස්වීම්,
සේවයෙන් ඉල්ලා අස්වීම්, සේවය හැර යාම සහ විශ්‍රාම ගැනීම

සේවයට බඳවා ගැනීම්

සහකාර නීති නිලධාරී	01
ප්‍රාදෙශීය පරිසර නිලධාරී / පරිසර නිලධාරී	26
කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	03
ප්‍රාථමික මට්ටමේ (පුහුණු) රියදුරු	01
ප්‍රාථමික මට්ටමේ (නුපුහුණු) කම්කරු	06

සේවයෙන් ඉල්ලා අස්වීම්

අධ්‍යක්ෂ	01
සැලසුම් නිලධාරී	01
ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරී	01
ප්‍රාදේශීය පරිසර නිලධාරී /පරිසර නිලධාරී	07
පරිසර බලාත්මක නිලධාරී	03
ක ළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	02
ප්‍රාථමික මට්ටමේ (නුපුහුණු) කම්කරු	03

උසස්වීම්

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	02
අධ්‍යක්ෂ	01
සහකාර අධ්‍යක්ෂ	01

විශ්‍රාම යාම්

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	01
අධ්‍යක්ෂ	01
ප්‍රාදේශීය පරිසර නිලධාරී	01
ප්‍රවාහන නිලධාරී	01

13.3. මුදල් ඒකකය

2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති

13.3.1. ආයතනික තොරතුරු

13.3.1.1. නීත්‍ය නෛතික ස්වරූපය

මධ්‍යම පරිසර අධිකාරිය ව්‍යවස්ථාපිත ආයතනයකි. එහි ප්‍රධාන කාර්යාලය පිහිටා තිබෙන්නේ අංක 104, "පරිසර පියස", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව යන ලිපිනය සහිත ස්ථානයෙහිය.

13.3.1.2. ප්‍රධාන ක්‍රියාකාරිත්වයන් සහ මෙහෙයුම් ස්වභාවය

මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන ක්‍රියාකාරිත්වයන් වන්නේ අපගේ නාක්ෂණික විශේෂඥතාව සහ කැපවීම මත පදනම්ව, දූෂණ පාලනය, ස්වභාවික සම්පත් කළමනාකරණය සහ පාරිසරික අධ්‍යාපනය මගින් පරිසරය ආරක්ෂා කිරීමත් එහි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමත්ය.

13.3.1.3. සේවක සංඛ්‍යාව

වර්ෂය අවසානයේ දී සේවක සංඛ්‍යාව 683ක් විය.

13.3.2. සකස් කිරීමේ පදනම

13.3.2.1. අනුකූලතා ප්‍රකාශය

මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශ සමන්විත වන්නේ ශේෂ පත්‍රය, ආදායම හා වියදම ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් යන කොටස් වලිනි. මේ ප්‍රකාශ පිළියෙල කරනු ලබන්නේ ශ්‍රී ලංකා

වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (ICASL) විසින් නියම කරනු ලැබ ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති වලට අනුකූලවය.

13.3.2.2. මැනීමේ පදනම

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලැබ ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම මතය. උද්දමනකාරී සාධක සම්බන්ධයෙන මූල්‍ය ප්‍රකාශ වල ගැලපීම් සිදු කර නැත.

13.3.2.3. කාර්යබද්ධ සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

මේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබන්නේ මධ්‍යම පරිසර අධිකාරියේ කටයුතු සිදුවන මූල්‍ය ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

13.3.3. මූලික ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති

මෙහි පහත දැක්වෙන ගිණුම් තැබීම් ප්‍රතිපත්ති, මේ මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කරනු ලබන සියලුම කාල පරිච්ඡේද සඳහා අනුකූල වන ආකාරයෙන් අදාල කරගනු ලැබ ඇත.

13.3.3.1. දේපළ, යන්ත්‍ර හා උපකරණ

දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ වල පිරිවැය යනු වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජනය සඳහා ක්‍රියාත්මක තත්ත්වයට එය ගෙන ඒමේ දී වැය වන යම් වියදමක් වේ නම් එයත් සමඟ එකී වත්කම ලබා ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය වේ. ගත් මිලට ඇති වත්කම් වශයෙන් වත්කමක් මුලින් පිළිගැනීමට යටත්ව, නැවත අගය කරනු ලබන වත්කම් පවත්වාගෙන යනු ලබන්නේ ඒවායේ කවර හෝ කාලීන ක්ෂය වීමක් ඇත්නම් එය අඩු කිරීමෙන් පසු නැවත අගය කරනු ලබන ප්‍රමාණයේ වටිනාකමටය. අනෙකුත් සියලුම වත්කම්, යන්ත්‍රාගාර හා උපකරණ සඳහන් කරනු ලබන්නේ සමුච්චිත ක්ෂය වීම අඩු කළ පසු පිරිවැයටය. යම් දේපළක්, යන්ත්‍රාගාරයක් සහ උපකරණ අයිතමයන් වෙනස් ප්‍රයෝජනවත් ආයුකාලයන් සහිත සංරචක වලින් සමන්විත වන අවස්ථාවලදී ඒවා ගණන් ගනු ලබන්නේ වෙන ම දේපළ, යන්ත්‍රාගාර හා උපකරණ අයිතමයක් වශයෙනි. වත්කමේ ශේෂ අගයන්, ප්‍රයෝජනවත් ආයු කාලයන් හා ක්ෂයවීමේ ක්‍රමය යෝග්‍ය වේ නම් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ දී සමාලෝචනයට හා ගැලපීම් වලට ලක් කරනු ලැබේ.

දේපළ, යන්ත්‍ර හා උපකරණ - ප්‍රධානය වශයෙන් ලැබුණු

ඕනෑම ප්‍රදේශයක් යටතේ අත්පත් කරගනු ලැබ ඇති දේපළ, යන්ත්‍ර සහ උපකරණ පිරිවැයට ප්‍රාග්ධනකරණය කරනු ලැබේ. දේපළ, යන්ත්‍ර, උපකරණ සහ අනෙකුත් සින්නක්කර ඉඩම් සඳහන් කරනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂය වීම අඩු කිරීමෙන් පසුය. සින්නක්කර ඉඩම පිරිවැයට දක්වා ඇත.

ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලයන් තුළ දී පිරිවැය කපා හැරීම සඳහා, සින්නක්කර ඉඩම් හැරුණු විට දේපළ, යන්ත්‍ර සහ උපකරණ සම්බන්ධයෙන් ක්ෂය වීම අඩු කරනු ලැබේ.

මිලදී ගැනීමේ වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසා ඇති අතර, බැහැර කිරීම සම්බන්ධයෙන් සැලකීමේ දී බැහැර කිරීමේ වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසනු නොලැබේ.

පහත දැක්වෙන පරිදි සෘජු රේඛීය පදනමක් මත දේපළ, යන්ත්‍ර හා උපකරණ ක්ෂය කරනු ලැබේ. තවද, ශ්‍රී ලංකා ගිණුම් තැබීමේ ප්‍රමිතිය 18 හි නියම කරනු ලැබ ඇති පිරිවැය ක්‍රමය අනුව සියලුම දේපළ, යන්ත්‍ර හා උපකරණ ගිණුම්ගත කර ඇත.

1. මෝටර් රථ - වර්ෂයකට 25%
2. ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ - වර්ෂයකට 10%
3. රසායනාගාර උපකරණ - වර්ෂයකට 10%
4. පුස්තකාල පොත් - වර්ෂයකට 10%
5. ගොඩනැගිලි - වර්ෂයකට 2.5%
6. ගොඩනැගිලි - පින්තාරු කිරීම - වර්ෂයකට 20%

දේපළ, යන්ත්‍ර හෝ උපකරණ අයිතමයක් බැහැර කිරීමේ අවස්ථාවකදී හෝ එය භාවිත කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන අවස්ථාවකදී එකී අයිතමය පිළිගැනීමෙන් ඉවත් කරනු ලැබේ. වත්කම පිළිගැනීමෙන් ඉවත් කිරීමෙන් ඇති වන යම් ලාභයක් හෝ පාඩුවක් (බැහැර කිරීමෙන් ලැබෙන ශුද්ධ ලැබීම් සහ වත්කම් පවත්වාගෙන යෑමට ලැබෙන ආදායම අතර වෙනස වශයෙන් කරනු ලබන) වේ නම් එය එකී වත්කම පිළිගැනීමෙන් බැහැර කරන වර්ෂයේ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

2011.12.31 දිනට මූල්‍ය ප්‍රකාශය

මූලින් ම තක්සේරු කරන ලද කාර්ය සාධන ප්‍රමිතියෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභය ප්‍රතිස්ථාපනය කිරීම හෝ පවත්වාගෙන යෑම පිණිස, දේපළ, යන්ත්‍ර හා උපකරණ අලුත්වැඩියාව හෝ නඩත්තුව සඳහා දරණු ලබන වියදම, එය සිදු වන අවස්ථාවේ දී වියදමක් වශයෙන් පිළිගනු ලැබේ.

13.3.3.2. ඉන්වෙන්ටරි

මුදල් වර්ෂය තුළදී භාවිත කරන ලද ඉන්වෙන්ටරි ආදායම් හා වියදම් ප්‍රකාශයට ඇතුළත් කර ඇත්තේ පිරිවැයටය.

ඉතිරි තොග තක්සේරු කරනු ලැබ ඇත්තේ පිරිවැය, විකුණුම් මිල හෝ ලබාගත හැකි ශුද්ධ වටිනාකම යන ඒවායින් වඩා අඩු ප්‍රමාණයටය.

රසායන ද්‍රව්‍ය සහ විදුරු බඩු සැලකීමේ දී, වසර තුල කරන ලද සියලු මිලදී ගැනීම් පරිභෝජනය සේ සලකන ලදි. මේ ක්‍රමය අනුගමනය කරන ලද්දේ ඒවා මැනීමේ දුෂ්කරතාවත්, භාවිතයේ සාපේක්ෂ අඩු පිරිවැයත් හේතුකොටගෙනය.

13.3.3.3. කෙටි කාලීන ආයෝජන

වසර තුනකට වැඩි කල් පිරීම් කාලයක් සහිත මුදල් වෙළඳපොල සාධන පත්‍ර වල කරනු ලබන ආයෝජන කෙටිකාලීන ආයෝජන වශයෙන් සලකනු ලබන අතර පිරිවැයට දක්වා ඇත.

13.3.3.4. මුදල් හා මුදල් වලට සමාන දේ

මුදල් හා මුදල් වලට සමාන දේවල් සමන්විත වන්නේ ඇතැති මුදල් සහ බැංකුවේ තිබෙන ඒක්ෂණ තැන්පතු යන අයිතමයන්ගෙනි.

13.3.3.5. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලැබ ඇත්තේ වක්‍ර ක්‍රමය භාවිත කරමිනි.

13.3.3.6. බැරකම් සහ ප්‍රතිපාදන

බේරුම් කිරීමක් සිදු කළහොත් ආර්ථික ප්‍රතිලාභ ගෙන දෙමින් සම්පත් බැහැරකරලීමක් ඇති කරනු ඇතැයි අපේක්ෂිත අතීත සිදුවීම් වල ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන බැඳීමක් සිදුවන අවස්ථාවලදී බැරකම් ශේෂ පත්‍රයේ පිළිගනු ලැබේ. ණය හිමියන් ඉල්ලන විට හෝ ශේෂ පත්‍ර දිනයෙන් වසරක් ඇතුළත ඉටුකළ යුතු බැඳීම්, ජංගම බැරකම් වශයෙන් ශේෂ පත්‍රයේ සලකනු ලැබේ.

යම් අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන්, විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි වර්තමාන නෛතික හෝ වර්ධනාත්මක බැඳීමක් මධ්‍යම පරිසර අධිකාරිය සතු වන අවස්ථාවකදී සහ බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ බැහැර ගැලීමක් සිදුවීමට ඉඩ ඇති අවස්ථාවකදී ප්‍රතිපාදන පිළිගනු ලැබේ.

13.3.3.7. බදුකරණය

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ සහ එහි සංශෝධන වල විධිවිධාන වලට අනුකූලව බදු වියදම් මූල්‍ය ප්‍රකාශයේ සඳහන් කරනු ලබන අතර ඒ අනුව ගණනය කර ඇත.

13.3.3.8. සේවක ප්‍රතිලාභ

I නිර්වචනය කරන ලද දායකත්ව සැලැස්ම

නිර්වචනය කරන ලද දායකත්ව සැලැස්මට ඇති බැඳීම් ආදායම් ප්‍රකාශයේ පිළගනු ලබන්නේ දරණ ලද වියදම් වශයෙනි. මධ්‍යම පරිසර අධිකාරිය සේවකයින්ගේ දළ ලැබීම් වලින් 15% ක් සහ 3% ක් පිළිවෙලින් අර්ථසාධක අරමුදලට හා භාර අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවයි.

II නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලැස්ම

පාරිතෝෂිකය නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලැස්මකි. අදාළ ව්‍යවස්ථා ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට මධ්‍යම පරිසර අධිකාරිය බැඳී සිටී. මෙ බැඳීම් ඉටු කිරීම සඳහා, සේවයේ පළමු වර්ෂයෙන් ආරම්භ වී, සම්පූර්ණ කරනු ලබන සියලු සේවකයින්ගේ අවසාන මුදල් වර්ෂයේ අඩ මසක වැටුපට සමාන මුදලක් ශේෂ පත්‍රයේ ඉදිරියට ගෙන යෑමට ප්‍රතිපාදන සලසා ඇත.

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු පාරිතෝෂික සම්බන්ධයෙන් සියලු ම සේවකයින්ගේ විශ්‍රාම පාරිතෝෂික සඳහා විධිවිධාන සලසනු ලැබේ. ශේෂ පත්‍රයේ ජංගම නොවන වගකීම් යටතේ මේ අයිතමය වර්ගීකරණය කර තිබේ.

මහා භාණ්ඩාගාරය පවසන පරිදි, අවශ්‍ය අවස්ථා වලදී එය විසින් අරමුදල් ප්‍රදානය කරනු ලබන නිසා අරමුදනක් අවශ්‍ය නොවේ.

13.3.3.9. ආදායම් පිළිගැනුම

ආදායම මෙන්ම වියදම ද උපචිත පදනමක් මත ගිණුම්ගත කර තිබේ. අවුරුදු 3කට නිකුත් කරනු ලබන බලපත්‍ර නිකුත් කිරීමෙන් ඉපැයෙන ආදායමට ඇතුලත් වන්නේ 2011 ඉපැයූ ආදායම් වලින් 1/3 ක් පමණක් වන අතර ඊට පෙර වසර දෙක සඳහා ගලපනු ලැබ ඇත. ඊට අමතරව, එක් වර්ෂයකදි නිකුත් කරන ලද දිනය නොසලකා ඒ වසරේ ම ආදායම වශයෙන් ගණනය කර ඇත.

පොලී සහ බදු කුලී ආදායම් හැර අනෙකුත් ආදායම් මුදල් පදනමක් මත සඳහන් කර ඇත.

13.3.3.10. තුලනාත්මක තොරතුරු

අවශ්‍ය අවස්ථාවලදී, වර්තමාන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා තුලනාත්මක සංඛ්‍යා නැවත සකස් කරනු ලැබ ඇත.

13.3.3.11. ශේෂ පත්‍ර දිනකට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනකට පසු සියලු වැදගත් සිදුවීම් සලකනු ලැබ ඇති අතර යෝග්‍ය අවස්ථා වලදී මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අදාල සටහන්වල ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදු කර ඇත.

13.3.3.12. බැඳීම් සහ අවිනිෂ්චිත අවස්ථා

අවිනිෂ්චිත අවස්ථා යනු අවිනිෂ්චිත අනාගත සිදුවීම් ඇතිවීම හෝ ඇති නොවීම මත පමණක් සනාත කරනු ලබන, මධ්‍යම පරිසර අධිකාරියේ පාලනයෙන් තොර අතීත සිදු වීමකින් පැන නඟින වියහැකි වත්කම් හෝ බැරකම්ය.

13.3.3.13. ප්‍රධානයන් ගිණුම් තැබීම

i. ආණ්ඩුවේ ප්‍රදානයන්

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 24 ප්‍රකාරව ඉදිරිපත් කිරීමේ ක්‍රමය ඇතුලුව ආණ්ඩුවේ ප්‍රදාන සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය මෙසේය -:

(අ) වත්කම් මිලදී ගැනීම සඳහා වන ආණ්ඩුවේ ප්‍රදානයන්, වත්කම්වල ඵලදායී ආයුකාලය තුළ ආදායමක් වශයෙන් පිළගනු ලැබේ.

(ආ) විදේශ නියෝජිත ආයතන වලින් ලැබුණු අනෙකුත් පුනරාවර්තන ප්‍රදානයන් මෙන්ම ඒවායේ වියදම් ද 2011 ලාභ අලාභ ගිණුමට ඇතුළත් කරනු ලැබ ඇත.

(ඇ) පාසල් වැඩ සටහන් සඳහා වන ආණ්ඩුවේ ප්‍රදානයන් වර්ෂයේ වියදම් වශයෙන් සලකනු ලැබේ. ඊට හේතුව ඒවායින් ස්පෘශ්‍ය වත්කම් ඇති නොවන නිසාය.

ii. වෙනත් නියෝජිත ආයතන වලින් ලද ප්‍රාග්ධන ප්‍රදානයන්

ආණ්ඩුවේ ප්‍රදානයන් ගිණුම් තැබීම සඳහා අනුගමනය කරන ලද ක්‍රමයම වෙනත් නියෝජිත ආතන වලින් ලද ප්‍රාග්ධන ප්‍රදානයන් සම්බන්ධයෙන් ද අනුගමනය කරනු ලැබ ඇත.

(අ) වත්කම් වල ඵලදායී ආයුකාලය තුළ ලද ආදායමක් වශයෙන් වත්කම් වල පිරිවැය පිළිගනු ලැබේ.

2011 වසර තුළදී මධ්‍යම පරිසර අධිකාරිය පහත දැක්වෙන ප්‍රදානයන් ලබාගෙන තිබේ.

භාණ්ඩාගාරය - පුනරාවර්තන	275,997,000
භාණ්ඩාගාරය - ප්‍රාග්ධන - මුදලින්	19,700,000
භාණ්ඩාගාරය - ප්‍රාග්ධන - රථවාහන	5,600,000
ප්ලාස්ටික් ව්‍යාපෘතිය	1,244,880
ඉ-අපද්‍රව්‍ය ව්‍යාපෘතිය	60,000
ප්‍රදාන	428,422

ප්‍රාග්ධන ප්‍රධානයන් පහත දැක්වෙන පරිදි භාවිත කරනු ලැබ ඇත.

	රු.
ද්විතීය පාසල් මට්ටමේ පරිසර අධ්‍යාපන වැඩසටහන්	4,904,704
කාර්යාල උපකරණ - භාණ්ඩාගාරය	5,693,032
කාර්යාල උපකරණ - ප්ලාස්ටික	832,330
කාර්යාල උපකරණ - විද්‍යුත් අපද්‍රව්‍ය	60,000

	රු.
කාර්යාල උපකරණ - ප්‍රදාන	383,200
පුස්තකාල පොත් - භාණ්ඩාගාරය	520,650
පුස්තකාල පොත් - ප්‍රදාන	45,222
ගෘහ භාණ්ඩ	169,247
ගොඩනැගිලි - ප්ලාස්ටික්	412,550
රසායනාගාර උපකරණ	391,100
ප්‍රාදේශිය කාර්යාල ප්‍රාග්ධන වියදම්	1,662,797
රථවාහන - භාණ්ඩාගාරය	521,000
රථවාහන - ප්‍රදාන	5,600,000
GIT සහ WIP	4,573,203

13.3.3.14. විවිධ ණය ගැතියන්

ශ්‍රී ලාල් කල්දේරා මහතා 2006 දී මිය ගියේය. අධිකරණ නීන්දුව ලබා දුන් පසු, ඔහුට ලබාදෙන ලද අත්තිකාරම් මුදල කපා හැරීම සඳහා කටයුතු කරනු ලැබේ.

13.3.3.15. ආයෝජනය

ස්ථාවර තැන්පතු වල සහ කෙටිකාලීන තැන්පතුවල ආයෝජන පිරිවැයට දක්වා ඇත. එවැනි ආයෝජන වලින් ලද ආදායම් උපචිත පදනමක් මත හිණුම්ගත කර ඇත.

13.3.3.16. හදිසි අවස්ථා සහ බැඳීම්

මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව අධිකරණයේ නඩු 13 ක් පවරනු ලැබ ඇති අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය බැඳීම් නැති බව සඳහන් කළ යුතු ව ඇත.

13.3.4. මධ්‍යම පරිසර අධිකාරිය (60%), මොරටුව විශ්ව විද්‍යාලය (10%) සහ එන්. ඩී. ආනන්ද විතානගේ මහතා (වන නිපැයුම්කරු 30%) විසින් හවුලේ පිහිටුවන ලද සීමා සහිත පොලිප්ටෝ ලංකා (පෞද්.) සමාගම, අති විශේෂ ගැසට් නිවේදනයක් මඟින් 2010 ඔක්තෝම්බර් 04 දින විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගන්නා ලදි. භාණ්ඩාගාරයේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට අරමුදල් ලැබුණු වහාම රු. 22,790,683.26 ක මුදල ප්‍රතිපූරණය කිරීම සඳහා කටයුතු කරන බව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය අපට දන්වා ඇත.

මධ්‍යම පරිසර අධිකාරිය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

	සටහන	2011	2010
		රු	රු
මෙහෙයුම් ආදායම්			
පුනරාවර්තන ප්‍රදානය භාණ්ඩාගාරය		275,997,000.00	260,000,000.00
වෙනත්	4	53,586,855.36	57,804,092.57
විලම්බිත ආදායම		37,263,985.30	31,616,696.53
වෙනත් ආදායම්	4	142,354,783.66	111,087,594.76
පාසල් වැඩසටහන් භාණ්ඩාගාරය		5,000,000.00	5,000,000.00
මුළු ආදායම්		**514,202,624.32**	**465,508,383.86**
මෙහෙයුම් වියදම්			
පුද්ගල පඩිනඩි	5	303,173,110.42	278,426,496.63
ගමන් වියදම්	6	14,539,339.06	11,558,168.61
සැපයුම් සහ භාවිත කරන ලද පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	7	27,429,863.08	19,787,436.97
නඩත්තු	8	18,086,067.68	12,921,496.59
ගිවිසුම්ගත සේවා	9	33,576,278.78	31,345,708.87
පර්යේෂණ හා සංවර්ධන	10	15,102,434.34	11,068,466.44
ක්ෂය වීම සහ ක්‍රමක්ෂය වීම	11	37,263,985.30	31,616,696.53
වෙනත් මෙහෙයුම් වියදම්	12	4,010,894.40	2,444,368.58
ව්‍යාපෘති ක්‍රියාකාරකම්	13	54,412,218.54	56,928,814.93
මුළු මෙහෙයුම් වියදම්		**507,594,191.60**	**456,097,654.15**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අතිරික්තය/(හිඟය)		**6,608,432.72**	**9,410,729.71**
මූල්‍ය පිරිවැය			
බැංකු ගාස්තු		303,171.62	539,617.68
මුළු මෙහෙයුම් නොවන පිරිවැය		**303,171.62**	**539,617.68**
කාල සීමාව තුළ ශුද්ධ අතිරික්තය / (හිඟය)		**6,305,261.10**	**8,871,112.03**

මධ්‍යම පරිසර අධිකාරිය

2011 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන	2011	2010
		රු	රු
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, යන්ත්‍ර හා උපකරණ	14	325,038,024.93	346,011,157.29
ආයෝජන	15	9,960,000.00	9,960,000.00
සංවල භාණ්ඩ සහ ක්‍රියාත්මකව පවතින වැඩ	16	4,573,203.00	-
ජංගම වත්කම්			
ඉන්වෙන්ටරි	17	5,998,630.19	7,733,106.72
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේවල්	18	67,626,955.39	54,054,404.67
පූර්ව ගෙවීම්	19	4,410,304.74	4,319,165.49
මුදල් හා මුදල් වලට සමාන දේ	20	87,294,990.94	75,134,681.77
මුළු වත්කම්		**504,902,109.19**	**497,212,515.94**
බැරකම්			
ජංගම බැරකම්			
ගෙවිය යුතු			
උපචිත වියදම්	21	37,108,280.67	38,113,007.72
විලම්බිත ආදායම් සංචිතය	22	43,959,269.64	34,237,800.39
කොම්පෝස්ට් බඳුන් සංචිතය		10,137,020.00	10,670,729.46
බැංකු අයිරා - ලංකා බැංකුව පැලවත්ත - 2937341		7,802,480.63	7,442,330.63
		-	100.00
ජංගම නොවන බැරකම්			
පුනරාවර්තන ප්‍රදානය			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය -	23	26,521,836.03	32,452,141.26
	24	110,125,260.56	96,123,022.50
මුළු බැරකම්		**235,654,147.53**	**219,039,131.96**
මුළු ශුද්ධ වත්කම්			

	සටහන	2011	2010
		269,247,961.66	278,173,383.98
ශුද්ධ වත්කම් / කොටස්			
සමුච්චිත අරමුදල		73,573,242.64	73,573,242.64
ඉ/ගෙ අතිරික්තය			
වර්ෂය සඳහා අතිරික්තය / (හිහය)		(53,178,545.18)	(62,049,657.21)
ප්‍රාග්ධන ප්‍රදානයන්		6,305,261.10	8,871,112.03
	25	242,548,003.10	257,778,686.52
		269,247,961.66	278,173,383.98

මධ්‍යම පරිසර අධිකාරිය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන	2011	2010
		රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරිත්වයන්ගෙන් / (භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ			
මෙහෙයුම් කටයුතු වලින් අතිරික්තය		6,305,261.00	8,871,112.03
ගලපන ලද්දේ :			
ක්ෂය වීම	11	37,263,985.30	31,616,696.53
යතුරුපැදි හිමිකම පැවරීමේදි අතිරික්තය		(7,555,887.12)	
කාර්යාල උපකරණ වලට ගැලපීම		-	262,113.78
විලම්බිත ආදායම		(533,709.46)	2,458,008.58
මූල්‍ය පිරිවැය		303,171.62	539,617.68
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය	5	17,162,990.56	8,964,854.75
		52,945,812.00	52,712,403.35
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර - මෙහෙයුම් ලාභය	17	1,734,476.53	(294,378.28)

ඉන්වෙන්ටරි වල (වැඩි වීම්) / අඩු වීම	18	(13,572,550.72)	(947,153.16)
වෙළඳ හා අනෙකුත් ලැබීම් වල (වැඩිවීම) / අඩු වීම	19	(91,139.25)	1,214,691.00
පූර්ව ගෙවීම් වල (වැඩිවීම) / අඩු වීම	21	(1,004,727.05)	4,945,904.03
ගෙවිය යුතු දේවල වැඩි වීම / (අඩුවීම)	22	9,721,469.25	4,959,705.29
උපචිත වියදම්වල වැඩි වීම / (අඩු වීම)		360,150.00	409,950.00
කොම්පෝස්ට් බඳුන් සංචිතයේ වැඩි වීම / (අඩු වීම)	23	(5,930,305.23)	(7,324,989.70)
පුනරාවර්තන ප්‍රදානයන්		44,163,185.53	55,676,132.53
මෙහෙයුම් වලින් ලද මුදල්		(303,171.62)	(539,617.68)
ගෙවන ලද මූල්‍ය පිරිවැය		(3,160,752.56)	(2,236,154.75)
ගෙවන ලද පාරිතෝෂික			
මෙහෙයුම් කටයුතු වලින් / (භාවිත කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහ		**40,699,261.35**	**52,900,360.10**
ආයෝජන ක්‍රියාකාරිත්වයන්ගෙන් (භාවිත කරන ලද) මුදල් ප්‍රවාහයන්	-	-	-
දේපළ යන්ත්‍ර හා උපකරණ අත්පත්කර ගැනීම	14.1	(16,291,127.69)	(18,472,527.47)
යතුරුපැදි හිමිකම පැවරීමෙන් ලත් මුදල්		7,556,161.93	-
ආයෝජන ක්‍රියාකාරිත්වයන්ගෙන් / (භාවිත කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහ		**(8,734,965.76)**	**(18,472,527.47)**
මූල්‍ය සම්පාදන කටයුතු වලින් / (භාවිත කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහ	25	-	-
ප්‍රාග්ධන ප්‍රධානයෙන්ගෙන් ලත් මුදල්		(15,230,683.42)	(12,753,794.92)
මූල්‍ය සම්පාදන කටයුතු වලින් / (භාවිත කරන) ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**(15,230,683.42)**	**(12,753,794.92)**
මුදල් හා මුදල් වලට සමාන දේවල් ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		16,733,612.17	21,674,037.71
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් වලට සමාන දේ	20	75,134,581.77	53,460,544.06
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් වලට සමාන දේ	20	87,294,990.94	75,134,581.77

මධ්‍යම පරිසර අධිකාරිය
2011 දෙසැම්බර් 31 දිනට කොටස් වෙනස්කම්
පිළිබඳ ප්‍රකාශය

	පාලක මණ්ඩලයේ හිමිකරුවන්ට අදාළ කල හැකි			මුළු ශුද්ධ
	සමුච්චිත අරමුදල	මෙහෙයුම් අතිරික්තය/(හිඟය)	ප්‍රාග්ධන ප්‍රදානය	වත්කම් / කොටස්
	රු.	රු.	රු.	රු.
2010 දෙසැම්බර් 31 දිනට ශේෂය				
සමුච්චිත අරමුදල	73,573,242.64			73,573,242.64
ඉ/ගෙ අතිරික්තය		(62,049,657.21)		(62,049,657.21)
වර්ෂයේ අතිරික්තය / (හඟය)		8,871,112.03		8,871,112.03
ප්‍රාග්ධන ප්‍රධානයන්			257,778,686.52	257,778,686.52
	73,573,242.64	**(53,178,545.18)**	**257,778,686.52**	**278,173,383.98**
2011 වර්ෂයේ ශුද්ධ වත්කම් / කොටස්වල වෙනස්කම්				
වර්ෂයේ අතිරික්තය / (හිඟය)		6,305,261.10		6,305,261.10
ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් ලත් මුදල්			(15,230,683.42)	(15,230,683.42)
2011 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන ගිය ශේෂය	**73,573,242.64**	**(46,873,284.08)**	**242,548,003.10**	**269,247,961.66**

සටහන 4 අ.	2011	2010
<u>මෙහෙයුම් ආදායම</u>	රු.	රු.
<u>අනෙකුත් පුනරාවර්තන ප්‍රදානයන්</u>		
පාරිසරික සම්පත් තොරතුරු පද්ධතිය	245,956.00	851,565.33
මාලේ සම්මුති ව්‍යාපෘතිය	404,986.69	337,633.84
පරිසර දූෂණ ක්‍රියාකාරකම් සම්බන්ධ දත්ත සමුදාය සංවර්ධනය	1,360,001.91	1,056,292.42
KITA වැඩසටහන	142,301.43	519,539.85
ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය	42,820,635.04	50,459,231.04
අවට පරිසර වායු තත්ත්ව වැඩසටහන	651,000.00	283,536.54
ජලයේ ගුණාත්මකභාවය - මහා පරිමාණ	506,459.20	956,188.22
පරිසර නියමු වැඩසටහන - අමාත්‍යාංශය	5,000,000.00	2,341,000.00
ප්‍රජා මූල ජල තත්ත්ව කළමනාකරණ වැඩසටහන	527,241.00	296,650.00
ජල තත්ත්ව අධීක්ෂණ වැඩසටහන	374,699.96	400,000.00
ප්‍රධාන ජලාශ තුනක ජලයේ ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම	374,443.11	302,455.33
තෙත් බිම් දිනය CBL	887,212.00	-
විද්‍යුත් - අපද්‍රව්‍ය වැඩසටහන	291,919.02	-
එකතුව	**53,586,855.36**	**57,804,092.57**

සටහන 4 ආ	2011	2010
	රු.	රු.
මෙහෙයුම් ආදායම		
වෙනත් ආදායම්		
පරීක්ෂණ ගාස්තු	68,070,044.73	58,780,107.87
බලපත්‍ර ගාස්තු	32,093,664.46	30,540,457.47
ආයෝජන මණ්ඩල පරීක්ෂණ ගාස්තු	2,727,500.00	2,858,500.00
ආයෝජන මණ්ඩල බලපත්‍ර ගාස්තු	2,980,000.00	1,375,250.00
උපදේශන ගාස්තු	742,351.66	656,747.29
පරීක්ෂණ පිපිරවීම	2,152,564.63	1,671,069.42
පරිසර බලපෑම් තක්සේරු සහ IEE ව්‍යාපෘති ආදායම	5,158,674.72	3,996,902.80
අන්තරායකර අපද්‍රව්‍ය වැඩසටහන	494,108.27	594,710.47
EIA සහ MHP හිමිකම් පැවරුම	175,000.00	100,000.00
ජල තත්ත්වය	906,103.78	618,957.81
උසාවි නඩු ආදායම්	637,167.00	840,400.00
විද්‍යුත් සිතියම	68,463.21	117,932.00
ලෝක පරිසර දිනය	115,000.00	154,000.00
තෙත් බිම් දින ආදායම	-	826,820.80
පාරිසරික PB කඳවුර	75,000.00	-
Go Green ගස් සිටු වීමේ ව්‍යාපෘතිය	50,000.00	-
යෝග්‍යතා පරීක්ෂණ වැඩසටහන	102,500.00	-
බොල්ගොඩ නාම පුවරුව	150,000.00	-
ආයෝජකයන් සහ කර්මාන්ත සඳහා සම්මන්ත්‍රණය	76,255.00	-
ගොඩනැගිලි කුලිය	4,171,370.76	4,195,495.89
ශ්‍රවණාගාර ගාස්තු	55,500.00	62,000.00
පොලී ආදායම	2,097,613.63	2,146,718.28
පොත් සහ ප්‍රකාශන අලෙවිය	17,566.50	141,153.00
වීරවිල බංගලා ගාස්තු	102,453.00	38,116.13
ආපසු නොගෙවෙන ටෙන්ඩර් තැන්පතු	174,839.49	257,713.00
වාහන කුලියට ගැනීමේ ගාස්තු MALE සහ වෙනත්බැඳුම්කරය	-	153,750.00
පියවීම - පණ්ඩිතරත්න මිය	325,000.00	300,000.00
30 වැනි සංවත්සර ප්‍රදානය	1,000,000.00	-
රක්ෂණ හිමිකම් ම.ප.අ.	273,200.26	248,340.21
විවිධ ආදායම්	293,026.99	412,452.32
යතුරුපැදි හිමිකම් පැවරුම් අතිරික්තය	7,555,887.12	-
සංචල නොවන පුනරාවර්තන ප්‍රදාන පැවරුම්	9,513,928.45	-
එකතුව	**142,354,783.66**	**111,087,594.76**

සටහන 5	2011	2010
	රු.	රු.
පුද්ගල පඩිනඩි		
වැටුප් සහ වේතන	239,382,297.75	226,376,651.28
සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල්	33,206,189.61	31,573,493.33
සේවක භාරකාර අරමුදලේ දායක මුදල්	6,644,690.45	6,315,796.97
අතීතකාල සහ නිවාඩු ගෙවීම්	6,504,587.73	4,994,391.38
පාරිතෝෂික ප්‍රතිපාදන	17,162,990.56	8,964,854.75
මණ්ඩල සාමාජික දීමනා	121,116.00	30,200.00
සහා සාමාජික දීමනා	60,712.00	107,056.32
සංග්‍රහ වියදම්	90,526.32	64,052.60
එකතුව	**303,173,110.42**	**278,426,496.63**

සටහන 6	2011	2010
	රු.	රු.
ගමන් වියදම්		
දේශීය	10,788,619.67	9,618,653.33
විදේශීය	3,750,719.39	1,939,515.28
එකතුව	**14,539,339.06**	**11,558,168.61**

සටහන 7	2011	2010
	රු.	රු.
සැපයුම් සහ පරිභෝජ්‍ය ද්‍රව්‍ය		
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	6,065,403.16	4,320,074.21
ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය	19,661,648.67	14,874,068.27
නිල ඇඳුම්	201,673.40	172,520.87
මුද්‍රණ	74,729.00	4,300.00
පුවත්පත්	288,137.00	241,581.00
වාර සඟරා, ෆැක්ස් පත්‍රිකා සහ පෝස්ටර්	1,138,271.85	174,892.62
එකතුව	**27,429,863.08**	**19,787,436.97**

සටහන 8	2011	2010
	රු.	රු.
නඩත්තු		
වාහන අලුත්වැඩියා සහ නඩත්තු වියදම්	10,446,005.66	6,322,122.67
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	3,374,428.27	2,785,786.08
කාර්යාල හා රසායනාගාර උපකරණ	4,122,717.93	3,802,970.40

විදුලි ජනක යන්ත්‍රය	142,915.82	10,617.44
එකතුව	**18,086,067.68**	**12,921,496.59**

සටහන 9	2011	2010
	රු.	රු.
ගිවිසුගත සේවා		
විදුලිය	9,672,649.37	7,892,751.25
ආරක්ෂක සේවා	5,841,327.74	5,891,929.29
රක්ෂණ	3,747,335.16	3,790,849.48
තැපැල් ගාස්තු	1,852,406.30	1,811,232.19
දුරකථන	5,312,166.90	5,158,501.51
ගොඩනැගිලි කුලී	2,396,656.54	2,086,076.58
ජල සම්පාදන	771,338.21	916,052.82
ආර්ථික සේවා ගාස්තු	100,774.75	848,887.33
ජාතිය ගොඩනැගීමේ බද්ද	2,114,257.28	2,091,993.68
විගණන ගාස්තු	710,787.00	800,205.00
සාමාජික ගාස්තු	1,056,579.53	57,229.74
එකතුව	**33,576,278.78**	**31,345,708.87**

සටහන 10		2011	2010
		රු.	රු.
පර්යේෂණ සහ සංවර්ධනය			
පරිසර අධ්‍යාපන සහ දැනුවත් කිරීමේ වියදම්	10.1	3,876,869.50	5,337,240.38
පරිසර දූෂණ පාලන	10.2	4,067,649.69	2,430,434.97
කොම්පෝස්ට් බඳුන් පිරිවැය		30,360.00	467,253.34
නීති වියදම්		1,831,049.23	884,138.38
පරිසර කළමනාකරණය සහ තක්සේරුව	10.3	2,488,835.80	1,536,129.84
මානව සම්පත් සංවර්ධනය		2,807,670.12	413,269.53
එකතුව		**15,102,434.34**	**11,068,466.44**

සටහන 11	2011	2010
	රු.	රු.
ක්ෂය වීම		
ගොඩනැගිලි	4,859,163.85	4,863,209.79
ගොඩනැගිලි - පින්තාරු කිරීම	635,526.77	-
මෝටර් වාහන	7,340,157.71	8,239,504.46
සොබා ක්ෂෙත්‍ර මධ්‍යස්ථානය	484,630.65	121,157.65

උපකරණ හා සවි කිරීම	5,453,188.60	133,933.93
කාර්යාල උපකරණ	9,925,286.37	9,486,051.61
රසායනාගාර උපකරණ	6,246,882.95	6,499,781.73
පුස්තකාල පොත්	568,432.25	507,503.72
නාම පුවරු හා උද්‍යාන පුටු	87,790.17	86,074.55
යන්ත්‍ර සූත්‍ර	731,290.14	774,037.92
ප්‍රාදේශීය කාර්යාල	931,635.84	905,441.17
එකතුව	**37,263,985.30**	**31,616,696.53**

සටහන 12	2011	2010
	රු.	රු.
වෙනත් මෙහෙයුම් වියදම්		
දැන්වීම්	349,697.52	197,953.20
විවිධ	425,996.06	627,550.69
සුබසාධන වියදම්	2,331,302.97	1,618,864.69
30 වැනි සංවත්සරය	903,897.85	-
එකතුව	**4,010,894.40**	**2,444,368.58**

සටහන 13		2011	2010
		රු.	රු.
විදේශ නියෝජිත ආයතන වල අරමුදල් ලබන ව්‍යාපෘති වියදම්			
මාලේ ප්‍රකාශනය	13.1	404,986.69	337,633.84
ප්ලාස්ටික් අපද්‍රව්‍ය අවම කිරීමේ ව්‍යාපෘතිය	13.2	42,820,635.04	50,459,231.04
පාරිසරික සම්පත් තොරතුරු පද්ධතිය	13.3	245,956.00	851,565.33
KITA වැඩසටහන	13.4	142,301.43	519,539.85
අවට පරිසර වායු තත්ත්ව වැඩසටහන		272,359.22	217,116.12
ජල තත්ත්වය - මහා පරිමාණ		82,014.29	147,331.00
පරිසර ආරක්ෂක ක්‍රියාකාරකම් සඳහා දත්ත සමුදාය සංවර්ධනය	13.5	1,360,001.91	1,056,292.42
පරිසර නියමු වැඩසටහන - අමාත්‍යාංශය	13.6	4,904,703.87	2,341,000.00
ප්‍රධාන ජලාශ තුනක ජල තත්ත්ව අධීක්ෂණය		374,443.11	302,455.33
ප්‍රජා මූල ජල තත්ත්ව වැඩසටහන	13.7	527,241.00	296,650.00
ජල තත්ත්ව අධීක්ෂණ වැඩසටහන		374,699.96	400,000.00
තෙත් බිම් දිනය CBL		887,212.00	
විද්‍යුත් - අපද්‍රව්‍ය වැඩසටහන		291,919.02	-
ලෝක පරිසර දිනය		115,000.00	-
පාරිසරික PB කඳවුර			-
30 වැනි සංවත්සර ප්‍රදාන වියදම්		75,000.00	-

Go Green ගස් සිටුවීමේ ව්‍යාපෘතිය	1,378,745.00	-
බොල්ගොඩ නාම පුවරුව	5,000.00	-
	150,000.00	-
එකතුව	54,412,218.54	56,928,814.93

සටහන 14		2011	2010
දේපළ, යන්ත්‍ර හා උපකරණ		රු.	රු.
ඉඩම්		27,453,088.65	27,453,088.65
ගොඩනැගිලි	14.1	147,391,382.74	155,015,628.07
ගොඩනැගිලි - පින්තාරු කිරීම	14.1	2,542,104.71	-
මෝටර් වාහන	14.1	11,842,418.92	13,061,851.38
ජංගම රසායනාගාරය	14.1	3.04	3.04
ගෘහ උපකරණ හා සවි කිරීම්	14.1	20,410,150.58	25,694,092.18
කාර්යාල උපකරණ	14.1	52,571,765.10	55,528,489.87
රසායනාගාර උපකරණ	14.1	20,559,310.07	26,415,093.02
පුස්තකාල පොත්	14.1	3,484,440.31	3,487,000.75
යන්ත්‍ර හා උපකරණ	14.1	1.00	731,291.14
ප්‍රාදේශීය කාර්යාල	14.1	34,376,606.08	33,645,444.64
නාම පුවරුව	14.1	442,857.51	530,647.68
සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථානය	14.1	3,963,896.22	4,448,526.87
එකතුව		325,038,024.93	346,011,157.29

සටහන 15	2011	2010
ආයෝජනය	රු.	රු.
භාණ්ඩාගාර බිල්පත් - ලංකා බැංකුව	9,960,000.00	9,960,000.00
එකතුව	9,960,000.00	9,960,000.00

සටහන 16	2011	2010
	රු.	රු.
සංචල භාණ්ඩ සහ සිදුවෙමින් තිබෙන වැඩ		
ඩෙක්ස්ටොප් පරිගණක 07	671,160.00	-
UPS 07	31,773.00	-
ලේසර් ප්‍රින්ටර් 04	60,00.00	-
කාර්යාල උපකරණ - රසායනාගාර	999,360.00	-
අධි අන්ත පරිගණක 04	547,300.00	-
ලැප්ටොප් පරිගණක 05	486,000.00	-
රසායනාගාර උපකරණ	648,300.00	-
ගෘහ භාණ්ඩ - මොණරාගල	159,943.00	-
ගෘහ භාණ්ඩ - කිලිනොච්චිය	159,943.00	-
	72,424.00	-

ගෘහ භාණ්ඩ - කුරුණෑගල	400,000.00	-
ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීම - මහනුවර	94,000.00	-
ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීම - ගාල්ල	243,000.00	-
ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීම - අනුරාධපුරය		
එකතුව	**4,573,203.00**	-

සටහන 17	2011	2010
	රු.	රු.
ඉන්වෙන්ටරි		
ලිපි ද්‍රව්‍ය කාර්යාල අවශ්‍යතා	1,646,445.26	2,110,110.78
සුඛසාධන ද්‍රව්‍ය	-	18,116.08
පොත් සහ ප්‍රකාශන	4,163,720.46	5,301,992.31
මෝටර් රථ අමතර කොටස්	160,608.71	123,652.96
විදුලිජනක අයිතම	-	142,915.82
විදුලි භාණ්ඩ	27,855.76	36,318.77
එකතුව	**5,998,630.19**	**7,733,106.72**

සටහන 18		2011	2010
වෙළඳ සහ අනෙකුත් ලැබීම්		රු.	රු.
විවිධ ණය ගැතියන්			
විවිධ අත්තිකාරම්	18.1	-	153,750.00
මිලදී ගැනීමේ අත්තිකාරම්	18.2	251,762.10	296,819.74
ආපදා ණය		2,055,802.62	360,483.60
සුනාමි ණය	18.3	48,224,064.28	35,149,202.31
උත්සව අත්තිකාරම්		21,111.29	29,074.09
ලැබිය යුතු භාණ්ඩ හා සේවා බදු		747,600.00	738,700.00
ලැබිය යුතු තැන්පතු	18.4	143,738.62	143,738.62
යතුරුපැදි රක්ෂණය (DO)		633,515.00	642,407.00
පවුල් වෛද්‍ය රක්ෂණය		214,192.13	475,901.88
විශේෂ අත්තිකාරම්		1,685,083.20	797,282.38
ලැබිය යුතු වටිනාකම් එකතු වූ බදු		605,708.50	659,708.50
පරිසර බලපෑම් තක්සේරු ව්‍යාපෘති	18.5	9,346,724.68	11,180,735.40
ලැබිය යුතු - පිළිසරු ව්‍යාපෘතිය		-	57,549.75
යතුරුපැදි ණය - රියැදුරන්	18.6	-	2,205,453.65
ලැබිය යුතු බදු කුලී - ප්ලාස්ටික් සහ පිළිසරු ව්‍යාපෘති		907,320.00	27,320.00
ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති මිලදී ගැනීමේ අත්තිකාරම්		459,000.00	-

පරිසර බලපෑම් තක්සේරු අත්තිකාරම්	18.8	-	362,423.75
ලැබිය යුතු - WHT		157,690.00	55,854.00
මුදල් අග්‍රිම		180,000.00	180,000.00
මුදල් අත්තිකාරම් - GIS	18.9	90,000.00	90,000.00
මුදල් අත්තිකාරම් - EP ක්‍රියාකාරකම් සඳහා දත්ත පදනම සංවර්ධනය කිරීම		-	20,000.00
ප්‍රජා මූල ජල තත්ත්ව වැඩසටහන	18.11	22,920.00	-
ජල තත්ත්ව අධීක්ෂණ වැඩසටහන	18.12	-	278,000.00
ලැබිය යුතු ගංවතුර ණය	18.13	-	150,000.00
ප්ලාස්ටික් අපද්‍රව්‍ය අත්තිකාරම්	18.14	1,854,404.97	-
		26,318.00	-
එකතුව		**67,626,955.39**	**54,054,404.67**

සටහන 19		2011	2010
		රු.	රු.
පූර්ව ගෙවීම්			
කලින් ගෙවන ලද ගෙවීම්	19.1	3,410,304.74	2,377,536.13
ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ අත්තිකාරම් අග්‍රිමය		1,000,000.00	1,000,000.00
එකතුව		**4,410,304.74**	**3,377,536.13**

සටහන 20	2011	2010
	රු.	රු.
මුදල් හා මුදල් වලට සමාන දෑ		
ලංකා බැංකුව, පැලවත්ත - ප්‍රධාන ගිණුම 0-002937303	73,550,089.82	66,530,564.96
ලංකා බැංකුව, පැලවත්ත - MALE - 0002972309	2,722,546.84	2,035,726.53
ලංකා බැංකුව, පැලවත්ත - DEO - 2937330	(475,897.17)	743,268.42
ලංකා බැංකුව, ආයතනික ශාඛාව, 1608	9,964,045.75	4,294,925.16
ලංකා බැංකුව, පැලවත්ත, පොලිසෙස් 2937361	1,534,205.70	961,417.99
ලංකා බැංකුව, පැලවත්ත, පිළිසරු 2937414	-	544, 903.71
ලංකා බැංකුව, පැලවත්ත, හරිත බද්ද 0000-823-6840	-	23, 875.00
එකතුව	**87,294,990.94**	**75,134,681.77**

සටහන 21		2011	2010
		රු.	රු.
ගෙවිය යුතු			
ගෙවිය යුතු තැන්පතු	21.1	53,000.00	53,000.00
ජාතික කඳවුර		8,000.00	8,000.00
සභාපතිගේ අරමුදල		8,218.66	8,218.66
පරිසර බලපෑම් තක්සේරු ව්‍යාපෘති	21.2	32,936,421.45	26,930,990.17
MHP ව්‍යාපෘති	21.3	86,518.00	86,518.00
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		1,099,640.97	913,185.65
වෛද්‍ය රක්ෂණ හිමිකම්		222,318.98	186,775.56
ගෙවිය යුතු යතුරුපැදි හිමිකම්		-	63,578.00
DEO යතුරුපැදි ණය අයකිරීම්		-	7,067,175.21
ඉහළ කොත්මලේ ජල තත්ත්වය		728,146.75	697,097.75
බාසල් සම්මුතිය		-	146,365.45
ගොඩකරන ලද ඉඩම්වල ඉදිකිරීම්		156,584.00	156,584.00
ගෙවිය යුතු මුද්දර බදු		907,887.05	742,596.65
කලින් ලද පොලී (ස්ථාවර තැන්පතු)		351,337.25	436,819.21
ඉදි කිරීම් සඳහා රඳවා ගැනීම		276,991.11	223,103.41
ආපසු ගෙවී යුතු ටෙන්ඩර් තැන්පතු පිළිසරු		-	385,000.00
අයකර ගැනීම් - කැමරා		32,000.00	8,000.00
යතුරුපැදි රක්ෂණය		63,851.00	-
බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම		174,365.45	-
ඝන අපද්‍රව්‍ය කළමනාකරණ දීමනාව (DO)		3,000.00	-
එකතුව		**37,108,280.67**	**38,113,007.72**

සටහන 22	2011	2010
	රු.	රු.
උපචිත වියදම්		
වැටුප් හා වේතන	13,144,268.84	12,385,677.71
සේවක අර්ථසාධක අරමුදල	2,951,866.47	2,621,620.73
සේවක භාර අරමුදල	591,281.61	524,324.19
අතිකාල	517,476.03	386,251.33
පාරිතෝෂික දීමනා	681,939.75	150.00
අභ්‍යන්තර ගමන්	1,790,481.13	480,044.05
විදේශ ගමන්	27,767.22	12,000.00
සුබසාධන වියදම්	85,749.00	87,754.66
ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තුව	276,757.59	203,129.29
කාර්යාල උපකරණ අලුත්වැඩියා හා නඩත්තුව		212,607.36
	224,716.50	320,459.78

මෝටර් වාහන අලුත්වැඩියා කිරීම	664,683.11	1,845,530.65
ආරක්ෂක සේවා ගාස්තු	1,375,049.39	618,440.48
විදුලි ගාස්තු	735,541.50	1,053,913.85
ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය	1,292,478.67	331,751.47
ලිපි ද්‍රව්‍ය	139,108.34	47,453.00
තැපැල් ගාස්තු	23,631.00	594,297.21
දුරකථන ගාස්තු	408,061.64	466,000.00
පරිපාලන පොදු කාර්ය පිරිවැය	589,807.00	16,370.00
පුවත්පත්	2,150.00	29,459.62
ජල සම්පාදනය	35,692.94	360.00
නීති වියදම්	213,340.00	9,204.00
විවිධ වියදම්	-	1,036,302.49
වටිනාකම එකතු වූ බද්ද (උපචිත වියදම් වලට) (VAT)	2,758,666.15	91,000.00
ත්‍රෛමාසික පුවත් ලිපිය මුද්‍රණය කිරීම	115,000.00	791,227.00
කාර්යාල ලී බඩු	1,011,987.00	131,500.00
විනිසුරු පරිපාලන වියදම්	109,500.00	4,000.00
පරිසර දූෂණ පාලන මාර්ගෝපදේශ	-	324,670.63
රසායනාගාර ද්‍රව්‍ය මිලදී ගැනීම	264,266.50	23,876.96
අවට වාතයේ තත්ත්ව අධීක්ෂණය	327,174.40	700,000.00
විගණන ගාස්තු	1,400,000.00	164,592.50
කාර්යාල ගොඩනැගිලි කුලී	89,780.00	62,585.27
දේශීය පුහුණුව	-	35,000.00
පරිසර දූෂණ ක්‍රියාකාරකම් පිළිබඳ දත්ත සමුදාය සංවර්ධනය	173,699.18	1,344,846.44
ප්ලාස්ටික් වියදම්	830,288.85	3,002,498.16
කාර්යාල උපකරණ	4,130,685.14	25,330.04
රූපවාහිනී වැඩසටහන්	2,469.09	765,390.80
මුද්දර බදු	801,425.90	4,000.00
පාසල් වැඩසටහන් ප්‍රතිපාදන	-	210,878.97
ජාතිය ගොඩනැගීමේ බද්ද	404,642.02	-
ප්‍රාදේශීය කාර්යාල ඉදිකිරීම	1,023,618.93	935,325.99
ගොඩනැගිලි ඉදිකිරීම	148,677.48	800.00
ආපදා ණය - මුද්දර බද්ද	1,725.00	10,500.00
සාමාජික ගාස්තු	-	285,524.40
ආර්ථික සේවා ගාස්තු	-	73,000.00
හූ තොරතුරු	9,917.00	78,895.00
පරිසර නියමු වැඩසටහන ශක්තිමත් කිරීම	-	3,600.00
මණ්ඩල සාමාජික දීමනා	-	17,352.62
සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම		105,525.00
ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය	437,987.84	5,992.00
	170,516.00	269,000.00

දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	-	4,372.50
ප්‍රවර්ධන ප්‍රදර්ශන සංවිධානය කිරීම	195,360.00	300,000.00
EE&A ප්‍රවර්ධනය	428,118.14	368,818.91
සැලසුම් හා මෙහෙයුම් ඒකකය	182,338.91	302,455.33
රසායනාගාර උපකරණ නඩත්තුව	184,589.38	112,140.00
ප්‍රධාන ජලාශ තුනක ජලයේ තත්ත්වය අධීක්ෂණය කිරීම	250.00	400,000.00
ප්‍රජා මූල ජල තත්ත්ව කළමනාකරණ වැඩසටහන	13,884.25	-
ජල තත්ත්ව අධීක්ෂණ වැඩසටහන	5,300.00	-
විද්‍යුත් - අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය	225.00	-
යතුරු පැදි ණය	150,000.00	-
බොල්ගොඩ නාමපුවරු වියදම්	163,000.00	-
අධ්‍යාපනික උපකරණ සංවර්ධනය	941,224.00	-
පරිසර හිතකාමී නිෂ්පාදන ප්‍රවර්ධනය	71,850.75	-
පරිසරය පිළිබඳ වැඩසටහන් පැවැත්වීම	760,880.00	-
EPC අංශය	843,300.00	-
රසායනාගාර උපකරණ	1,200.00	-
මණ්ඩල සාමාජික දීමනා	33,875.00	
පරිසර නියමු පුවත් ලිපි		
එකතුව	**43,959,269.64**	**34,237,800.39**

සටහන 23	2011	2010
	රු.	රු.
<u>පුනරාවර්තන ප්‍රදානයන්</u>		
IEMP - පුනරාවර්තන ප්‍රදානය	-	745,466.55
සුනාමි ප්‍රදානය	-	133,006.26
Dutch ව්‍යාපෘති ලැබීම	-	2,447,673.06
ACAIR ව්‍යාපෘති ඕස්ට්‍රේලියානු ආධාර	-	370,388.68
කොළඹ වෙරළ තීරය - නාගරික සංවර්ධන අධිකාරිය	-	490,000.00
APPLLE ව්‍යාපෘතිය	-	65,246.08
නියමු ව්‍යාපෘති මිනුම	-	156,300.00
මාලේ ප්‍රකාශනය	3,958,050.38	3,271,230.07
UNITAR 234A	-	246,547.86
UNITAR 234B	-	147,231.04
UNITAR 234C	-	201,574.67
UNITAR 234D	-	764,220.71
UNITAR 234E	-	179,027.55
UNITAR 234F	-	178,855.74
UNITAR 234G	-	164,406.41
UNITAR 234H	-	125,623.00
743 A - ජල සාම්පල - දඬුගම්ඔය	-	197,518.51

සටහන 23	2011	2010
745 - ජල තත්ත්වය - ගාලු මුවදොර පිටිය	-	18,914.33
745 A - නුවර වැව ජල තත්ත්වය	-	78,800.00
746 - දකුණු අධිවේගී මාර්ගය	-	833,340.91
EAIP ජල තත්ත්වය - කැළණි ගඟ මැණික් ගැරීමේ	-	30,000.00
කර්මාන්ත	-	400.00
ගෘහස්ථ අපද්‍රව්‍ය අවම කිරීමේ ව්‍යාපෘතිය - ගම්පහ	-	952,974.41
ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රදානය	14,920,878.42	14,286,393.46
ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ප්‍රදානය	-	11,690.13
UNEP ප්‍රදානයන්	-	165,680.50
පශ්චාත් සුනාමි ප්‍රදානය	-	185,017.27
මූලික නාගරික සේවා ව්‍යාපෘති	-	77,662.50
FRMP පුනරාවර්තන ප්‍රදානය	-	274,998.80
රසායනාගාර උපදේශන ගාස්තු	-	160,000.00
GIS ව්‍යාපෘතිය	197,859.63	443,815.63
පිළිසරු කොම්පෝස්ට් බඳුන්	-	1,891,651.80
දකුණු ආසියා සමුළුව	-	17,009.32
පිළිසරු අරමුදල් තැන්පතු	-	100,000.00
පියකරු පුරවර	-	44,354.16
රෑමස්සල සොබා කෙත	-	50,000.00
පරිසර දූෂණ ක්‍රියාකාරකම් පිළිබඳ දත්ත සමුදාය සංවර්ධනය	261,391.07	121,392.98
මහා පරිමාණ ජල තත්ත්ව ප්‍රදානයන්	659,936.65	659,936.65
KITA ප්‍රදානය	105,822.02	248,123.45
පිළිසරු ව්‍යාපෘති උපකරණ ආපසු ලබා ගැනීම	-	89,886.32
ජල තත්ත්ව අධීක්ෂණ වැඩසටහන	425,300.04	300,000.00
ප්‍රජා මූල ජල තත්ත්ව කළමනාකරණ වැඩසටහන	526,109.00	1,053,350.00
ප්‍රධාන ජල සීමා තුනක ජල තත්ත්වය	290,619.84	472,432.45
විද්‍යුත් අපද්‍රව්‍ය ප්‍රදානය	5,048,080,98	-
තෙත් බිම් දින CBL	127,788.00	-
එකතුව	**26,521,836.03**	**32,452,141.26**

සටහන 24	2011	2010
	රු.	රු.
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය	110,125,260.56	96,123,022.50
එකතුව	**110,125,260.56**	**96,123,022.50**

සටහන 25	2011	2010
	රු.	රු.
ප්‍රාග්ධන ප්‍රදානය		
UNITAR ප්‍රාග්ධන ප්‍රදානය	165,155.53	193,064.57
FRMP ප්‍රාග්ධන ප්‍රදානය	279,226.82	326,412.36
Dutch ප්‍රාග්ධන ප්‍රදානය	21,960,691.05	25,671,749.15
EAIP ප්‍රදානය	4,405,769.87	5,150,285.05
ප්‍රාග්ධන ප්‍රදානය - භාණ්ඩාගාර අරමුදල	88,490,418.38	79,713,671.63
USAID ව්‍යාපෘතිය	81,187.35	94,906.91
නෙදර්ලන්ත ප්‍රදානය	480,409.07	561,591.67
ආසියානු සංවර්ධන බැංකුව	1,163,205.11	1,359,770.95
එක්සත් ජාතීන්ගේ සංවර්ධන බැංකු ව්‍යාපෘතිය	545,643.50	328,068.44
ලෝක සෞඛ්‍ය සංවිධානය	1,322,950.10	1,546,510.67
යුනිසෙෆ	51,353.37	60,031.39
APPELL ව්‍යාපෘතිය	38,249.40	44,713.03
මාලිගාවත්ත සංවර්ධන අරමුදල්		
NAREEP	20,951.30	24,491.79
UNIDO (IRRP)	154,830.20	180,994.40
ලෝක බැංකුව	1,213,390.85	1,418,437.40
නොරාඩ්	1,506,047,48	1,760,549.02
ගස් මිලියන සියයේ ව්‍යාපෘතිය	1,458,658.30	1,705,151.71
Sacap කේන්ද්‍රීය ක්‍රියාකාරකම් අරමුදල්	206,593.52	241,505.02
මහකොළඹ ගංතුර වැඩසටහන් දායකත්වය	56,244.64	65,749.22
කර්මාන්ත සමීක්ෂණය	87,471.74	102,253.27
වයඹ පළාත් (ආසියානු සංවර්ධන බැංකුව) ව්‍යාපෘතිය	40,707.45	47,586.46
NAREPP (පළාත් පාලන ආයතන)	9,231.97	10,792.05
පරිසර ප්‍රවර්ධන ව්‍යාපෘති	22,763.60	26,610.34
විදේශ ආධාර	3,928.36	4,592.20
ඊමේල් පහසුකම වැඩි දියුණු කිරීම	156,296.53	182,708.52
IS EIA ව්‍යාපෘතිය	5,921.36	6,921.99
පුස්තකාල පොත් ප්‍රදානය	29,436.59	34,410.97
NAREPP (කාර්යාල උපකරණ)	414,694.00	431,907.88
අන්තර්ජාතික සංවර්ධන සංගමය	265,215.08	310,032.82
IRMP	91,970,825.17	107,512,643.73
UNEP	672,748.95	786,434.37
ලංකා දුම්කොළ සමාගම	400,687.59	468,398.34
රථ වාහන ප්‍රදානය	13,350.18	15,606.18
UNEP ප්‍රාග්ධන ප්‍රදානය	235,648.28	275,469.63
	5,998.33	7,011.97

සටහන 25	2011	2010
විද්‍යුත් අපද්‍රව්‍ය ප්‍රාග්ධන ප්‍රදානය	53,079.91	62,049.69
ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රාග්ධන ප්‍රදානය	4,180,290.85	3,431,455.36
GIS ප්‍රාග්ධන ප්‍රදානය	863,448.48	1,009,359.53
ගෘහස්ථ අපද්‍රව්‍ය අවම කිරීමේ ව්‍යාපෘතිය - ගම්පහ	266,667.48	311,730.66
පශ්චාත් සුනාමි ප්‍රාග්ධන ප්‍රදානය	120,160.91	140,466.47
සොබා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන ප්‍රදානය	282,200.36	329,888.38
සංවත්සර ප්‍රදානය	1,034,198.69	1,208,964.20
අතරමැදි තට්ටුව	16,215,500.04	18,955,699.00
පරිසර දූෂණ ක්‍රියාකාරකම් සඳහා දත්ත සමුදාය වර්ධනය කිරීම	1,339,031.24	1,565,309.31
දකුණු ආසියා වැඩසටහන	79,324.12	92,728.82
සුරක්ෂිත ජංගම බැහැරලීම	60,000.00	-
ජෝන් කිල්ස් පදනම	118,200.00	-
එකතුව	242,548,003.10	257,778,686.52

සටහන 10.1	2011	2010
පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වියදම්	රු.	රු.
307 පරිසර පුවත් ලිපි		
අධ්‍යාපනික ද්‍රව්‍ය සංවර්ධනය	222,000.00	478,554.97
දිවයින පුරා පරිසර වැඩසටහන් ශක්තිමත් කිරීම	234,980.00	-
පරිසර නියමු නිර්මාණය	381,095.00	-
විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ඵලදායී ලෙස භාවිතය	635,360.00	-
පරිසර හිතකාරමී නිෂ්පාදනය ප්‍රවර්ධනය	470,000.00	-
ප්‍රායෝගික වැඩසටහන්	763,449.00	-
වර්තමාන ගැටලු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	613,491.75	-
දිනුවත් කිරීමේ වැඩසටහන්	49,912.00	-
පරිසර ගැටලු සහ සිදුවීම් පිළිබඳ දැනුවත් කිරීමේ ව්‍යාපාර පැවැත්වීම	204,880.00	-
ශ්‍රව්‍ය දෘශ්‍ය කොටස සංවර්ධනය කිරීම	251,430.75	-
ලෝක පරිසර දිනය සඳහා අධ්‍යාපනික ද්‍රව්‍ය සැකසීම	50,271.00	-
රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන සහ ගෘහණියන් සඳහා වැඩසටහන්	-	1,659,235.94
	-	369,809.19
	-	71,937.00
වැඩසටහන් ප්‍රදර්ශන මෙහෙය වීම	-	877,355.00
ස්වභාවික පරිසර ක්‍රියාත්මක කිරීම	-	517,990.00
වර්තමාන ගැටලු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙය වීම	-	167,231.28
ලෝක පරිසර දිනය	-	59,127.00
	-	136,000.00
එකතුව	3,876,869.50	5,337,240.38

සටහන 10.2	2011	2010
උපදුවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය	463,623.50	89,231.10
දූෂණ පාලන ඒකකය	805,380.36	532,413.70
පරීක්ෂණාගාරය සඳහා රසායනික ද්‍රව්‍ය හා විදුරු උපකරණ මිලදී ගැනීම	1,134,291.00	1,234,883.09
පරියේෂණාගාර උපකරණ නඩත්තු කිරීම	174,275.00	378,056.48
අවට වායුවේ ගුණත්වය පසු විපරම් කිරීම	1,490,079.83	195,850.60
එකතුව	**4,067,649.69**	**2,430,434.97**

සටහන 10.3	2011	2010
ස්වභාවික සම්පත් කළමනාකරණ ඒකකය	696,249.64	476,624.74
තෙත්බිම් දිනය	-	581,795.60
පරිසර බලය හා ඇගයීම් ඒකකය	494,111.00	101,410.50
පර්යේෂණ හා විශේෂ ව්‍යාපෘති ඒකකය	728,475.16	76,299.00
සැලසුම් ඒකකය	570,000.00	300,000.00
එකතුව	**2,488,835.80**	**1,536,129.84**

සටහන 13.1	2011	2010
මාලේ ප්‍රකාශන වැඩසටහන		
විදේශ ගමන් අතිකාල සඳහා	38,185.00	70,605.00
ගෙවීම් සහ දීමනා	182,540.79	239,235.20
විවිධ වියදම්	17,438.40	11,118.00
බැංකු ගාස්තු	-	936.64
ඉන්ධන ගාස්තු	166,822.50	15,739.00
එකතුව	**404,986.69**	**337,633.84**

සටහන 13.3	2011	2010
උනන්දුවක් දක්වන පාර්ශව හරහා ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීම	480,236.11	16,618,089.73
පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්	1,455,000.00	8,872,683.29
ප්‍රවර්ධන වැඩසටහන්	20,973,364.24	14,418,179.08
මෙහෙයුම් ක්‍රියාකාරකම්	9,476,639.28	10,550,278.94
ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පළාත් පාලන ආයතන වඩා ශක්තිමත් කිරීම	8,014,148.91	-
ප්‍රදර්ශන සහ දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන	2,420,646.50	-
එකතුව	**42,820,635.04**	**50,459,231.04**

සටහන 13.5	2011	2010
GPS දත්ත එකතු කිරීම	26,156.00	274,565.33
ඩිජිටල් දත්ත මිලදී ගැනීම	-	300,000.00
දත්ත එකතු කිරීම, ඇතුල් කිරීම සහ දත්ත පැහැදීම	-	204,000.00
ප්‍රතිඵලය ඉදිරිපත් කිරීම	219,800.00	73,000.00
එකතුව	**245,956.00**	**851,565.33**

සටහන 13.6	2011	2010
රසායනික ද්‍රව්‍ය හා වෙනත් වියදම්	5,906.43	165,561.50
උපදෙස් පත්‍රිකා	136,395.00	-
පොත් මුද්‍රණය	-	265,250.00
භාෂා පරිවර්තනය	-	10,750.00
තැපැල්	-	9,978.35
උපස්තම්භක කාර්ය මණ්ඩල ගාස්තුව	-	68,000.00
එකතුව	**142,301.43**	**519,539.85**

සටහන 13.7	2011	2010
පරිසර දූෂණ ක්‍රියාකාරකම් පිළිබඳ දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම		
පුහුණු සහ පුවත්පත් දැන්වීම්	3,500.00	38,119.70
GIS අංශය මඟින් අහඹු ලෙස පසුවිපරම් කිරීම	49,590.00	96,024.70
දත්ත රැස් කිරීම, දත්ත ඇතුල් කිරීම	79,500.00	868,816.42
ප්‍රශ්නාවලි මුද්‍රණය	25,000.00	-
GPS දත්ත රැස් කිරීම	971,902.89	-
ඩිජිටල් දත්ත හා උපකරණ මිලදී ගැනීම	78,259.02	-
වෙනත් වියදම්	52,250.00	-
ප්‍රතිඵල ඉදිරිපත් කිරීම	-	53,331.60
එකතුව	**1,360,001.91**	**1,056,292.42**

සටහන 13.8	2011	2010
පරිසර නියමු වැඩසටහන		
පාසල් මට්ටමින් පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ	1,106,602.16	974,768.54
වැඩමටහන් ප්‍රවර්ධනය කිරීම	179,410.00	164,236.06
පරිසර නියමු කොමසාරිස් සඳහා රැස්වීම් පැවැත්වීම	2,240,458.87	-
පෙර පාසල් ගුරුවරු සඳහා මාර්ගෝපදේශ	1,169,682.84	-
පරිසර නියමු වැඩසටහනට අදාල ද්‍රව්‍ය නිෂ්පාදනය	-	1,000,211.20
දිවයින පරිසර නියමු වැඩසටහන වඩා ශක්තිමත් කිරීම	-	31,997.00
වැදගත් සිදුවීම් ආවර්ණය	-	169,787.20
පරිසර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම		
එකතුව	**4,904,703.87**	**2,341,000.00**

සටහන 13.9	2011	2010
රුක් රෝපණය	85,000.00	273,995.00
මෙහෙයුම් සහ නඩත්තු කිරීම්	32,477.00	22,655.00
ජලාධාර ප්‍රදේශ 05ක රුක් රෝපණය	84,600.00	-
රුක් රෝපණ වැඩසටහන් දියත් කිරීම	52,410.00	-
තවාන් 09ක් පවත්වාගෙන යාම	183,470.00	-
ප්‍රජාමූල සංවිධාන සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු	89,284.00	-
එකතුව	**527,241.00**	**296,650.00**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: එම්/අයි/සිපඒ/එන්ඒ/2011
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திகதி / Date: 2012 සැප්තැම්බර් 03 දින.

සභාපති,
මධ්‍යම පරිසර අධිකාරිය.

මධ්‍යම පරිසර අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

මධ්‍යම පරිසර අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1980 අංක 47 දරන පාර්සර්ක පනතේ 6(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපතිවරයා වෙත 2012 ජූලි 16 දින නිකුත් කරන ලදී.

1.2 මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
පැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපෑල් / மின்- மெயில் / E-mail: oaggov@sltnet.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මුල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරනු ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මුල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් ,වංචා හෝ වැරදි හේතුවෙන් මුල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම වලදී ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ඉදිරිපත් කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මුල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණන විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු අනාවරණය විය.

(අ) ඉකුත් වර්ෂයේ ක්ෂය ප්‍රතිපාදනය අඩුවෙන් ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලී බඩු සවිකිරීම් වල අගය රු. 5,452,045 ක් වැඩියෙන්ද ක්ෂය, ප්‍රතිපාදනය ඒ හා සමාන ප්‍රමාණයකින් අඩුවෙන්ද ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ලේඛණ අනුව සමාලෝචිත වර්ෂයට අදාල ලී බඩු හා සවිකිරීම් මිලදී ගැනීම රු. 1,354,887 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ලී බඩු හා සවිකිරීම් මිලදී ගැනීම රු. 169,247 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) පරිසර අධිකාරිය මාලිගාවත්ත ගොඩනැගිල්ලේ පවත්වාගෙන යාම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ගොඩනැගිලි කුලී ගෙවා නොතිබූ අතර එම මුදල වන රු. 11,790,000 ක ප්‍රමාණය ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයට අදාළ ව ගිණුම්වල දක්වා තිබූ පාරිතෝෂික වෙන් කිරීම රු. 110,125,260 ක් වුවද ගණනය කිරීම් අනුව රු. 109,606,316 ක් විය. ඒ අනුව රු. 518,944 ක් වැඩියෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු. 57,626,955 වූ ණයගැතියන් සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි. වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ණය රු. 413,738 ක ශේෂයන් 03 ක් වර්ෂ 02 සිට 04 ක් දක්වා කාලයක සිට පැවතුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව රු. 37,108,281 ක් වූ ණයහිමියන් සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි. වටිනාකම රු. 312,320 ක ගෙවිය යුතු ශේෂයන් 05 ක් වර්ෂ 02 සිට 04 දක්වා කාලයක සිට පැවතුණි.

(ඇ) මාලිගාවත්ත කාර්යාල සංකීර්ණය පවත්වාගෙන ගිය කාලයේ සිට පැවති ගෙවිය යුතු ආරක්ෂක වියදම් රු. 830,610 ක් සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) 2010 වර්ෂයේ රු.1,710,938 ක උපචිත වියදම් අධි වෙන්කිරීමක් කර තිබූ අතර එයින් 2012 වර්ෂයේදී රු.166,448 ක් වැය කර ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ලී බඩු හා උපකරණ ලබාගෙන තිබුණි. එම ලී බඩු හා උපකරණ සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණද, ලේඛණ ගත කර නොතිබුණි. මේ අනුව උපචිත වියදම් අධි වෙන්කිරීම් සමාලොචිත වර්ෂයේ හා පසු වර්ෂවල අනුමැතියෙන් තොර වියදම් පියවීම සඳහා යොදාගෙන තිබුණි.මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් "උපචිත වියදම් නිශ්චිතව ඇස්තමේන්තු කළ නොහැක" යනුවෙන් පිළිතුරු සපයා තිබුණි.

(ඉ) උසාවි දඩ මුදල් ලෙස ලැබිය යුතු රු. 339,333 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

අවස්ථා 03 කට අයත් එකතු වටිනාකම රු. 8,585,101ක් වූ ගනුදෙනු වලට අදාලව සාක්ෂි නොතිබීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2.4 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

	නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව		අනුකූල නොවීම්
(අ)	භාණ්ඩාගාර වක්‍රලේඛ		
	(i)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 වක්‍රලේඛය	ස්ථාවර වත්කම් ලේඛනයක් ඇතත් එය යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි.
	(ii)	2002 නොවැම්බර් 28 දිනැති අංක අයි/ඒ/අයි/2002/02 වක්‍රලේඛය	වක්‍රලේඛ උපදෙස් පරිදි පරිගණක ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ආ)	ආයතන සංග්‍රහය XV පරිච්ඡේදයේ 1.1 වගන්තිය		අධ්‍යයන හා අභ්‍යාස යන අර්ථ නිරූපනයට ඇතුලත් කටයුතු සඳහා විදේශගත වූ නිලධාරීන් 19 ක් වෙනුවෙන් අනියම් දීමනාව ලෙස දිනකට ඇ:ඵ:ජ ඩොලර් 50 බැගින් ගෙවා තිබුණි. ඒ අනුව රු. 251,247 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.
(ඇ)	2010 ඔක්තෝබර් 11 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ වක්‍රලේඛ අංක 01/2010/01		දෙවන ගණයේ නිලධාරීන්ට ගෙවී යුතු සංයුක්ත දීමනා රේටි ප්‍රමාණය වෙනුවට ගණය නොසලකා එක් නිලධාරීනියකට රු.72,107 ක් සංයුක්ත දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි. එය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි.
(ඈ)	1997 පෙබරවාරි 03 දිනැති රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ අංක 06/97 න් සංශෝධිත ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදය		වැඩ බැලීමේ තනතුරු සඳහා මාස 03 ක උපරිම කාල සීමාවකට පත් කළ හැකි වුවත් අධිකාරියේ නිලධාරීන් 08 දෙනෙකු මෙම කාලසීමාව ඉක්මවා මාස 03ත් අවුරුදු 03ත් අතර කාල පරාසයක් තුල වැඩ බැලීමේ තනතුරු වල කටයුතු කර තිබුණි.

(ඊ) මුදල් රෙගුලාසි සංග්‍රහය

(i)	මු:රෙ: 371(2)(ඇ)	වර්ෂ 16 කට වඩා පැරණි රු.189,450 ක අත්තිකාරම් ශේෂයක් වූ අතර අධිකාරිය විසින් පවරන ලද නඩු අංක 25161 දරණ නඩුවට අනුව ඇස්කිසි ක්‍රියාත්මක කර මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම විත්තිකරු දැන් මියගොස් ඇති බව සාමාන්‍යාධිකාරවරයා දැනුම් දී ඇත.
(ii)	මු:රෙ:757	අධිකාරියේ ප්‍රාදේශිය කාර්යාල 06 වෙනුවෙන් හාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි.

2.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදේශ ගමන් වෙනුවෙන් පිළිසරු ව්‍යාපෘතියේ අධ්‍යක්ෂකවරයාට ඉකුත් වර්ෂයේදී ගෙවා තිබූ රු. 47,541 ක මුදල 2012 ජූලි 31 දින දක්වා ව්‍යාපෘතියෙන් ප්‍රතිපූරණය කර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු මුද්දර ගාස්තු ලෙස ගිණුමේ රු. 1,709,312 ක් විය. 2012 ජනවාරි මස රු. 801,425 ක් පමණක් ගෙවා තිබුණි. ඉතිරිය රු. 907,887 ක් රඳවා ගෙන තිබුණි. එලෙස රඳවා ගැනීමට හේතුව විගණනයට පැහැදිලි නොකෙරුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු. 6,305,261 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 8,871,112 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී අතිරික්තය රු. 2,565,851 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම රු. 51,496,538 කින් වැඩිවීම් මෙයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිර්ක්ෂණයන් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ වැදගත් දත්තයන් ඉකුත් වර්ෂයට අදාල අනුරූප අගයන් සමඟ පහත දැක්වේ.

	2011 රු(,000)	2010 රු(,000)
පුනරාවර්තන ප්‍රදාන	275,997	260,000
වෙනත් ප්‍රදාන	53,596	57,804
වෙනත් ආදායම්	142,354	111,087
මුළු මෙහෙයුම් වියදම්	507,594	456,097
අතිරික්තය	6,305	8,871

3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ද්‍රවශීලතා අනුපාත	සම්මත අනුපාතය	වර්ෂය		
		2011	2010	2009
ජංගම අනුපාතය	2:1	1.7:1	1.56:1	1.54:1
ක්ෂණික වත්කම් අනුපතය	1:1	1.6:1	1.48:1	1.44:1

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී කාරක ප්‍රාග්ධන අනුපාත යහපත් තත්ත්වයක පවති.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත නිර්ක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිසර කළමනාකරණ ඇගයීම් අංශය ,පරිසර දූෂණ පාලන අංශය හා පරිසර අධ්‍යාපන මෙහෙයුම් අංශය යන අංශ 03ක මූල්‍ය කාර්යය සාධනය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ආ) පසු ගාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතිය සඳහා වෙන්කල රු. 100,000,000 ක ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට දරන ලද වියදම් රු. 44,700,000 කි. එයින් 22 % ක් වැටුප් හා වේතන සඳහා වැයකර තිබුණි. ප්‍රතිපාදනයෙන් ඌන උපයෝජිත මුදල රු. 55,300,000 ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 55 % කි.

(ඇ) පසු හාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතියේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් වර්ෂය තුල ඉටු කල යුතු වූ පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටු කිරීමේ හෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

(i) ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර් ගත නොවූ C.1.12 Waste Management activities in Public and private instructions නැමැති ක්‍රියාකාරකම සඳහා කාර්ය සාධන වාර්තාවන්ට අනුව රු.3,155,000ක මුදලක් වියදම් කර තිබුණි.

(ii) ක්‍රියාත්මක නොකල ක්‍රියාකාරකම් 20 හි වෙන්කළ ප්‍රතිපාදන රු. 8,920,00 හෙවත් 100% ක්ම ඉතිරි වී තිබුණි.

(iii) ප්‍රතිශතය 99% ත් 50% ත් අතර ප්‍රතිපාදන ඉතිරි වූ ක්‍රියාකාරකම් ගණන 14 ක් වූ අතර ඉතිරිය රු. 35,919,000 කි.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

අධිකාරියේ ප්‍රාදේශිය කාර්යාලවලට සහ පැමිණිලි ඒකකයට පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට සඳහා 2009 වර්ෂයේදී රු. 600,000 ක පිරිවැයකට එකඟ වී රු. 300,000 ක අත්තිකාරමේ ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයේදී එම පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි.

4.3 වාහන උපයෝජනය

සමාලෝචිත වර්ෂයේ අධිකාරිය සතුව වාහන 50 ක ඇණියක් පවතින අතර එයින් වෙන් කළ වාහන 21 ක්ද සංචිත වාහන 13 ක්ද ප්‍රාදේශිය කාර්යාල සඳහා අනුයුක්ත කළ වාහන 13 ක්ද පැවතුණි. වාහන 50 ක ඇණියක් තිබිය දී කුලී වාහන සඳහා රු. 6,462,813 ක වියදමක් දරා තිබුණි.

4.4 කාර්ය මණ්ඩල කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට අධිකාරිය අනුමත කාර්ය මණ්ඩල 802 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 683 ක් විය. ඒ අනුව පුරප්පාඩු 119 ක් පැවතුණි.

(ආ) නිලධාරීන් 08 දෙනෙකු වැඩ බැලීමේ මාස 03 ක කාල සීමාව ඉක්මවා සිටි කාලය සඳහා 2011 දෙසැම්බර් 31 දින දක්වා වැඩ බැලීමේ දීමනාව ලෙස රු. 439,121 ක් හා ඉන්ධන දීමනාව ලෙස රු. 216,000 ක් ගෙවා තිබුණි.

(ඇ) 2008 නොවැම්බර් 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛ අංක 52 අනුව වයස අවුරුදු 60 සම්පූර්ණ වූ නිලධාරියකු නැවත සේවයේ යෙදවීම නොහැකි වුවද අධ්‍යක්ෂ ජනරාල්වරිය 2011 මාර්තු 05 දින වයස අවුරුදු 60 සම්පූර්ණවීම හේතුවෙන් විශ්‍රාම යවා තිබූ අතර අනුමැතියකින් තොරව තවදුරටත් එම ධුරයේ රාජකාරී කටයුතු සිදු කරමින් පැවතුණි.

5. ගිණුම්කටයුතුහාවය සහ යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව සකස් කර ඇති ප්‍රගති සමාලෝචන වාර්තාවේ ඉලක්ක ලහා කර ගැනීම ගණනය කොට නොතිබුණි. තවද 2003 ජුනි 02 දිනැති පී‍ඊඩී 12 වක්‍රලේඛයේ 5 වන පරිච්ඡේදයේ 5.1.2 වගන්තිය අනුව ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු හා ඉලක්ක (goals and targets) ලහා කර ගතයුතු, වගකිව යුතු නිලධාරීන් නම් කර නොතිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණක සහකාර පුරප්පාඩුව සමාලෝචිත වර්ෂයේදීද පැවතුණි.

(ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 13(5)(ඩී) වගන්තිය පරිදි අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.3 ප්‍රසම්පාදන සැලැස්ම

අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයට සාරාංශ ගත ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද එම සැලැස්මේ විස්තරාත්මක තොරතුරු ඇතුලත් ලිපි ගොනුව විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම තාත්වික ද, එය සමාලෝචනය කර තිබේද, පාලන කාරකයක් ලෙස යොදා ගෙන තිබේ ද යන්න තහවුරු කර ගැනීමට නොහැකි විය.

5.4 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය ආරම්භයෙදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අයවැය ලේඛණය අනුමත කර තිබු අතර සමාලෝචිත වර්ෂය අවසානයේදි සංශෝධිත අයවැය ලේඛණය සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගෙන තිබුණි. අයවැය ගත වියදම ශීර්ෂ 07 කට අදාලව සත්‍ය වියදම් 95% සිට 957% ක පරාසයක විචලනයන් සිදු වී ඇති හෙයින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

අධිකාරියේ 2007 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2009 ජුනි 12 දින සභාගත කර තිබුණි. 2008 සහ 2009 වර්ෂික වාර්තා සමාලෝචිත වර්ෂය ආරම්භය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

5.6 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විසිරී පින්තාරු බලපත්‍ර ලබාදීම.

(i) විසිරී පින්තාරු කටයුතු සිදු කිරීමේදි වායු ගෝලයට මෝචනයන් සිදුවන අතර අධිකාරිය ඒ පිළිබඳ කටයුතු කර නොතිබුණි.

(ii) ඉල්ලුම්පත සම්පූර්ණ කර නොතිබියදි ආරක්ෂණ බලපත්‍රය ලබාදි තිබුණි.

(iii) ටින්කරින් වැඩ සිදු කිරීමේදි 1996 මැයි 21 දිනැති 924/12 උපලේඛණ 01 රෙගුලාසි 02 අනුව ඩෙසිබල් 63 ට වඩා අඩු ශබ්දයක් පවත්වාගෙන යනු ලබන්නේද යන්න පරිසර අධිකාරිය විසින් සනාථ කරගෙන නොතිබුණි.

(iv) විසිරී පින්තාරු කටයුතු සිදු කිරීම සඳහා බලපත්‍රය ලබාදි තිබුණද ක්ෂේත්‍ර පරීක්ෂණ වාර 03 කදි වත් විසිරී පින්තාරුව, කුටිරය තුළ සිදු කරන්නේද යන්න අනාවරණය කර ගෙන නොතිබුණි.

(v) පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි අංක 1:4 යටතේ ශබ්ද මිනුම් වාර්තාවක් හා 2:3 කොන්දේසි යටතේ වායු දූෂණ පාලන පද්ධතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්තාවන් මධ්‍යම පරිසර අධිකාරිය පිළිගත් අනුමත ආයතනයකින් ලබා ගෙන බලපත්‍රය නිකුත් කළ දින සිට මාස 06 ක කාලයක් තුළ අධිකාරිය වෙත කර්මාන්තකරු විසින් ඉදිරිපත් කල යුතු වුවත් එම බලපත්‍රයේ කොන්දේසි සම්පූර්ණ කර නොතිබුණි.

(vi) එක් පැමිණිල්ලක් 2007 වර්ෂයේ මාර්තු මස 12 වෙනිදා සිට 2011 ඔක්තෝබර් 11 දක්වා වර්ෂ 5 ක කාලයක් තුළ වාර කිහිපයකදීම ලැබී තිබූ අතර එම පැමිණිල්ල සම්බන්ධයෙන් අධිකාරිය විසින් වර්ෂ 05 තුළදීම පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාදී තිබූ කාර්යය තහවුරු කරගෙන නොතිබුණි.

(ආ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම

(i) සංශෝධනය කිරීම මැයෙන් පරිසර අමැතිතුමා ඉදිරිපත් කළ 2006 ජූලි 21 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 22 සහ 23 ඡේද යටතේ දක්වා ඇති අවශ්‍යතා ඇතුලත් වන පරිදි 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සංශෝධනය හා එම කාර්යය සඳහා අවශ්‍ය සංශෝධන ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමට නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි.

(ii) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් කෙටුම්පත් කිරීමට නීති කෙටුම්පතක් සම්පාදනයට අමාත්‍යමණ්ඩලය නියෝග කර තිබුණි.
ඒ අනුව වැඩි දියුණු කිරීමට අවශ්‍ය අංශ 18 ක් හදුනාගෙන තිබුණද එම හදුනා ගත් අංශයන් 18 ක් වෙනුවෙන් 2012 ජූලි 31 දක්වා පනතේ සංශෝධයන් සිදුකර නොතිබුණි.

(iii) 2011නොවැම්බර් 15 දින 119 වැනි පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාව මගින් මධ්‍යම පරිසර අධිකාරියේ හදුනාගන්නා ලද ප්‍රධාන ගැටලු යටතේ 2008 - 2012 සංයුක්ත සැලැස්ම අනුව ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම සිදු කළ යුතු බවට නියෝගයන් ලබාදී තිබුණි.2012 මැයි 24 දින වන විටත් එම සංශෝධනයන් සිදුකර නොතිබුණි.

(ඇ) පරිසර පැමිණිලි පරීක්ෂාව

(i) 2011 වර්ෂයට අදාළව අධිකාරිය වෙත ලද මුළු පැමිණිලි සංඛ්‍යාව 1974 ක් විය.කොළඹ දිස්ත්‍රික්කයෙන් පැමිණිලි 371 ක්ද ගම්පහ දිස්ත්‍රික්ක තුළින් පැමිණිලි 234 ක් ලැබී තිබූ අතර ඉන් කොළඹ දිස්ත්‍රික්කයෙන් ලද පැමිණිලි 02 ක්ද ගම්පහ දිස්ත්‍රික්කයෙන් ලද පැමිණිලි 15 ක් ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්ත වෙනුවෙන් විය.එම පැමිණිලි 17 ම ආයෝජන මණ්ඩලය වෙත යොමු කර තිබූ අතර ඒවා පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි.

(ii) ප්‍රාදේශිය කාර්යාල වලට ලැබෙන පැමිණිලි වෙනුවෙන් ප්‍රධාන කාර්යාලයෙන් යොමු අංකයක් ලබා ගැනීමේ ක්‍රම වේදයන් නොමැති නිසා පළාත් කාර්යාල වලට ලැබෙන සියළු පැමිණිලි හා යොමු කරන ලද පැමිණිලි පිසදා තිබේ ද යන්න ප්‍රධාන කාර්යාලයට පැහැදිලිව හඳුනා ගත නොහැකි විය.

(iii) 2012 මාර්තු මස 30 දින වන විට කැඳවන ලද පැමිණිලි වල ප්‍රගති වාර්තා අනුව බස්නාහිර පළාත් කාර්යාලයේ නියැදි පරීක්ෂාවේදී කළුතර පළාත් කාර්යාලවලට 70ක්ද ,දකුණු පළාත් කාර්යාලවලට 84 ක්ද ,උතුරු මැද පළාත් කාර්යාලවලට 79 ක්ද වශයෙන් පැමිණිලි 233 ක් ලැබී තිබුණි. ඉන් පැමිණිලි 28 ක් පළාත් කාර්යාල වලට යොමු කර තිබු අතර ඉතිරි පැමිණිලි වලින් 22 ක් පසුවිපරමි කර නොතිබු අතර 31ක් විසඳා නොතිබුණි. පැමිණිලි 10 ක් පරීක්ෂා කර හෝ නොතිබුණි.

(iv) බස්නාහිර පළාත් කාර්යාලයට ලද පැමිණිලි පරීක්ෂාවේදි පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත් කර්මාන්ත වලින් ලද පැමිණිලි 371 කින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදි ඇති කර්මාන්ත වලට විරුද්ධව පැමිණිලි 18 ක් ලැබී තිබුණි.එම කර්මාන්ත වලට බලපත්‍ර ලබා දි තිබිය දීම, පරිසර පිඩාවන් ඇති වන අයුරින් එම කර්මාන්ත ක්‍රියා කර ඇති බව පැමිණිලි වල සඳහන් වී ඇත.ඒ අනුව බලපත්‍ර ලබා දීමේදි අධිකාරිය හා පළාත් පාලන ආයතන පරිසර පිඩාවන් හා බලපත්‍රයට අනුකූලවම කර්මාන්තය පවත්වාගෙන යාම පිළිබඳ අවධානයක් යොමු කර නොතිබුණි.

(v) 2011 වර්ෂයේ ජුලි මස වන විට අධිකාරිය වෙත ලද පැමිණිලි වලින් පරිසර දූෂණ පාලන අංශය වෙත පැමිණිලි 31 ක් විසඳීම සඳහා යොමු කර තිබුණි.එම යොමු කරන ලද පැමිණිලි වලින් පැමිණිලි 12 ක් විදුලි සංදේශන කුඑණු සවිකිරීම් සම්බන්ධයෙන් ලද පැමිණිලි විය.එම පැමිණිලි සියල්ලම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත යොමු කර තිබුණද එම පැමිණිලි විසදි නොතිබුණි.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණ වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(1) අයවැය

(2) ස්ථාවර වත්කම්

(3) ලේඛන පැවැත්වීම

(4) විදේශ ගමන්

(5) ප්‍රසම්පාදන ක්‍රියාවලිය

(6) පුනරාවර්තන ආධාර

(7) පාරිතෝෂික වෙන් කිරීම්

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

15. පිළිසරු ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

15.1. හැඳින්වීම

අක්‍රමවත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ශ්‍රී ලංකාවේ විශාලතම සහ ප්‍රධානතම පාරිසරික ගැටළුවක් බවට පත් වී ඇත. කසළ එකතු කිරීමේ, කසළ ප්‍රවාහනය කිරීමේ, අතරමැදි ප්‍රතිකර්ම යෙදීමේ ක්‍රමවේදයක් සහ සුදුසු අවසාන බැහැරලීමේ ක්‍රමවේදයක් නොමැති වීම ශ්‍රී ලංකාව තුල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ගැටළු තවත් උග්‍ර කරවීමට හේතු වී ඇත. ශ්‍රී ලංකාව තුල වර්තමානයේ පවතින අක්‍රමවත් කසළ බැහැරලීමේ ක්‍රියාකාරකම් මගින් මහජනයා වෙත විවිධ වූ පාරිසරික ගැටළු මෙන්ම විවිධ පීඩාකාරී තත්ත්ව උද්ගත කර ඇත. මෙම ක්‍රියාකාරකම් වල අවසාන ප්‍රතිඵලය වනුයේ සමාජය විවිධ වූ සෞඛ්‍යමය, සමාජමය, ආර්ථිකමය සහ සංස්කෘතිකමය ගැටළු වලින් පීඩා විඳින තත්ත්වයකට පත් වීම වන අතර එය නව ගැටළු උද්ගත වීමට හේතු සාධක වී ඇත.

දිවයිනේ බොහෝමයක් පළාත් තුල කසළ එකතු කිරීමට සහ බැහැරලීම සඳහා අවශ්‍ය කරන යටිතල පහසුකම් සහ සම්පත් නොමැති වීමෙන් පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශ වලද කිසිදු පාලනයකින් තොරව කසළ බැහැරලීම සහ විසිරීම සිදු කරනු ලැබේ. බොහෝ ප්‍රදේශවල ගෘහස්ථ ලෙස සහ කර්මාන්ත ශාලා වලින් නිපදවන බොහොමයක් කසළ අවසාන බැහැරලීම සඳහා ක්‍රමවත් පහසුකම් නොමැත. මෙලෙස අක්‍රමවත් ලෙස බැහැරලන කසළ මගින් කාණු පද්ධතිවල ජලය ගලා යෑම අවහිර වන අතර, රෝග වාහකයින් එනම්, මැස්සන්, මදුරුවන් සහ මීයන් සඳහා අභිජනන ස්ථාන සපයයි.

ස්වභාවික ස්ථාන වල සිදුවන විවෘත කසල බැහැරලීම මගින් මතුපිට හා භූගත ජලය අපිරිසිදු වීම සිදුවන අතර, අනවසර ලෙස ඉඩම් පැහැර ගැනීමටද එමගින් අවස්ථාව උදාවේ. අඩු උෂ්ණත්ව තත්ත්ව යටතේ කසළ විවෘත දහනයද විශාල වශයෙන් පැතිර පවතී. එමගින් වායු දූෂණය හා විවිධ වූ භයානක සෞඛ්‍යමය ගැටළු උද්ගත කරයි.

අදාළ අණපනත් මගින් ශ්‍රී ලංකාව තුල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයේ සම්පූර්ණ වගකීම පැවරී ඇත්තේ පළාත් පාලන ආයතන වලට වේ. මහ නගර සභා ආඥා පනත, නගර සභා සහ ප්‍රාදේශීය සභා පනත් මගින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල සම්පූර්ණ වගකීම අදාල පළාත් පාලන ආයතන වෙත පවරා ඇති නමුත් ඔවුන්ගේ දැක්ම තුළ වැඩිමනත් අවධානය යොමු කර ඇත්තේ භෞතික සම්පත් දියුණු කිරීම කෙරෙහි වන අතර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි දැක්වෙන උනන්දුව සාපේක්ෂ වශයෙන් පහත් තත්ත්වයක පවති.

15.2. පිළිසරු ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම.

ශ්‍රී ලංකාවේ බොහොමයක් ප්‍රදේශ වල පළාත් පාලන ආයතන කසළ කළමනාකරණය කෙරෙහි සාපේක්ෂ වශයෙන් දක්වන පහත් උනන්දුව හේතුවෙන් සාමාන්‍ය ජනතාව මත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ විවිධ වූ ගැටළු සහගත තත්ත්වයන් උද්ගත වී ඇති අතර පසුගිය වසර කිහිපය තුල පළාත් පාලන ආයතන මෙම ගැටළු සහගත තත්ත්වය විසඳීම සඳහා ගෙන ඇති පියවරයන් සාපේක්ෂ ලෙස අඩුවී ඇත. මෙම හේතුව මත මධ්‍යම පරිසර අධිකාරිය සහ එවකට පැවති පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය වෙත පළාත් පාලන ආයතන වලට එරෙහිව නිරන්තරයෙන් මහජන පැමිණිලි නගමින් පැවතිණ.

මෙම හේතූන් මත උක්ත ගැටළුව සම්බන්ධයෙන් විසඳුම් ලබාදීම සඳහා එවකට පැවති පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයේ අමාත්‍යතුමාගේ මහ පෙන්වීම මත "පිළිසරු" නමින් ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් එවකට පැවති පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ මහ පෙන්වීම මත අනෙකුත් රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ ක්ෂේත්‍රයේ විශේෂඥයන්ගේ සහභාගිත්වයෙන් පිහිටුවන ලදී.

සිංහල භාෂාව අනුව පිළිසරු යන වචනයේ අර්ථය වනුයේ නැවත සම්පතක් කර ගැනීම වේ. මෙය මෙම වැඩසටහනේ ප්‍රධාන අභිප්‍රාය වේ. මෙම වැඩසටහනේ සංකල්පය වනුයේ කසළ ලෙස ඉවත දමන ද්‍රව්‍ය උපරිම ලෙස නැවත ප්‍රයෝජනයට ගැනීම සහ අවශේෂ කසළ පරිසර හිතකාමී ලෙස අවසාන බැහැරලීම සිදු කිරීමයි.

මෙම ගැටළුව කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කම මත ජාතික වශයෙන් සම්බන්ධීකරණයක් ලබාදීම සඳහා එවකට පැවති පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය විසින් පිළිසරු වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ලදුව ඒ සඳහා 2007 ජූලි 25 දින න්‍යායාත්මක වශයෙන් අවසර ලබා දෙන ලදි.

මෙම වැඩසටහනේ පහත සඳහන් ක්‍රියාකාරකම් ඇතුලත් වේ.

- ජාතික කසළ කළමනාකරණ ප්‍රතිපත්තියක් සැකසීම.
- කසළ කළමනාකරණය කෙරෙහි නිරත වී සිටින පිරිස් සඳහා ධාරිතා වර්ධනය සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

පළාත් පාලන ආයතන වල පවතින කසළ කළමනාකරණ වැඩසටහන් වැඩි දියුණු කිරීමට සහ නව ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කරන තාක්ෂණික සහය සහ අනෙකුත් සම්පත් ලබා දීම.

- සම්පත් හුවමාරුව සහ උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම තුලින් කසළ කළමනාකරණ වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම.
- කසළ කළමනාකරණ වැඩසටහන් අධීක්ෂණය කිරීම.
- දීර්ඝකාලීන යොමුවක් වශයෙන් වශකිවයුතු පාර්ශවයන් අදාල කාර්යයන් නිසි පරිදි සිදු නොකරන්නේ නම්, ඊට එරෙහිව නීතිමය පියවර ගැනීම.

පිළිසරු වැඩසටහන -

"ශ්‍රී ලංකාව තුල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රවේශයක් - පිළිසරු ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම" යන මැයෙන් එවකට පැවති පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට 2007 දෙසැම්බර් මස 19 වන දින ලැබුණු අනුමැතිය අනුව 2008 ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි පිළිසරු ව්‍යාපෘතිය මධ්‍යම පරිසර අධිකාරියේ ස්ථාපිත කෙරිණ.

පිළිසරු වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සම්පර්ණ මහ පෙන්වීම ලබා දෙනුයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ උසස් මට්ටමේ ජාතික කමිටුවක් මගින් වන අතර, මෙහි සම සභාපතිත්වය පරිසර අමාත්‍යාංශය සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරුන් විසින් උසුලනු ලබයි.

පිළිසරු වැඩසටහන පිළිසරු ව්‍යාපෘතිය වශයෙන් 2008 ජනවාරි මස සිට මූලිකව අවුරුදු 3ක කාලයක් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ස්ථාපිතව ක්‍රියාත්මක කෙරිණ. මූල්‍යමය ප්‍රතිපාදන ලෙස රුපියල් බිලියන 5.675ක මුදලක් ලබා ගැනීමට බලාපොරොත්තු වූ අතර එම මුදල ප්‍රධාන වශයෙන් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට අපේක්ෂිත විය.

පිළිසරු වැඩසටහන මගින් 2008-2010 අතර කාල සීමාව තුල සිදු කිරීමට යෝජිත කාර්යභාරයේ විශාලත්වය අවබෝධ කර ගත් එවකට පැවති පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය විසින් පිළිසරු වැඩසටහන ව්‍යාපෘතියක් ලෙස මධ්‍යම පරිසර අධිකාරියේ ස්ථාපිත කරන ලද අතර පිළිසරු වැඩසටහනට අදාලව ව්‍යාපෘති වාර්තාවේ ඇතුලත් ව්‍යාපෘති ක්‍රියාකාරකම් කාලානුරූපව ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගැනීම සඳහා විශේෂිත වූ වගකීම් පවරන ලද ව්‍යාපෘති නිලධාරීන් පිරිසක් යොදවා ඇත.

ව්‍යාපෘතියේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් සහ කාලීන අවශ්‍යතාවය මත තවත් ඉදිරි වසර 3ක් සඳහා එනම් 2011 ජනවාරි 01 දින සිට ඉදිරි වසර 3 සඳහා මෙම ව්‍යාපෘතියේ කාල සීමාව දීර්ඝ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. ඒ අනුව 2011-2013 තෙවසර සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද අතර එහිදී විශේෂයෙන්ම මෙතෙක් නිම කිරීමට නොහැකි වූ ක්‍රියාකාරකම් මෙම ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කරන ලදි.

15.3. ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය

පිළිසරු වැඩ සටහනේ එක් ආරම්භයක් වශයෙන් පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය විසින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් 2007 ඔක්තෝම්බර් මසදී කෙටුම්පත් කරන ලදි. එසේම ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ උපාය මාර්ගයන් කෙටුම්පත් කරන ලදි. අදාල ප්‍රදේශ වල තිරසාර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඒ සඳහා පළාත් පාලන ආයතන වල පූර්ණ සහයෝගය ලබාගැනීම සඳහා උක්ත උපාය මාර්ග ක්‍රියාවෙහි නැංවීම වර්තමානයේ ඉතා අත්‍යාවශ්‍ය කරුණක් වී ඇත. පිළිසරු වැඩ සටහන මෙම උපාය මාර්ග ක්‍රියාවෙහි යෙදවීමේ අභියෝගය මනාව හඳුනාගෙන ඇත.

15.4. අරමුණු

පිළිසරු වැඩ සටහනේ ප්‍රධාන අරමුණු පහකි.

- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීම

- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික උපාය මාර්ග සැකසීම

- සියළුම පාර්ශවයන් සඳහා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයට අදාලව ඵලදායී අධ්‍යාපනයන් හා දැනුවත් කිරීමක් ලබාදීම. මේ සඳහා පුහුණු කිරීම් හා ධාරිතා වර්ධනය ඇතුලත් වේ.

- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ව්‍යාපෘති සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතන වලට පහසුකම් සැපයීම

- කාර්යක්ෂම ලෙස අණපනත් ක්‍රියාත්මක කිරීම සඳහා පවතින නීති රාමුව සවිබල ගැන්වීම

ඉහත අරමුණු ගොඩනංවා ඇත්තේ ඝණ අපද්‍රව්‍ය හා සබැඳිව පවතින ගැටළු සහ ඝණ අපද්‍රව්‍ය හා සබැඳිව විවිධ පාර්ශවයන් විසින් මඟුණපාන ගැටළු සැලකීම තුලින් සහ දිවයින තුල පූර්ණ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීමට විශේෂයෙන් ප්‍රබල ගැටළු ලෙස සැලකෙන අතරමැදිප්‍රතිකර්ම යෙදීම සහ අවශේෂ කසල පරිසර හිතකාමී ලෙස අවසාන බැහැරලීම පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම පදනම් කරගෙනය.

15.5. විෂය පථය

මෙහිදී ඝණ අපද්‍රව්‍ය ලෙස ගෘහස්ථ කසළ, නාගරික කසළ , වාණිජ කසළ, ආයතනික කසළ සහ සමහරක් කර්මාන්තශාලා කසළ මෙන්ම පළාත් පාලන ආයතන සහ පොදු ස්ථාන වලින් බැහැරලන කසළ අයත් වේ. පිළිසරු ව්‍යාපෘතියේ දැක්ම තුල පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් ඇතුලත් වේ.

(i) පළාත් පාලන ආයතන වලින් ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධව තොරතුරු රැස් කිරීම

පළාත් පාලන ආයතන මඟින් වර්තමානයේ සිදුකරන කසළ බැහැරලන ක්‍රමවේදයන්, දැනට ක්‍රියාත්මක කර අතහැර දමා ඇති ව්‍යාපෘති සහ සැලසුම් කටයුතු සඳහා දැනට ඇති සම්පත් පිළිබඳ දත්ත එක්රැස් කිරීම මේ යටතේ සිදු කෙරේ. දත්ත එක්රැස් කිරීමේ දී මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල ජාලය හරහා ප්‍රාදේශීය පරිසර නිලධාරීන්ගේ සහාය ලබා ගැනේ.

(ii) ව්‍යාපෘති වාර්තා විශ්ලේෂණය කිරීම

පළාත් පාලන ආයතන මඟින් එවනු ලබන ව්‍යාපෘති වාර්තා විශ්ලේෂණය කිරීම සහ එමඟින් අදාල ව්‍යාපෘති බිම් මට්ටමේ සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහාය ලබාදෙනු ලැබේ. එම ව්‍යාපෘති සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත විශ්ලේෂණ ක්‍රමවේදය ගොඩනඟා ඇති අතර, ක්ෂේත්‍රයේ විවිධ තාක්ෂණික විශේෂඥයන්ගේ සහාය මේ සඳහා ලබාගනු ඇත.

(iii) කසළ ප්‍රතිචක්‍රීකරණ බැංකු ක්‍රමයක් ස්ථාපිත කිරීම

පිළිසරු ව්‍යාපෘතිය විසින් සණස සංවර්ධන බැංකුව සමඟ එක්ව කසළ ප්‍රතිචක්‍රීකරණ බැංකු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව පිළිබඳ සලකා බලන ලදි. ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසළ විශේෂයෙන්ම ප්ලාස්ටික් සහ පොලිතීන් ගිණුම් හිමියන්ගෙන් අදාල බැංකුව ලබා ගන්නා අතර, කසළ වල අගයට සමාන මුදලක් එම ගිණුම් හිමියාගේ ගිණුමට බැර කරනු ලැබේ. බැංකුව මඟින් නිරන්තරයෙන් එකතු කරනු ලබන කසළ ප්‍රතිචක්‍රීකරණ ආයතන වෙත විකුණනු ලබන අතර, ලැබෙන මුදලෙන් ගිණුම් හිමියන්ට ගෙවීමට මුදල මෙන්ම බැංකුවේ වියදම් පියවා ගැනීමට තරම් වූ ආදායමක් උපයා ගනියි. මෙය පිළිසරු ව්‍යාපෘතිය විසින් සණස බැංකුව සමඟ එක්ව සිදුකරන නව හඳුන්වාදීමක් ලෙස පෙන්වා දිය හැකිය.

(iv) කසළ එකතු කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම

(v) තාක්ෂණික සහාය, ආයතනික ශක්තිය සහ ධාරිතා වර්ධනය

(vi) ලෝහ ප්ලාස්ටික්, වීදුරු සහ කඩදාසි කසළ සඳහා එකතු කිරීමේ ජාලයන් ඇති කිරීම තුලින් ප්‍රතිචක්‍රීකරණය ශක්තිමත් කිරීම

ඉවතලන ප්ලාස්ටික්, ලෝහ, වීදුරු සහ කඩදාසි ප්‍රතිචක්‍රීකරණය සඳහා යෝග්‍ය ද්‍රව්‍ය වේ. පෞද්ගලික අංශයේ විවිධ ආයතන, ප්ලාස්ටික් සහ අනෙකුත් ප්‍රතිචක්‍රීයකරණ කසළ එකතු කිරීම සඳහා යොමු වන ප්‍රවණතාවය වැඩි වෙමින් පවතී. විශේෂයෙන්ම පාසල් ප්‍රජා සංවිධාන කාන්තා සංවිධාන සහ පළාත් පාලන ආයතන සඳහා විශේෂිත වූ අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම තුලින් ඉහත කසළ ප්‍රතිචක්‍රීකරණය සඳහා ධෛර්යමත් කිරීම සිදු කරනු ලැබේ.

(vii) පළාත් පාලන ආයතන මට්ටමින් කොම්පෝස්ට් අංගන ඉදිකිරීම

විවෘත භූමි වලට සහ ජලාශ්‍රිත ප්‍රදේශ වලට අවිධිමත් ලෙස කසළ බැහැරලීමේ ගැටළුවට විද්‍යාත්මක ලෙස පිළිගත හැකි විසඳුමක් ලබාදීමේ උත්සාහයේ දී පිළිසරු ව්‍යාපෘතිය විසින් පළාත් පාලන ආයතන සඳහා කොම්පෝස්ට් අංගන ඉදිකිරීම මෙන්ම පරිසර හිතකාමී ලෙස කසළ බැහැරලීම සඳහා පහසුකම් සැපයීම ට අවශ්‍ය කරන පියවර සලසා දෙනු ලැබේ. මෙහිදී සුදුසු තාක්ෂණික ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ ජාතික ව්‍යුහය මඟින් ස්ථාපිත කරන ලද විශේෂඥ දැනුමෙන් පරිපූර්ණ වූ තාක්ෂණික කමිටුවේ සාමාජිකයින්ගේ සහාය ලබාගනු ලැබේ.

(viii) අවශේෂ කසළ බැහැරලීම සඳහා අඩු වියදම් සනීපාරක්ෂක කසළ රඳවන ඉදිකිරීම

සනීපාරක්ෂක කසළ රඳවන සැලසුම් කෙරෙනුයේ පරිසර හිතකාමී ලෙස අවශේෂ කසළ බැහැරලීම සඳහාය. මෙම සැලසුම් තුල අපදියර සහ වායු පාලනය සිදු කිරීම කසළ මත දෙනිකව පස් ආවරණයක් යෙදීම, මතුපිට ජලය ගලායෑම පාලනය කිරීම තුලින් මතුපිට සහ භූගත ජලය අපිරිසිදු වීම අවම කිරීම සිදු කෙරේ. පිළිසරු ව්‍යාපෘතිය තුලින් මෙවැනි වූ සනීපාරක්ෂක කසළ රැඳවුම් කිහිපයක් ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර, එමඟින් පොකුරු ක්‍රමය යටතේ පළාත් පාලන ආයතනවලට සිය අවශේෂ කසළ මෙම සනීපාරක්ෂක කසළ රඳවන වලට බැහැර කිරීමට අවස්ථාව සැලසේ.

(ix) ගෘහස්ථ කොම්පෝස්ට්කරණය ප්‍රචලිත කිරීම

ගෘහස්ථ කොම්පෝස්ට් වලට අයත් වනුයේ මුළුතැන්ගෙයන් සහ ගෙවත්තෙන් ඉවතලන සාපේක්ෂ වශයෙන් කුඩා ප්‍රමාණයක් වූ කාබනික ද්‍රව්‍ය වේ. විවෘත කුඩා අට්ටි මඟින් හානි වන උෂ්ණත්වය හා තෙතමනය කොම්පෝස්ට් බඳුනක් හෝ වලක් භාවිතා කිරීම තුලින් රඳවා ගැනීමට හැකියාව ලැබේ. මෙවැනි වූ බඳුනක් භාවිතා කිරීම තුලින් අවට අශෝභන වීම අවම වීම සිදුවීම වාසියක් වන බැවින්, ජනාකීර්ණ ප්‍රදේශවලට මෙවැනි කොම්පෝස්ට් බඳුන් භාවිතය ඉතා සුදුසු වේ. එබැවින්, පිළිසරු ව්‍යාපෘතිය විසින් පළාත් පාලන ආයතන සඳහා සහන මිලකට කොම්පෝස්ට් බඳුන් ලබාදීම තුලින් ගෘහස්ථ කොම්පෝස්ට්කරණය ප්‍රචලිත කිරීමට පියවර ගැනීම සිදු කෙරේ.

(x) පසුවිපරම් කිරීම හා නිසි ලෙස ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය නොකරන පළාත් පාලන ආයතනවලට එරෙහිව නීතිමය පියවර ගැනීම.

පිළිසරු ව්‍යාපෘතිය විසින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය නිසි පරිදි සිදු නොකරන පළාත් පාලන ආයතනවලට එරෙහිව අවසානයේ දී නීතිමය පියවර ගැනීම මේ යටතේ සිදු කෙරේ. ප්‍රාදේශීය පරිසර නිලධාරීන්ගෙන් සහ පිළිසරු ව්‍යාපෘතියේ නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මාර්ගයෙන් පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කෙරෙන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහන් නිරන්තරයෙන් පසුවිපරම් කිරීම සහ අධීක්ෂණය කිරීම සිදු කෙරේ.

15.6. පිළිසරු ක්‍රියාකාරී සැලැස්ම

පිළිසරු ව්‍යාපෘතියේ 2008-2010 සහ 2011-2013 තෙවසරවල් සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම වලට අමතරව, අදාල වසරවල් සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මවල් ද සකස් කර ඇත. ඒ අනුව 2011 වසර සඳහා පිළිසරු ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත්තේ අදාල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කල යුතු ප්‍රමාණ හඳුනාගෙන ඇති ආකාරය අනුවය. මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී කාලයෙන් කාලයට හඳුනා ගන්නා ලද ක්‍රියාකාරකම් වලට අනුකූලව මෙම 2011 වසරේ ක්‍රියාකාරී සැලැස්ම වරින් වර විවිධ වූ සංශෝධන වලට ලක් කරන ලදි.

මේ ආකාරයෙන්ම සමහරක් ක්‍රියාකාරකම් සඳහා වර්ෂ ආරම්භයේ වෙන් කිරීමට සැලසුම් කරන ලද ප්‍රතිපාදන ක්‍රියාකාරී අවදියේදී අවශ්‍යතා අනුව විවිධ වූ වෙනස්වීම් වලට ලක් කරන ලද අතර විශේෂයෙන්ම පිළිසරු ව්‍යාපෘතියේ පාලනයෙන් ස්වාධීනව විවිධ අවස්ථාවල පැන නැගුණු විවිධ වූ ගැටළුකාරී තත්ත්වයන්ට අනුව එකී සැලැස්ම වෙනස් කිරීම් වලට භාජනය කිරීමට සිදු විය. අවශ්‍ය අවස්ථාවල මෙලෙස ක්‍රියාකාරී සැලැස්මේ සිදු කරන ලද වෙනස්වීම් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදි.

15.7.පිළිසරු ව්‍යාපෘතියේ ප්‍රගතිය

පහසුව සහ පැහැදිලි බව සඳහා පිළිසරු ව්‍යාපෘතියේ ප්‍රගතිය දක්වා ඇත්තේ 2011 වසරේ ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති සියළු ක්‍රියාකාරකම් වලට අනුකූල වන පරිදිය. කෙසේ වෙතත් විශේෂයෙන් සඳහන් කළ යුත්තේ සමහරක් ක්‍රියාකාරකම් වල ඉතා අල්ප හෝ කුඩා ප්‍රගතියක් පෙන්වා ඇති අතර සමහරක් ක්‍රියාකාරම් සඳහා කිසිදු ප්‍රගතියක් නොපෙන්වූ අවස්ථා ද ඇති බවය. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ අමාත්‍ය මණ්ඩලය මගින් ව්‍යාපෘති සඳහා අනුමත කර ඇති සමහරක් ඇබෑර්තු සඳහා මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවට අනුමැතිය නොලැබීමයි.

මේ ආකාරයෙන්ම පිළිසරු ව්‍යාපෘතිය විසින් ක්‍රියාකාරී සැලැස්මේ නොමැති එහෙත් ජාතික වශයෙන් වැදගත් වූ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා මිනිස් ශ්‍රමය මගින් මෙන්ම මූල්‍යමය වශයෙන් සහයෝගය ලබා දෙන ලදි.

15.8. විශාල පරිමාණ කොම්පෝස්ට් අංගන සංකීර්ණ ඉදි කිරීම:

පිළිසරු ක්‍රියාකාරී සැලැස්ම මගින් උතුරු පළාත ද ආවරණය වන පරිදි විශාල පරිමාණ කොම්පෝස්ට් අංගන ඉදි කිරීමට හඳුනාගෙන ඇත.

- කොලොන්නාව, පොතුවිල් කුඹුර කොම්පෝස්ට් අංගනය
- කළුතර, පොහොර වත්ත කොම්පෝස්ට් අංගනය
- ගාල්ල, හික්කඩුව කොම්පෝස්ට් අංගනය
- දොම්පෙ, මාලිගාවත්ත කොම්පෝස්ට් අංගනය
- කුරුණෑගල මහ නගර සභාවට අයත් කොම්පෝස්ට් අංගනය
- උතුරු පළාත සඳහා කොම්පෝස්ට් අංගනය (වව්නියාව, යාපනය, කැලණිය)

15.8.1. විශාල පරිමාණ කොම්පෝස්ට් අංගන

ශ්‍රී ලංකාවේ ඝණ අපද්‍රව්‍ය වල සංයුතිය සලකා බැලීමේ දී සහ දැනට ඇති තාක්ෂණික දැනුම අනුව ඝණ අපද්‍රව්‍ය සඳහා ප්‍රතිකර්ම යෙදීමේ සුදුසු ම ක්‍රමවේදය ලෙස කොම්පොස්ට්කරණය හඳුනාගෙන ඇත. මේ නිසා පිළිසරු ව්‍යාපෘතිය මඟින් විශාල ලෙස ඝණ අපද්‍රව්‍ය ජනනය වන පළාත් පාලන ආයතන වල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා මෙම ක්‍රමවේදය අනුගමනය කරනු ලබයි. පිළිසරු ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයක් වනුයේ විශාල සහ කුඩා පරිමාණ කොම්පෝස්ට් අංගන සඳහා පහසුකම් සැපයීමයි.

දිනකට ඝණ අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 10කට වඩා ජනනය වන පළාත් පාලන ආයතන සඳහා විශාල පරිමාණයේ කොම්පෝස්ට් අංගන ඉදිකිරීම සඳහා පිළිසරු ව්‍යාපෘතිය මඟින් සහය ලබා දීම සිදු කෙරේ. මෙම පහසුකම් දිවයින පුරා ලබා දෙන අතර මේ යටතේ මැදිරිගිරිය, අනුරාධපුර, කළුතර, කොලොන්නාව, කුරුණෑගල, හික්කඩුව, දොම්පෙ, මාතලේ, ත්‍රිකුණාමලය සහ ගෝනාධිකවත්ත කොම්පෝස්ට් අංගන ඉදිකිරීම හා ඒ සඳහා පහසුකම් ලබා දීම සිදු කෙරේ. මෙයට අමතරව උතුරු පළාතේ වව්නියාව, යාපනය සහ කන්නියා ප්‍රදේශවල ප්‍රධාන කොම්පෝස්ට් අංගන 3ක් සඳහා පහසුකම් ලබා දේ. මැදිරිගිරිය, අනුරාධපුරය සහ කළුතර කොම්පෝස්ට් අංගන වල ඉදිකිරීම් කටයුතු 2010 වසරේදී නිම කල අතර මේ වන විට එහි මෙහෙයුම් කටයුතු සාර්ථකව සිදු කෙරේ. කොලොන්නාව සහ හික්කඩුව කොම්පෝස්ට් අංගන ඉදිවෙමින් පවතින අතර අනෙකුත් කොම්පෝස්ට් අංගන වල සැලසුම් කටයුතු සිදු වෙමින් පවති.

ඉදිකිරීම් කටයුතු නිමකර ඇති කොම්පෝස්ට් අංගන සඳහා ඉදිකිරීම් කටයුතු නිමකර වසරක් යන තෙක් අධීක්ෂණ කටයුතු පිළිසරු ව්‍යාපෘතිය මඟින් සිදු කෙරේ. කොම්පෝස්ට්කරණය පිළිබඳ අදාල කොම්පෝස්ට් අංගනවල සේවකයන් සඳහා ප්‍රායෝගික පුහුණුවක් වැලිගම නගර සභාව සතු කොම්පෝස්ට් අංගනයේදී ලබාදීම සිදු කෙරිණ.

විශේෂයෙන්ම මෙම කොම්පෝස්ට් අංගන ලබා දෙනුයේ පළාත් පාලන ආයතන කිහිපයක එකතු කරනු ලබන ඝණ අපද්‍රව්‍ය සඳහා එක් කොම්පෝස්ට් අංගනයක් වන පරිදි පොකුරු ක්‍රමයටය. මෙම විශාල පරිමාණ කොම්පෝස්ට් අංගන වල ක්‍රියාකාරිත්වය සඳහා අත්‍යාවශ්‍ය අංග කිහිපයකි.

15.8.2. විශාල පරිමාණ කොම්පෝස්ට් අංගනයක ප්‍රධාන අංග:

කසළ ගොඩගසන සහ වෙන් කරන ස්ථානය

ව්‍යාපෘති භූමියට ප්‍රවාහනය කරනු ලබන කසළ එම ස්ථානයේදී ගොඩබාන අතර කොම්පෝසට් කල හැකි ද්‍රව්‍ය සහ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය වෙන් කිරීමත් කිසිදු ප්‍රයෝජනයකට ගත නොහැකි ද්‍රව්‍ය අසළ ඇති බිම් පිරවුම වෙත යොමු කිරීමත් සිදු කෙරේ. මේ නිසා පහසුවෙන් ලහා විය හැකි ස්ථානයක මෙම කසළ ගොඩබාන ස්ථානය ඉදිකිරීම සිදු කෙරේ. එසේම වහලයක් සහිත අට්ටි ගසන ස්ථානයට යාබදව මෙම ස්ථානය තිබිය යුතු අතර එමඟින් දිරාපත් වන ද්‍රව්‍ය පහසුවෙන් කොම්පෝස්ට් කිරීම සඳහා යොමු කිරීම සිදු කල හැකිය.

වහලයක් / ආවරණයක් සහිත අට්ටි ගසන ස්ථානය

මෙම ගොනැගිල්ල ඉදි කෙරෙනුයේ කසළ ගොඩගසන සහ වෙන් කරන ස්ථානයට යාබදව වන අතර එමඟින් දිරාපත් වන ද්‍රව්‍ය පහසුවෙන් මෙම ස්ථානයට යොමු කළ හැකිය. මෙහිදී කොම්පෝස්ට් කිරීම සඳහා දිරාපත් වන කසළ අට්ටි ගැසීම සිදු කෙරෙන අතර කොම්පෝස්ට්කරණයට අදාළ සියළුම ක්‍රියාකාරකම් මෙහිදී සිදු කෙරේ. මෙම ගොඩනැගිල්ලේ බිම් සකස් කරනුයේ මධ්‍යයට වන විට 1:80 බෑවුමකට වන සේය. එමඟින් අපදියර මධ්‍යයට වන්නට අති අපදියර, එකතු කිරීමේ කාණු පද්ධතිය වෙත යොමු කෙරේ.

ඇසුරුම් සහ ගබඩා ස්ථානය

නිෂ්පාදිත කොම්පෝස්ට් ඇසුරුම් කිරීමට සහ වෙනත් ස්ථානයකට ප්‍රවාහනය කරන තෙක් ගබඩා කිරීමට ස්ථානයක් අවශ්‍ය වේ. මෙම ස්ථානයේ කොම්පෝස්ට් හැලීමට සහ පවනේ වේලීමට පහසුකම් තිබිය යුතුය.

අනෙකුත් පහසුකම් සපයන ගොඩනැගිල්ල

මෙම ගොඩනැගිල්ල ඉදි කෙරෙනුයේ සේවකයන්ට පහසුකම් සැලසීම සඳහා වන අතර එයට විවේකාගාරයක්, මෙන්ම ස්ත්‍රී සහ පුරුෂ දෙපාර්ශවය වෙන් වෙන් වශයෙන් වූ නාන කාමර අන්තර්ගත වේ. මෙම කොම්පෝස්ට් අංගන වල සේවකයන් දවස පුරාම කසළ සහ එහි දුර්ගන්ධය සමඟ වාසය කරන බැවින් යලි ඔවුන් නිවසට යෑමට ප්‍රථම පවිත්‍ර වීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයිය යුතුය. එමඟින් සේවකයින්ගේ උනන්දුව ප්‍රවර්ධන කිරීම මෙන්ම මෙම ක්ෂේත්‍රයේ සේවය කිරීම සඳහා ජනතාව නැඹුරු කිරීම වර්ධනය කිරීමට හැකියාව ලැබේ.

ප්‍රධාන කාර්යාලය

කාර්යාලයක් ඉදි කිරීම මඟින් පරිපාලන කටයුතු සිදු කිරීම මෙන්ම බාහිර ආයතන / පුද්ගලයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට හැකිවේ. කාර්යාලය ඉදි කරනුයේ ව්‍යාපෘති භූමියේ මුළු ප්‍රදේශයම නැරඹිය හැකි ස්ථානයකය.

ආරක්ෂ කුටිය

ආරක්ෂක කුටිය ඉදි කෙරෙනුයේ ව්‍යාපෘති භූමියෙහි පිවිසුම් ස්ථානයේ වන අතර එමඟින් අපේක්ෂා කරනුයේ ව්‍යාපෘති භූමියෙහි ඇති උපකරණ වල ආරක්ෂාව සහ නිෂ්පාදිත කොම්පෝස්ට් වල ආරක්ෂාව තහවුරු කිරීම වේ. මෙම ආරක්ෂා කුටිය ඉදි කරනුයේ ද ව්‍යාපෘති භූමියට දර්ශනය වන ස්ථානයකය.

අපදියර ප්‍රතිකර්ම පද්ධතිය

කොම්පෝස්ට් අට්ටි මඟින් ජනනය වන අපදියර එකතු කිරීමට සහ නැවත එම අපදියර කොම්පෝස්ට්කරණ ක්‍රියාවලියට භාවිතා කිරීම සඳහා අපදියර ටැංකිය වෙත අපදියර යොමු කිරීම සඳහා කාණු සහ නල පද්ධති ක්‍රමවත්ව ඉදි කිරීම සහ සවි කිරීම කළ යුතුය.

හොඳින් සැකසුනු අභ්‍යන්තර මාර්ග පද්ධති

විශාල පරිමාණ කොම්පෝස්ට් අංගන ඉදි කෙරෙන ස්ථාන වල කසළ රැගත් වාහන නිරන්තරයෙන් ගමන් කිරීම සිදු වේ. විශේෂයෙන්ම කසළ එකතු කිරීමේදී වාහන ගමනාගමනයට අවහිර වීම් සිදු වීම නොවැලැක්විය හැකිය. නමුත් මාර්ග පද්ධතිය ක්‍රමවත් පරිදි ඉදි කිරීම තුලින් වාහන ගමනාගමනයට වූ අවහිර වීම් වැලැක්විය හැකි අතර වාහන ගමනාගමනයට ප්‍රමාණවත් ඉඩ ප්‍රමාණයක් ලබා දීමට මාර්ග පද්ධති අවශ්‍ය ප්‍රමාණයට පළල් වීම මෙන්ම ශක්තිමත් ලෙස ඉදිකිරීම අත්‍යවශ්‍ය වේ.

ව්‍යාපෘති භූමිය වටා වූ ආරක්ෂක වැට

අයාලේ යන සතුන් ව්‍යාපෘති භූමියට ඇතුළු වීම වැලැක්වීමට සහ කසළ විසිරී යෑම වැලැක්වීම සඳහා ව්‍යාපෘති භූමිය වටා වැටක් තිබීම අවශ්‍ය වේ. එසේම එමඟින් ව්‍යාපෘති භූමිය තුල වූ වාහන, යන්ත්‍රෝපකරණ සහ විවිධ පැල වර්ග වලට අවශ්‍ය ආරක්ෂාව ලබා දෙන අතර කසළ ශෝධකයන් භූමියට පැමිණීම ද වැලැක්වේ.

ස්වාරක්ෂක කලාපය

සාමාන්‍ය මහජන ආකල්පය වනුයේ යම් තැනක කසළ විවෘත ලෙස බැහැර කරනු ලබයිද එම ස්ථානයෙන් දුගඳක් වහනය වන බවයි. සමහරක් විට සත්‍ය වශයෙන්ම එම ස්ථානයෙන් දුර්ගන්ධය වහනය නොවනු ඇත. මෙය මානසික ගැටළුවක් වන අතර මෙම හේතුව මත බොහොමයක් කසළ කළමනාකරණ ව්‍යාපෘති සඳහා මහජන විරෝධයක් උද්ගත වේ. මේ නිසා කොම්පෝස්ට් අංගනය බාහිරව දර්ශනය වීම වැලැක්වීම සඳහා ව්‍යාපෘති භූමිය වටා ගස් රෝපණය කිරීම සිදු කරන අතර එමඟින් ස්වාරක්ෂිත කලාපයක් බිහි වේ. එමඟින් දූවිලි සහ කසළ ව්‍යාපෘති භූමියෙන් පිටතට විසිරීම වැළැක්වේ.

විශාල පරිමාණ කොම්පෝස්ට් අංගන සංකීර්ණ සඳහා ඉංජිනේරුමය ඇස්තමේන්තු සැකසීම, ව්‍යුහාත්මක නිර්මාණ සැලසුම් සකස් කිරීම, ප්‍රමාණ පත්‍ර සැකසීම (Bool) සහ අනෙකුත් ගෘහ නිර්මාණ සැලසුම් සකස් කිරීම සඳහා උපදේශකවරයකුගේ සේවය ලබා ගැනීමට තීරණය විය. මෙම ඉංජිනේරුමය සැකසුම් සහ ඇස්තමේන්තු සකස් කිරීම සඳහා උපදේශකවරයෙකු තෝරාගනු ලැබුවේ ජාතික ප්‍රසම්පාදන උපාය මාර්ග අනුගමනය කිරීමෙනි. අනෙකුත් කොම්පෝස්ට් ව්‍යාපෘති සඳහා මූල්‍යමය ප්‍රතිපාදන ලබා දීමට ප්‍රථම එම ව්‍යාපෘති වල තාක්ෂණික අනුකූලතාවය සහ උපයෝගිතාවය තහවුරු කිරීම සඳහා තාක්ෂණික විශ්ලේෂණ ක්‍රම වේදයක් අනුගමනය කරනු ලැබේ. මෙම විශ්ලේෂණ ක්‍රම වේදය ආරම්භ කරනුයේ පිළිසරු ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ව්‍යාපෘති භූමියේ ප්‍රාථමික හඳුනා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව පිළිසරු ජාතික ව්‍යුහය මඟින් පත් කරන ලද විශේෂඥ කමිටුවක් මඟින් ව්‍යාපෘති වාර්තාව තියුණු තාක්ෂණික විශ්ලේෂණයකට භාජනය කිරීමෙනි. පිළිසරු ව්‍යාපෘතිය මඟින් මූල්‍යාධාර හා තාක්ෂණික ආධාර ලබා දීමේ දී ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීම සඳහා සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය පහත පරිදි වේ.

- සංකල්ප ගොඩනැගීම
- ව්‍යාපෘති වාර්තාව සැකසීම
- පාරිසරික අනුමැතිය ලබාගැනීම
- අදාළ පළාත් පාලන ආයතනයේ අනුමැතිය ලබා ගැනීම
- ව්‍යාපෘති භූමියට අදාලව පාංශු පරීක්ෂණ වාර්තාව සහ අනෙකුත් හඳුනාගැනීමේ වාර්තා ලබා ගැනීම

- ව්‍යාපෘති භූමියෙහි මානක සැලසුම් සකස් කිරීම
- සැලසුම් සකස් කිරීම (සියළුම ගොඩනැගිලි වල සැලසුම් සකස් කිරීම)
- ගිවිසුම් සකස් කිරීම
- ගිවිසුම් අත්සන් කිරීම
- ප්‍රසම්පාදන පටිපාටිය සම්පූර්ණ කිරීම
- ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම
- අධීක්ෂණ සහ ප්‍රගති සමාලෝචනය
- ව්‍යාපෘති භූමිය හාර දීම

15.8.3 කොලොන්නාව, පොතුවිල් කුඹුර කොම්පෝස්ට් අංගන සංකීර්ණය ඉදි කිරීම

කොලොන්නාව කොම්පෝස්ට් අංගනය සැලසුම් කරන ලද්දේ කොලොන්නාව නගර සභා සීමාවේ දිනකට ජනනය වන ටොන් 40ක් වූ නාගරික කසළ කළමනාකරණය සඳහාය. මෙම ව්‍යාපෘතිය කොලොන්නාව පොතුවිල් කුඹුර ප්‍රදේශයේ අක්කර 4ක භූමි ප්‍රමාණයක පිහිටා ඇත. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 98.28 කි.

පිළිසරු ව්‍යාපෘතිය මගින් මහා පරිමාණ කොම්පොස්ට් අංගන ඉදිකිරීම යටතේ කොලොන්නාව නගර සභාවේ සහ මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවේ ජනනය වන කසළ කළමනාකරණය සඳහා කොලොන්නාව නගර සභා සීමාවේ මෙම කොම්පොස්ට් අංගනය ඉදි කිරීමට තීරණය විය. මෙම පළාත් පාලන ආයතන වල දෛනික කසළ ජනනය මෙට්‍රික් ටොන් 58ක් වන අතර එයින් මෙට්‍රික් ටොන් 35 ක් පමණ දිරාපත් වන කසළ වේ. මෙම කොම්පෝස්ට් අංගනයේ දෛනික කොම්පෝස්ට් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 7.5 ක් පමණ වෙතැයි අපේක්ෂා කෙරේ. පසු කාලීනව මුල්ලේරියාව ප්‍රාදේශිය සභාව විසින් සිය දෛනික කසළ ජනනය වන මෙට්‍රික් ටොන් 35ක් කළමනාකරණය කර ගැනීමට තීරණය කරන ඇත.





	පහසුකම්	වර්ග ප්‍රමාණය (ව. මී)
01	ආවරණයක් සහිත අට්ටි ගසන ස්ථානය	2727.00 m^2
02	විවෘත අට්ටි ගසන ස්ථානය	1820.00 m^2
03	විවේක කාමරය, කැබලිකරන යන්ත්‍රය, සහ හලනය ඇති ස්ථානය, ගබඩා කාමරය	186.40 m^2
04	කාර්යාලය	46.07 m^2
05	ආරක්ෂක කුටිය	16.00 m^2
06	අවසාන ලෙස කසළ වෙන් කරන ස්ථානය, විවේකාගාර සහ වැසිකිළි	357.35 m^2
07	බර කිරන බාලම සහ ගබඩාව	52.25 m^2
08	ගරාජය සහ නඩත්තු ස්ථානය	112.06 m^2
09	බයිසිකල් නවතා තබන ස්ථානය	21.58 m^2
10	මුළු බිම් ප්‍රමාණය	5337.07 m^2

කොම්පෝස්ට් අංගනය ඉදි කිරීම සඳහා ලබා දී තිබූ කාලය 2010 සැප්තැම්බර් 20 සිට 2011 අප්‍රේල් 20 දක්වා මාස 7ක කාලයක් දීර්ඝ කරන ලදි. අදාල ගිවිසුම අනුව සෑම දිනකම ඉදිකිරීමේ කටයුතුවල ප්‍රගතිය කොලොන්නාව නගර සභාවේ සභාපති මූලසුන හොබවන ප්‍රගති සමාලෝචන කමිටුවක් මඟින් සමාලෝචනය කරනු ලැබිණ. මෙයට අමතරව පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තුමේන්තුවේ පළාත් ඉංජිනේරු හා පළාත් ඉංජිනේරු විසින් පත් කරන ලද සහකාර ඉංජිනේරු සහ පිළිසරු ව්‍යාපෘතියේ නිලධාරීන්ගෙන් සැලසුම් ලත් කමිටුවක් මඟින් මෙම ව්‍යාපෘති භූමිය අධීක්ෂණය කරනු ලැබේ.

ඉදිකිරීම් සිදු කරන ලද කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘති භූමියේ වූ දුර්වල තත්ත්වය මත විවිධ වූ දුෂ්කරතා වලට මුහුණ දීමට සිදු විය.









- ඉතාමත්ම දුර්වල තත්ත්වයේ පැවති ව්‍යාපෘති භූමිය සීමිත මූල්‍යමය ප්‍රතිපාදන හමුවේ කළමනාකරණය දුෂ්කර විය.
- 18m ක් ගැඹුරට විහිදුනු කසළ හමවේ ජම්බාර කටයුතු වල ප්‍රගතියක් දක්නට නොවීය.
- නිරන්තරයෙන් ව්‍යාපෘති භූමිය හරහා ගමන් කරන කසළ සහිත ට්‍රක් රථ නිසා කොන්ත්‍රාත්කරු වෙත ඉදිකිරීම් කටයුතු සිදු කිරීම් අපහසු වීම, ව්‍යාපෘති භූමියේ ආරක්ෂාවට තර්ජනයක් වීම මෙන්ම ව්‍යාපෘති භූමිය අවහිර වීමද සිදු විය.
- යන්ත්‍රෝපකරණ වල ආරක්ෂාව සහ ව්‍යාපෘති භූමියෙහි වූ අනාරක්ෂිත සෞඛ්‍ය තත්ත්වය හේතුවෙන් මහජනයාට වන දුෂ්කරතා මගහැරවීම සඳහා ජම්බාර සවි කිරීම දිවා කාලයේ පමණක් සිදු කෙරිණ.
- ඉහත අනාරක්ෂිත සෞඛ්‍ය තත්ත්වය යටතේ සේවය කිරීම හේතුවෙන් සේවකයන් හා අනෙකුත් නිලධාරීන්ට විවිධ හදිසි තුවාල මෙන්ම රෝග වැළඳීම සිදු විය.
- සේවකයන් සඳහා ආරක්ෂිත උපකරණ එනම් ආරක්ෂිත පාවහන්, හිස් වැසුම්, මුහුණු ආවරණ ලබා දුන් නමුත් ඔවුන් එම උපකරණ භාවිතයට කැමැත්තක් නොදැක්වීය.
- කොන්ත්‍රාත්කරුගේ නිලධාරීන් මෙන්ම පළාත් පාලන කොමසාරිස් අනාරක්ෂිත සෞඛ්‍ය තත්ත්වය යටතේ විවිධ වූ රෝගාබාධ වලට ලක් වීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු නිරන්තරයෙන්ම සේවක හිඟය පිළිබඳ පැමිණිලි නැගීය.
- නමුත් ඉහත දුෂ්කරතා හමුවේ කොන්ත්‍රාත්කරු විසින් සාර්ථකව ඉදිකිරීම් කටයුතු 2011 ජූලි මසදී නිමකරන ලද අතර මෙහිදී ව්‍යාපෘති භූමියේ පැවති දුෂ්කරතා සලකා බලා ඉදිකිරීම් කටයුතු සඳහා ලබා දී තිබූ කාලය ද දීර්ඝ කරන ලදි.





15.8.4 කළුතර පොහොර වත්තේ ඉදි කරන ලද කොම්පෝස්ට් අංගනය

මෙහි ඉදි කිරීම් කටයුතු 2010 වසරේ නිම කරන ලද නමුදු 2011 වසරේදී එහි යම් යම් අඩුපාඩු දක්නට ලැබුණු බැවින් කාලයෙන් කාලයට එහි නවීකරණ කටයුතු සිදු කරන ලදි. අධීක්ෂණ කටයුතු බස්නාහිර පළාත්, පළාත් පාලන කොමසාරිස් හරහා සිදු කරන ලද අතර නිරන්තරයෙන්ම එහි අධීක්ෂණ කටයුතු පිළිසරු ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ක්ෂේත්‍ර චාරිකා සිදු කරමින් සිදු කරන ලදි.





කළුතර පොහොර වත්තේ ඉදිකරන ලද පහසුකම් පිළිබඳ පහත වගුවේ සවිස්තරාත්මකව දකවා ඇත.

	පහසුකම්	ප්‍රමාණය (ව. අ.)
01	වහලක් සහිත අට්ටි ගසන ස්ථානය (1)	40522.00
02	විවෘත අට්ටි ගසන ස්ථානය (2)	7839.52
03	ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය ගබඩාව	671.34
04	ගබඩාව, වියලන සහ හලන ස්ථානය	1295.00
05	විවේකාගාරය	232.87
06	සෝදන ස්ථානය සහ වැසිකිළි	568.75
07	ප්‍රාථමික කසළ වෙන් කිරීම සඳහා කසළ ගොඩබාන ස්ථානය	6410.00
08	ගබඩාව සහ ප්‍රධාන කාර්යාලය	671.34
09	ආරක්ෂක කුටිය	36.00





15.8.5 හික්කඩුව මොන්රෝවියා වත්තේ ඉදිකෙරෙන කොම්පෝස්ට් අංගන සංකීර්ණය

ගාල්ල ප්‍රදේශයේ කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමට යෝජිත ව තිබූ භූමිය සංවේදි ප්‍රදේශයක් වූ බැවින් එය ඉහත ඉදිකිරීම් වලට නුසුදුසු වූයෙන් එයට ආදේශකයක් වශයෙන් පිළිසරු ව්‍යාපෘතිය විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු රජගම මොන්රෝවියාවත්ත ඉඩම මේ සඳහා තෝරා ගන්නා ලදි. මෙහිදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ අනෙකුත් අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වා අවසානයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව දීර්ඝකාලීන බදු පදනම මත අක්කර 20ක් උක්ත කොම්පෝස්ට් අංගනය ඉදි කිරීම වෙනුවෙන් ලබා දීමට එකඟ විය.

වසර 2008 දී පිළිසරු ව්‍යාපෘතිය විසින් කොම්පෝස්ට් අංගනයක් සහ සනීපාරක්ෂක කසළ රඳවනයක ඉදිකිරීම සඳහා මොන්රෝවියා වත්ත ඉඩමෙන් අක්කර 28ක් ලබා ගැනීමට යෝජනා කරන ලදී. මෙම කොම්පෝස්ට් අංගනය මහින් රජගම ප්‍රාදේශිය සභාව, හික්කඩුව නගර සභාව, අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාව, අම්බලන්ගොඩ නගර සභාව, බලපිටිය ප්‍රාදේශිය සභාව, ගාල්ල මහ නගර සභාව, බෝපේ-පෝද්දල ප්‍රාදේශිය සභාව යන පළාත් පාලන 7හි ජනනය වන කසළ සඳහා කොම්පෝස්ට් අංගනයක් සහ අවසාන බැහැරලීමේ බිමක් ඉදි කිරීමට යෝජනා කරන ලදි. නමුත් අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාව සහ බලපිටිය ප්‍රාදේශය සභාව යන පළාත් පාලන ආයතන දෙක විසින් රජගම මොන්රෝවියාවත්ත කොම්පෝස්ට් අංගනයේ පහසුකම් අනවශ්‍ය බව දකුණු පළාත් සභාව තුල ඉහත පළාත් පාලන 7හි නිලධාරීන්, සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් සහ පිළිසරු ව්‍යාපෘතියේ නිලධාරීන් සහභාගි වූ සාකච්ඡාවකදී දැන්විය. නමුත් මෙම සාකච්ඡාවේදි ඉහත පළාත් පාලන ආයතන 2කට රජගම මොන්රෝවියා වත්තේ ඉදිකිරීමට යෝජිත සනීපාරක්ෂක කසළ රඳවනයේ පහසුකම් අවශ්‍ය බව දැන්විය.

වසර 2010 දී ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම සිදු කරන ලදි. 2011 පෙබරවාරි මස දී තෝරා ගන්නා ලද කොන්ත්‍රාත්කරු වෙත ඉදි කිරීම් කටයුතු සිදු කිරීමේ කොන්ත්‍රාත්තුව භාර දෙන ලදි. ඉදිකිරීම් කාලසීමාව මාස 7ක් විය.

දකුණු පළාතේ පළාත් පාලන කොමසාරිස් විසින් ඉදි කිරීම් කටයුතු අධීක්ෂණය කිරීම සඳහා ඉංජිනේරුවරයෙකු සහ සහකාර ඉංජිනේරුවරයෙකු පත් කරන ලදි. කොන්ත්‍රාත්කරු විසින් අහිතකර කාළගුණ තත්ත්වය හා ප්‍රදේශයේ පැවති වර්ෂා රටාව නිසා මාස 3ක දීර්ඝ කිරීමක් සහිතව 2011 නොවැම්බර් මසදී ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලදි. ඉදිකිරීම් සඳහා වැය වූ මුළු මුදල රු. 79,250,248.83 කි.

පහසුකම්	වර්ග ප්‍රමාණය (ව.අ.)
ආවරණයක් සහිත අට්ටි ගසන ස්ථානය (1)	21670
විවෘත්ත අට්ටි ගසන ස්ථානය (2)	14450
ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය සඳහා ගබඩාව	483
ගබඩාව, කොම්පෝස්ට් පවනේ වේලන ස්ථානය සහ හලනය සහිත ස්ථානය	870
සේවකයන්ගේ විවේකාගාරය	312
සේදුම් ස්ථානය සහ වැසිකිළි	430
කසළ ප්‍රාථමික ලෙස වෙන් කරන ස්ථානය සහ කසළ ගොඩබාන ස්ථානය	2415
ප්‍රධාන කාර්යාලය සහ අනෙකුත් පහසුකම්	210
ආරක්ෂක කුටිය	36

රජගම ප්‍රාදේශිය සභාවේ පවතින කොම්පෝස්ට් අංගනය





කොම්පෝස්ට් අංගනය සහ සනීපාරක්ෂක කසළු රඳවනය ඉදි කිරීමට යෝජිත භූමිය





වහලයක් සහිත අට්ටි ගසන ස්ථානය



වහලයක් සහිත අට්ටි ගසන ස්ථානය සහ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති වතුර ටැංකිය



15.8.6. දොම්පේ මාලිගාවත්ත ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත කොම්පෝස්ට් අංගනය

එවකට පැවති පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය වෙත දොම්පේ ප්‍රාදේශිය සභාව කරන ලද ඉල්ලීමකට අනුව පිළිසරු ව්‍යාපෘති විසින් දොම්පේ ප්‍රාදේශිය සභා සීමාවේ ජනනය වන කසළ සඳහා ක්‍රමවත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් ඇති කිරීමට යෝජනා විය. මේ සඳහා දොම්පේ මාලිගාවත්ත ප්‍රදේශයේ වූ ඇකේසියා, පයිනස් වැනි විදේශිය ශාක වලින් වැසී පැවති වාණිජ වන වගා භූමියක් තෝරා ගැනිණ.

දොම්පේ ප්‍රාදේශිය සභා සීමාව තුල දෛනිකව කසළ මෙට්‍රික් ටොන් 5ක් පමණ ජනනය වන අතර එයින් 50%ක් පමණ ඇත්තේ දිරාපත් වන කසළ වේ. උක්ත භූමිය හෙක්ටයාර 5ක් වන අතර එයින් හෙක්ටයාර 3ක් කොම්පෝස්ට් අංගනය ඉදි කිරීම සඳහා යොදා ගැනේ.

කොම්පෝස්ට් අංගනය සහ සනීපාරක්ෂක කසළ රඳවනය ඉදි කිරීමට යෝජිත දොම්පේ භූමිය





දොම්පේ ප්‍රදේශිය සභා සීමාවේ එකතු කරන කසළ වල දිරාපත්වන කාබනික කොටසින් කොම්පෝස්ට් සෑදීම සඳහා කොම්පෝස්ට් අංගනය යෝජිත සනීපාරක්ෂක බිම් පිරවුම ආසන්නයෙන් ඉදිකිරීමට නියමිතය. මෙහි සැලසුම් කටයුතු මේ වන විටත් පිළිසරු ව්‍යාපෘතිය මගින් සිදු කර අවසන්ය. ඉහත යෝජිත කසළ කළමනාකරණ ව්‍යාපෘතියට සභා අනුමැතිය ලබා ගන්නා ලෙසට දොම්පේ ප්‍රාදේශිය සභාවේ සභාපතිගෙන් ඉල්ලීමක් කරන ලද අතර දොම්පේ ප්‍රාදේශිය සභාව වෙත ඉදිරිපත් කරන ලද ගොඩනැගිලි අයදුම් පතට සහ අනෙකුත් ඉදිකිරීම් වලට අදාල සැලසුම් වලට අනුමැතිය ලබාදෙන ලෙසට ද ඉල්ලීමක් කරන ලදි.

නමුත් ව්‍යාපෘතියේ ප්‍රගතිය සැලකියයුතු තරම් ප්‍රමාද වූ අතර එයට ප්‍රධාන හේතුව ප්‍රදේශයේ ජනතාවගෙන් ව්‍යාපෘතියට එරෙහිව පැන නැගුනු මහජන හා දේශපාලන විරෝධයයි. ගම්වැසියන්ගෙන් පිළිසරු ව්‍යාපෘතියේ නිලධාරීන්ට වූ භෞතික හිරිහැර වලට එරෙහිව නීතිමය පියවර ද ගැනිණ.

පිළිසරු ව්‍යාපෘතිය මගින් ඉදිකෙරෙන අනෙකුත් විශාල පරිමාණ කොම්පෝස්ට් අංගන හා සැසඳීමේ දී මෙම කොම්පෝස්ට් අංගනයේ විශේෂත්වය වනුයේ ව්‍යාපෘතියේ උපදේශක හා අනුග්‍රාහකයා යන දෙදෙනාම පිළිසරු ව්‍යාපෘතිය වීමයි. මෙම ව්‍යාපෘතිය සඳහා 10% ක හදිසි වියදම් සමඟ ඉංජිනේරු ඇස්තමේන්තුව රු.16,198,063.75 කි.

ඉදිකිරීම් කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවූ අතර පූර්ව ප්‍රසම්පාදන රැස්වීම් 2010-08-27 වැනි දින පැවැත්විණි. ටෙන්ඩරය විවෘත කරන ලද්දේ 2010-09-06 වන දින වන අතර ඒ සඳහා කොන්ත්‍රාත්කරුවන් 12ක ටෙන්ඩර් පත්‍ර එවන ලදි. ඉදි කිරීම් සඳහා ඉංජිනේරුමය ඇස්තමේන්තුව මිලියන 18කි. ටෙන්ඩර් විශ්ලෙෂණය අවසන් අතර එය පිරිනැමීම තාවකාලිකව නවතා ඇත. එයට හේතුව එම භූමියේම සනීපාරක්ෂක කසළ රඳවනය ඉදිකිරීම් සඳහා වූ බිම් සැකසුම් 2011 ජනවාරි මස සිට ආරම්භ කිරීමයි.

15.8.7 කුරුණෑගල සුන්දරාපොල විශාල පරිමාණ කොම්පෝස්ට් අංගනය

කුරුණෑගල මහ නගර සභාව සහ ප්‍රාදේශිය සභාව සැලකූ කල පසුගිය අවුරුදු කිහිපය තුල සතුටුදායක කසළ කළමනාකරණ ක්‍රමවේදයක් අනුගමනය කර නොමැත. කෙසේ වෙතත් කුරුණෑගල මහනගර සභාව විසින් පාරිසරික සංරක්ෂිත මධ්‍යස්ථාන සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථාන හරහා සිදු කිරීමට සැලසුම් කර ඇත. මේ සඳහා මූල්‍යමය ප්‍රතිපාදන පිළිසරු ව්‍යාපෘතියෙන් ලබා ගැනීමට සැලසුම් කරන ලදි.

නමුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී තුන්වන පාර්ශවයක් සමඟ කටයුතු කිරීමේ දී විය හැකි ප්‍රමාද දෝෂයන් මඟ හරවා ගැනීම සඳහා ඉහත ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සෘජුව පිළිසරු ව්‍යාපෘතිය මඟින් සිදු කිරීමට තීරණය විය.

ව්‍යාපෘති භූමියේ තත්ත්වය

වර්තමානයේ වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුවට අයත් කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවේ පවතින අක්කර 11.3ක් වූ සුන්දරාපොල වනය තුල නීතිමය නොවන ආකාරයට කසළ බැහැරලීම සිදු කරයි. වර්තමානයේ පවතින මෙම සුන්දරාපොල භූමිය පිහිටා ඇත්තේ කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවේ වන අතර කසළ බැහැරලන භූමිය ආසන්න වශයෙන් හෙක්ටයාර 5කි. මෙම භූමියේ පවතින ස්වභාවික බෑවුම නිසා වර්ෂා කාලයේදී මතුපිට ජලය ගලා යෑම සිදු වේ. වර්ෂා කාලයේදී නැත නැත වර්ෂා ජලය රැඳෙනු දක්නට ලැබෙන අතර පසේ ගැඹුරට ගමන් කරන ජලය හේතුවෙන් භූගත ජල මට්ටම ඉහළට පැමිණේ. භූමියේ බොහෝ ප්‍රදේශ ආසන්න වශයෙන් මීටර් 2-3 ඝනකම් කසල තට්ටුවකින් වැසී පවතී. කසළ බැහැරලන භූමියේ දකුණු පසට වන්නට නිවාස 20ක් පමණ පවතින අතර උතුරු, නැගෙනහිර සහ බස්නාහිර පෙදෙස් වනයෙන් වැසී පවතී.





ජනනය වන කසළ වලින් සමහරක් එකතු කරන අතර ඒවායින් සමහරක් සාම්ප්‍රදායික නොවන අංශ මඟින් ප්‍රතිචක්‍රීකරණය කරන අතර ආහාරමය කසළ ප්‍රදේශයේ පවතින ඌරු කොටු වලට ආහාර ලෙස යොදා ගනියි.

කුරුණෑගල මහනගර සභාව මඟින් උක්ත භූමියෙහි කසළ බැහැර කල ද ඉඩමේ අයිතිය ඇත්තේ වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුවටයි. නිරන්තරයෙන් ඇති වන ගිණි ගැනීම් මෙම කසළ විසිරුනු භූමියේ තැනින් තැන දක්නට ලැබේ. කෙසේ වෙතත් කුරුණෑගල මහනගර සභාව විසින් පස් හාරා එම පස් ගෙන කසළ වැසීම සිදු කිරීමට උත්සහයක් ගනියි. වාහන නඩත්තු ස්ථාන වලින් හා මෝටර් රථ අලුත්වැඩියා කරන ස්ථාන වලින් පැමිණෙන කසළ දහනය කිරීම මඟින් එහි ඇති ලෝහ ද්‍රව්‍ය ලබා ගැනීමද මෙම කසළ භූමියේ දක්නට ලැබේ.

කාර්යක්ෂම ලෙස කසළ වෙන් කිරීම සහතික කිරීම සඳහා සම්ප්‍රේෂණ පටි 3ක් මෙම කොම්පෝස්ට් අංගනයට ඇතුලත් වන අතර මීටර් 6ක් පළල අභ්‍යන්තර මාර්ගයක් සහ මීටර් 450ක් දිගැති සහ මීටර් 10ක් පළල ස්වාරක්ෂක කලාපයක් මෙම කොම්පෝස්ට් අංගන සංකීර්ණයට ඇතුලත්ය. ආවරණයක් සහිත අට්ටි ගසන ස්ථාන 2ක් මෙහි ඇති අතර කොම්පෝස්ට් නිෂ්පාදනයේ මූලික සති කිහිපයක් සඳහා අට්ටි ගැසීමට කොටසක් ආවරණයක් රහිත විවෘත අට්ටි ගසන ස්ථානයක් ලෙස මෙම කොම්පෝස්ට් අංගනයට ඇතුලත්ය.

සුන්දරාපොලට මහා පරිමාණ කොම්පෝස්ට් අංගනයක් ඉදි කිරීමට තීරණය කරන ලද්දේ දෛනික කසළ එකතු කිරීම මෙට්‍රික් ටොන් 42ක් සහ එයින් මෙට්‍රික් ටොන් 25ක් කොම්පෝස්ට් කල හැකි ද්‍රව්‍ය වීමයි. මෙම ප්‍රමාණයෙන් මෙට්‍රික් ටොන් 35.6ක් දෛනිකව එකතු කරණු ලැබෙනුයේ කුරුණෑගල මහනගර සභාවෙන් වන අතර ඉතිරි මෙට්‍රික් ටොන් 6.4 කුරුණෑගල ප්‍රාදේශීය සභාව මඟින් එකතු කරනු ලබයි. මෙම කොම්පෝස්ට් අංගනයෙන් ආසන්න වශයෙන් දෛනිකව කොම්පෝස්ට් මෙට්‍රික් ටොන් 8.4 ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත අතර එය මහජනයාට අලෙවි කිරීමට ද එමඟින් අවස්ථාව උදා වේ.

පිළිසරු ව්‍යාපෘතියේ ඉල්ලීම පරිදි වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් උක්ත ඉඩමෙන් අක්කර 12.6ක් වූ ප්‍රමාණය ඉහත ව්‍යාපෘතිය සඳහා 2010-07-21 දින ලබා දෙන ලදි. ඉහත ඉඩමේ මිනුම් කටයුතු මිනින්දෝරු දෙපාර්තුමේන්තුව විසින් සිදු කරන ලදි.

පිළිසරු ව්‍යාපෘතියේ සහාය ඇතිව කුරුණෑගල මහනගර සභාව විසින් සැලසුම් සහ ඇස්තමේන්තු සකසන ලදි. ඇසතමේන්තුගත වියදම රුපියල් මිලියන 50කි. වසර 2011 දි ඉදිකිරීමට අදාලව ටෙන්ඩර් කැඳවීම සිදු කරන ලද අතර සියලු ටෙන්ඩර් පත්‍ර විශ්ලේෂණය සිදු කරන ලදි. ගරු පරිසර අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි මෙම ටෙන්ඩර් අවලංගු කිරීම සිදු කරන ලද අතර එතුමා උපදෙස් ලබා දුන්නේ මෙම සැලසුමට නව අංගයක් ලෙස මළඅපද්‍රව්‍ය පිරිපහදු අංගනයක් ද කොම්පෝස්ට් අංගනයට එකතු කරන ලෙසය.

ඒ අනුව කුරුණෑගල මහනගර සභාව සහ පිළිසරු ව්‍යාපෘතිය විසින් නැවත සැලසුම් කටයුතු සිදු කිරීමට පියවර ගත් අතර ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කරමින් පවතියි.

15.8.8 උතුරු පළාත සඳහා කොම්පෝස්ට් අංගන

පැවති සිවිල් යුද්ධමය වාතාවරණය මත උතුරු පළාත සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පිළිසරු ව්‍යාපෘතියට නොහැකි විය. එනමුත් එම ප්‍රදේශ තුල ක්ෂේත්‍ර වාරිකා අවසන් වූ වහාම පිළිසරු ව්‍යාපෘතිය විසින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් උතුරු පළාත සඳහා ක්‍රියාත්මක කිරීම ඇරඹීය. පිළිසරු

ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් වවුනියාව සහ යාපනය යන ප්‍රදේශ වල ක්ෂේත්‍ර චාරිකා පවත්වා අදාල පළාත් පාලන ආයතන වල නියෝජිතයන් සහ ප්‍රදේශයේ කසළ කළමනාකරණ කටයුතු සඳහා සහභාගි වන නිලධාරීන් සමඟ සාකච්ඡා පවත්වා ව්‍යාපෘති ආරම්භ කිරීමට අදාලව තීරණ කිහිපයකට එළඹින. යාපනය තුල සිදු කළ ක්ෂේත්‍ර චාරිකාවේ දී දැන ගැනීමට හැකි වූයේ යාපනය මහනගර සභාව සතුව අත්හැර දමන ලද කොම්පෝස්ට් අංගනයක් පවතින බවත් සුළු අලුත්වැඩියා කිරීමකින් අනතුරුව නැවත කොම්පෝස්ට් නිෂ්පාදනය ආරම්භ කළ හැකි බවත්ය. ඒ අනුව පිළිසරු ව්‍යාපෘතිය විසින් උපදෙස් ලබා දෙනු ලැබුවේ මූලික පියවර ලෙස අලුත්වැඩියා කටයුතු සඳහා, ප්‍රමාණ පත්‍ර සකසන ලෙස සහ අදාල අනෙකුත් ලිපි ලේඛන පිළිසරු ව්‍යාපෘතිය වෙත යොමු කරන ලෙසය.

ඇස්තමේන්තු සහ ව්‍යාපෘති වාර්තාව පිළිසරු ව්‍යාපෘතිය වෙත ලැබුණු පසු පවතින කොම්පෝස්ට් අංගනයේ අළුත්වැඩියා සඳහා මූල්‍යමය ප්‍රතිපාදන ලබා දුන් අතර එය යාපනය මහනගර සභාව සඳහා මහා පරිමාණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ප්‍රථම වූ මූලික අඩිතාලමයි. ඒ අනුව පිළිසරු ව්‍යාපෘතියේ මූල්‍යමය ප්‍රතිපාදන මඟින් යාපනය මහනගර සභාව විසින් අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදි.









මෙයට අමතරව පිළිසරු ව්‍යාපෘතිය විසින් විශාල පරිමාණ කොම්පෝස්ට් අංගනයක් සඳහා භූමියක් තෝරා ගත් අතර ඉංජිනේරුමය සැලසුම් කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කෙරිණ.

15.9. කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ (KOICA) තාක්ෂණික හා මූල්‍යාධාර මත දොම්පේ මාලිගාවත්ත ප්‍රදේශයේ ඉදිකෙරෙන සනීපාරක්ෂක කසළ රඳවනය

වග ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිතව තිබූ සනීපාරක්ෂක කසළ රඳවනයට එරෙහිව නැගුණු ප්‍රබල මහජන විරෝධය හමුවේ රජය තීරණය කරන ලද්දේ එම ව්‍යාපෘතිය තාවකාලිකව නැවැත්වීමටය. කෙසේ වෙතත් කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය මඟින් ශ්‍රී ලංකාවට ලබා දීමට නියමිතව තිබූ ආධාරය ප්‍රයෝජනයට ගැනීම සඳහා ව්‍යාපෘති ස්ථානය වග පැල්පොල සිට දොම්පේ වෙත වෙනස් කිරීමේ හැකියාව පිළිබඳ සාකච්ඡා කිහිපයක්

ම පැවැත්විණි. පිළිසරු ව්‍යාපෘතිය සහ මධ්‍යම පරිසර අධිකාරිය විසින් දරණ ලද එම උත්සහයේ ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති ස්ථානය දොම්පේ වෙනට වෙනස් කිරීමට KOICA ආයතනය සිය එකඟතාවය එල කලේය.

මෙම සනීපාරක්ෂක කසළ රඳවනය සැලසුම් කරන ලද්දේ දොම්පේ ප්‍රාදේශීය සභා සීමාවේ දිනකට ජනනය වන ටොන් 10ක් වූ කසළ ප්‍රමාණය සඳහා අවසාන බැහැරලීමේ ස්ථානයක් ලෙසය. මෙම සනීපාරක්ෂක කසළ රඳවනයට අමතරව මෙම භූමියේම කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීමට සැලසුම් කරන ලදි. මූලිකව මෙම භූමිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වූ අතර එය දීර්ඝකාලීන බදු පදනම මත වාණිජ වන වගාවක් සඳහා වන සංරක්ෂක දෙපාර්තුමේන්තුවට ලබා දී ඇත. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් මෙම භූමියෙන් අක්කර 68ක් දීර්ඝ කාලීන බදු පදනම මත පිළිසරු ව්‍යාපෘතිය වෙත නිදහස් කිරීමට පියවර ගත් අතර එයින් හෙක්ටයාර 6ක් සනීපාරක්ෂක කසළ රඳවන ඉදිකිරීම සඳහා තෝරා ගන්නා ලදි.

මෙයට සමගාමීව ව්‍යාපෘති භූමියට පිවිසීමට ඇති මාර්ගය ඉතා පටු වූ නිසා වාහන ගමනාගමනය අපහසු බැවින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත ඉල්ලීමක් කරමින් මෙම පිවිසුම් මාර්ගය අඩි 20 ක් දක්වා පළල් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටියේය. ඒ අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් නැවත යෝජිත ව්‍යාපෘති භූමියට ඇති පිවිසුම් මාර්ගය පළල් කිරීම සඳහා මානක සැලැස්ම සංශෝධනය කිරීමට පියවර ගන්නා ලදි.

ශ්‍රී ලංකා රජය සහ කොරියානු ජන රජය විසින් අත්සන් කරන ලද සාකච්ඡා සටහන් (ROD) අනුව පස් කැණීම්, ඉවුරු සකස් කිරීම, භූමිය සමතලා කිරීම සහ සනීපාරක්ෂක කසළ රඳවනය ඉදිකිරීම සඳහා අවශ්‍ය පිවිසුම් මාර්ග සංවර්ධනය, විදුලිය, ජලය ලබා ගැනීම, මළ අපද්‍රව්‍ය පරිවහනය, ජලවහන කාණු පද්ධති, දුරකථන පහසුකම් ආදි අනෙකුත් පහසුකම් ලබා දීම ශ්‍රී ලංකා රජයේ වගකීම වේ.

ශ්‍රී ලංකා රජයේ සම්මත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමින් සනීපාරක්ෂක කසළ රඳවනයේ පස් කැණීම් කටයුතු ඔරියන්ට් ඉදිකිරීම් පුද්ගලික සමාගම වෙත 2010 දෙසැම්බර් 09 දින පවරණ ලදි. පස් කැණීම් කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණේ 2011 සැප්තැම්බර් 15 වේ. මේ සඳහා වූ ප්‍රමාණ පත්‍ර වල එකී කාර්යන් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන් කර ඇත.

I කොටස : පස් හැරීම සහ ව්‍යාපෘති භූමියෙන් ඉවතට ප්‍රවාහනය

II කොටස : සනීපාරක්ෂක කසළ රඳවනය ඉදි කිරීම සඳහා ව්‍යාපෘති භූමිය තුල වූ පාංශු කාර්යයන්

මෙහි පළමුවන කොටසට පස් ඝන මීටර 109,000ක් කපා ඉවත් කිරීම ඇතුලත් අතර දෙවන කොටසට භූමිය එළි පෙහෙලි කිරීම, කපා ඉවත් කරන ලද ගස් කොටන් ඉවත් කිරීම, ආසන්න වශයෙන් ඝන මීටර 50,000 ක් වූ පස් ප්‍රමාණයක් භූමිය තුලම අට්ටි ගැසීම, භූමිය තුල ගොඩගසන ලද පස් වලින් කොටසක් මහින් ඉවුරු සෑදීම, ජල වහන කාණු සැකසීම, තණ පිඩැලි ඇල්ලීම ආදිය ඇතුලත් වේ.

පළාත් සභා ඡන්දය නිසා 2011-01-13 සිට 2011-03-21 කාලය තුල පාංශු කටයුතු තාවකාලිකව නැවැත්වීමට සිදු විය. ඡන්දය අවසන් වූ වහාම ඔරියන්ට් ඉදි කිරීම් පුද්ගලික සමාගම විසින් නැවත පස් හැරීමේ කටයුතු ආරම්භ කරන බව දැන්වූ අතර ඒ අනුව සංශෝධිත කාර්යය සටහන ඉදිරිපත් කෙරිණ.

2011 වසර අවසන් වන විට කොන්ත්‍රාත්කරු විසින් ප්‍රමාණ පත්‍ර වල II කොටසෙහි පාංශු කටයුතු පිළිබඳ 80% ක ප්‍රගතියක් පෙන්වන ලද නමුදු I කොටසෙහි පාංශු කටයුතු ආරම්භ කර තිබුන ද ට්‍රිපර් රථ කිහිපයක පස් පමණක් ප්‍රධාන වශයෙන් පරීක්ෂණ කටයුතු සඳහා ව්‍යාපෘති භූමියෙන් බැහැරට ප්‍රවාහනය කර තිබුණි.

කොන්ත්‍රාත්කරු සහ මධ්‍යම පරිසර අධිකාරිය අතර ඇතිකර ගත් ගිවිසුමට අනුවම ව්‍යාපෘති භූමියෙන පිටතට ප්‍රවාහනය කරන පස් ඝණ මීටරයක් සඳහා කොන්ත්‍රාත්කරු විසින් මධ්‍යම පරිසර අධිකාරියට රු. 45 ක් ගෙවිය යුතු අතර පිටතට ප්‍රවාහනය කරන මුළු පස් ප්‍රමාණය සඳහා රුපියල් මිලියන 4.9 ක් ගෙවිය යුතු නමුත් එම පස් වෙනත් කිසිදු කටයුත්තක් සඳහා සුදුසු නොවන බැවින් ප්‍රමාණ පත්‍ර වල I කොටසෙහ සඳහන් ඉහත ක්‍රියාවලිය පෙර ගිවිස ගත් පරිදි සිදු කල නොහැකි බව කොන්ත්‍රාත්කරු විසින් දන්වන ලදි.

ඉහත තත්ත්වය මත මධ්‍යම පරිසර අධිකාරිය විසින් එම පස් සාම්පල ජාතික ගොඩනැගිලි පරියේෂණ ආයතනය මගින් පරීක්ෂාවට ලක් කරන ලදි.

පර්යේෂණ වාර්තා සැසඳීමේදී ඉදිකිරීමේ, පුහුණු සහ සංවර්ධන ආයතනයේ (ICTAD) උපාය මාර්ග වලට අනුව මෙම පස් සාමාන්‍ය පිරවුම් කටයුතු, ප්‍රතිසංස්කරණ කටයුතු සහ ඉවුරු සැකසීම සඳහා යොදා ගත හැකි විය. එයට හේතුව මෙම පස් ඉහත ICTAD උපාය මාර්ග වලට අනුව වර්ගය 1 සහ 2 යන කොටස් දෙකට අයත් වීමයි. මෙයට අමතරව මෙම පස් විශාල පීඩනයකට ලක් කිරීම තුළින් මාර්ග වල උප ස්ථරය සඳහා ඒවායේ වැඩිදියුණු කිරීම් කටයුතු වලට යොදා ගත හැකි විය.

ඒ අනුව මෙම පස් අධිවේගි මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සඳහා අලෙවි කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියේ නිර්දේශය ලබා ගැනීමට උත්සාහ කල ද මාර්ග සංවර්ධන අධිකාරිය සහ අධිවේගි මාර්ගයේ ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන් විසින් මෙම පස් ඉහත කාර්යය සඳහා යොදා ගැනීම ප්‍රතික්ෂේප කරන ලදි.

පරිසර අමාත්‍යතුමා විසින් "දොම්පේ මාලිගාවත්ත යෝජිත සනීපාරක්ෂක කසළ රඳවනයේ පස් හැරීම සහ හාරන ලද පස් ඉවත් කිරීම වෙනුවෙන් ඔරියන්ට් ඉදිකිරීම් පුද්ගලික සමාගම වෙත ගෙවීම" යන මැයෙන් 2011-11-22 දින අංක 11/2207/527/027 යන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව පහත අනුමැතින් සඳහා ඉදිරිපත් කරනලදි.

i) ව්‍යාපෘතියේ පස් කපා ගොඩගැසීම සඳහා පස් ඝන මීටරයකට රු. 295/- බැගින් පස් ඝන මීටර් 109,000 ක් කපා ගොඩගැසීම සඳහා ඔරියන්ට් ඉදිකිරීම් පෞද්ගලික සමාගමට මුළු මුදල රු. 32,155,000.00 ක් ගෙවීම.

ii) කපන ලද පස් ඝණ මීටර 109,000ක් භූමිය පිරිසිදු කිරීමෙන් පසු ගොඩ ගැසීම සඳහා ව්‍යාපෘති භූමියට යාබදව අක්කර 3 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් සහ වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුවෙන් ලබා ගැනීම.

iii) ඉහත (ii) හි සඳහන් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට නොහැකි නම් ඔරියන්ට් ඉදිකිරීම් පෞද්ගලික සමාගමට, අදාල පස් ව්‍යාපෘති භූමියෙන් පිටතට ප්‍රවාහනය සඳහා පස් ඝන මීටරයට රු. 50 බැගින් ගෙවීම.

iv) පස් හැරීමට, ප්‍රවාහනයට සහ ගොඩගැසීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම සඳහා පළිසරු ව්‍යාපෘතිය යටතේ වූ කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතන (KOICA) ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්මට වෙන්කර ඇති ප්‍රතිපාදන උපයෝගී කර ගැනීම.

ඉහත (ii) සහ (iv) ට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණ. ඉහත (i) සඳහා එම ගැටළුව පරිසර අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කිරීමට තීරණය කරන ලද අතර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ අනුව ක්‍රියා කිරීමට තීරණය විය. ඒ අනුව අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව 2011 දෙසැම්බර් 21 දින පැවැත් වූ අතර එහිදී නාක්ෂණික කමිටුවේ නිර්දේශ පදනම් කරගෙන අනුමැතිය ලබා දෙන ලදි.

ඔරියන්ට් ඉදිකිරීම් පුද්ගලික සමාගම විසින් ඔවුන් නැවත ඉදිකිරීම් කටයුතු 2011 දෙසැම්බර් 30 දින ආරම්භ කළ බව දැන්විය. ඒ අනුව ඉහත ඉදිකිරීම් සමාගම විසින් නියමිත කාලයට ව්‍යාපෘති කටයුතු නිම කිරීම සඳහා සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කරන ලදි.





කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ මැනුම් කටයුතු සිදු කරන කණ්ඩායම එනම් මෙම කණ්ඩායමට සූඩොක්වාන් කසළ රඳවන භූමි කළමනාකරණ ආයතනයේ (Sudokwon Landfill sit Management Corp) සහ ව්‍යාපෘති කොන්ත්‍රාත්කරුගේ සිවිල් ඉංජිනේරු ඇතුලත් වූ අතර ඔවුන් ශ්‍රී ලංකාවට පැමිණ ව්‍යාපෘති භූමිය සකස් කිරීමේ තත්ත්වය අධීක්ෂණය සහ ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කිරීම අධීක්ෂණය මෙන්ම පරිසර අමාත්‍යාංශයේ ලේකම් සමඟ සාකච්ඡාවක් පැවැත්වීම සිදු කරන ලදි.

කොරියානු විශේෂඥයන් ව්‍යාපෘති භූමිය නිරීක්ෂණය කිරීම.





මෙයට අමතරව මුදල් සහ සැලසුම් අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් විසින් 2011 දෙසැම්බර් 19 දින ව්‍යාපෘති භූමියෙහි ක්ෂේත්‍ර චාරිකාවක යෙදෙමින් එහි ප්‍රගතිය අධීක්ෂණය කළහ.

කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය - පිළිසරු ව්‍යාපෘතිය අතර ක්‍රියාකාරී සැලැස්ම අනුව කොම්පෝස්ට් පහසුකම් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව පැවැත්වුන අතර ඒ සඳහා කොම්පෝස්ට් ව්‍යාපෘති සඳහා සෘජුව දායකත්වය සපයන විවිධ ව රාජ්‍ය ආයතන වල නිලධාරීන් 15 දෙනෙකු තෝරා ගැනිණ.

ඒ අනුව 2011 අප්‍රේල් 10 සිට 23 දක්වා වූ දෙසතියක කාලය තුල කොරියාවේ සියොල් හිදි කොම්පෝස්ට් පහසුකම් කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම මෙන්ම පුහුණු වැඩමුළුවක් පැවැත්විණි. ඒ සඳහා පහත නිලධාරීන් සහභාගි විය.

	නම	තනතුර	ආයතනය
1	රමණී ඇල්ලේපොල මහත්මිය	අධ්‍යක්ෂ ජනරාල්	මධ්‍යම පරිසර අධිකාරිය
2	කෝලිත නිමාල් මුතුකුඩආරච්චි මහතා	නි. අධ්‍යක්ෂ ජනරාල් පාරිසරික දූෂණ පාලන අංශය	මධ්‍යම පරිසර අධිකාරිය
3	හෙට්ටිආරච්චිගේ පත්මා සරෝජනී ජයසේකර මහත්මිය	වැ.ඛ.අ. අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය	මධ්‍යම පරිසර අධිකාරිය
4	මොහොමඩ් අබ්දුල් කුඩෝස් නජීබ් මහතා	නි. අධ්‍යක්ෂ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය	මධ්‍යම පරිසර අධිකාරිය
5	විජිතා සත්‍යකුමාර් මහත්මිය	සහකාර අධ්‍යක්ෂ උතුරු පළාත් කාර්යාලය	මධ්‍යම පරිසර අධිකාරිය
6	රංජිත් මහේෂ් ජල්තොට මහතා	සහකාර අධ්‍යක්ෂ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය	මධ්‍යම පරිසර අධිකාරිය
7	දොලපිල මුදලිගේ සමන් කුමාර ආරියවංශ මහතා	ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරී සබරගමුව පළාත් කාර්යාලය	මධ්‍යම පරිසර අධිකාරිය
8	දලදාගේ නිහාල් ද සිල්වා මහතා	ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරී උඟව පළාත් කාර්යාලය	මධ්‍යම පරිසර අධිකාරිය
9	ලොකුලියනගේ මංගලිකා මහත්මිය	අධ්‍යකෂ ජාතික ඝණ අපද්‍රව්‍ය සහායක මධ්‍යස්ථානය	පළාත් පාලන හා පළාත් සභා අධ්‍යනාංශය
10	දිසානායක මුදියන්සලාගේ ජයන්ති මහත්මිය	පාරිසරික කළමනාකාර නිලධාරී ප්‍රතිපත්ති හා සැලසුම්	පරිසර අමාත්‍යාංශය
11	මුදියන්සලාගේ චතුර සුදත් කුමාර මල්වාන මහතා	නි. අධ්‍යක්ෂ පිළිසරු ව්‍යාපෘතිය	මධ්‍යම පරිසර අධිකාරිය
12	චිත්‍රසේන අලුත්ගමගේ	ව්‍යාපෘති නිලධාරී පිළිසරු ව්‍යාපෘතිය	මධ්‍යම පරිසර අධිකාරිය
13	ගුත්ගමුව යද්දෙහි අප්පුහාමිලාගේ නිල්මිණි මෙනවිය	ව්‍යාපෘති ඉංජිනේරු පිළිසරු ව්‍යාපෘතිය	මධ්‍යම පරිසර අධිකාරිය
14	රන්දෙනිය පිදුමවත්තගේ ජනක රන්දෙනි මහතා	ව්‍යාපෘති සහකාර පිළිසරු ව්‍යාපෘතිය	මධ්‍යම පරිසර අධිකාරිය
15	සුනෙත්‍රා වැලිකල මහත්මිය	ප්‍රමාණ සමීක්ෂක පිළිසරු ව්‍යාපෘතිය	මධ්‍යම පරිසර අධිකාරිය

මෙයට අමතරව තවත් පුහුණු වැඩමුළුවක් එනම්, කසළ පහසුකම් කළමනාකරණය පිළිබඳව පැවැත් වූ අතර එයට ප්‍රතිපත්ති සැකසුම් නිලධාරීන් ඇතුළු 14 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සහභාගි විය. මෙම වැඩමුළුව 2011 ජුනි 06 සිට 2011 ජුනි 18 දක්වා දෙසතියක් කොරියාවේ දී පැවැත්වුනු අතර එහි දී කසළ පහසුකම් කළමනාකරණය මෙරට සනීපාරක්ෂක කසළ රැඳවුම් පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙන ලදි. ඒ සඳහා පහත නිලධාරීන් සහභාගි විය.

	නම	තනතුර	ආයතනය
1	ආර්.ඒ.ආර්.ආර්. රූපසිංහ මහතා	අතිරේක ලේකම්	පරිසර අමාත්‍යාංශය
2	ජේ.එම්.යූ. ඉන්ද්‍රරත්න මහතා	නි. අධ්‍යක්ෂ ජනරාල්	මධ්‍යම පරිසර අධිකාරිය
3	එම්.ජේ.ජේ. ප්‍රනාන්දු මහතා	ව්‍යාපෘති අධ්‍යක්ෂ පිළිසරු ව්‍යාපෘතිය	මධ්‍යම පරිසර අධිකාරිය
4	එන්.එස්. ගමගේ මහතා	අධ්‍යක්ෂ බස්නාහිර පළාත් කාර්යාලය	මධ්‍යම පරිසර අධිකාරිය
5	ඩබ්.ජී. කුමාරගමගේ මහත්මිය	ප්‍රාදේශීය ලේකම් පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය
6	මනූජා විමලරත්න මහත්මිය	නි. අධ්‍යක්ෂ (නීති) පිළිසරු ව්‍යාපෘතිය	මධ්‍යම පරිසර අධිකාරිය
7	එස්.පී. පෙරියප්පෙරුම මහත්මිය	නි. අධ්‍යක්ෂ පරිසර කළමනාකරණ හා ඇගයීම්	මධ්‍යම පරිසර අධිකාරිය
8	ප්‍රේමරත්න දිසානායක මහතා	නි. අධ්‍යක්ෂ පාරිසරික අධ්‍යාපන හා දැනුවත් කිරීම්	මධ්‍යම පරිසර අධිකාරිය
9	දුලාර ගුණතිලක මහතා	නි. කළමනාකරු	මධ්‍යම පරිසර අධිකාරිය
10	සුනිල් උඩුකල මහතා	සහකාර අධ්‍යක්ෂ	පරිසර අමාත්‍යාංශය
11	ඒ.එස්. ලියනගේ මහතා	ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරී මධ්‍යම පළාත් කාර්යාලය	මධ්‍යම පරිසර අධිකාරිය
12	ඩිල්ෂාන් සෙන්දප්පෙරුම මහතා	ව්‍යාපෘති සහකාර පිළිසරු ව්‍යාපෘතිය	මධ්‍යම පරිසර අධිකාරිය
13	ලංකා වීරසිංහ මෙනවිය	ව්‍යාපෘති සහකාර පිළිසරු ව්‍යාපෘතිය	මධ්‍යම පරිසර අධිකාරිය
14	ඉශානි මුණසිංහ මෙනවිය	සැලසුම් ශිල්පි පිළිසරු ව්‍යාපෘතිය	මධ්‍යම පරිසර අධිකාරිය

කොරියාවේ දෙසතියක පුහුණු සංචාරයක නියලුනු නිලධාරීන්





15.10. සනීපාරක්ෂක කසළ රඳවන ඉදි කිරීම් සඳහා වූ ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල (Economic Development Corporation Funds EDCF)

වර්තමානයේ රට තුල පවතින මූල්‍යමය අර්බුදය හමුවේ පිළිසරු ක්‍රියාකාරී සැලැස්ම විසින් හඳුනාගත් සමහරක් ක්‍රියාකාරකම් සිදු කිරීමේ අපහසුතාවයක් ඇති විය. විශේෂයෙන් ම විශාල පරිමාණ ව්‍යාපෘති යටතේ වූ සනීපාරක්ෂක කසළ රඳවන ඉදි කිරීම ඉන් එකකි. මෙවැනි ව්‍යාපෘති සඳහා කොරියානු ජනරජය විසින් ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල මගින් ණය පහසුකම් ලබා දීම සිදු කෙරේ. ඒ අනුව පිළිසරු ව්‍යාපෘතිය විසින් කොරියානු ජනරජයේ අපනයන - ආනයන බැංකුවේ (Eximbank) ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදලෙන් ණය මුදලක් ලබා ගැනීමට ඉල්ලීමක් කරන ලදි. පානදුර (මාලමුල්ල), අනුරාධපුරය, හික්කඩුව සහ මහනුවර යන ප්‍රදේශ වල සනීපාරක්ෂක කසළ රඳවන ඉදිකිරීම සඳහා මෙම ආර්ථික සංවර්ධන අරමුදලෙන් ණයක් ලබා ගැනීම වෙනුවෙන් ව්‍යාපෘති සැකසීමේ සහායක වාර්තාව (Project Preparation Assistence - PPA) සහ ව්‍යාපෘති වාර්තාව ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ඉදිරිපත කරන ලදි.

කොරියානු අපනයන - ආනයන බැංකුවේ සැලසුම් ආයතනය වන කුන්වා උපදේශක සහ ඉංජිනේරුමය ආයතනයේ විශේෂඥයන් කිහිප වාරයක් ශ්‍රී ලංකාවේ සංචාරය කළ අතර මධ්‍යම පරිසර අධිකාරිය සහ මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා පවත්වා අවසානයේ 2010 අප්‍රේල් මාසයේ දී ඉහත ව්‍යාපෘතිය සඳහා වූ ශක්‍යතා අධ්‍යයන වාර්තාව ඉදිරිපත් කරන ලදි.

කොරියානු අපනයන - ආනයන බැංකුවේ ඉල්ලීම පරිදි පානදුර, හික්කඩුව, අනුරාධපුරය සහ ගෝනාධිකවත්ත සඳහා වූ යෝජිත ව්‍යාපෘති සඳහා පාරිසරික ඇගයීම් වාර්තාව සකස් කර කොරියානු අපනයන - ආනයන බැංකුව වෙත ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කරන ලදි. කෙසේ වෙතත් මහනුවර ගෝනාධිකවත්තේ ඉදි කිරීමට යෝජිත ව්‍යාපෘතිය සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව මෙතෙක් සකස් වෙමින් පවති.

මෙයට සමගාමීව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් එවන ලද ණය ලබා ගැනීම සඳහා කෙටුම්පත් කරන ලද ගිවිසුම සකස් කර අත්සන් කිරීමට ප්‍රථම ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අදහස් හා යෝජනා ඉදිරිපත් කරන ලදි.

උපදේශක සේවා සඳහා සහ සිවිල් කටයුතු සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම 2011-09-20 දින කොරියානු අපනයන - ආනයන බැංකුව වෙත ඉදිරිපත් කරන ලද අතර එම බැංකුව විසින් එවන ලද සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම, කෙටුම්පත් කරන ලද ව්‍යාපෘති වාර්තාව සඳහා වූ ඉල්ලීම (RFP) සහ කාර්යය නිර්ණය (TOR) නැවත පිළිසරු ව්‍යාපෘතිය විසින් කොරියානු බැංකුව වෙත 2011- 09- 26 දින ඉදිරිපත් කරන ලදි.

පිළිසරු ව්‍යාපෘතිය විසින් සංශෝධිත සැලසුම, ව්‍යාපෘති වාර්තා ඉල්ලුම්පත වාර්තාව සහ කාර්යය නිර්ණය නැවත 2011-09-30 වන දින බැංකුව වෙත ඉදිරිපත් කරන ලදි.

15.11 .පළාත් පාලන ආයතන සඳහා කුඩා සහ මධ්‍ය පරිමාණ කොම්පෝස්ට් අංගන ඉදි කිරීම.

කුඩා හා මධ්‍ය පරිමාණ කොම්පෝස්ට් අංගන සහ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන ඉදි කිරීමේ ව්‍යාපෘති සඳහා තාක්ෂණික හා මූල්‍යාධාර ලබා දීම වෙනුවෙන් පිළිසරු ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘති වාර්තාව කැඳවීම සිදු කරන ලදි. පිළිසරු ව්‍යාපෘතිය විසින් විශාල පරිමාණ කොම්පෝස්ට් අංගන සහ සනීපාරක්ෂක කසළ රඳවන ඉදි කෙරෙන අතරතුර මෙවැනි කුඩා පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පිළිසරු ව්‍යාපෘතිය විසින් මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මෙන්ම ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ව්‍යූහයෙන් ද අනුමැතිය ලබා ගැනිණ. රාජ්‍ය ආයතන එනම් අධ්‍යාපන ආයතන සහ හමුදා කඳවුරු සඳහා ද කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍යාධාර ලබා දීම වෙනුවෙන් මධ්‍යම පරිසර අධිකාරියේ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදි.

බස්නාහිර පළාත තුල වූ පළාත් පාලන ආයතන වලින් ව්‍යාපෘති වාර්තා කැඳවීමේ දී එය බස්නාහිර පළාත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ අනුමැතිය ඇතිව ඉදිරිපත් කළ යුතු අතර පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ යටතේ වූ ජාතක ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය ද, කුලියාපිටිය නගර සභාව, නාවලපිටිය නගර සභාව, මාතර මහ නගර සභාව, බදුල්ල මහ නගර සභාව, තංගල්ල නගර සභාව සහ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව යන පළාත් පාලන ආයතන වල පාරිසරික සංරක්ෂණ මධ්‍යස්ථාන ඉදි කිරීම වෙනුවෙන් ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කෙරිණ.

පිළිසරු ව්‍යාපෘතියෙන් තාක්ෂණික හා මූල්‍යාධාර ලබා ගැනීමට උනන්දුවක් දක්වන පළාත් පාලන ආයතන වලට ව්‍යාපෘති වාර්තා ලබා දෙන ලෙස දිවයිනේ සියළු පළාත් පාලන ආයතන වලට දන්වන ලදි. මූල්‍යාධාර ලබා දීමට ප්‍රථම ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ ජාතික ව්‍යූහය මගින් පත් කරන ලද තාක්ෂණික මණ්ඩලයක් මගින් පළාත් පාලන ආයතන මගින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා ඇගයීමකට ලක් කරනු ලැබේ. පිළිසරු ව්‍යාපෘතිය මගින් මූල්‍යාධාර ලබා දීම සඳහා එක් එක් ව්‍යාපෘති වාර්තා ඇගයීමේ දී පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කරනු ලැබේ.

- පළාත් පාලන ආයතන වලින් නාගරික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයට අදාලව ව්‍යාපෘති වාර්තා කැඳවීම.
- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යූහය මගින් පත් කර ඇති තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් එක් එක් ව්‍යාපෘති වාර්තා ඇගයීමකට ලක් කිරීම.

- පිළිසරු ව්‍යාපෘතියේ නිලධාරීන් / තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයන් සහ අදාල පළාත් පාලන ආයතනයේ නියෝජිතයන් සමඟ ක්ෂේත්‍ර අධ්‍යයනයක නිරත වීම.
- ක්ෂේත්‍ර අධ්‍යනයේ දී ලද නිරීක්ෂණ සහ පිළිසරු ව්‍යාපෘතියේ සම්මන්ත්‍රණයන්ට අනුකූලව අවශ්‍ය නම් ව්‍යාපෘති වාර්තා සංශෝධන වලට ලක් කිරීම.
- අදාල පළාතේ පළාත් පාලන කොමසාරිස් සහ දිස්ත්‍රික් ඉංජිනේරු තැනගේ නිර්දේශය සහිතව සංශොධිත ව්‍යාපෘති වාර්තාව අදාල පළාත් පාලන ආයතනය විසින් නැවත පිළිසරු ව්‍යාපෘතියට භාර දීම.
- අධික්ෂණය සහ අනුමැතිය සඳහා ව්‍යාපෘති වාර්තාව තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම.
- ඍණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති සඳහා මූලාධාර ලබා දීමට ප්‍රථම අදාල තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර අවශ්‍ය කරන අනුමැතිය ලබා ගැනීම.
- පිළිසරු ව්‍යාපෘතිය / මධ්‍යම පරිසර අධිකාරිය අදාල පළාත් පාලන ආයතනය සමඟ ගිවිසුමකට එළඹීම.
- පළාත් පාලන ආයතන සඳහා යෝජිත මුදලෙන් 20%ක් මූලික අත්තිකාරම් ලෙස ලබා දීම සිදු කෙරේ. සාමාන්‍යයෙන් චෙක්පත ලබා දීම සිදු කෙරෙනුයේ ගරු පරිසර අමාත්‍ය තුමා විසින් හෝ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති තුමා විසින් අදාළ පළාත් පාලන ආයතනයේ සභාපති තුමා වෙතය. මෙවැනි අවස්ථාවක බොහෝ විට මාධ්‍ය ආවරණය ලබා දීම සඳහා මාධ්‍ය වෙත පණිවිඩයක් නිකුත් කිරීම ද සිදු කෙරේ.
- ගිවිසුම් පත්‍රයෙහි සඳහන් ආකාරයට ව්‍යාපෘතියේ ඉදි කිරීම් හා ක්‍රියාත්මක කිරීම් අධික්ෂණය සඳහා අධික්ෂණ හා විශ්ලේෂක කමිටුවක් පළාත් පාලන ආයතන තුල පිහිටු වීම සිදු කෙරේ.
- ඉදි කිරීම් කටයුතු සඳහා වූ කොටස් ගෙවීම් ලදු පත් ලැබීමෙන් අනතුරුව සලකා බලනු ලැබේ. මෙම ලදු පත් ඉදිරිපත් කළ යුත්තේ අදාළ පළාත් පාලන ආයතන විසින් පළාත් පාලන කොමසාරිස්, දිස්ත්‍රික් ඉංජිනේරුගේ අනුමැතිය සහ නිර්දේශය සහිතව අධික්ෂණ සහ විශ්ලේෂක කමිටුව විසින් අත්සන් කරන ලද වාර්තාව සමඟය.

- ලදු පත් සඳහා ගෙවීම් සිදු කරනු ලබනුයේ ඉදිකිරීම් කටයුතු වල ප්‍රගතිය අධික්ෂණය කිරීම සඳහා සිදු ක්ෂේත අධ්‍යනයෙන් පසුවය. මෙම ක්ෂේත්‍ර චාරිකාව සඳහා පිළිසරු ව්‍යාපෘතියේ ව්‍යාපෘති නිලධාරී / ව්‍යාපෘති සහකාර සහ ඉංජිනේරු සහ / හෝ ප්‍රමාණ පත්‍ර විශ්ලේෂකගෙන් සමන්විත කණ්ඩායමක් සහභාගි වන අතර සෑම ක්ෂේත්‍ර අධ්‍යනයක් අවසානයේදී ම ක්ෂේත්‍ර පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.
- අදාල පළාත් පාලන ආයතනය, පළාත් පාලන කොමසාරිස්, දිස්ත්‍රික් ඉංජිනේරු, අධික්ෂණ හා විශ්ලේෂණ කමිටුව සහ පිළිසරු ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉදිකිරීම් කටයුතු වල ප්‍රගතිය පිළිබඳ සිදු කරනු ලබන නිර්දේශය අනුව මූල්‍යමය ප්‍රතිපාදන නිදහස් කිරීම සිදු කරනු ලබයි.
- පළාත් පාලන ආයතනය මහින් පත් කරන ලද නිරන්තර අධික්ෂණය මහින් ව්‍යාපෘතියේ තිරසාර බව තහවුරු කරනු ලබයි.

පිළිසරු ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඍණ අපද්‍රව්‍ය ව්‍යාපෘති කාලානුරූපව ක්ෂේත්‍ර අධ්‍යන තුලින් මෙහෙයුම්

කටයුතු සහ ක්‍රියාකාරී අවදිය අධීක්ෂණය කළ යුතුය.

අනෙකුත් රාජ්‍ය ආයතන එනම්, ආරක්ෂක කඳවුරු, අධ්‍යාපන ආයතන ආදී ස්ථාන වල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ස්ථාපිත කිරීමේ දී ද ඉහත ක්‍රමවේදය අනුගමනය කරනු ලබයි.

ව්‍යාපෘති සඳහා තාක්ෂණික උප කමිටුවේ නිර්දේශ ලැබුණු වහාම මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීමට ප්‍රථම මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සිදු කෙරේ. ප්‍රමාණ පත්‍ර වල නිවැරදිභාවය තහවුරු කර ගැනීම සඳහා සහ යටිතල පහසුකම් ඉදිකිරීමේ දී එනම් කොම්පෝස්ට් අංගනය, කොන්ක්‍රීට් ආස්තරය, පිවිසුම් මාර්ග, වැසිකිළි, කාර්යාල, ගබඩා කාමර, වැට, විදුලි සැපයීම, ළිං, ජල නල එලීම ආදිය සඳහා වූ සිදු කරනු ලබන මුදල් හුවමාරු වල විනිවිදභාවය ආරක්ෂා කිරීම සඳහා පළාත් පාලන ආයතන විසින් ප්‍රමාණ පත්‍ර සඳහා දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගේ අනුමැතිය ලබාගෙන පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයාගේ නිර්දේශය සහිතව ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

මූල්‍යමය ප්‍රතිපාදන නිදහස් කිරීමට ප්‍රථම අදාල පළාත් පාලන ආයතනයෙ සභාපති තුමා සහ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති තුමා අතර ගිවිසුම් අත්සන් කිරීම සිදු කෙරේ. ව්‍යාපෘතිය ආරම්භයේ දී අත්තිකාරම් ලෙස මුළු ව්‍යාපෘති වියදමෙන් 20% ක මුදලක් නිදහස් කරනු ලැබේ.

ව්‍යාපෘතියේ ප්‍රගතිය සහ ඉදිකිරීම් කටයුතුවල තත්ත්වය අධීක්ෂණය කිරීම සඳහා අධීක්ෂණ හා විශ්ලේෂක කමිටුවක් පිහිටු වීමට සෑම පළාත් පාලන ආයතනයකට ම උපදෙස් දෙනු ලැබේ. ඒ සමඟ ම මෙම කමිටුව විසින් ඉදිකිරීම් සඳහා වූ ලඳුපත් සඳහා නැවත මුදල් ලබා ගැනීමට / මුදල් පියවීම් කටයුතු සඳහා අවශ්‍ය වාර්තා ඉදිරිපත් කිරීම සිදු කෙරේ. ලඳුපත් සඳහා මුදල් ලබා ගැනීමේ දී අදාල ලඳු පත් ඉදිරිපත් කළ යුත්තේ දිස්ත්‍රික් ඉංජිනේරු තැනගේ සහතිකය සහ පළාත් පාලන කොමසාරිස්වරයාගේ නිර්දේශය සහිතව අධීක්ෂණ සහ විශ්ලේෂණ කමිටුවේ නිර්දේශිත වාර්තාව සමඟය.

සෘජු අධීක්ෂණයට අමතරව ඉදිකිරීම් හා මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය කරන මාර්ගෝපදේශ ලබා දීමට මෙන් ම ඉදිකිරීම් කටයුතු සිදු කරන ආකාරය අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය අවස්ථා වලදී අධීක්ෂණ හා විශ්ලේෂණ කමිටු රැස්වීම් සඳහා පිළිසරු ව්‍යාපෘතියේ නිලධාරීන් ද සහභාගි වේ. ඉදිකිරීම් කටයුතු වලට අදාලව ලඳු පත් සඳහා මුදල් ලබා දීමට ප්‍රථම පිළිසරු ව්‍යාපෘතියේ නිලධාරීන් විසින සාමාන්‍යයෙන් ක්ෂේත්‍ර අධ්‍යනයක් සිදු කරනු ලැබේ.

2011වසරේ දී කුඩා හා මධ්‍ය පරිමාණ කොම්පෝස්ට් අංගන ඉදිකිරීම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දුන් පළාත් පාලන ආයතන

අංකය	පළාත් පාලන ආයතන	අනුමත මුදල (රු)	නිදහස් කරන ලද මුළු මුදල (රු)
1	අම්බලන්තොට ප්‍රාදේශීය සභාව	1,266,743.34	253,348.67
2	යාපනය මහනගර සභාව	1,272,094.50	869,589.05
3	මාවනගම ප්‍රාදේශීය සභාව	6,070,157.65	1,214,031.53
4	රිදීගම ප්‍රාදේශීය සභාව	4,034,531.09	806,906.22

අංකය	පළාත් පාලන ආයතන	අනුමත මුදල (රු)	නිදහස් කරන ලද මුළු මුදල (රු)
5	මහව ප්‍රාදේශීය සභාව	3,871,132.56	774,226.51
6	නිකවැරටිය ප්‍රාදේශීය සභාව	2,465,256.48	493,051.30
7	තනමල්විල ප්‍රාදේශීය සභාව	1,801,506.27	360,301.25
8	තනමල්විල ප්‍රාදේශීය සභාව / සෙවනගල	2,595,822.19	519,164.44
9	අඹගමුව ප්‍රාදේශීය සභාව	5,148,264.30	1,029,652.86
10	ආනමඩුව ප්‍රාදේශීය සභාව	1,949,120.00	389,824.00
11	නිවිතිගල ප්‍රාදේශීය සභාව (කසළ එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන)	2,776,609.87	555,321.97
12	කුරුවිට ප්‍රාදේශීය සභාව (කසළ එකතු කිරීමේ මධ්‍යස්ථාන)	2,932,546.92	586,509.38
13		1,847,395.35	369,479.07
14	ගලෙන්බිඳුනු වැව ප්‍රාදේශීය සභාව	6,403,314.89	1,280,662.97
15	ගල්නෑව ප්‍රාදේශීය සභාව	5,295,245.90	1,059,049.18
16	ඉපලෝගම ප්‍රාදේශීය සභාව	6,042,336.98	1,208,467.40
17	කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව	6,497,638.42	1,299,527.68
18	මැදවච්චිය ප්‍රාදේශීය සභාව	6,497,638.42	1,299,527.68
19	රාජාංගනය ප්‍රාදේශීය සභාව	5,295,245.90	1,059,049.18
20	රඹෑව ප්‍රාදේශීය සභාව	6,497,638.42	1,299,527.68
21	තිරිප්පනේ ප්‍රාදේශීය සභාව	5,572,025.61	1,114,405.12
22	අලවිව ප්‍රාදේශීය සභාව	5,366,118.38	1,073,223.68
23	චාවකච්චේරිය නගර සභාව	5,606,917.18	1,121,383.44
24	හම්බන්තොට ප්‍රාදේශීය සභාව	512,638.94	102,527.79
25	ජා ඇල නගර සභාව	1,707,865.30	341,573.06
26	කාන්තන්කුඩි නගර සභාව	8,708,282.50	1,669,226.50
27	මාලිම්බඩ ප්‍රාදේශීය සභාව	1,129,457.90	225,891.58
28	මාතර ප්‍රාදේශීය සභාව	1,000,000.00	200,000.00
29	පොල්පිතිගම ප්‍රාදේශීය සභාව	3,981,693.02	796,338.60
30	රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව	1,043,984.58	208,796.92
31	වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව	3,875,896.63	775,179.33
32	වීරකැටිය ප්‍රාදේශීය සභාව	444,269.61	88,853.92
	මුළු මුදල	**119,509,389.10**	**24,444,617.96**

15.11.1 අම්බලන්තොට ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය






කොම්පෝස්ට් අංගනය සහ වැට *කාර්යාලය* *ආරක්ෂක කුටිය* *වෙළඳසැල*

අම්බලන්තොට ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේය. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු වර්ගඵලය 255km^2 වේ. මුළු ජනගහනය 16,500 කට අධික අතර එයින් 80% ක ගොවිතැන් කරන පිරිස වේ.

නාගරික ඝන අපද්‍රව්‍ය ටොන් 40 කට අධික ප්‍රමාණයක් දෛනිකව ප්‍රාදේශීය සභා සීමාවෙන් එකතු කරන අතර මෙම කසළ අතර ආහාරමය අපද්‍රව්‍ය, කෙසෙල් ගස් වල කොටස් සහ නොදිරන කසළ ඇතුලත් වේ. ප්‍රදේශයේ පවතින වෙළඳ මධ්‍යස්ථාන 4කින් ද කසළ එකතු කිරීම සිදු කරනු ලබයි.

කසළ කළමනාකරණය සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අක්කර 10ක භූමි ප්‍රමාණයක් අදාළ පළාත් පාලන ආයතනය වෙත ලබා දෙන ලදි. පිළිසරු ව්‍යාපෘතිය විසින් උහපිටගොඩ ප්‍රදේශයේ කසළ කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදි කිරීම ආරම්භ කරන ලද අතර ඒ සඳහා අනුමත මුළු මුදල රු. 1,266,743.34 කි. මේ වන විට මෙම කොම්පෝස්ට් අංගනය තුළ ටොන් 4ක වූ දෛනික කසළ කොම්පෝස්ට් කිරීම සිදු කරනු ලබයි. වර්තමානයේ මෙලෙස නාගරික ඝන අපද්‍රව්‍ය වලින් නිපදවන කොම්පෝස්ට් අම්බලන්තොට ප්‍රාදේශීය සභාව විසින් අලෙවි කරනු ලබයි.

15.11.2 යාපනය මහනගර සභාව සඳහා ව කොම්පෝස්ට් අංගනය

යාපනය මහනගර සභාව පිහිටා ඇත්තේ උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කය තුළය. මහනගර සීමාවේ මුළු වර්ගඵලය 20.0km^2 වූ අතර මුළු ජනගහනය 90,000.

යාපනය මහනගර සභාවේ කොම්පෝස්ට් අංගනය



දෛනිකව මහනගර සහා සීමාවෙන් ටොන් 40ක් එකතු කරනු ලබයි. යාපනය මහ නගර සභාව සඳහා මහා පරිමාණ කොම්පෝස්ට් අංගනයක් ඉදි කිරීම සඳහා අනාගතයේ දී පිළිසරු ව්‍යාපෘතියෙන් මූල්‍යමය සහ තාක්ෂණික ආධාර ලබා දීමට නියමිතය. මෙයට සමගාමීව කාරතිවි ප්‍රදේශයේ වූ අක්කර 2.5ක් වූ ඉඩ ප්‍රමාණයක පිහිටා ඇති කොම්පෝස්ට් අංගනය නැවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පිළිසරු ව්‍යාපෘතියෙන් මූල්‍යාධාර ලබා දෙන ලදි.

හුලනය මඟින් කොම්පෝස්ට් හැලීම



15.11.3 මාවතගම ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

මාවතගම ප්‍රාදේශීය සභාව පිහිටා ඇතිතේ වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේය. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු වර්ගඵලය 653km^2 කි. මාවතගම ප්‍රාදේශීය සභා සීමාවේ ප්‍රධාන නගර වනුයේ මාවතගම, පොල්ගහදෙණිය, පිල්ලස්ස සහ මාවතගම නිදහස් වෙළඳ කළාපය වේ. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු ජනගහනය 42,000ක් පමණ වන අතර එයට පවුල් 18,000ක් ඇතුලත් වේ.

පිළිසරු ව්‍යාපෘතිය මඟින් මූල්‍යාධාර ලබා දෙන ලද කසළ කළමනාකරණ ව්‍යාපෘතිය ඉදිකර ඇත්තේ ඩෙන්ඩ්‍රන් වත්තෙහි උලුකැලේ නම් භූමියෙහිය. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු මුදල රු. 6,070,157.65 ක් වන අතර එයින් 20% ක් එනම් රු. 1,214,031.50 ක් අත්තිකාරම් ලෙස ඉදිකිරීම් කටයුතු සඳහා ලබා දෙන ලදි. කොම්පෝස්ට් අංගනය සැලසුම් කරන ලද්දේ දෛනිකව කසළ මෙට්‍රික් ටොන් 6ක ධාරිතාවයකටය.

15.11.4 රිදීගම ප්‍රාදේශීය සභාව සඳහා වූ කොම්පෝස්ට් අංගනය

රිදීගම ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේය. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු වර්ගඵලය 393km^2 කි. රිදීගම ප්‍රාදේශීය සභා සීමාවේ ප්‍රධාන නගර 2ක් පිහිටා ඇති අතර ඒවා නම් රිදීගම සහ දොඩන්ගස්ලන්දය. ප්‍රදේශයේ මුළු ජනගහනය 24,000ක් වන අතර එයට පවුල් 7,300 ක් ඇතුලත්ය.

පිළිසරු ව්‍යාපෘතිය අධාර ලබා ඉදිකර ඇති කසළ කළමනාකරණ ව්‍යාපෘතිය ඉදිකර ඇත්තේ ෂෙක්ලි වත්තේ ගෝනියදෙනියවත්ත නම් ඉඩමෙහිය. ව්‍යාපෘති භූමියෙහි මුළු වර්ග ප්‍රමාණය අක්කර 4කි.

ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල රු. 4,034,531.09 ක් වන අතර එයින් 20% ක් එනම් රු. 806,906.22 ක් මූලික අත්තිකාරම් ලෙස ඉදි කිරීම් කටයුතු වලට නිදහස් කරන ලදි.

15.11.5. මහව ප්‍රාදේශීය සභාව සඳහා වූ කොම්පෝස්ට් අංගනය

මහව ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේය. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු වර්ග ඵලය 1,355km^2 පමණ වේ. ප්‍රදේශයේ මුළු ජනගහනය 36,000 පමණ වන අතර පවුල් 12,300 ක් පමණ එයට අයත් වේ. මහව ප්‍රාදේශීය සභා සීමාවේ ප්‍රධාන නගර වනුයේ අඹන්පොල, මහව සහ යාපහුව වේ.

නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා මූල්‍යාධාර ලබා ගැනීම වෙනුවෙන් ව්‍යාපෘති වාර්තාවක් මහව ප්‍රාදේශීය සභාව විසින් පිළිසරු ව්‍යාපෘතිය වෙත ලබා දෙන ලදි. ප්‍රදේශයේ දෛනිකව කසළ එකතු කරන ප්‍රමාණය ටොන් 4ක් වේ. පිළිසරු ව්‍යාපෘතිය විසින් දෛනිකව ටොන් 2 ක ධාරිතාවයක් සහිත කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම සඳහා මූල්‍යාධාර ලබා දීමට එකඟතාවය පළ කර ඇති අතර මෙහිදී එම කොම්පෝස්ට් අංගනයේ සාර්ථකත්වය මත ඉදිරියේ දී ධාරිතාවය පුළුල් කිරීමට පියවර ගනු ඇත.

ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල රු. 3,871,132.86 ක් වන අතර එයින් 20% ක් එනම් රු. 774,226.81 ක් මූලික අත්තිකාරම් ලෙස ඉදිකිරීම් කටයුතු සඳහා මූලිකව ලබා දෙන ලදි.

15.11.6. නිකවැරටිය ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

නිකවැරටිය ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ය. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු වර්ගඵලය 998km^2 කි. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු ජනගහනය 32,000ක් පමණ වන අතර එයට පවුල් 12,000 ක් පමණ අයත් වේ.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් සඳහා මූල්‍යාධාර ලබා ගැනීම සඳහා නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් ව්‍යාපෘති වාර්තාවක් පිළිසරු ව්‍යාපෘතිය වෙත ඉදිරිපත් කරන ලදි. යෝජිත කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමට යෝජිතව ඇත්තේ බෝගලාගම රජයේ ඉඩමකය. ව්‍යාපෘති භූමියේ මුළු ප්‍රමාණය අක්කර 2 රූඩ් 3 පර්වස් 8.9 ක් වේ.

දෛනිකව මෙට්‍රික් ටොන් 2 ක ධාරිතාවයක් ඇති කොම්පෝස්ට් අංගනයක් ඉදි කිරීම සඳහා අනුමත මුදල රු. 2,465,256.48 කි. ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා අනුමත මුදලෙන් 20% ක් එනම් රු. 493,051.30 ක් ලබා දෙන ලදි.

15.11.7 තණමල්විල ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

තණමල්විල ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ උඟව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේය. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු ජනගහනය 70,403 ක් වන අතර මෙයින් බොහොමයක් ජීවත් වනුයේ තණමල්විල ප්‍රධාන නගරයේ ය .

තණමල්විල ප්‍රාදේශීය සභා සීමාවේ ජනනය මුළු කසළ ප්‍රමාණය ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් 2 කි. කසළ ජනනය වන ප්‍රධාන ස්ථාන වනුයේ පාසැල්, වෙළඳ සැල්, රාජ්‍ය ආයතන සහ 300 ක් පමණ වූ නිවාස ඒකක වේ.

පිළිසරු ව්‍යාපෘතිය විසින් බෝධාගම ග්‍රාම නිලධාරී වසමේ කකුල් කටුව වැව නම් භූමියෙහි කසළ කළමනාකරණ පහසුකමක් ඉදිකිරීමට අනුමැතිය ලබා දෙන ලදි. මෙම ඉඩමෙහි නීතිමය හිමිකම ඇත්තේ තණමල්විල ප්‍රාදේශීය සභාවට වේ. කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම සඳහා රු. 1,801,506.27 ක ඇස්තමේන්තුගත මුදලක් අනුමත විය. එම මුදලෙන් රු. 360,301.25 ක අත්තිකාරම් මුදලක් කොම්පෝස්ට් අංගනය ඉදි කිරීම සඳහා තණමල්විල ප්‍රාදේශීය සභාව වෙත ලබා දෙන ලදි.

15.11.8 තණමල්විල ප්‍රාදේශීය සභාවේ සෙවනගල කොම්ටපෝස්ට් අංගනය

තණමල්විල ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ උඟව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේය. මෙම කොම්පෝස්ට් අංගනය ඉදිකර ඇත්තේ සෙවනගල දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශයේය. සෙනවගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුළු ජනගහනය 20,613ක් වන අතර එයින් වැඩි ප්‍රමාණයක් ජීවත් වනුයේ සෙවනගල ප්‍රධාන නගරයේ ය .

සෙවනගල ප්‍රදේශයේ දෛනික කසළ ජනනය ආසන්න වශයෙන් ටොන් 4කි. කසළ ජනනය වන ප්‍රධාන ස්ථාන වනුයේ පාසල්, වෙළඳසැල් 4ක් සහ නිවාස ඒකක 556 කින් වේ. දෛනිකව කසළ එකතු කරන ප්‍රමාණය ආසන්න වශයෙන් ටොන් 2 කි.
පිළසරු ව්‍යාපෘතිය විසින් දන්දුම ග්‍රාමයේ C-07 ඇළ යන ඉඩමෙහි කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදි. ව්‍යාපෘති භූමියෙහි වර්ග ප්‍රමාණය හෙක්ටයාර 0.4047 කි. පිළිසරු ව්‍යාපෘතිය විසින් මුළු ඇස්තමේන්තුගත මුදල රු. 2,595,822.19 කට කොම්පෝස්ට් අංගනයක් ඉදි කිරීමට අනුමැතිය ලබා දුන් අතර එයින් රු. 519,164.44 ක් අත්තිකාරම් ලෙස තණමල්විල ප්‍රාදේශීය සභාව වෙත සෙවනගල කොම්පෝස්ට් අංගනය ඉදි කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදි.

15.11.9 අඹගමුව ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

අඹගමුව ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 5ක් එයට අයත් වේ. ඒවා නම් කොත්මලේ, හඟුරන්කෙත, වලපනේ, නුවරඑළිය සහ අඹගමුව කෝරලේ වේ. අඹගමුව ප්‍රාදේශීය සභාවේ මුළු ජනගහනය ආසන්න වශයෙන් 12,000ක් පමණ වේ.

මෙම ප්‍රදේශය සඳහා කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ප්‍රධාන වශයෙන් වැදගත් වනුයේ වන්දනා කාලයේ දී වන්දනා කරුවන් විශාල වශයෙන් ශ්‍රී පාද වන්දනා කිරීම හේතුවෙනි.

පිළිසරු ව්‍යාපෘතිය විසින් මෙහි කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කළ අතර ඒ සඳහා අනුමත මුළු මුදල රු. මිලියන 5.14ක් වන අතර එයින් අත්තිකාරම් මුදලක් කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම ආරම්භ කිරීම සඳහා ලබා දෙන ලදි.
වර්තමානයේ ඉදිකිරීම් කටයුතුවල 85% ක ප්‍රගතියක් පෙන්වයි.

15.11.10. ආනමඩුව ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

ආනමඩුව ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ වන අතර ප්‍රාදේශීය සභා සීමාවේ

වර්ගඵලය 1936km^2 ක් පමණ වේ. ප්‍රදේශයේ මුළු ජනගහනය 37,000ක් වන අතර එයට පවුල් 13,000 ක පමණ ඇතුලත් වේ. ආනමඩුව ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රධාන නගර වනුයේ ආනමඩුව, පල්ලම සහ මහකුඹුක්කැලේ වේ.

ආනමඩුව ප්‍රාදේශීය සභාව විසින් නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා පිළිසරු ව්‍යාපෘතියෙන් මූලාශ්‍රය ආධාර ලබා ගැනීම වෙනුවෙන් පිළසරු ව්‍යාපෘතිය වෙත ව්‍යාපෘති වාර්තාවක් ලබා දෙන ලදි. මෙම කොම්පෝස්ට් අංගනය ඉදි කෙරෙනුයේ පූලන්ගහවත්ත නම් ඉඩමෙහිය. ව්‍යාපෘති භූමියෙහි මුළු වර්ග ප්‍රමාණය අක්කර 3 රූඩ් 1 පර්චස් 35ක් වේ.

කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සඳහා අනුමත මුළු මුදල රු.1,949,120.00 ක් වන අතර ධාරිතාවය දෛනිකව කසල මෙට්‍රික් ටොන් 3 කි. ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා 20%ක් වූ අත්තිකාරම් මුදලක් එනම් රු. 389,824.00 ක් නිදහස් කරන ලදි.

15.11.11 නිවිතිගල ප්‍රාදේශීය සභාව සඳහා කසල එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ඉදි කිරීම.

නිවිතිගල ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේය. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු වර්ග ප්‍රමාණය 272.73 km^2 කි. ප්‍රදේශයේ මුළු ජනගහනය 101,586 කි. ප්‍රදේශයේ ප්‍රධාන නගර වනුයේ නිවිතිගල, කරවිට සහ යද්දෙහිවත්ත වේ. ග්‍රාම නිලධාරී වසම් 44කි. මෙම ප්‍රාදේශීය සභාවට ආයතන 28ක්, කර්මාන්ත ශාලා 43ක්, වෙළඳසැල් 1250ක්, සති පොළවල් 1ක්, හෝටල් 24ක්, ආරෝග්‍ය ශාලා 3ක් සහ පාසල් 49ක් ඇතුලත් වේ.

ප්‍රාදේශිය සභා සීමාවේ දිනකට එකතු කරන කසල ප්‍රමාණය ටොන් 2ක් පමණ වේ. පිළිසරු ව්‍යාපෘතිය විසින් නිවිතිගල ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනයක් ඉද කිරීමට ප්‍රථම ඔවුන් විසින් විවෘත කසල බැහැරලීම සිදු කරන ලදි. ප්‍රතිවක්‍රීකරණ කළ හැකි කසල එනම් වීදුරු, ලෝහ, පොලිතීන් සහ ප්ලාස්ටික්, කඩදාසි සහ පොල් කටු ආදිය එකතු කර ගබඩා කිරීම සඳහා කසළ එක්රැස් කිරීමේ මධ්‍යස්ථානයක් ඉදි කිරීමට පිළිසරු ව්‍යාපෘතිය විසින් මූලාධාර ලබා දෙන ලදි. කසල එකතු කිරීමේ මෙම මධ්‍යස්ථානය ඉදි කිරීම සිදු කරන ලද්දේ නිවිතිගල ප්‍රාදේශීය සභා භූමියේය. මේ සඳහා අනුමත මුදල රු. 2,776,609.87 ක් වන අතර එයින් 20% ක් එනම් රු. 555.321.97 ක් අත්තිකාරම් ලෙස ලබා දුන් අතර ඉදි කිරීමේ කටයුතු වලින් 75% ක් මේ වන විට අවසන් කර ඇත.

15.11.12 කුරුවිට ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය සහ කසල එකතු කිරීමේ මධ්‍යස්ථානය

කුරුවිට ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේය. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු වර්ග ඵලය 263.1 km^2 කි. මුළු ජනගහනය 114,592කි. ප්‍රාදෙශීය සභාවේ ප්‍රධාන නගරය කුරුවිට වේ. ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව 56 කි. ප්‍රාදේශීය සභා සීමාව තුළ පවුල් 25,000 ක්, කර්මාන්තපුර 2ක්, සති පොළවල් 3ක්, හෝටල් 35ක්, ආරෝග්‍යශාලා 3ක්, වෙළඳසැල් 408ක් සහ පාසල් 48 ක් පවති. වීදුරු, ලෝහ, පොලිතින් සහ ප්ලාස්ටික්, කඩදාසි සහ පොල් කටු ආදි ප්‍රතිවක්‍රීකරණ ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා කසළ එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටු වීමට පිළිසරු ව්‍යාපෘතිය මූලාධාර ලබා දෙන ලදි. මෙම කසල එකතු කිරීමේ මධ්‍යස්ථානය ඉදි කර ඇත්තේ දෙල්ගම පිහිටි අක්කර 5 පර්චස් 3 ක භූමි ප්‍රමාණයකය. මේ සඳහා අනුමත මුදල රු.

2,932,546.92 කි. එයින් 20% ක් එනම් රු. 586,509.38 ක මුදලක් ඉදිකිරීම් කටයුතු සඳහා මූලිකව නිදහස් කරන ලදි.

15.11. 13. ශ්‍රී ලංකා යුධ හමුදාවේ මහකන්දරාවැව 6 වෙනි පාබල කඳවුර සඳහා කොම්පෝස්ට් අංගනය

මෙම 6 වෙනි පාබල හමුදා කඳවුර පිහිටා ඇත්තේ උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලේ ප්‍රාදේශීය සභා සීමාවේය. හමුදා කඳවුර පිහිටා ඇත්තේ අක්කර 75ක් වූ භූමි භාගයකය. හමුදා කඳවුර තුළ 500 - 600 ක් පමණ වූ නේවාසික නිලධාරීන් පිරිසක් සිටින අතර පහසුවෙන් දිරාපත් වන කසළ ටොන් 0.5 ක් පමණ දිනකට මෙම හමුදා කඳවුර තුල ජනනය වේ.

මෙම හමුදා කඳවුර තුල කොම්පෝස්ට් අංගනයක් ඉදි කිරීමේ මූලික අරමුණ වනුයේ විවෘත කසල බැහැරලීම අවම කර එමඟින් පාරිසරික දූෂණය අවම කර හමුදා කඳවුර තුළම පහසුවෙන් දිරාපත් වන කසළ වලින් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමයි. නිපදවන කොම්පෝස්ට් හමුදා කඳවුර තුළ වගා කෙරෙන භෝග සඳහා පොහොරක් ලෙස භාවිතා කෙරේ.

හමුදා කඳවුර තුල සහ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් සඳහා පිළිසරු ව්‍යාපෘතිය විසින් රු. 1,847,395.53 ක මුදලක් අනුමත කළ අතර මෙම මුදල කොම්පෝස්ට් අංගනය, කසල ගොඩබාන සහ වෙන් කරන ස්ථානය, කැලි කරන සහ පොහොර හලන ස්ථානය සහ සෝදන ස්ථානය ඉදි කිරීම සඳහා වෙන් කර ඇත. 2012 දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිදු කරන ජාතික තලයේ ඉදි කිරීම් වලට අදාලව මෙම කසළ කළමනාකරණ ව්‍යාපෘතිය හැකි ඉක්මණින් ආරම්භ කිරීම වෙනුවෙන් අනුමත මුදලෙන් 20% ක් එනම් රු. 369,479.07 ක් අත්තිකාරම් වශයෙන් 2011 නොවැම්බර් 29 දින මූලිකව ලබා දෙන ලදි.

15.11.14 ගලෙන් බිඳුණු වැව ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

ගලෙන් බිඳුනු වැව ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේය. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු වර්ග ප්‍රමාණය 1,756 km^2 කි. පිළිසරු ව්‍යාපෘතිය විසින් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ඉදි කිරීම සඳහා රු. 6,403,314.89 ක මුළු මුදලක් අනුමත කරන ලද අතර එයින් 20% ක් එනම් රු. 1,280,662.97 ක් මූලික අත්තිකාරම් වශයෙන් ලබා දෙන ලදි. මෙම ව්‍යාපෘතිය මඟින් ප්‍රදේශයේ කසළ කළමනාකරණ ක්‍රමවේදයක් ඇති කිරීම බල ගැන්වෙන අතර අනුරාධපුර දිස්ත්‍රික්කයේ 2012 දැයට කිරුළ ප්‍රදර්ශනයට සිදු කරන ජාතික තලයේ ඉදි කිරීම් වලට සමගාමීව මෙම ව්‍යාපෘතිය ඉදි කෙරෙනු ඇත.

වර්තමානයේ මෙම ව්‍යාපෘතිය තාවකාලිකව නවතා ඇති අතර එයට මූලික හේතුව ගලෙන් බිඳුනු වැව ප්‍රාදේශීය සභාවට එරෙහිව ගෙන ඇති නීතිමය පියවර වේ. මෙම ප්‍රාදේශීය සභාව විසින් රජයේ සහ රාජ්‍ය නොවන සංවිධාන වල මුදල් අයුතු ලෙස භාවිත කර ඇත. මෙම නීතිමය පියවර හමුවේ පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රාදේශීය සභාව සතු දේපළ තම භාරයට පවරා ඇත. ඒ අනුව පිළිසරු ව්‍යාපෘතිය මඟින් අරමුදල් ලබා දී ඇති කසළ කළමනාකරණ ව්‍යාපෘතිය තාවකාලිකව නවතා ඇති අතර එය නැවත පළාත් පාලන කොමසාරිස්ගේ සුපරීක්ෂාව යටතේ නැවත ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

15.11.15 ගල්නෑව ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

ගල්නෑව ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේය. ප්‍රදේශයේ මුළු ජනගහනය 21,900 ක් වන අතර එයට පවුල් 8500ක් ඇතුලත් වේ. ගල්නෑව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන නගර වනුයේ ගල්නෑව, බලලුවැව, අවුකන සහ බුල්නෑව වේ. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු වර්ග ඵලය 893 km^2 ක් වේ.

පිළිසරු ව්‍යාපෘතිය මගින් කොම්පෝස්ට් අංගනය ඉදිකෙරෙනුයේ ගල්නෑව බොරළු කැපුවල නම් ඉඩමෙහි වන අතර එහි මුළු ප්‍රමාණය අක්කර 4 රූඩ් 2 ක් සහ පර්චස් 11.6 කි.

පිළිසරු කසළ කළමනාකරණ ව්‍යාපෘතියේ අනුමත වියදම රු. 5,295,245.30 ක් වන අතර ධාරිතාව දිනකට ටොන් 1 ක් වේ. අනුරාධපුරයේ 2012 දැයට කිරුළට සමගාමීව සිදු වන ජාතික ඉදි කිරීම් වලට සමගාමීව මෙම කසළ කළමනාකරණ ව්‍යාපෘතිය කඩිනමින් ස්ථාපිත කිරීම සඳහා රු.1,059,049.18 ක අත්තිකාරම් මුදලක් ලබා දෙන ලදි.

15.11.16 ඉපලෝගම ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

ඉපලෝගම ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළය. ප්‍රදේශයේ මුළු ජනගහනය 25,000 ක් පමණ වන අතර එයට පවුල් 8,750 ක් ඇතුලත්වේ. මෙම ප්‍රාදේශීය සභා සීමාවේ ප්‍රධාන ජනාවාස වනුයේ ඉපලෝගම, මහඉලුප්පියන, රණවිරුගම රාජ්‍ය නිවාස සංකීර්ණය සහ හිරපිටිය වේ. ප්‍රදේශයේ මළු වර්ග ප්‍රමාණය 720 km^2 කි.

පිළිසරු ව්‍යාපෘතිය විසින් කොම්පෝස්ට් අංගනයක් ඉදි කිරීම සඳහා අනුමත වූ මුළු මුදල රු. 6,042,336.98 ක් වන අතර එහි ධාරිතාව දිනකට මෙට්‍රික් ටොන් 2 ක් පමණ වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ 2012 දැයට කිරුළට සමගාමීව සිදු කරන ජාතික මට්ටමේ ඉදිකිරීම් වලට සමගාමීව මෙහි ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා පරිසර අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා විසින් රු. 1,208,467.40 ක අත්තිකාරම් මුදලක් ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත මධ්‍යම පරිසර අධිකාරියේ පැවති උත්සවයක දී ලබා දෙන ලදි.

15.11.17 කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේය. මෙම ප්‍රාදේශීය සභා සීමාවේ මුළු වර්ග ඵලය 1,132km^2 වන අතර එයට කහටගස්දිගිලිය නගරය, ගෝනදෙනිය සහ සීපූක්කුලන නගරය යන ප්‍රධාන නගර ඇතුලත් වේ. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු ජනගහනය 29,000 ක් පමණ වන අතර එයට පවුල් 10,500 ක් ඇතුලත් වේ.

පිළිසරු ව්‍යාපෘතිය යටතේ මූලාධාර ලබා ඉදි කෙරෙන කොම්පෝස්ට් අංගනය පිහිටා ඇත්තේ බොරළු වැව මඩගාලිදාහින්න නම් ස්ථානයේය. එම ස්ථානයේ මුළු ප්‍රමාණය අක්කර 2 කි. මෙම කොම්පෝස්ට් අංගනය සැලසුම් කර ඇත්තේ දිනකට ටොන් 2 ක ධාරිතාවකටය. මෙම කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සඳහා අනුමත මුළු මුදල රු. 6,497,638.42 කි. මෙම මුදලෙන් 20% ක අත්තිකාරම් මුදලක් එනම් රු. 1,299,527.68 ක් කොම්පෝස්ට් අංගනයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම තුළින් ප්‍රදේශයේ ක්‍රමවත් සංවර්ධනයක් ඇති කිරීමට

නිදහස් කරන ලදි. මෙම ක්‍රියාකාරකම සිදු වනුයේ 2012 අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවැත්වීමට නියමිත දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව වේ.

15.11.18 මැදවච්චිය ප්‍රාදේශීය සභාව සඳහා වූ කොම්පෝස්ට් අංගනය

මැදවච්චිය ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේය. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු වර්ගඵලය 113km²ක් වන අතර එයට ප්‍රධාන වශයෙන් මැදවච්චිය, ඒ 9 පාර, මැදවච්චිය - බටහිර, මැදවච්චිය - නැගෙනහිර සහ කුඩා මැදවච්චිය ඇතුලත් වේ. මෙම ප්‍රාදේශීය සභා සීමාවේ මුළු ජනගහනය 36,000 ක් වන අතර එයට පවුල් 16,000 ක් ඇතුලත් වේ.

පිළිසරු ව්‍යාපෘතිය මගින් ඉදිකෙරෙන කොම්පෝස්ට් අංගනය ඉදිකෙරෙනුයේ කුඩා මැදවච්චියේ පැරණි ගම් සභා ඉඩමෙහිය. ඉඩමේ ප්‍රමාණය අක්කර 1 රූඩ් 2 කි.

මෙම කොම්පෝස්ට් අංගනය ඉදිකර ඇත්තේ දිනකට ටොන් 2 ක් කසළ කොම්පෝස්ට් කළ හැකි වන සේය. කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම වෙනුවෙන් අනුමත මුළු මුදල රු. 6,497,638.42 ක් වන අතර එයින් 20% ක් එනම් රු. 1,299,527.68 ක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් නිදහස් කරන ලදි. මෙම ව්‍යාපෘතිය ඉදිකෙරෙනුයේ 2012 අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවැත්වීමට නියමිත දැයට කිරුළ ජාතික සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව සිදු කරන සංවර්ධන කටයුතු වලට අදාල වන සේය.

15.11.19. රාජාංගනය ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

රාජාංගනය ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේය. ප්‍රදේශයේ මුළු ජනගහණය 24,000 ක් පමණ වන අතර එයට පවුල් 11,000 ක් පමණ ඇතුළත් වේ. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු වර්ග ප්‍රමාණය 1,000 km² ක් වන අතර එයට රාජාංගනය, ඉබලාගම, සෝල වැව සහ පුත්තලම මංසන්ධිය යන ප්‍රධාන නගර ඇතුලත් වේ.

පිළිසරු ව්‍යාපෘතිය මගින් ඉදිකෙරෙන කොම්පෝස්ට් අංගනය සඳහා අනුමත මුළු මුදල රු. 5,295,245.90 කි. එයින් 20% ක් එනම් රු. 1,059,049.18 ක් අත්තිකාරම් මුදල ලෙස ලබා දෙන ලදි. මෙම කොම්පෝසට් අංගනය ඉදි කෙරෙනුයේ 2012 වසරේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවැත්වීමට නියමිත දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව දිස්ත්‍රික්කයේ සිදු කරන සංවර්ධන කටයුතු වලට සමගාමීව වේ. මෙම කොම්පෝස්ට් අංගනය සැලසුම් කර ඇත්තේ දිනකට ටොන් 1 ක ධාරිතාවකටය. කොම්පෝස්ට් අංගනයේ මූලික ඉදිකිරීම් කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

15.11.20. රබෑව ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනය

රබෑව ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ රබෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේය. ප්‍රදේශයේ මුළු ජනගහනය 38,509 ක් වන අතර එයට පවුල් 10,727 ක් ඇතුලත් වේ. ප්‍රදේශයේ මුළු වර්ග ප්‍රමාණය 1,073 km² වේ. රබෑව ප්‍රාදේශීය සභා සීමාවේ වැඩිම ජනගහනයක් ඇත්තේ රබෑව, ඒ 9 පාර සහ ඉකිරිගොල්ල යන නගර වලය.

පිළිසරු ව්‍යාපෘතිය විසින් රබෑව ප්‍රාදේශීය සභා සීමාවේ දෛනික කසල ටොන් 2 ක ධාරිතාවයකට මෙම කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමට අනුමත කරන ලද අතර ඒ සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල රු. 6,497,638.42 කි. අත්තිකාරම් වශයෙන් රු. 1,299,527.68 ක මුදලක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් නිදහස් කරන ලද අතර මෙම කොම්පෝස්ට් අංගනය 2012 අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවැත්වීමට නියමිත දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමී දිස්ත්‍රික්කයේ සිදුවන සංවර්ධන කටයුතු වලට සමගාමීව ඉදි කෙරෙනු ඇත.

15.11.21 . තිරිප්පනේ ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනය

තිරිප්පනේ ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිරිප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේය. මුළු ජනගහනය 18,500ක් වන අතර එයට පවුල් 6700 ක් ඇතුලත්වේ. තිරිප්පනේ ප්‍රාදේශීය සභාවට තිරිප්පනේ, දයගම, මරදන්කඩවල සහ නාච්චිදූව යන ප්‍රධාන නගර ඇතුලත් වේ. ප්‍රදේශයේ මුළු වර්ග ප්‍රමාණය 830 km^2 කි.

පිළිසරු ව්‍යාපෘතිය මඟින් ඉදිකෙරෙන මෙම කොම්පෝස්ට් අංගනයේ ධාරිතාව දිනකට ටොන් 1 ක් වන අතර ඉදකිරීම් කටයුතු සඳහා අනුමත මුළු මුදල රු. 5,572,025.61 කි. එයින් රු. 1,114,405.12ක් අත්තිකාරම් ලෙස ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් නිදහස් කරන ලදි. මෙම කොම්පෝස්ට් අංගනය 2012 වසරේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවැත්වීමට නියමිත දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව දිස්ත්‍රික්කයේ සිදුවන සංවර්ධන කටයුතු වලට සමගාමීව ඉදි කෙරෙනු ඇත.

15.11.22. අලවිව ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

අලවිව ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේය. ප්‍රාදේශීය සභා සීමාවේ ප්‍රධාන නගර වනුයේ අලවිව, ගිරිඋල්ල, පොල්ගහවෙල පාර, බෝයවලාන, කොට්ටවත්ත සහ වාරච්චිමුල්ල වේ. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු ජනගහනය 67,806 ක් වන අතර එයට පවුල් 4000 ක් ඇතුලත් වේ.

පිළිසරු ව්‍යාපෘතිය මඟින් ඉදි කෙරෙන කොම්පෝස්ට් අංගනය සහිත ඉඩමේ මුළු ප්‍රමාණය පර්චස් 36.29 කි. ඉඩම දවටගල්ල නම් වේ. ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් අනුමත මුළු මුදල රු. 5,366,118.38 ක් වන අතර එයින් 20% ක් එනම් රු. 1,073,233.68 ක් අත්තිකාරම් ලෙස ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් නිදහස් කරන ලදි.

15.11.23. චාවකච්චේරිය නගර සභාව සඳහා වූ කොම්පෝස්ට් අංගනය

චාවකච්චේරිය නගර සභාව පහිටා ඇත්තේ උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේය. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු වර්ග ප්‍රමාණය 19.4 km^2 කි. මුළු ජනගහනය 19,500 කි. නගර සීමාවේ දිනකට එකතු කරන කසළ ටොන් 5 ක් කොම්පෝස්ට් කිරීම වෙනුවෙන් මෙම කොම්පෝස්ට් අංගනය ඉදි කෙරෙනු ඇත.
කොම්පෝස්ට් අංගනය ඉදි කෙරෙනුයේ කඩල්කාරෙයිපිරායි නම් ඉඩමෙහි අක්කර 2 ක භූමි ප්‍රමාණයකය. චාවකච්චේරිය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ඉදිකෙරෙන මෙම කොම්පෝස්ට් අංගනය සඳහා අනුමත මුළු මුදල රු. 5,606,917.18 ක් වන අතර එයින් 20% ක් එනම් රු. 1,121,383.44 ක් අත්තිකාරම් ලෙස ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා නිදහස් කරන ලදි.

15.11.24. හම්බන්තොට ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

මෑනකදී ලබා ගත් ඉඩම



හම්බන්තොට ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ හම්බන්තොට දිස්ත්‍රික්කයේය. ප්‍රදේශයේ මුළු වර්ග ප්‍රමාණය 308 km^2 කි. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු ජනගහනය 50,320 කි. ප්‍රාදේශීය සභා සීමාවේ දිනකට නාගරික කසළ ටොන් 2 ක් එකතු කරන අතර එයින් වැඩි ප්‍රමාණයක් ආහාරමය අපද්‍රව්‍ය, මාලු කැබලි සහ දිරාපත් නොවන කසළ වේ. කසළ විශාල ප්‍රමාණයක් සතියකට දෙවරක් පැවැත්වෙන පොලෙන් එකතු කරනු ලැබේ.

ප්‍රදේශයේ සුදුසු ඉඩමක් ලබා ගැනීම දුර්ලභ වූයෙන් මහවැලි අධිකාරියට අයත් බොල්ගිඳ පිහිටි ඉඩම පිළිසරු ව්‍යාපෘතියේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ඉදිකිරීම වෙනුවෙන් නිදහස් කර ගැනීමට සැහෙන කාලයක් ගත විය. හම්බන්තොට ප්‍රාදේශීය සභාව වෙනුවෙන් මෙම කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමට අනුමත මුදල රු. 2,563,194.69 ක් වන අතර එය දෛනික කසළ ටොන් 2 ක් කොම්පෝස්ට් කිරීම සඳහා කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම වෙනුවෙන් වැය කරනු ඇත.

15.11.25. ජා - ඇල නගර සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

ජා - ඇල නගර සභාව පිහිටා ඇත්තේ බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ය. ජා - ඇල නගර සභා සීමාවේ මුළු ජනගහනය 36,960 කි. නගර සභා සීමාවේ ප්‍රධාන නගර වනුයේ ජා - ඇල, තුඩැල්ල සහ සුදු ඇල්ල වේ. නගර සභා සීමාවේ 7,200 ක් පමණ වූ පවුල් වලින් ජනනය වන කසළ නාගරික කසළ ප්‍රවාහයට එක් වේ. ජා - ඇල නගර සභා සීමාවේ දිනකට ජනනය වන කසළ ප්‍රමාණය ටොන් 26 ක් පමණ වන අතර එකතු කරනු ලබනයේ දිනකට ටොන් 20 ක් පමණි. නාගරික ප්‍රදේශ වලින් එකතු කරනු ලබන කසළ සුදු ඇල්ල ප්‍රදේශයේ විවෘත ලෙස බැහැර කරනු ලබයි. මෙමගින් පාරිසරික සහ සෞඛ්‍යමය ගැටළු රාශියක් උද්ගත වී ඇත.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ පහසුවෙන් දිරාපත් වන කසළ වලින් කොම්පෝස්ට් නිෂ්පාදනය තුලින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විසඳුමක් ලබා දීම වේ. ප්‍රදේශයේ ජනනය වන කසළ වලින් 70% ක් දිරාපත් වන ද්‍රව්‍ය වන අතර එම ප්‍රමාණය මෙම ව්‍යාපෘතිය තුලින් කොම්පෝස්ට් බවට පත් කිරීමට ගනු ලැබේ.

කොම්පෝස්ට් අංගනය ඉදි කරනු ලැබුවේ ජා - ඇල සුදු ඇල්ල නම් නගරයේ ඇති ඉඩමකය. ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය ඇත්තේ ජා - ඇල නගර සභාවටය. පිළිසරු ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් මෙම ඉඩමෙන් පර්චස් 80 ක් වෙන් කෙරිණ. මෙම ඉඩමෙහි සීමා සහිත බව හේතු කොට ගෙන දිනකට කසළ ටොන් 7ක්

කළමනාකරණය කළ හැකි වන සේ කොම්පෝස්ට් අංගනය සැලසුම් කරන ලදි.

කොම්පෝස්ට් අංගනය ඉදි කිරීම සඳහා අනුමත මුදල රු. 8,539,326.48 ක් වන අතර එයින් 20% ක් එනම් රු. 1,707,865.30 ක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා අත්තිකාරම් ලෙස ලබා දෙන ලදි. පිළිසරු ව්‍යාපෘතිය විසින් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් මෙම මූල්‍යාධාර නිදහස් කරන ලදි.

ඉඩම සකස් කිරීම, කොම්පෝස්ට් අංගනය, කාර්යාලය, විවේක කාමරය, ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි ද්‍රව්‍ය සහ නිෂ්පාදිත කොම්පෝස්ට් ගබඩා කිරීම සඳහා ගබඩා කාමරය, සෝදන ස්ථානය, ජල සැපයුම, බෝක්කුව, විදුලි සැපයුම, දම් වැල් වැට සහ ගේට්ටුව සහ පහත් බිම පිරිසිදු කිරීම සහ ගොඩ කිරීම වෙනුවෙන් මෙම මුදල් යොදාගනු ඇත.

15.11.26. කාන්තන්කුඩි නගර සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

කාන්තන්කුඩි නගර සභාව පිහිටා ඇත්තේ නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේය. නගර සභා සීමාවේ මුළු වර්ග ප්‍රමාණය වර්ග කි.මී. 6.5 ක් වන අතර මුළු ජනගහනය 48,569 ක් පමණ වේ.

නගර සභා සීමාවේ දිනකට එකතු කරනු ලබන කසළ ප්‍රමාණය ටොන් 9 ක් පමණ වේ. කොම්පෝස්ට් ව්‍යාපෘතිය පිහිටා ඇත්තේ අක්කර 2 ක පමණ භූමි ප්‍රමාණයකය. කාන්තන්කුඩි නගර සභාව සඳහා පිළිසරු නාගරික කසළ කළමනාකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් අනුමත මුළු මුදල රු. 8,708,282.50 කි. එයින් රු. 1,669,226.50 ක් කොම්පෝස්ට් අංගනයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා නගර සභාව වෙත ලබා දෙන ලදි.

15.11.27. මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේය. ප්‍රධාන නගරය මාලිම්බඩ වේ. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු ජනගහනය 23,000ක් පමණ වන අතර එයට පවුල් 7,000 ක් පමණ ඇතුලත්වේ.
පිළිසරු ව්‍යාපෘතිය විසින් සුල්තානංගොඩ නම් රුඩ් 3ක ඉඩමක කසළ කළමනාකරණ පහසුකම් ඉදිකිරීම සඳහා මූල්‍යාධාර ලබා දෙනු ලැබේ. දිනකට කසළ ටොන් 2ක් කොම්පෝස්ට් කිරීම වෙනුවෙන් අනුමත මුළු මුදල රු. 5,647,289.49 කි. එයින් රු. 1,129,457.90 ක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා අත්තිකාරම් ලෙස මාලිම්බඩ ප්‍රාදේශීය සභාව වෙත ලබා දෙන ලදි.

15.11.28. මාතර ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

මාතර පාදේශීය සභාව පිහිටා ඇත්තේ දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේය. ප්‍රදේශයේ මුළු ජනගහනය 43,000 කි. ප්‍රධාන නගරය මාතර වේ.

පිළිසරු ව්‍යාපෘතිය විසින් මාතර නාවිමන ප්‍රදේශයේ යක්දූව නම් ඉඩමෙහි අක්කර 1 ක භූමි ප්‍රමාණයක කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදෙණි. කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමට වැයවෙතැයි අපේක්ෂිත මුදල රු. 1,000,000.00 වන අතර එහි ධාරිතාව දිනකට ටොන් 5 කි. කොම්පෝස්ට් අංගනයේ

ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා අත්තිකාරම් වශයෙන් රු. 200,000.00 ක මුදලක් මූලිකව මාතර ප්‍රාදේශීය සභාවට ලබා දෙන ලදි.

15.11.29 . පොල්පිතිගම ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

පොල්පිතිගම ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේය. පොල්පිතිගම ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රධාන නගර පොල්පිතිගම, මාඳැල්ල සහ ගල්ටැන් වැව වේ. ප්‍රදේශයේ මුළු ජනගහනය 88,764 ක් වන අතර එයට පවුල් 24,230 ක් පමණ ඇතුලත්වේ.

පිළිසරු ව්‍යාපෘතිය විසින් මූල්‍යාධාර ලබා ඉදිකෙරෙන කොම්පොස්ට් අංගනය පොල්පිතිගම කිරීමානගොඩයාය නම් ඉඩමෙහි අක්කර 3 ක භූමි ප්‍රමාණයක ඉදි කෙරෙනු ඇත. ව්‍යාපෘතිය සඳහා වැයවෙනැයි අපේක්ෂිත මුළු මුදල රු. 3,981,693.02 ක් වන අතර එයින් 20% ක් එනම් රු. 796,336.60 ක් අත්තිකාරම් වශයෙන් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් නිදහස් කර ඇත. මෙම කොම්පෝස්ට් අංගනය දෙනිකට ටොන් 1ක කසළ ප්‍රමාණයක් සකස් කිරීම වෙනුවෙන් ඉදිකෙරෙනු ඇත.

15.11.30. රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

නෝරාගන්නා ලද ඉඩම



යෝජිත ව්‍යාපෘති භූමිය



රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ කෑගල්ල දිස්ත්‍රික්කයේය. ප්‍රදේශයේ මුළු වර්ග ප්‍රමාණය 170 km^2 කි. ප්‍රාදේශීය සභා සීමාවේ මුළු ජනගහනය 70,000 ක් පමණ වේ.

දෙනිකට කසළ ටොන් 3කට අධික ප්‍රමාණයක් ග්‍රාම නිලධාරී වසම් 38කින් එකතු කරනු ලබයි. කසළ ප්‍රධාන වශයෙන් එකතු කරනු ලබනුයේ කරවනැල්ල, රුවන්වැල්ල, අඟුරුවැල්ල සහ කනන්තොට යන නගර වලිනි.

පිළිසරු ව්‍යාපෘතියේ මූල්‍යාධාර යටතේ කරවනැල්ල ප්‍රාදේශීය සභාව විසින් දෙනිකට කසළ මෙට්‍රික් ටොන් 3 ක් කළමනාකරණය කිරීම සඳහා කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. මේ සඳහා අනුමත මුළු මුදල රු. 5,219,922.89 කි.

15.11.31. වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ පුත්තලම දිස්ත්‍රික්කයේය. ප්‍රදේශයේ මුළු ජනගහනය 19,000 ක්

පමණ වන අතර එයට පවුල් 5,300 ක් ඇතුලත් වේ. ප්‍රදේශයේ ප්‍රධාන ජනාකීර්ණ නගර අතර වනාතවිල්ලුව, ප්‍රධාන නැනක් ගන්නා අතර එය ධීවර ගම්මානයකි. මෙහි අවතැන් වූ පිරිස් සඳහා කඳවුරු කිහිපයක් පවති. ප්‍රදේශයේ මුළු වර්ග ප්‍රමාණය වර්ග කි.මී. 710 කි.

පිළිසරු කොම්පෝස්ට් ව්‍යාපෘතිය ඉදිකෙරෙනුයේ ප්‍රදේශයේ අක්කර 2ක භූමි ප්‍රමාණයකය. කොම්පෝස්ට් අංගනයේ ඉදිකිරීම් කටයුතු සඳහා අනුමත මුදල රු. 3,875,896.63 ක් වන අතර එමගින් දෛනිකව කසළ ටොන් 2 ක් සැකසීමට අපේක්ෂා කෙරේ. ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් මූලිකව රු. 775,179.00 ක් අත්තිකාරම් ලෙස නිදහස් කරන ලදි.

15.11.32. වීරකැටිය ප්‍රාදේශීය සභාව සඳහා කොම්පෝස්ට් අංගනය

වීරකැටිය ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනක් ඇතුලත් වේ. ඒවා නම්, වලස්මුල්ල, ඔකවෙල සහ වීරකැටිය වේ. ප්‍රදේශයේ මුළු ජනගහනය 70,000 ක් පමණ වේ.

ප්‍රදේශයෙ පවතින සුදුසු ඉඩම් වල හිඟතාවය මත වර්තමානයේ ව්‍යාපෘතිය සඳහා ලැබී ඇති ඉඩම් නිදහස් කර ගැනීමට දීර්ඝ කාලයක් ගත විය. දෛනිකව නාගරික කසළ ටොන් 2 ක් කළමනාකරණය සඳහා පිළිසරු ව්‍යාපෘතිය මගින් කොම්පෝස්ට් අංගනයක් ඉදි කිරීම වෙනුවෙන් රු. 2,221,348.50 ක අත්තිකාරම් මුදලක් මූලිකව නිදහස් කරන ලදි.

15.12. පළාත් පාලන ආයතන, ආරෝග්‍ය ශාලා, හමුදා කඳවුරු සහ අනෙකුත් රාජ්‍ය ආයතන සඳහා ජීවවායු ඒකක සහ කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන ඉදිකිරීම.

ආරෝග්‍ය ශාලා, හමුදා කඳවුරු සහ අනෙකුත් රාජ්‍ය ආයතන එනම්, විශ්ව විද්‍යාල සහ සිරකඳවුරු සඳහා එම ස්ථාන වල ජනනය වන කසළ එම භූමි තුළම කළමනාකරණය කර ගැනීම සඳහා ප්‍රායෝගික විසඳුමක් ලබා ගැනීමේ අදහසින් පිළිසරු ව්‍යාපෘතියෙන් මූල්‍යමය සහ තාක්ෂණික අධාර ලබා ගැනීමට ඉල්ලීමක් සිදු කෙරිණ. පිළිසරු ව්‍යාපෘතියේ 2011 ක්‍රියාකාරී සැලැස්මට අනුව පිළිසරු ව්‍යාපෘතිය විසින් ජීව වායු ඒකක ඉදි කිරීම තුළින් ඉහත ආයතන ඉවතලන කසළ වලට සිය ස්ථාන තුළම ලබා දීම සඳහා ක්‍රියා කෙරිණ. මේ ආකාරයෙන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට විසඳුමක් ලබා දීම තුළින් ඉහත ආයතන තුළ සිදු කෙරෙන අක්‍රමවත් කසළ බැහැරලීම නැවැත්වීමට මෙන්ම එමගින් සිදුවන පාරිසරික දූෂණය සැලකිය යුතු ප්‍රමාණයකින් අවම කිරීමට හැකියාව ලැබේ.

අදාල ව්‍යාපෘති වාර්තා තාක්ෂණික විශෙෂඥ කමිටුව විසින් අදාල නිර්නාකයන්ට අනුකූලව විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව ජීව වායු ඒකක 2 ක් ස්ථාන 19 ක ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2011 ජුනි 28 වන දින අනුමැතිය ලබා දෙන ලදි. මේ සඳහා අනුමත මුළු මුදල රු. 21,279,592.50 ක් වන අතර ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව මෙහි ඉදිකිරීම් සඳහා වූ කොන්ත්‍රාත්තුව ඉසුරු ඉංජිනේරින් පෞද්ගලික ආයතනය වෙත පවරන ලදි.



පිළිසරු ව්‍යාපෘතිය විසින් ජීව වායු ඒකක ස්ථාපිත කිරීම සඳහා අනුමත රාජ්‍ය ආයතන පහත දක්වා ඇත.

අංකය	ආයතනය	ඒකක ගණන	ධාරිතාව (m^3)	අනුමත මුදල රු.
1	මහරගම පිළිකා රෝහල	1	40	818,930.25
2	කොළඹ උතුර රාගම ශික්ෂණ රෝහල	2	55	1,054,930.50
3	මහනුවර ශික්ෂණ රෝහල	2	60	1,113,088.50
4	යාපනය ශික්ෂණ රෝහල	2	60	1,195,539.50
5	රත්නපුර මහ රෝහල	1	45	891,938.25
6	පොළොන්නරුව මහ රෝහල	2	40	879,591.75
7	නාගොඩ මහ රෝහල	1	50	993,701.25
8	ගම්පහ මහරෝහල	1	50	993,701.25
9	කුලියාපිටිය මූලික රෝහල	1	10	392,310.00
10	ත්‍රිකුණාමලය මහ රෝහල	1	22	587,830.00
11	ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල	1	65	1,206,913.50
12	කරෙයිනගර් නාවික කඳවුර	1	25	726,051.25
13	මින්කසන්තුරේ නාවික කඳවුර	2	55	1,138,073.50
14	ගාල්ල නාවික කඳවුර	1	35	752,672.25
15	බොරලන්ද පොලිස් පුහුණු කඳවුර	1	10	421,370.00
16	විවෘත විශ්ව විද්‍යාලය නාවල	1	10	392,310.00
17	වටරැක සිර කඳවුරු	1	50	993,701.25
18	මොල්ලිකුලම නාවික කඳවුර	1	35	808,425.75
19	මොණරාගල දිස්ත්‍රික්ක මහ රෝහල	1	22	547,290.00

ඉහත ආයතන වල ජීව වායු ඒකක මේ වන විට ඉදිවෙමින් පවති. කෙසේ වෙතත් පිළිසරු ව්‍යාපෘතියේ මූලාධාර මත ජීව වායු ඒකක ඉදි කිරීමට නියමිතව තිබූ රත්නපුර මහ රෝහල, ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සහ මොරලන්ද නාවික කඳවුර යන ස්ථාන වල එම ව්‍යාපෘති ඔවුන්ගේ ඉල්ලීම පරිදි අවලංගු කිරීමට සිදු විය.

මෙම ජීව වායු ඒකක ඉදිකිරීම අහෝසි වීමත් සමඟ මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් $35m^3$ ධාරිතාව ඇති එක් ජීව වායු ඒකකයක් අනුරාධපුර ශ්‍රවන් හමුදා මූලස්ථානයටත් $50\ m^3$ ක ධාරිතාව ඇති ජීව වායු ඒකක 2ක් අනුරාධපුර ශික්ෂණ රෝහලට ඉදිකිරීමටත් අනුමැතිය ලබා දුන් අතර එහිදී වැය වන මුළු මුදල ඉහත

ඉදිකිරීම් කටයුතු නවතා දැමූ ව්‍යාපෘති දෙක වෙනුවෙන් ඇස්තමේන්තුගත මුදලට සමාන වේ.

15.13. ගෘහස්ථ කොම්පෝස්ට් බඳුන්, කසළ එකතු කිරීමේ බඳුන් සහ බැග පළාත් පාලන ආයතන, පාසැල්, ආගමික් සිද්ධස්ථාන සහ අනෙකුත් ආයතන සඳහා ලබා දීම.

ගෘහස්ථව ජනනය වන නාගරික කසළ වල ඇති දිරාපත් වන කාබනික කොටස බැහැරලීම සඳහා කොම්පෝස්ට් බඳුන් භාවිතය ජනප්‍රිය කිරීම පිළිසරු ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලබයි. මෙහිදී කොම්පෝස්ට් බඳුන් වටිනාකමෙන් 50% ක් පිළිසරු ව්‍යාපෘතිය විසින් දරන අතර ඉතිරිය වූ 50% ක මුදල අදාල පළාත් පාලන ආයතනය සහ කොම්පෝස්ට් බඳුන පරිහරණය කරන පාරිභෝගිකයා විසින් දැරිය යුතු වේ.
කොම්පෝස්ට් බඳුන් සඳහා ඇති අධික ඉල්ලුම නිසා 2011 වසරේ දී තෙවැනි අධියර යටතේ නවත් කොම්පෝස්ට් බඳුන් 5000 ක් මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව මිලදී ගත් අතර එම බඳුන් පළාත් පාලන ආයතන සහ අනෙකුත් ආයතන අතර ඔවුන්ගේ ඉල්ලුම අනුව බෙදා හරින ලදි. (පළමු අදියර යටතේ කොම්පෝස්ට් බඳුන් 8000 ක් ද දෙවන අදියර යටතේ කොම්පෝස්ට් බඳුන් 17000 ක් මිලදී ගන්නා ලදි.)

කොම්පෝස්ට් බඳුන් 5000 ක් මිලදී ගැනීමට සහ ප්‍රවාහනය සඳහා වූ ටෙන්ඩරය වසර 2010 දී පුවත්පත් වල පල කරන ලදි.

පරිසර අමාත්‍යාංශයේ ලේකම්ගේ සහභාගිත්වයෙන් යුත් අමාත්‍ය ප්‍රසම්පාදන කමිටුව විසින් ටෙන්ඩර් පත්‍ර විශ්ලේෂණය කර අනතුරුව අදාල ටෙන්ඩරය 2011 ජනවාරි 12 වන දී මහරගම, නාවින්න ආර්.ජී.සී. පොලිමර් පෞද්ගලික ආයතනයට ප්ලාස්ටික් කොම්පෝස්ට් බඳුන් 5000ක් සැපයීම සහ ප්‍රවාහනය වෙනුවෙන් මුළු මුදල රු.12,749,968.00 ක මුදලට පිරිනමන ලදි. මෙහිදී මැටි බඳුන් රහිතව එක් බඳුනක මිල රු. 2,276.78 ක් විය.

තෙවන අදියර යටතේ පිළිසරු ව්‍යාපෘතිය විසින් කොම්පෝස්ට් බඳුන් 4,277 ක් රු. 1,275.00 ක් වැනි වූ මුදලකට පහත සඳහන් පළාත පාලන ආයතන සහ අනෙකුත් ආයතන අතර බෙදා හරින ලදි.

තෙවන අදියර යටතේ ප්ලාස්ටික් කොම්පෝස්ට් බඳුන් ලබා දුන් පළාත් පාලන ආයතන

පළාත් පාලන ආයතනය	සපයන ලද ප්ලාස්ටික් කොම්පෝස්ට් බඳුන් සංඛ්‍යාව
කඩුගන්නාව නගර සභාව	100
මාවනැල්ල ප්‍රාදේශීය සභාව	200
ගල්ගමව ප්‍රාදේශීය සභාව	100
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව	75
ගම්පහ ප්‍රාදේශීය සභාව	600
මීරිගම ප්‍රාදේශීය සභාව	75
කළුතර නගර සභාව	150
ජා - ඇල ප්‍රාදේශීය සභාව	1250
ගොඩකවෙල ප්‍රාදේශීය සභාව	100

පළාත් පාලන ආයතනය	සපයන ලද ප්ලාස්ටික් කොම්පෝස්ට් බඳුන් සංඛ්‍යාව
කඩුවෙල නගර සභාව	51
හාලිඇල ප්‍රාදේශීය සභාව	50
නාරම්මල ප්‍රාදේශීය සභාව	150
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව	250
කළුතර ප්‍රාදේශීය සභාව	210
කෑගල්ල නගර සභාව	50
වාරියපොල ප්‍රාදේශීය සභාව	100
කළුතර ප්‍රාදේශීය සභාව	60
බියගම ප්‍රාදේශීය සභාව	300
අලවිව ප්‍රාදේශීය සභාව	100
වත්තල ප්‍රාදේශීය සභාව	200
අම්පාර නගර සභාව	156
ජා - ඇල ප්‍රාදේශීය සභාව	250
මුළු එකතුව	**4,277**

තෙවන අදියර යටතේ ප්ලාස්ටික් කොම්පෝස්ට් බඳුන් ලබාදුන් ආගමික් සිද්ධස්ථාන, පාසැල් සහ අනෙකුත් ආයතන

පාසැල්	ලබා දුන් කොම්පෝස්ට් බඳුන් සංඛ්‍යාව
අයි.එල්.එම්. සම්සුධීන් විද්‍යාලය, බේරුවෙල	2
මෙස්සලා ප්‍රාථමික් විද්‍යාලය, බේරුවෙල	1
මාලිගහහේන මුස්ලිම් මහා විද්‍යාලය, බේරුවෙල	2
බේරුවෙල බෞද්ධ කනිෂ්ඨ විද්‍යාලය	2
බේරුවෙල අරියවංශ මහා විද්‍යාලය	2
අල් ෆාසියාතුල් නස්රියා මුස්ලිම් බාලිකා මහා විද්‍යාලය, බේරුවෙල	2
හලාවකන්ද ප්‍රාථමික විද්‍යාලය, බේරුවෙල	1
බේරුවෙල ප්‍රාථමික විද්‍යාලය	1
අල් හියුමස්රා මධ්‍ය මහා විද්‍යාලය, බේරුවෙල	3
බේරුවෙල රෝමානු කතෝලික පාසැල	2
ඩී.එස්. සේනානායක මධ්‍ය මහා විද්‍යාලය, බේරුවෙල	2
නලීම් හජ්ජියාර් බාලිකා විද්‍යාලය, බේරුවෙල	2
බුත්තල ප්‍රාදේශීය සභාව (දැයට කිරුළ වැඩසටහන යටතේ පාසැල් 11 ට ලබා දීම)	15
කිරිඇල්ල සිරි දේවකිත්ත ප්‍රාථමික විද්‍යාලය, කිරිඇල්ල (රත්නපුර)	2
පිටුමිපේ කණිෂ්ඨ විද්‍යාලය, පාදුක්ක	1

පාසැල්	ලබා දුන් කොම්පෝස්ට් බඳුන් සංඛ්‍යාව
මාදම්පේ මධ්‍ය මහා විද්‍යාලය, මාදම්පේ, කුලිගොඩ	1
තලංගම ලංකා සභා කණිෂ්ඨ විද්‍යාලය, බත්තරමුල්ල	1
සංඝමිත්තා බාලිකා විද්‍යාලය, කොළඹ 10	2
බණ්ඩාරනායක මධ්‍ය මහා විද්‍යාලය, වේයන්ගොඩ	2
පින්නකැලේ වත්ත ප්‍රාථමික විද්‍යාලය, දිවුලපිටිය	2
මුස්ලිම් කාන්තා විද්‍යාලය, කොළඹ 04	1
සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය, නුගේගොඩ	4
ගෝතමි බාලිකා විද්‍යාලය, ගම්පහ	2
කැගල්ල ගොන්ගල කණිෂ්ඨ විද්‍යාලය	1
සිරි සාරානන්ද මහා විද්‍යාලය, කුලියාපිටිය	2
කෙ/දෙහි/ මුරුත්තෙට්ටුව කණිෂ්ඨ විද්‍යාලය	1
කෙ/ කඩිගමුව විද්‍යාලය	1
ඇරැවිවල ධර්මපාල විද්‍යාලය	3
ගොඩකවෙල රාහුල ජාතික පාසැල	2
ශාන්ත ඇන්ඩෘ මධ්‍ය මහා විද්‍යාලය, පුත්තලම	1
පී/ ආනන්ද ජාතික පාසැල	1
ශාන්ත ඇන්ඩෘ ප්‍රාථමික පාසැල, පුත්තලම	1
සෙම්මන්දලුව කණිෂ්ඨ විද්‍යාලය	1
සහිරා ජාතික පාසැල, පුත්තලම	1
පී/ ෆාතිමා බාලිකා මහා විද්‍යාලය	1
පී/ හින්දු මධ්‍ය මහා විද්‍යාලය	1
තල්දිය මුස්ලිම් මහා විද්‍යාලය	1
පී/ ශාන්ත මරියා දෙමළ මහා විද්‍යාලය	1
පී/ මනල්කුන්දුරු මුස්ලිම් විද්‍යාලය	1
පී/ ශනිබ් මුස්ලිම් කාන්තා ප්‍රාථමික විද්‍යාලය	1
සහිරා ප්‍රාථමික පාසැල	1
තම්බපන්නි ඇබඩීන් මුස්ලිම් විද්‍යාලය	1
ජනාධිපති විද්‍යා විද්‍යාලය, පුත්තලම	1
ජෝශප් වාස් මධ්‍ය මහා විද්‍යාලය	4
ශාන්ත මරියා ප්‍රාථමික පාසැල	1
ශා/වෙන්/ පොටුවටවාන ශ්‍රී ජිනරතන විද්‍යාලය	2
වෙන්/ නෙයිනමඩම මහා විද්‍යාලය	2
වෙන්/ බණ්ඩිරිප්පුව ප්‍රාථමික විද්‍යාලය	1
වෙන්/ නිමල මාරියා විද්‍යාලය	1
වෙන්/ දන්කොටුව බාලිකා මහා විද්‍යාලය	4

පාසැල්	ලබා දුන් කොම්පෝස්ට් බඳුන් සංඛ්‍යාව
වෙන්/ රෝමානු කතෝලික විද්‍යාලය	1
බෞද්ධ කාන්තා විද්‍යාලය, කිරිමැටියන	1
වෙන්/ හල්දන්දුවන බෞද්ධ විද්‍යාලය	1
ශා/ මාර්ටින් ඩී. පෝස් මහා විද්‍යාලය	2
ශාන්ත පවුලේ බාලිකා මහා විද්‍යාලය, වෙන්නප්පුව	4
වෙන්/ ජන්කුරවෙල කණිෂ්ඨ විද්‍යාලය, යොගියන	1
වෙන්/ ශාන්ත පවුලේ ප්‍රාථමික බාලිකා විද්‍යාලය	2
වෙන්/ තඹරවිල රජයේ පාසැල	1
ශා/ ලුණුවිල බෞද්ධ කණිෂ්ඨ විද්‍යාලය	1
ශා/ බොරලැස්ස ශාන්ත ආනාගේ මහා විද්‍යාලය	2
ශා/වෙන්/ ගෝනවිල ශාන්ත ජෝශප් විද්‍යාලය	2
ශා/ශ්‍රී සන්ඝබෝධි මධ්‍ය මහා විද්‍යාලය	3
බෞද්ධ කාන්තා විද්‍යාලය, කිරිමැටියන	2
ශා/වෙන්/ සින්දුකුමාරි විද්‍යාලය	1
ශා/වෙන්/ බොරලැස්ස ප්‍රාථමික විද්‍යාලය	1
කම්මල ශාන්ත ඔඩිලියා කණිෂ්ඨ විද්‍යාලය	1
වෙන්/ ශාන්ත ඇන්ස් කණිෂ්ඨ විද්‍යාලය	1
වෙන්/ ශාන්ත සේවියර් කණිෂ්ඨ විද්‍යාලය	1
එස්.එච්./ ශාන්ත රිටාගේ විද්‍යාලය, තල්දෙක, වෙන්නප්පුව	1
හෝ/ හෝමාගම මහා විද්‍යාලය, හෝමාගම	3
මධ්‍යම පරිසර අධිකාරියේ මාතර දිස්ත්‍රික් කාර්යාලය පිටබැද්දර පාසැල් 23 ක බෙදා හැරීම සඳහා	23
මුළු එකතුව	**149**

ආගමික සිද්ධස්ථාන	ලබා දුන් කොම්පෝස්ට් බඳුන් සංඛ්‍යාව
ශ්‍රී විශුද්ධාරාම මහා විහාරය, වන්දල, රුවන්වැල්ල	2
ශ්‍රී ලුම්බිණි විවේක සේනාසනය, උතුරු තලංගම, බත්තරමුල්ල	2
හොරගම්ලිටිය ශ්‍රී ගංගාරාම විද්‍යාලය, හොරගම්පිටිය	1
මුළු එකතුව	5
අනෙකුත් ආයතන	**ලබා දුන් කොම්පෝස්ට් බඳුන් සංඛ්‍යාව**
රෝඩිනි වර්ණකුල මහතා - මධ්‍යම පරිසර අධිකාරියේ සුභ සාධන සංගමය	1
පන්නල (විශේෂ වැඩසටහන් සඳහා)	102

පරිසර අමාත්‍යාංශය	61
යටිතල පහසුකම් සහ නිවාස සංවර්ධන ව්‍යාපෘතිය, පුත්තලම	335
විශේෂ බලකාය, කොළඹ 07	15
ලෝක පරිසර දිනය - පින්තවල	19
නීති වෛද්‍ය සහ විෂ විද්‍යා ආයතනය	1
පරිසර අමාත්‍යාංශය	4
මධ්‍යම පරිසර අධිකාරියේ කුරුණෑගල කාර්යාලය	1
ජනාධිපති ලේකම් කාර්යාලය	2
රත්මලාන ගුවන්තොටුපොල	3
පොලිස් මූලස්ථානය - කොළඹ	1
සුහසාධක සංගමය - නාගරික සංවර්ධන අධිකාරිය, සෙත්සිරිපාය	1
මුළු එකතුව	**546**

15.13.1. කසළ එකතු කිරීමේ බඳුන් බෙදාහැරීම (විශාල බඳුන් -200 l)

ජාතික ප්‍රසම්පාදන උපාය මාර්ග වලට අනුකූලව වැටි බදු රහිතව ඒකක මිල රු. 2,901.78 ක් වන සේ කසළ එකතු කිරීමේ බඳුන් මහරගම පිහිටි 4260 ක් ආර්.පී.සී. පොලිමර් පෞද්ගලික ආයතනයෙන් මිලදී ගන්නා ලදි. මේ සඳහා වැය වූ මුළු මුදල රු. 12,361,582.80 ක් වූ අතර මෙයට අමතරව වැටි බදු මෙම මුදලට වැටි බදු එකතු කරන ලදි.

කසළ වෙන් කිරීමේ බඳුන් ලබා දුන් ආරෝග්‍ය ශාලා, පාසැල්, ආරක්ෂක කඳවුරු, ආගමික සිද්ධස්ථාන හා අනෙකුත් ආයතන ලබා දුන් ආකාරය පහත පරිදි වේ.

ස්ථානය / වැඩසටහන	තැඹිලි	නිල්	රතු	කොළ	එකතුව	කට්ටල ගණන
යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිසම, ඉසුරුපාය, බත්තරමුල්ල	8	8	8	0	24	8
ලක්විරු සෙවන සාප්පු සංකීර්ණය - සේවා වනිතා හමුදා කඳවුර	1	1	0	1	3	1
56 ඒකකය, කොකලිය, වවුනියාව	0	0	0	2	2	0
පළාත් අධ්‍යාපන කාර්යාලය, ශ්‍රී ජයවර්ධනපුර, බත්තරමුල්ල	1	1	1	0	3	1
පන්නල (විශේෂ වැඩසටහන - ශ්‍රීමාලි නානායම)	15	15	0	15	0	15
බුත්තල ප්‍රාදේශීය සභාව - දැයට කිරුළ 2011	20	20	0	20	60	20
හමුදා කඳවුර -: දිය දහරයි තරු වියනයි,	5	5	5	5	20	5

ස්ථානය / වැඩසටහන	තැඹිලි	නිල්	රතු	කොළ	එකතුව	කට්ටල ගණන
නාවල						
ශ්‍රී ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය	25	25	5	25	80	25
පිටබැද්දර පාසැලට බෙදාහැරීම සඳහා මාතර දිස්ත්‍රික් කාර්යාලයට	23	23	0	23	69	23
පින්නවල මධ්‍ය මහා විද්‍යාලය, පාරිසරික දිනය	101	101	4	101	307	101
මහරගම පොලිස් ස්ථානය	1	1	0	1	3	1
මීගමුව මහනගර සභාව - පාරිසරික දිනය	20	20	0	20	60	20
නීති වෛද්‍ය විද්‍යාලය සහ ව්‍යාධිවේදි ආයතනය	1	1	0	1	3	1
උඩවත්ත සෞඛ්‍ය ග්‍රාම ව්‍යාපෘතිය	2	2	0	2	6	2
ශ්‍රී ලංකා නීති විද්‍යාලය	2	2	0	2	6	2
වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව, බත්තරමුල්ල	3	3	0	3	9	3
නියෝජ්‍ය පරිසර අමාත්‍යතුමාගේ ගම්පොල කාර්යාලය	33	33	0	33	99	33
කිලිනොච්චියේ නාමල් රාජපක්ෂ උත්සවය	90	90	0	90	270	90
කුරුණෑගල කාර්යාලය	1	1	0	1	3	1
රත්මලාන ගුවන්තොටුපල	3	3	0	3	9	3
තලවිල ශාන්ත අන්තෝනි දෙවිමැදුර	25	25	0	25	75	25
මහනුවර පෙරහැර	10	10	0	10	30	10
ගාල්ල ම.ප.අ. කාර්යාලය	5	5	0	5	15	5
කුරුණෑගල ම.ප.අ. කාර්යාලය	80	80	0	80	240	80
යාපනය ම.ප. අධිකාරියේ කාර්යාලය කට්ටල - 51						
උතුරු පළාත් සභාව	3	3	0	3	9	3
යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (5x3)	15	15	0	15	45	15
දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය 09	18	18	0	18	54	18
නල්ලූර් කෝවිල	3	3	0	3	9	3
යාපනය ශික්ෂණ රෝහල	7	7	0	7	21	7
යාපනයේ පාසැල් 5ක් - උඩුවිල් පිරිමි මහා විද්‍යාලය, චුන්නකම්, උඩුවිල්	5	5	0	5	15	5

ස්ථානය / වැඩසටහන	තැඹිලි	නිල්	රතු	කොළ	එකතුව	කට්ටල ගණන
බාලිකා විද්‍යාලය, මයිලිඳදි උතුර කලෙයිමගල් සහා විද්‍යාලය, මයිලනි සහිවා මහා විද්‍යාලය, කන්දෙරොඩි දමිළ කන්දියල් විද්‍යාලය						
හමුදා කඳවුර - බුස්ස	5	5	0	5	15	5
ධර්මායතන විහාරය, නාරාහේන්පිට	4	4	0	4	12	4
පාරිසරික අධ්‍යයන කේන්ද්‍රය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය	35	35	0	35	105	35
මධ්‍යම පරිසර අධිකාරියේ කුරුණෑගල කාර්යාලය (පුත්තලම දිස්ත්‍රික්කයේ පළාත් කාර්යාල සහ මුන්නේස්වරම් කෝවිල) කට්ටල 37						37
මුන්නේස්වර්ම් කෝවිල කට්ටල 3	3	3	0	3	9	0
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම	2	2	0	2	6	0
ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 (16x2=32)	32	32	0	32	96	0
මධ්‍යම පරිසර අධිකාරියේ මහනුවර කාර්යාලය (රෝහල් සහ පළාත් කාර්යාල සඳහා)	106	106	0	106	318	106
මධ්‍යම පළාත්, පලාත් සභාව 01	3	3	0	3	9	0
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කාර්යාල 03	9	9	0	9	27	0
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 36 (36x2=72)	72	72	0	72	216	0
පේරාදෙණිය ශික්ෂණ රෝහල	6	6	0	6	18	0
නාවලපිටිය මූලික රෝහල	4	4	0	4	12	0
මාතලේ මූලික රෝහල	4	4	0	4	12	0
දඹුල්ල මූලික රෝහල	4	4	0	4	12	0
නුවරඑළිය මූලික රෝහල	4	4	0	4	12	0
හෝමාගම මූලික රෝහල	4	4	0	4	12	4
සබරගමුව පළාත - කට්ටල 74						
සබරගමුව පළාත - පළාත් සභාව - 01	3	3	0	3	9	3
සබරගමුව පළාත - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 02	6	6	0	6	18	6
සබරගමුව පළාත - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 28x2	56	56	0	56	168	56

ස්ථානය / වැඩසටහන	තැඹිලි	නිල්	රතු	කොළ	එකතුව	කට්ටල ගණන
බලන්ගොඩ මූලික රෝහල	3	3	0	3	9	3
කහවත්ත මූලික රෝහල	3	3	0	3	9	3
කරවනැල්ල මූලික රෝහල	3	3	0	3	9	3
වැතර දිස්ත්‍රික් රෝහල	2	2	2	2	8	2
කුරුණෑගල ප්‍රාදේශීය සභාව	1	1	0	1	3	1
දකුණු පළාත - කට්ටල 130						
බලපිටිය මලික රෝහල	4	4	0	4	12	4
කරාපිටිය ශික්ෂණ රෝහල	5	5	0	5	15	5
මහමෝදර ශික්ෂණ රෝහල	3	3	0	3	9	3
තංගල්ල දිස්ත්‍රික් රෝහල	3	3	0	3	9	3
මාතර මූලික රෝහල	6	6	0	6	18	6
හම්බන්තොට මූලික රෝහල	3	3	0	3	9	3
දකුණු පළාත - පළාත් සභාව	3	3	0	3	9	3
මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	3	3	0	3	9	3
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	3	3	0	3	9	3
ගාල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (කට්ටල 19x2)	38	38	0	38	114	38
මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (කට්ටල 16x2)	32	32	0	32	96	32
හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (කට්ටල 12x2)	24	24	0	24	72	24
ඌව පළාත - කට්ටල 67						
ඌව පළාත - පළාත් සභාව	3	3	0	3	9	3
බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	3	3	0	3	9	3
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	3	3	0	3	9	3
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (15x2)	30	30	0	30	90	30
මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (11x2)	22	22	0	22	44	22
මහියංගනය මූලික රෝහල	3	3	0	3	9	3
දිවතලාව මූලික රෝහල	3	3	0	3	9	3
උතුරු මැද පළාත - කට්ටල 83						
මැදිරිගිරිය මූලික රෝහල	3	3	0	3	9	3
තඹුත්තේගම මූලික රෝහල	3	3	0	3	9	3
කැඹිතිගොල්ලෑව මූලික රෝහල	3	3	0	3	9	3

ස්ථානය / වැඩසටහන	තැඹිලි	නිල්	රතු	කොළ	එකතුව	කට්ටල ගණන
උතුරු මැද පළාත - පළාත් සභාව	3	3	0	3	9	3
අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	3	3	0	3	9	3
පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	3	3	0	3	9	3
අනුරාධපුරය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (23x2)	46	46	0	46	138	46
පොළොන්නරුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (7x2)	14	14	0	14	42	14
අනුරාධපුරයේ ශ්‍රී මහා බෝධිය	5	5	0	5	15	5
නැගෙනහිර පළාත - කට්ටල 110						
නැගෙනහිර පළාත - පළාත් සභාව	3	3	0	3	9	3
අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	3	3	0	3	9	3
ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	3	3	0	3	9	3
මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	3	3	0	3	9	3
අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (19x2)	38	38	0	38	114	38
මඩකලපුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (13x2)	26	26	0	26	78	26
ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (11x2)	22	22	0	22	44	22
මඩකලපුව ශික්ෂණ රෝහල	3	3	0	3	9	3
වාලච්චේනිය මූලික රෝහල	3	3	0	3	9	3
කන්තලේ මූලික රෝහල	3	3	0	3	9	3
කල්මුනේ මූලික රෝහල - උතුර	3	3	0	3	9	3
මධ්‍යම පරිසර අධිකාරියේ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය 45						
ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	3	3	0	3	9	3
ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (13x2)	26	26	0	26	78	26
කැළණිය විහාරය	3	3	0	3	9	3
වතුපිටිවල මූලික රෝහල	4	4	0	4	12	4
මීගමුව මූලික රෝහල	4	4	0	4	12	4
ගම්පහ මූලික රෝහල	5	5	0	5	15	5
පන්නල මහා විද්‍යාලය, ජාතික පාසැල	5	5	0	5	15	5
ශ්‍රීපවරබෝධිරාජාරාමය,	1	1	0	1	3	1

ස්ථානය / වැඩසටහන	තැඹිලි	නිල්	රතු	කොළ	එකතුව	කට්ටල ගණන
මානිමාගොඩැල්ල, නූපේ, කොස්ගොඩ						
ගුවන් හමුදා වෛද්‍ය මධ්‍යස්ථානය	4	4	0	4	12	4
ශ්‍රී ලංකා ගුවන් හමුදා ස්ථානය	1	1	0	1	3	1
පොලිස් මූලස්ථානය - කොළඹ	4	4	0	4	12	4
ගුවන්හමුදා සථානය - කොළඹ	1	1	0	1	3	1
පොලිස් මූලස්ථානය - කොළඹ	1	1	0	1	3	1
හක්මන ප්‍රා.ස. (බඳුන් 100 ක් ඉල්ලන ලද අතර බඳුන් කට්ටල 17 ක් මාතර දිස්ත්‍රික් කාර්යාලයේ ඇති (17x3=51) ඉතිරී බඳුන් 49 පමණක් පිළිසරු ව්‍යාපෘතියෙන් ලබා දෙන ලදි.)	17	16	0	16	49	16
මිහිඳු සෙත් මැදුර - දෙහිවල, අත්තිඩිය	3	3	0	3	9	3
කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කොළඹ 12	3	3	0	3	9	3
මලියදේව මහා විද්‍යාලය	3	3	0	3	9	3
මධ්‍යම සංස්කෘතික අරමුදල	20	20	0	20	60	20
ජනාධිපති විද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ	3	3	0	3	9	3
කටාන පොලිස් පීඨය	5	5	0	5	15	5
නියෝජ්‍ය පොලිස්පති, කුරුණෑගල පොලිසිය	8	8	0	8	24	8
කැළණිතිස්ස බලාගාරය, විදුලිබල මණ්ඩලය	8	8	0	8	24	8
ශ්‍රී ලංකා ගුවන් හමුදාව, කොග්ගල	3	3	0	3	9	3
ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව	3	3	0	3	9	3
මෝදර පාබල හමුදාව	4	4	0	4	12	4
මුළු එකතුව	**1429**	**1428**	**0**	**25**	**4139**	**1319**

15.13.2. කසළ එකතු කිරීමේ බඳුන් බෙදා හැරීම (මධ්‍යම ප්‍රමාණයේ බඳුන් - 110)

ජාතික ප්‍රසම්පාදන උපාය මාර්ග වලට අනුකූලව කසළ එකතු කිරීමේ බඳුන් 900 ක් වයඹ පොලිමර් පෞද්ගලික සමාගමෙන් (M/S Wayamba Polymers (Pvt) Ltd) වලදී ගන්නා ලද අතර ඒකක වල වැට් බදු රහිතව රු. 2,297.97 ක් වූ අතර ඒ සඳහා මුළු මුදල 2,068,173.00 ක් වැය වූ අතර ඒ සඳහා වැට් බදු අගයද එකතු විය. මෙම බඳුන් පහත සඳහන් ආයතන වලට බෙදා හරින ලදි.

කසළ වෙන් කිරීමේ බඳුන් පහත සඳහන් ආයතන වලට බෙදා හරින ලදි.

අනු අංකය	ස්ථානය / වැඩසටහන	කොළ	නිල්	තැඹිලි	මුළු එකතුව	බඳුන් කට්ටල සංඛ්‍යාව
1	කුරුඳුවත්ත පොලිස් ස්ථානය	10	10	10	30	10
2	ජාතික තරුණ සේවා සභාව	8	8	8	24	8
3	නියෝජ්‍ය අමාත්‍ය ගරු අබ්දුල් කාදර් මැතිතුමා	1	1	1	3	1
4	බුත්තල දැයට කිරුළ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් කාර්යාලයට	16	16	16	48	16
5	සූරියවැව ප්‍රාදේශීය සභාව (ලෝක කුසලාන ක්‍රිකට් තරඟය සඳහා)	15	15	15	45	15
6	පන්නල (ශ්‍රීමාලි ආපන ශාලාවට)	61	61	61	183	61
7	පින්නවල මධ්‍ය මහා විද්‍යාලය	52	52	52	156	52
8	මුස්ලිම් බාලිකා විද්‍යාලය කොළඹ 04	2	2	2	6	2
9	සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය	3	3	3	9	3
10	ඉසිපතන මහා විද්‍යාලය	3	3	3	9	3
11	පුත්තලම නගර සභාවේ පාසැල	14	14	14	42	14
12	දෙබරවැව	2	2	2	6	2
13	සාරිපුත්ත මහා විද්‍යාලය බුස්ස	1	1	1	3	1
14	ජෝසප්වාස් විද්‍යාලය, වෙන්නප්පුව	4	4	4	12	4
15	කොළඹ ආසියානු ජාත්‍යන්තර පාසැල	1	1	1	3	1
16	විශාකා විද්‍යාලය කොළඹ	4	4	4	12	4
17	නාලන්දා විද්‍යාලය කොළඹ	4	4	4	12	4
18	කුලරත්න මධ්‍ය මහා විද්‍යාලය, ගොඩකවෙල	2	2	2	6	2
19	ඇල්පිටිය සිද්ධාර්ථ මහා විද්‍යාලය	1	1	1	3	1
20	රාහුල ජාතික පාසැල, ගොඩකවෙල	2	2	2	6	2
21	ශාන්ත අන්තෝනිගේ විද්‍යාලය, රක්වාන	1	1	1	3	1
22	වේරහැර ධර්ම විජය විද්‍යාලය	1	1	1	3	1
23	බිබිලෙගම මහා විද්‍යාලය, ගොඩකවෙල	1	1	1	3	1
24	නාලන්දා විද්‍යාලය, කොළඹ	4	4	4	12	4

අනු අංකය	ස්ථානය / වැඩසටහන	කොළ	නිල්	තැඹිලි	මුළු එකතුව	බඳුන් කට්ටල සංඛ්‍යාව
	එකතුව	213	213	213	633	218

15.14. විශාල පරිමාණ / මධ්‍ය පරිමාණ කොම්පෝස්ට්කරණය සහ බිම් පිරවුම් පිළිබඳ මෙහයුම් සහ නඩත්තු කටයුතු පිළිබඳ අදාල පාර්ශවයන් දැනුවත් කිරීම / ඒකාබද්ධ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව අදාල පාර්ශවයන් සහ ව්‍යාපෘති නිලධාරීන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම.

පාර්ශවයන්	පැවැත්වූ දිනය
ආරක්ෂක නිලධාරීන්	26.05.2011 - 27.05.2011
යාපනය දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන නිලධාරීන්	22.06.2011 - 23.06.2011
පළාත් පාලන ආයතන වල නිලධාරීන්	06.07.2011 - 07.07.2011
පිළිසරු ව්‍යාපෘතියෙන් මූල්‍යාධාර ලබන පළාත් පාලන ආයතන වල ප්‍රධානීන්	25.08.2011 - 26.08.2011

ඉහත නිලධාරීන් සඳහා ප්‍රායෝගික පුහුණුව ලබාදීම සඳහා විශේෂ පුහුණු වැඩමුළු සංවිධානය කරන ලදි. මෙහිදී කොම්පෝස්ට්කරණය පිළිබඳ විවෘත අට්ටි ක්‍රමයට අදාලව විෂයානුබද්ධ කරුණු මෙන්ම ප්‍රායෝගික පුහුණුවක් ද ලබාදීම සිදු කෙරේ. බිම් පිරවුම් පිළිබඳ විද්‍යාත්මක ක්‍රමවේදය පිළිබඳ විෂයානුබද්ධ කරුණු ද එයට අදාලව නවීන තාක්ෂණික ක්‍රමවේදයන් ද මෙම පුහුණුවට ඇතුලත්ය.

කෙළොන්නාව කොම්පෝස්ට් අංගනයට නවක වූ සේවකයන්ට නාගරික ඝණ අපද්‍රව්‍ය වලින් කොම්පෝස්ට් සෑදීම පිළිබඳ දින 07 ක ප්‍රායෝගික පුහුණුවක් වැලිගම කොම්පෝස්ට් අංගනයේ දී පැවැත්විනි.

<u>වැලිගම කොම්පොස්ට් අංගනයේ දී පළාත් පාලන ආයතන වල ප්‍රධානීන් සඳහා පැවැත්වූ පුහුණු වැඩමුළුව</u>





සෑම වැඩමුළුවක් අවසානයේ දී ම එහි සාර්ථකත්වය පිළිබඳ විශ්ලේෂණයක් කරනු ලැබේ. මෙහිදී වැඩමුළුවට සහභාගී වූ පිරිසගෙන් 95 ක්ම දක්වා ඇත්තේ මෙම වැඩමුළුව අති සාර්ථක බවත්, වැඩමුළුවේ අන්තර්ගතය, තාක්ෂණික උපයෝගිතාවය, ප්‍රායෝගික පුහුණුවේ සාර්ථකත්වය මෙන්ම ඉදුම් ගිටුම් ලබාදීම පිළිබඳව ඉතා විශිෂ්ඨ ප්‍රතිචාරයක් ලබා දී තිබුණි.

15.15. කසළ කළමනාකරණ ප්‍රචාරක ක්‍රියාකාරකම්

15.15.1 ප්‍රදර්ශන

ප්‍රදර්ශන වලට සහභාගී වීමේ මූලික අරමුණක් වනුයේ විවිධ පාර්ශවයන් විශේෂයෙන් මහජනයා සහ පාසල් ළමුන්ට කමවත් කසළ කළමනාකරණ ක්‍රමවේදයක් පිළිබඳව අවබෝධයක් ලබා දීම වේ. මෙමඟින් පිළිසරු ව්‍යාපෘතිය සහ එහි ක්‍රියාකාරකම් පිළිබඳව ද දැණුවත් කිරීමට අවස්ථාව උදා වේ. තවමත් සමහරක් කසළ ප්‍රතිකර්ම ක්‍රමවේදයන් සහ බැහැරලීමේ ක්‍රමවේදයන් මෙරටට අලුත් වූයෙන් ඒ සඳහා ආකෘති භාවිතා කරමින් ඒවායේ ක්‍රමවේදය සහ ක්‍රියාකාරිත්වය පැහැදිලි කිරීම මෙම ප්‍රදර්ශන වලදී සිදු කෙරේ.

ප්‍රධාන වශයෙන් පහත සඳහන් ක්‍රියාකාරකම් පිළිබඳව ප්‍රදර්ශන වලදී දැණුවත් කිරීම් සිදු කරනු ලැබේ.

- සම්මත වර්ණ වලට අනුකූලව කසළ වෙන් කිරීම
- කසළ අවම කිරීම
- කොම්පෝස්ටිකරණය (ගෘහස්ථ ක්‍රමවේදය සහ විවෘත අට්ටි ක්‍රමය භාවිතයෙන් කොම්පෝස්ට් සෑදීම)
- සනීපාරක්ෂක කසළ රඳවන
- ශ්‍රී ලංකාව තුළ සහ අන්තර්ජාතික වශයෙන් ඉහත තාක්ෂණික ක්‍රමවේදයන්ගේ භාවිතය

පහත සඳහන් ප්‍රදර්ශන වලට පිළිසරු ව්‍යාපෘතියේ නිලධාරීන් සහභාගී වූ අතර එහිදී දැනුවත් කිරීමේ ක්‍රමවේදය ලෙස ප්‍රදර්ශන පුවරු, බැනර්, ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය, ආකෘති, අත් පත්‍රිකා, පෝස්ටර් සහ කැලැන්ඩර් භාවිතා කරමින් අවශ්‍ය පණිවුඩය රට තුලට ගෙන යන ලදි.

වගුව : පිළිසරු ව්‍යාපෘතිය සහභාගී වූ ප්‍රදර්ශන

අංකය	ප්‍රදර්ශනය	ස්ථානය	දිනය
1	එඩෙක්ස් (EDEX) ප්‍රදර්ශනය 2011	බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව	2011 ජනවාරි
2	දැයට කිරුළ 2011	අනුරාධපුරය	පෙරවාරි 4-10
3	සොබා 2011 - ජාතික පාරිසරික දිනට සමගාමීව	පින්නවල මධ්‍ය මහා විද්‍යාලය	2011 ජුනි 05
4	රට සරු පිළිසරු කාටූන් ප්‍රදර්ශනය	පින්නවල මධ්‍ය මහා විද්‍යාලය	2011 ජුනි 05
5	දෙහිඅත්තකන්ඩියේ මහජන ක්‍රීඩාංගනයේ පැවති ප්‍රදර්ශනය	දෙහිඅත්තකන්ඩිය	2011 ජුනි 06 සහ 07
6	මතුගම සරණතිස්ස මහා විද්‍යාලයේ පැවති ප්‍රදර්ශනය	මතුගම	2011 අගෝස්තු
7	ගොවිජන උදානය	ගල්ගමුව	2011 සැප්තැම්බර්
8	රාජකීය විද්‍යාලයේ පැවති ප්‍රදර්ශනය	කොළඹ	2011 සැප්තැම්බර්
9	හේනේගම මධ්‍ය මහා විද්‍යාලයේ පැවති ප්‍රදර්ශනය	හේනේගම	2011 ඔක්තෝබර්
10	රටසරු පිළිසරු කාටූන් ප්‍රදර්ශනය	ජාතික පුස්තකාල	2011 නොවැම්බර්

11	කළුතර මහජන ක්‍රීඩාංගනයේ පැවති ප්‍රදර්ශනය	කළුතර	2011 නොවැම්බර්
12	ස්ත්‍රී මේලා	බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව	2011දෙසැම්බර්
13	බොඩිලයින් පෞද්ගලික ආයතනයේ පවුල් දිනය ප්‍රදර්ශනය	හොරණ	2011 දෙසැම්බර්
14	නත්තල් උත්සව ප්‍රදර්ශනය	ජා ඇල	2011 දෙසැම්බර්
15	කිරිඳිවැල මධ්‍ය මහා විද්‍යාලයේ 50 වෙනි සංවත්සර ප්‍රදර්ශනය	කිරිඳිවැල	2011 දෙසැම්බර්









දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය 2011

15.15.2. පිළිසරු ව්‍යාපෘතිය මඟින් ඉදි කර නිමා කරන ලද කසළ කළමනාකරණ ව්‍යාපෘති විවෘත කිරීමේ උත්සව වෙනුවෙන් පැවැත් වූ දැණුවත් කිරීමේ වැඩමුළු

කසළ කළමනාකරණය පිළිබඳ මහජනයා දැනුවත් කිරීමේ වැදගත්කම මත පිළිසරු ව්‍යාපෘතියේ තාක්ෂණික හා මූල්‍ය අනුග්‍රහය යටතේ විවිධ පළාත් පාලන ආයතන වල ඉදි කරන ලද කසළ කළමනාකරණ ව්‍යාපෘති වල මල් ගල තබන අවස්ථාවේ හෝ විවෘත කරන අවස්ථාවේ දී විවිධ වූ අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත් විණි. මෙම අවස්ථාවලට සාමාන්‍ය ජනයා සහ පාසල් ළමුන් විශාල ප්‍රමාණයක් සහභාගී වන බැවින් මෙවැනි වැඩසටහන් මඟින් කසළ කළමනාකරණය පිළිබඳ පුළුල් ප්‍රචාරයක් ලබා දීමට එමඟින් අවසථාව උදා විය.

කළුතර පොහොර වත්තේ ඉදි කරන ලද විශාල පරිමාණ කොම්පෝස්ට් ව්‍යාපෘතිය විවෘත කරමින්









පහත ලේඛනයේ දක්වා ඇත්තේ පිළිසරු ව්‍යාපෘතිය මගින් ඉදිකිරීම් කටයුතු නිමා කර විවෘත කරන ලද ව්‍යාපෘති කිහිපයකි.

වගුව : දැණුවත් කිරීමේ වැඩමුළු පවත් වන ලද විවෘත කිරීම / මුල් ගල් තැබීම් සහ ගිවිසුම අත්සන් කිරීමේ උත්සව

අනු අංකය	පළාත් පාලන ආයතනය / රාජ්‍ය ආයතනය	විවෘත කරන ලද දිනය
1	කොළඹ රාජකීය විද්‍යාලය තුල කොම්පෝස්ට් අංගනයක් ඉදි කිරීම ආරම්භ කිරීම ඇතුළුව කසළ කළමනාකරණ ක්‍රමවේදයක් ආරම්භය	2011 ජනවාරි 21
2	කළුතර, පොහොර වත්ත විශාල පරිමාණ කොම්පෝස්ට් අංගනය විවෘත කිරීම	2011 මාර්තු 1
3	කුරුණෑගල කොම්පෝස්ට් අංගනය සඳහා මුල්ගල තැබීමේ උත්සවය	2011 ඔක්තෝබර්
4	කොබෙයිගනේ කොම්පෝස්ට් අංගනය විවෘත කිරීම	2011 නොවැම්බර්

15.15.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සහ සනීපාරක්ෂක කසළ රඳවනයට අදාලව වාර්තාමය වැඩසටහන් සහ වාර්තාමය නාට්‍ය නිෂ්පාදනය සහ විකාශනය

- පාරිසරික මාසය වෙනුවෙන් ගුවන් විදුලි සංස්ථාවේ නාලිකා තුනක් හරහා පණිවුඩ ප්‍රචාරය කිරීම
- ගුවන් විදුලි නාලිකාවක් තුළින් "රට සරු පිළිසරු" වාර්තාමය නාට්‍ය ප්‍රචාරය කිරීම
- යටියන්තොට ප්‍රාදේශීය සභාව සහ කැගල්ල නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති පාදක කර ගනිමින් සොබා කෙත රූපවාහිනී වැඩසටහන් විකාශනය කිරීම
- යාපනය දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන වල ප්‍රධානීන් සඳහා පැවැත් වූ දැණුවත් කිරීමේ වැඩමුළුවට සමගාමීව දමිළ ගුවන් විදුලි වැඩසටහනක් ප්‍රචාරය කිරීම

15.15.4. පුවත්පත් වල / සමරු කළාප වල දැන්වීම් පළ කිරීම

- දෙරණ ප්‍රජා සංවර්ධන පදනම සඳහා වූ සමරු කළාපයේ දැන්වීමක් පළ කිරීම
- හරිත වන සංසන්දය මගින් සංපාදිත සමරු කලාපයක් සඳහා දැන්වීමක් පළ කිරීම
- ශාන්ත ජෝශප් විද්‍යාලයේ නත්තල් වෙනුවෙන් සංපාදිත සමරු කළාපය වෙනුවෙන් දැන්වීමක් පළ කිරීම
- ශාන්ත ජෝශප් විද්‍යාලයේ නිවාසාන්තර ක්‍රීඩා උළෙල වෙනුවෙන් සංපාදිත සමරු කළාපයේ දැනිවීමක් පළ කිරීම
- ක්‍රමවත් කසළ කළමනාකරණ ක්‍රමවේදයක් පිළිබඳව ජාතික පාරිසරික දිනය වෙනුවෙන් පුවත්පත් දැන්වීමක් පළ කිරීම

15.15.5 පාරිසරික සංරක්ෂණය පිළිබඳව මාධ්‍යකරුවන් දැනුවත් කිරීමේ ජාතික වැඩමුළුව

පාරිසරික සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව මාධ්‍යකරුවන් දැනුවත් කිරීම සඳහා 2011 දෙසැම්බර් මස 17 සහ 18 යන දින වල ජාතික මට්ටමේ දෙදින වැඩමුළුවක් පැවැත්විණි. මෙම වැඩමුළුවට 2011 දෙසැම්බර් මස 17 සහ 18 යන දින වල කල්පිටිය, මාරවිල සහ කුලියාපිටිය යන ප්‍රදේශ වල පැවැත්විණි.

මෙම වැඩමුළුව සඳහා පිළිගත හැකි ආයතන වලින් ජාතික මට්ටමේ මාධ්‍යවේදීන් 50ක පමණ සහභාගි විය. සහභාගී වූවන්ට අක්‍රමවත් කසළ බැහැරලීමේ පාරිසරික, ආර්ථිකමය - සමාජමය ගැටළු, සහ අනෙකුත් ගැටළු වලට නිරාවරණය වීමේ අවස්ථාවක් උදා විය. කොම්පෝස්ට්කරණයේ විද්‍යාත්මක පසුබිම මෙන්ම නාගරික ඝණ අපද්‍රව්‍ය වලින් කොම්පෝස්ට් නිෂ්පාදනයේ දී ඒවායේ ගුණාත්මක භාවය පවත්වා ගැනීම සඳහා තිබිය යුතු විවිධ වූ භෞතික නිර්නායක පිළිබඳව අත්දැකීමක් ලබා ගැනීමට මෙම වැඩමුළුව මගින් අවස්ථාව උදා විය.

කල්පිටිය, පුත්තලම, මාරවිල සහ කුලියාපිටිය ප්‍රදේශ වල පැවති මාධ්‍යකරුවන් දැනුවත් කිරීමේ ජාතික වැඩමුළුව









15.15.6 අනෙකුත් වැඩසටහන්

1. "දිය දහරයි තරු වියනයි" වැඩ සටහන සංවිධානය කිරීම.
2. කටුගම්පොළ ප්‍රදේශයේ ආගමික සිද්ධස්ථාන සහ අනෙකුත් රාජ්‍ය ආයතන වලට කොම්පෝස්ට් බඳුන් සහ කසළ වෙන් කිරීමේ බඳුන් බෙදා හැරීමේ උත්සවය සංවිධානය කිරීම.
3. කසළ වෙන් කිරීම පිළිබඳව බූස්ස ශ්‍රී නිගෝධාරාමයේ දහම් පාසල් සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම.
4. ගරු පරිසර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් බස්නාහිර පළාතේ පිළිසරු පිවිතුරු පාසල් සඳහා ත්‍යාග ප්‍රධානය කිරීමේ උත්සවය සංවිධානය කිරීම.
5. පුත්තලම දිස්ත්‍රික්කයේ සියළුම පළාත් පාලන ආයතන සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් සංවිධානය කිරීම.
6. යාපනයේ දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන වල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත් වීම.
7. වෙයන්ගොඩ දිස්ත්‍රික්කයේ පාසල් 100 ක විදුහල්පති වරුන් සඳහා පිළිසරු පිවිතුරු පාසල් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත් වීම.

ගිනොට මධ්‍ය මහා විද්‍යාලයේ පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩමුළුව







මධ්‍යම පරිසර අධිකාරියේ පැවැත් වූ පිළිසරු පිටිතුරු පාසල් සඳහා ත්‍යාග ප්‍රධානෝත්සවය



කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාසල් 100 ක විදුහල්පති වරුන් සඳහා පිළිසරු පිටිතුරු පාසල් පිළිබඳව පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩමුළුව





රාජකීය විද්‍යාලය සඳහා කුඩා පරිමාණ කොම්පෝස්ට් අංගනයක් ඉදි කිරීම සඳහා මූල්‍යාධාර ලබා දීම







ආගමික සිද්ධස්ථාන හා රාජ්‍ය ආයතන සඳහා කොම්පෝස්ට් බඳුන් සහ කසළ වෙන් කිරීමේ බඳුන් ලබා දීම.



කොනලාවල ආරක්ෂක විද්‍යාපීඨයේ කොම්පෝස්ට් අංගනය විවෘත කිරීම





යාපනය දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත් වීම.





පළාත් පාලන ආයතන සඳහා පහසුකම් සැලසීම





ජාතික හරිත උළෙල





15.16.මූල්‍ය ප්‍රගතිය 2011

වසර 2011 දී පිළිසරු ව්‍යාපෘතිය විසින් විවිධ පාර්ශව සඳහා ආධාර ලබා දුන් අතර ඒ අතර දිවයිනේ කසළ කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රධාන වශයෙන් දායක වන පළාත් පාලන ආයතන මේ අතර ප්‍රධාන වේ. පිළිසරු ව්‍යාපෘතිය මඟින් කුඩා - මධ්‍යම සහ මහා පරිමාණ කොම්පෝස්ට් අංගන ඉදි කිරීම, සහනදායී මිල ක්‍රමය යටතේ කොම්පෝස්ට් බඳුන් බෙදා හැරීම, කසළ ප්‍රතිචක්‍රීකරණ පහසුව, ජීව වායු ඒකක, දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩමුළු සහ ඒ සඳහා අවශ්‍ය කරන පත්‍රිකා සහ ආකෘති සැකසීම, තාක්ෂණික වාර්තා සහ මාර්ගෝපදේශ සැකසීම ආදිය සඳහා මූල්‍යාධාර ලබා දීම සිදු කෙරිණ.

ව්‍යාපෘතිය සඳහා 2011 වසරේ දී වෙන් කරන ලද රු. මිලියන 637.3 න් රු. 465,100,000.00 ක මුදලක් 2011 වසරේ පිළිසරු ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් වෙනුවෙන් වැය කරන ලද අතර 73% ක මූල්‍යමය ප්‍රගතියක් පෙන්නුම් කරයි.

කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතන මූල්‍යමය සහ තාක්ෂණික ආධාර මත දොම්පේ ඉදි කෙරෙන සනීපාරක්ෂක කසළ රඳවනය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ වෙන් කරන ලද මුදලෙන් 2011 වසරේ දී රු. 21,100,000.00 ක් වැය කරන ලදි.

15.17. පිළිසරු ව්‍යාපෘතිය - අවසාන ගිණුම්

පිළිසරු ව්‍යාපෘතිය 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය			
	උපලේඛනය	2011	2010
වත්කම්			
ප්‍රවර්තන නොවන වත්කම්	1	24,040,774.89	38,570,412.29
		24,040,774.89	**38,570,412.29**
ප්‍රවර්තන වත්කම්			
බැංකු ශේෂය		11,354,244.81	9,071,815.71
තොග	2	2,004,689.50	200,172,90
පූර්ව ගෙවීම්	3	827,830.80	757,871.44
ලැබිය යුතු අත්තිකාරම්	4	922,224.99	989,345.25
සවලකරණ අත්තිකාරම්	5	37,665,076.68	
සුළු මුදල් අග්‍රිමය		-	21,055.00
ලැබිය යුතු අත්තිකාරම්	6	100,000.00	189,886.32
		52,874,066.78	11,230,146.62
මුළු වත්කම්		76,914,841.67	49,800,558.91
බැරකම්			
උපචිත වියදම්	7	21,478,139.58	4,292,328.32
ගෙවිය යුතු රඳවා ගැනීම	8	15,850,789.36	2,205,453.65
ගෙවිය යුතු පාරිතෝෂික	9	783,195.00	11,500.00
මධ්‍යම පරිසර අධිකාරියට ගෙවිය යුතු	10	300,000.00	6,723,044.76
ආපසු ගෙවන තැන්පතු			
පුනරාවර්තන ප්‍රදාන		38,412,123.94	13,232,326.73
		38,502,717.73	**36,568,232.18**
ශුද්ධ වත්කම්		38,502,717.73	36,568,232.18
ප්‍රාග්ධන ප්‍රදානය සහ අතිරික්තය	11	**38,502,717.73**	**36,568,232.18**

පිළිසරු ව්‍යාපෘතිය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

	2011	2010
(භාවිත කරන ලද) මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මූල්‍ය ප්‍රවාහයන් අතිරික්තය	10,367,647.67	510.40
ක්ෂයවීම් වෙනුවෙන් ගැලපීම	15,682,013.11	15,196,416.47
විලම්භිත ආදායම	(15,682,013.11)	(15,196,416.47)
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය	**10,367,647.67**	510.40
ජංගම වත්කම් වල වැඩිවීම් / අඩුවීම	(39,361,491.06)	
ජංගම බැරකම් වල වැඩිවීම් / අඩුවීම	25,179,797.21	(1,604,639.95)
(භාවිත කරන ලද) මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ		5,082,471.27
(භාවිත කරන ලද) ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ	(3,814,046.18)	
දේපළ හා උපකරණ අත්පත් කර ගැනීම		3,478,341.72
(භවිත කරන ලද) ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	14,529,637.40	
(භාවිත කරන ලද) මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ	10,715,591.22	13,726,829.80
ප්‍රාග්ධන ප්‍රදාන වලින් ලැබීම්		17,205,171.52
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය එකතු කළා	(8,433,162.12)	
වර්ෂය ආරම්භයේ (2011-01-10) මුදල් හා මුදල් වලට සමාන දේ	2,282,429.10	(15,180,125.47)
වර්ෂය අවසානයේ (2011-12-31) මුදල් හා මුදල් වලට සමාන දේ	9,071,815.71	2,025,046.05
		7,046,769.66
	11,354,244.81	**9,071,815.71**

ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති

1. ආයතනික තොරතුරු

නීත්‍ය නෛතික ස්වභාවය

ජාතික වශයෙන් සම්බන්ධීකරණය වූ ප්‍රවේශයක් මගින් අවිධිමත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ගැටළුව විසඳීම අරමුණු කර ගනිමින් "පිළිසරු වැඩසටහන - ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රවේශයක්,

පිළිසරු ව්‍යාපෘතිය ස්ථාපනය කිරීම" යන මැයෙන් යුත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් 2007 දෙසැම්බර් 19 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදි. ඒ අනුව 2008 ජනවාරි 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මධ්‍යම පරිසර අධිකාරියෙහි පිළිසරු ව්‍යාපෘතිය ස්ථාපනය කරන ලදි. මේ ව්‍යාපෘතියේ වැදගත්කම සහ කාලෝචිත අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින්, 2011 ජනවාරි 1 වැනි දින සිට තවත් අවුරුදු තුනක කාලයකට ව්‍යාපෘතිය දීර්ඝ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය දී ඇත.

අරමුණු

පිළිසරු වැඩසටහනේ දැක්වෙන මූලික අරමුණු මෙසේය:-

i. **<u>විධිමත් සම්පත් කළමනාකරණය සහ විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණයක් සහතික කිරීම</u>**

ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ දී නිවැරදි ප්‍රතිපත්තියක් හා උපායමාර්ග භාවිත කිරීම සහ එමඟින් කැලිකසළ බැහැරලීමෙන් අපතේ යන සම්පත් සංරක්ෂණය කිරීම සහ නොවිධිමත් / අයෝග්‍ය ඝන අපද්‍රව්‍ය කළමනාකරණය නිසා බලපෑමට ලක්වන ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීම.

ii. **<u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අදාළ පිරිස් තුළ අවබෝධයක් ඇති කිරීම සහ ඔවුන්ගේ නිපුණතා වැඩි දියුණු කිරීම</u>**

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන ප්‍රවේශය සම්බන්ධයෙන් විශේෂයෙන් ම පළාත් පාලන ආයතන ප්‍රධානීන් සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන් හා ප්‍රාදේශීය පරිසර නිලධාරීන් තුළ අවබෝධයක් ඇති කිරීම සහ ඔවුන් පුහුණු කිරීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරනය හා සම්බන්ධ නිපුණතා වැඩි දියුණු කරනු පිණිස පෞද්ගලික, රාජ්‍ය, රාජ්‍ය නොවන, අධ්‍යාපනික සහ විශේෂඥ දැනුම ඇති පුද්ගලයින් යන අංශවල සහභාගිත්වය ඇතිව අවශ්‍ය වැඩමුළු සංවිධාන කරනු ලැබේ. අවබෝධය ලබා දීමේ වැඩසටහන් වලට පහත දැක්වෙන ඒවා ඇතුළත් වේ.

- "දැයට කිරුළ" ජාතික ප්‍රදර්ශනය වැනි අවස්ථා වලදී ප්‍රදර්ශනය කිරීම
- පාසල්, විශ්වවිද්‍යාල, වෙනත් ආයතන සහ අවස්ථා වලදී පත්‍රිකා සහ පෝස්ටර් බෙදාහැරීම
- අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පොත් සහ වාර්තා ඇතුළුව ලේඛන ප්‍රකාශයට පත් කිරීම
- පාසල්වල සහ විශ්ව විද්‍යාලවල අධ්‍යන වැඩසටහන්
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ සෞඛ්‍යාරක්ෂිත කසළ රැඳවුම් ස්ථාන පිළිබඳ රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන්
- පුවත්පත් ලිපි සහ විශේෂාංග
- පළාත් පාලන ආයතන වල සහ අනෙකත් ආයතන වල ප්‍රධානීන් සඳහා පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

- ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සඳහා රෙදි මලු බෙදා දීම

iii. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වලට සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති ආරම්භ කිරීමට අපේක්ෂාවෙන් සිටින පළාත් පාලන ආයතන වලට අවශ්‍ය තාක්ෂණික දැනුම සහ සම්පත් දීප ව්‍යාප්ත වශයෙන් සැපයීම. එසේ ම, පළාත් පාලන ආයතන වල අතහැර දමන ලද ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති එසේ අතහැර දමනු ලැබීමට හේතු සෙවීමට කටයුතු කිරීම සහ එකී ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම. දිනකට ටොන් 10 කට අඩු අපද්‍රව්‍ය ලබා ගන්නා ඝන අපද්‍රව්‍ය රැඳවුම් ස්ථාන සඳහා ව්‍යාපෘතිය විසින් පළාත් පාලන ආයතන 80 කට වැඩි සංඛ්‍යාවකට සහාය ලබා දී තිබේ.

iv. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන්කරුවන් අධීක්ෂනය කිරීම

ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වගකීම පැවරී ඇත්තේ පළාත් පාලන ආයතන වලටය. නමුත් මහජන පැමිණිලි බහුතරයක් ලැබෙන්නේ පරිසර අමාත්‍යාංශයට සහ මධ්‍යම පරිසර අධිකාරියටය. ඒ නිසා පළාත් පාලන ආයතන වලට අවශ්‍ය සම්පත් හඳුනා ගැනීමත්, විධිමත් පරීදි ඝන අපද්‍රව්‍ය කළමනාකරණයක් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන අයතන වලට සහාය වීමත් සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති පිළිබඳ ප්‍රතිපෝෂණය සිදු කරනු ලැබේ.

v. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය නිසි පරිදි සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම

ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ දී ප්‍රතිචක්‍රීකරණය සඳහා ඇති පහසුකම් වැඩි දියුණු කිරීම සහ වෙළඳපොලක් නිර්මාණය කිරීම මගින් සම්පත් සංරක්ෂණය කිරීම; ප්‍රතිචකකරණය සඳහා සම්පත් සැපයීම පහසු කරවීම සඳහා ගෘහස්ථ මට්ටමේ දී අපද්‍රව්‍ය වෙන් කිරීම ප්‍රචලිත කිරීම. අවශ්‍ය හැම අවස්ථාවලදී ම දිවයින පුරා ඝන අපද්‍රව්‍ය එක් රැස් කිරීමේ මධ්‍යස්ථාන විවෘත කිරීම සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ ලා සහභාගිත්වය වැඩ කිරීම සඳහා මහජනතාව තුළ අවබෝධය ඇති කිරීම. තව ද, ඉතාමත් සහනාදායී මිල ගණන්වලට ගෘහස්ථ කොම්පෝස්ට් බඳුන් සහ අපද්‍රව්‍ය වෙන් වෙන් වශයෙන් රැස් කරන බඳුන් ලබා දීම.

vi. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීම

රජයෙන් සහ අනෙකුත් අරමුදල් සම්පාදන නියෝජිත ආයතන වලින් අරමුදල් එක්රැස් කිරීම මගින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පරමාර්ථ සඳහා විවිධ සංවිධාන මාර්ගයෙන් පළාත් පාලන ආයතන වලට මූල්‍ය පහසුකම් සැලසීම පිණිස කටයුතු කරනු ලැබේ.

vii. අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ බැංකු පද්ධතියක් ස්ථාපනය කිරීම

මේ අපද්‍රව්‍ය බැංකු පද්ධතිය අනුව, ගිණුම් හිමියන්ගෙන් අපද්‍රව්‍ය එකතු කිරීමට කිර්තිමත් බැංකුවක් එකඟ විය යුතු අතර අපද්‍රව්‍ය වල වටිනාකමට සමාන මුදලක් ඔවුන්ගේ බැංකු ගිණුම් වලට බැර කළ යුතුය. එසේ එකතු කරනු ලබන අපද්‍රව්‍ය බැංකුව විසින් ප්‍රතිචක්‍රීකාරකයින්ට විකුණනු ලැබීමෙන් පසු මුදල් බවට පරිවර්තනය කරනු ලැබේ. ජීව වායු ඒකක, රෝහල් සහ හමුදා කඳවුරු ඇතුළු ස්ථාන 19 ක ජීව වායු ඒකක 24 ක් ඉදි කිරීමට දැනට දිවයින

පුරා සිදු කැරෙමින් පවතී.

2. 2011 අවසන් ගිණුම් පිළිබඳ සටහන්
ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්
ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති පිළිබඳ සාරංශය

2.1. පොදු

2.1.1. අනුකූලතා ප්‍රකාශය

පිළිසරු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ශේෂ පත්‍රය සහ අදාළ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ සහ ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති සහ ගිණුම් පිළිබඳ සටහන්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නියම කරනු ලැබ ඇති ශ්‍රී ලංකා ගිණුම් තැබීමේ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කරනු ලැබ ඇත.

2.1.2. අවසන් ගිණුම් සකස් කිරීමේ පදනම

ව්‍යාපෘතියේ අවසන් ගිණුම සකස් කරනු ලැබ ඇත්තේ පොදුවේ පිළිගැනෙන ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති අනුව යමින් ඓතිහාසික පිරිවැය පරිවර්තනයට අනුකූල වන පරිදිය.

ගිණුම් වලට බලපාන උද්ධමනකාරී සාධක වෙනුවෙන් ගැලපීම් සිදු කර ඇත.
යථෝක්ත ගිණුම සකස් කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

2.1.3. තුලනාත්මක තොරතුරු

ව්‍යාපෘතිය විසින් ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති අනුකූල වන ආකාරයෙන් යොදාගනු ලැබ ඇති අතර පූර්ව වර්ෂයේ ප්‍රතිපත්ති වලට ඒවා අනුකූල වේ. වර්තමාන ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි අවශ්‍ය හැම අවස්ථාවලදීම පූර්ව වර්ෂ සංඛ්‍යා නැවත සකස් කරගනු ලැබ ඇත.

2.1.4. දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ

2.1.4.1. පිළිගැනුම සහ අගැයීම

දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ සටහන් කරනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂයවීම අඩු කිරීමෙන් පසු පිරිවැයටය. යම් වත්කමක් අගයෙන් ඉහළ යන විට, එය පවත්වාගෙන යෑමේ ප්‍රමාණයේ වන යම් වැඩි වීමක් වේ නම් එය ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට කෙළින් ම බැර කරනු ලැබේ. දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ යනාදියේ පිරිවැය වන්නේ එකී වත්කමේ අපේක්ෂිත භාවිතය සඳහා වැඩ කරන තත්ත්වයට එය පත් කිරීමේ දී දරනු ලබන යම් වියදමක් වේ නම් එය ද සමඟ එය මිලදී ගැනීමේ හෝ ඉදි කිරීමේ පිරිවැය ය. දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ පිරිවැය වන්නේ පිළිගනු ලබන දිනය වන විට, එනම් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 18 ප්‍රකාරව මිලදී ගත් දිනට, මුදල් වටිනාකමට සමාන මුදලය.

2.1.4.2. ක්ෂය කිරීම

ක්ෂය ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ අදාළ වත්කමේ ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය තුළ එකී ප්‍රමාණය කපා හැරීම සඳහා සියලු ම දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ නැවත ඇගයීමේ පිරිවැය අනුව

සෘජු රේඛීය ක්‍රමය භාවිත කිරීමෙනි.

වත්කම් කාණ්ඩය

රථවාහන	අවුරුදු 04 ට වැඩි
කාර්යාල උපකරණ	අවුරුදු 04 ට වැඩි
ගෘහ භාණ්ඩ	අවුරුදු 10 ට වැඩි
රසායනාගාර උපකරණ	අවුරුදු 10 ට වැඩි
ගොඩනැගිලි	අවුරුදු 40 ට වැඩි

2.1.5. ඉන්වෙන්ටරි

ඉනවෙන්ටරි පිරිවැය

ඉන්වෙන්ටරි පිරිවැය සමන්විත වන්නේ වර්තමාන ඉන්වෙන්ටරි සකස් කරන අවස්ථාවේ දී තිබුණු භාණ්ඩ මිලදි ගැනීමේ දී සිදු කරන ලද පිරිවැයෙනි.

ව්‍යාපෘතිය විසින් ගෘහස්ථ කොම්පෝස්ට් බඳුන් ඉතා සහනදායී මිලකට සපයනු ලබන අතර ජාතික මට්ටමේ උත්සව, පාසල් ප්‍රදර්ශන ආදී අවස්ථාවල කරනු ලබන ඉල්ලීම අනුව, අපද්‍රව්‍ය වෙන වෙන ම රැස් කිරීමේ බඳුන් නොමිලේ සපයනු ලැබේ.

ඉතිරි කොම්පෝස්ට් බඳුන් සහ අපද්‍රව්‍ය රැස් කිරීමේ බඳුන් වල වටිනාකම, ව්‍යාපෘතිය අවසානයේ දී අවසන් ගිණුම සඳහා ගලපනු ලැබ ඇත.

පිළිසරු හිස්වැසුම්, ටී ෂර්ට් සහ රෙදි මලු ප්‍රවර්ධන අයිතම වල වර්ෂාවසාන ශේෂය ද අවසන් තොග වශයෙන් සලකනු ලැබේ.

2.1.6. මුදල් සහ මුදල් වලට සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සකස් කිරීමේ පරමාර්ථය සඳහා මුදල් හා මුදල් වලට සමාන දෑ නිර්වචනය කරනු ලබන්නේ අතැ'ති මුදල් සහ බැංකුවේ ඇති මුදල් වශයෙනි.

2.1.7. බැරකම් සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍රයේ ජංගම බැරකම් වශයෙන් වර්ගීකරණය කරනු ලබන බැරකම් වන්නේ ඉල්ලූ විට ගෙවිය යුතු හෝ ශේෂ පත්‍ර දිනයෙන් වර්ෂයක් තුළ ගෙවිය යුතු බැරකම්ය.

අතීත සිදුවීම් වල ප්‍රතිඵලයක් වශයෙන් නෛතික හෝ වර්ධනාත්මක බැඳීමක් ව්‍යාපෘති සතු වන විට හෝ බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ වල බාහිර ගලා යෑමක් අවශ්‍ය වීමට ඉඩ ඇති විට ප්‍රතිපාදන හා බැරකම් පිළිගනු

ලැබේ.

2.1.8. සේවකයින්ට අවසන් ප්‍රතිලාභ

(අ) නිර්වචනය වූ ප්‍රතිලාභ සැලසුම්

විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම අනුගමනය කරන ලද්දේ 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම පිළිබඳ පනත යටතේ අවශ්‍ය වන පරිදිය.

අංක 16 දරන ශ ලංකා විගණන ප්‍රමිතිය - "විශ්‍රාම පාරිතෝෂික පිරිවැය" ප්‍රකාරව සේවකයාගේ පළමු සේවා වර්ෂයේ සිට විශ්‍රාම පාරිතෝෂික සඳහා වන ප්‍රතිපාදන ව්‍යාපෘති කාර්ය මණ්ඩල ගිණුම් වලට ඇතුළත් කරනු ලැබ ඇත.

(ආ) නිර්වචනය කරන ලද දායක සැලසුම් - සේ.අ.අ. සහ සේ.හා.අ.

නිර්වචනය කරන ලද අර්ථසාධක අරමුදල් දායකත්වයන්ට සහ සේවක භාර අරමුදල් දායකත්වයට සුදුසුකම් ලබන සියලුම සේවකයින්, අදාළ තත්ත්වයන් අනුව අදාළ දායකත්ව අරමුදල්වලට හරවනු ලැබේ.

2.1.9. විලම්බිත ආදායම

2.1.9.1. රජයේ ප්‍රදාන

ක්‍රමානුකූල පදනමක් මත හානි පූරණය කිරීමට අපේක්ෂිත අදාළ වියදම් වලට ගැලපීමට අවශ්‍ය වන කාලසීමාවන් තුළ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට රජයේ ප්‍රදාන එකතු කරනු ලැබේ.

සාධාරණ අගය අනුව මූල්‍ය නොවන ප්‍රදාන ඇතුළුව වත්කම්වලට අදාළ ප්‍රදාන ශේෂ පත්‍රයේ සඳහන් කරනු ලබන අතර අදාළ වත්කම් වල ප්‍රයෝජනවත් ආයු කාලය තුළ ආදායම් ප්‍රකාශයට එකතු කරනු ලැබේ.

2.2. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2.2.1. ආදායම

(අ) රජයේ ප්‍රදාන

ආදායම් ස්වභාවයට සම්බන්ධ ප්‍රදාන, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 24 ප්‍රකාරව, ඒවා ලැබෙන වර්ෂය තුළ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

(ආ) කොම්පෝස්ට් බඳුන් වලින් ලැබෙන ආදායම

කොම්පෝස්ට් බඳුන් වලින් ලැබෙන ආදායම, ඉතා අඩු සහන මිලකට මුදල් පදනමකින් පිළිගනු ලැබ ඇත.

(ඇ) ආපසු නොගෙවනු ලබන තැන්පතු

ආපසු නොගෙවනු ලබන තැන්පතු වලින් වන ලැබීම් විවිධ ආදායම් වශයෙන් සලකා මුදල් පදනමකින් පිළිගනු

ලැබ ඇත.

2.2.2. වියදම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී සහ ව්‍යාපෘතිය තුළ දේපළ, යන්ත්‍ර සහ උපකරණ කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යෑමේ දී දරනු ලබන සියලු වියදම්, නිසි පරිදි ගිණුම් ඉදිරිපත් කිරීමේ දී කාර්ය සාධන ප්‍රකාශයට එකතු කර තිබේ.

2.3. වෙනත් තොරතුරු

මධ්‍යම පරිසර අධිකාරියේ සේවකයින් 5 ක්ද ඇතුළුව සේවකයෝ 35 දෙනෙක් 2011 වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතියේ සේවය කළහ.

උපලේඛනය 01

ප්‍රවර්තන නොවන වත්කම්

	2011-01-01 දිනට ශේෂය	වසර තුළ එකතු කිරීම	වසර තුළ බැහැර කිරීම	31-12-2011 දිනට ශේෂය	සමුච්ඡිත ක්ෂය වීම 01-01-2011	2011 වසරේ ක්ෂය වීම	බැහැර කිරීම මත ක්ෂය වීම	සමුච්චිත ක්ෂය වීම 31-12-2011	ශුද්ධ අගය
රථ වාහන	51,406,752.00	-	-	51,406,752.00	21,115,216.00	12,984,850.34	-	34,100,066.34	17,306,685.66
ගෘහ භාණ්ඩ	2,554,960.50	182,883.00	-	2,737,843.50	490,964.92	276,464.63	-	767,429.55	1,970,413.95
ගොඩනැගිලි (ගරාජය)	1,500,000.00	-	-	1,500,000.00	36,765.82	37,500.00	-	74,265.82	1,425,734.18
උපකරණ	8,677,119.30	443,686.48	-	9,120,805.78	4,208,142.74	2,296,960.68	-	6,505,103.42	2,615,702.37
රසායනාගාර උපකරණ	862,374.60	-	-	862,374.60	53,898.41	86,23746	-	140,135.87	722,238.73
	65,001,206.40	**626,569.48**	-	**65,627,775.88**	**25,904,987.89**	**15,682,013.11**	-	**41,587,001.00**	**24,040,774.89**

සටහන 01

වසර තුළ එකතු වූ ප්‍රවර්තන නොවන වත්කම්

දිනය	විස්තරය	කාණ්ඩය	සංඛ්‍යාව	ප්‍රමාණය	එකතුව
18-10-2011	ලිපිකරු මේස	ගෘහ භාණ්ඩ හා සවිකිරීම	8	115,832.00	
18-10-2011	ඇඳි පුටු (DEO)		7	15,596.00	
18-10-2011	ඇඳි පුටු (අමුත්තන්)		12	26,736.00	
18-10-2011	විධායක මේස		1	16,943.00	
18-10-2011	විධායක පුටු		2	7,776.00	182,883.00
11-04-2011	ලේසර් ජෙට් ප්‍රින්ටර්	උපකරණ	3	141,000.00	
07-02-2011	DVDප්ලේයර්		1	7,134.00	
18-07-2011	වීඩියෝ කැමරා		1	130,999.99	
29-07-2011	සිටුවන පංකා		4	23,400.00	
11-08-2011	ජලය උණුකරන යන්ත්‍ර පොලිතින් සීලර්		1	12,800.00	
26-08-2011	මැෂින්		1	2,700.00	
15-09-2011	ටෙන්ඩර් පෙට්ටිය		1	2,350.00	
29-09-2011	වායු සමීකරණයේ වැස්ම		1	118,502.49	
14-10-2011	විදුලි කේතලය		1	4,800.00	443,686.48
					626,569.48

සටහන 02

ජංගම නොවන වත්කම්වල ක්ෂයවීම

රථවාහන	12,984,850.34
උපකරණ	2,296,960.68
ගෘහ භාණ්ඩ	276,464.63
ගොඩනැගිලි	37,500.00
රසායනාගාර උපකරණ	86,237.46
	15,682,013.11

වැඩි විස්තර සඳහා කාර්ය සාධන ප්‍රකාශය - සටහන 09 - ක්ෂය කිරීම සඳහා ගණනය කිරීම බලන්න

<u>උපලේඛනය 02</u>

තොග

විස්තරය	සංඛ්‍යාව	මුදල	වටිනාකම රු.	
කොම්පෝස්ට් බඳුන	50	2,550.00	127,500.00	C1.3
අපද්‍රව්‍ය රැස්කිරීමේ බඳුන්	350	2,599.00	792,695.00	C1.3
අපද්‍රව්‍ය රැස්කිරීමේ බඳුන්	326	3,250.00	1,059,500.00	
රෙදි මලු	50	93.40	4,670.00	C1.3
ටී ෂර්ට්	34	475.00	16,150.00	D2
පිළිසරු හිස්වැසුම්	33	126.50	4,174.50	D2
එකතුව			**2,004,689.50**	D2

<u>උපලේඛනය 03</u>

ගෙවීම්

දිනය	විස්තරය	මුදල
30-12-2011	රක්ෂණ - ශ්‍රී ලං.ර.සං.	218,212.32
20-09-2011	කාර්යාල කුලී එන්.ඒ.කේ.	320,000.00
30-12-2011	රක්ෂණ - ශ්‍රී ලං.ර.සං.	289,618.48
	එකතුව	**827,830.80**

උපලේඛනය 04

ජංගම වත්කම් - ලැබිය යුතු අත්තිකාරම්

දිනය	වවුචර් අංකය	විස්තර	චෙක්පත් අංකය	මුදල රු.	පසුකාලීනව පියවීම
13-08-2010	P/G/10/77	නුවර පෙරහැර ම.ප.අ. මධ්‍යම පළාත	000502	556,690.74	
20-06-2011	P/G/11/114	මහනුවර මධ්‍යම පරිසර අධිකාරිය	087227	230,000.00	02-01-2012
30-06-2011	P/G/11/124	හරිත ප්‍රදානය සඳහා බ.අ.ජා.ස. ශාලාව වෙන් කිරීම	087282	25,000.00	
05-10-2011	P/G/11/179	කසළ ඇඹරුම් යන්ත්‍රය	087561	30,000.00	
19-11-2011	P/G/11/195	දකුණු ආසියා වැඩසටහනේ බැනර් මුද්‍රණය	175674	15,000.00	02-01-2012
30-11-2011	P/G/11/203	කොමසාරිස්වරුන් පත් කිරීමේ උත්සවය	175764	22,000.00	29-02-2012
01-12-2011	P/T/11/34	දන්ත එකතු කිරීම සඳහා ඉන්ධන අත්තිකාරම්	175766	10,000.00	05-01-2012
02-12-2011	P/T/11/35	දන්ත එකතු කිරීම සඳහා ඉන්ධන අත්තිකාරම්	175772	10,000.00	02-01-2012
06-12-2011	P/G/11/56	උණුසුම් ඇඳුම් අත්තිකාරම්	062555	13,533.75	02-01-2012
26-12-2011	P/G/11/216	කර්මාන්ත සම්ක්ෂණ දන්ත රැස්කිරීම	175842	10,000.00	05-01-2012
				922,224.99	

උපලේඛනය 05

සක්‍රිය කිරීමේ අත්තිකාරම් වල අයවිය යුතු මදල්		
ප්‍රධාන ව්‍යාපෘති	**රු.**	**රු.**
ප්‍රවේශ මාර්ගය - අනුරාධපුරය	1,357,149.20	
කසළ රඳවනය - දොම්පේ	3,785,234.94	
කුඩා කසළ රඳවනය - මාතර	811,378.32	**5,953,762.46**
සුළු ව්‍යාපෘති - පළාත් පාලන ආයතන		
බොරලැස්ගමුව	326,906.64	
ඇල්පිටිය	300,000.00	
පොල්ගහවෙල	350,392.24	
CDF CAMP ගල්කැටියාගම	51,353.97	
Armand Crops	129,478.03	
බෙලිඅත්ත	1,254,606.18	

සක්‍රිය කිරීමේ අත්තිකාරම් වල අයවිය යුතු මදල්		
ප්‍රධාන ව්‍යාපෘති	රු.	රු.
මුලතියන	337,201.44	
මඩවාරච්චි	1,299,527.68	
කැළණිය	1,667,503.23	
නිකවැරටිය ප්‍රාදේශීය සභාව	493,051.30	
රිදීගම	806,906.22	
මාවතගම	1,214,031.53	
මාහෝ ප්‍රාදේශීය සභාව	774,226.51	
තනමල්විල ප්‍රාදේශීය සභාව	360,301.25	
තනමල්විල සෙවනගල	519,164.44	
අඹගමුව	1,029,652.86	
ආනමඩුව	389,824.00	
අම්බලන්තොට	253,348.67	
ඉපොලෝගම	1,208,467.40	
ගලෙන්බිඳුනු වැව	1,280,662.97	
තිරප්පනේ	1,114,405.12	
රඹෑව	1,299,527.68	
කහටගස්දිගිලිය	1,299,527.68	
රාජාංගනය	1,059,049.18	
ගල්නෑව	1,059,049.18	
මහකනදරාවැව හමුදා කඳවුර	369,479.07	
මාතර	200,000.00	
වීරකැටිය	444,269.61	
ජා ඇල	1,707,865.30	
වනාතවිල්ලුව	775,179.33	
පොල්පිතිගම	796,338.60	
අලවිව	1,073,223.68	
රුවන්වැල්ල	1,043,984.58	
හම්බන්තොට	512,638.94	
මාලිම්බඩ	1,129,457.90	
කාන්තන්කුඩි	1,669,226.50	
චාටකව්චේරි	1,121,383.44	
කොබෙයිගනේ - ව්‍යාපෘතිය	96,214.02	
කෑගල්ල	622,729.54	
කැලණිය විශ්ව විද්‍යාලය	271,158.31	31,711,314.22

සක්‍රිය කිරීමේ අත්තිකාරම් වල අයවිය යුතු මදල්		
ප්‍රධාන ව්‍යාපෘති	රු.	රු.
		37,665,076.68

උපලේඛනය 06

ලැබිය යුතු

දිනය	විස්තරය	මුදල රු.
09-12-2009	ඉන්ධන තැන්පතු නදීෂා ට්‍රැවල්ස්	100,000.00
		100,000.00

උපලේඛනය 07

උචිත වියදම්

විස්තරය	මුදල	ගෙවූ දිනය
කොළොන්නාව කොම්පෝස්ට් නිෂ්පාදනය	108,572.37	30-01-2012
ගෝනදිකවත්ත කොම්පෝස්ට් නිෂ්පාදනය	22,423.95	30-01-2012
හික්කඩුව මොන්රෝවියා වත්ත කොම්පෝස්ට් නිෂ්පාදනය	157,875.45	30-01-2012
EDCFසැලසුම් අංශය	80,092.81	
අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රවර්ධනය	911,680.28	
අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රවර්ධනය	40,584.52	11-01-2012
ජීව වායු යන්ත්‍රාගාර ඉදි කිරීම	5,998.21	23-01-2012
ඉ - අපද්‍රව්‍ය ජෛව වෛද්‍ය	1,356,654.19	01-02-2012
මුද්‍රණ වියදම් ප්‍රතිපාදනය	515,000.00	
ශ්‍රී ල.ගු.වි. සහ නිෂ්පාදන ගාස්තු	258,300.00	13-02-2012
අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රවර්ධනය	1,139,820.40	09-01-2012
GIS මූලික තොරතුරු පද්ධතිය	22,896.70	02-01-2012
රසායනාගාර උපකරණ	4,208,400.00	
මුද්දර බද්ධ	2,150.00	30-01-2012
ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය	181,357.50	23-01-2012
ප්‍රවාහන, ඉන්ධන කුලී	159,474.70	06-01-2012
වාහන නඩත්තුව	75,793.20	04-01-2012
ව්‍යාපෘති කාර්ය මණ්ඩල වැටුප්	206,436.20	30-01-2012
අවලංගු කළ චෙක්පත්	188,416.91	
සන්නිවේදන / තැපැල් ගාස්තු	199,104.23	11-01-2012

උපදේශන ගෙවීම් 4 කණ්ඩායම	904,211.81	17-02-2012
උපදේශන ගෙවීම් - ඩබ්.පී.එස්.පී. ජයසූරිය	796,569.29	
RPC පොලිමර් කොම්පෝස්ට් බඳුන් නිෂ්පාදනය	1,555,493.90	
නිකිනි ඔටොමේෂන්	8,380,832.96	03-02-2012
	21,478,139.58	

උපලේඛනය 08

ගෙවිය යුතු රැඳවුම් ගාස්තු

විස්තරය	මුදල රු.	මුදල රු.
ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘති වලට ගෙවිය යුතු රැඳවුම් ගාස්තු		
කොළොන්නාව - ස්ක්වෙයා මෙෂ් ඉංජිනියරින් (පෞද්.) සමාගම	2,513,104.52	
ගෙවිය යුතු රැඳවුම් ගාස්තු - කොළොන්නාව වැට	79,172.50	
ගෙවිය යුතු රැඳවුම් ගාස්තු - අනුරාධපුර ප්‍රවේශ මාර්ගය	508,230.40	
මැදිරිගිරිය පුහුණු කඳවුර	21,902.25	
- විදුලි වැට සඳහා ගෙවීම	68,118.43	
නිකිනි - ප්‍රධාන ස්ථාන වලට වාහන පටි	806,804.12	
දොම්පේ කසළ රඳවනය - ඔරියන්ට් කන්ස්ට්‍රක්ෂන්ස්	1,669,688.36	
හික්කඩුව කොම්පෝස්ට් G.G.C. ඉන්ටර්නැෂනල්	4,171,621.33	
කුඩා කසළ රඳවනය - මාතර	412,605.41	**10,251,247.32**
ගෙවිය යුතු රැඳවුම් ගාස්තු පළාත් පාලන ආයතන කුඩා ඉදිකිරීම් ව්‍යාපෘතිය		
අත්තනගල්ල	270,305.36	
බණ්ඩාරවෙල	409,528.92	
බුලත්සිංහල	235,409.04	
ගම්පහ 01	15,698.50	
ගම්පහ 02	19,696.50	
හොරණ	224,267.00	
කිරිත්දපුහුල්වැල්ල	281,519.59	
රඹුක්කන	135,256.64	
රජ්ගම	14,364.71	
වලල්ලාවිට	42,523.69	
කරන්දෙණිය	54,488.04	
නියාගම	60,082.77	
බද්දේගම	35,789.48	
ඇල්පිටිය	105,812.34	
මතුගම	100,221.23	

රත්තොට	154,987.17	
මාතලේ ප්‍රාදේශීය සභාව	132,478.59	
මාතලේ නගර සභාව	111,010.18	
හාලිඇල	324,927.70	
පොල්ගහවෙල	332,523.99	
ගල්කැටියාගම	44,867.15	
JKDU	51,566.15	
Almond crops	86,318.69	
ශ්‍රී ලංකා නාවික හමුදාව	10,331.00	
පහත හේවාහැට	207,237.88	
උඩුබැද්දේගම	22,584.81	
බෙලිඅත්ත	123,097.29	
ගල්ගමුව	290,155.95	
වාරියපොල	247,531.29	
කොබෙයිගනේ	248,223.16	
සීතාවක	64,300.12	
මුලතියන	114,291.16	
කැලණිය	694,793.01	
අකුරණ	269,748.21	
කාකතිවි	63,604.73	
		5,599,542.04
		15,850,789.36

උපලේඛනය 09

2011-12-31 දිනකට පාරිතෝෂික ප්‍රතිපාදන

අංකය	බැඳුණු දිනය	සේ.අ.අ. අංකය	නම	මාසික මූලික වැටුප	අවුරුදු ගණන	ගෙවන ලද මුදල
1	07-04-2008	1061	සී.එච්.මීපගේ	18,275.00	3.67	33,534.63
2	02-05-2008	1068	ආර්.බී. ප්‍රේමරත්න	40,000.00	3.67	73,400.00
3	02-05-2008	1069	ජී.ඩී.ඩී. ගුණතිලක	85,000.00	3.67	155,975.00
4	09-05-2008	1074	පී.එල්.ඩී.කේ. රොහාන් ලියනගේ	40,000.00	3.67	73,400.00
5	02-06-2008	1079	කේ.ඒ.ජී.එස්. පෙරේරා	13,560.00	3.50	23,730.00
6	02-06-2008	1080	එම්.එච්.එම්.අයි.යූ. මුණසිංහ	14,520.00	3.50	25,410.00
7	09-06-2008	1081	ජී.ඒ.ඩී. පෙරේරා	13,560.00	3.50	23,730.00
8	11-08-2008	1089	එච්. සුනෙත්‍රා රණතුංග	40,000.00	3.33	66,600.00
9	06-10-2008	1124	අනුපා පැස්කුවල්	40,000.00	3.17	63,400.00

අංකය	බැඳුණු දිනය	සේ.අ.අ. අංකය	නම	මාසික මූලික වැටුප	අවුරුදු ගණන	ගෙවන ලද මුදල
10	01-04-2009	1135	යූ.ඒ.ඩී. උපුල් ප්‍රියශාන්ත	12,680.00	2.67	16,927.80
11	08-04-2009	1136	ටී.ඩබ්. නානායක්කාර	12,680.00	2.67	16,927.80
12	08-04-2009	1137	සනත් ජයමහ	12,680.00	2.67	16,927.80
13	21-04-2009	1138	එස්.ඒ. තුෂාර තිලංක	12,680.00	2.67	16,927.80
14	04-06-2009	1148	ටී. කරුණාරත්න	12,030.00	2.50	15,037.50
15	07-07-2009	1149	එස්.එච්. අබේනායක	13,440.00	2.41	16,195.20
16	07-07-2009	1151	එස්.ඩබ්. චමිලා	17,695.00	2.41	21,322.48
17	05-10-2009	1162	ආර්.පී.ජේ. සිරිමෙවන්	17,985.00	2.25	20,233.13
18	17-06-2010	1165	පී.ඒ. ලයනල්	17,985.00	1.50	13,488.75
19	16-08-2010	1195	එස්.එම්.ඩී. සෙන්දුප්පෙරුම	17,695.00	1.33	11,767.18
20	16-08-2010	1203	සුනිල් සෙනෙවිරත්න	35,000.00	1.33	23,275.00
21	26-10-2010	1205	එන්.ටී.කේ. කුලතිලක	13,320.00	1.17	7,792.20
22	01-03-2011	1210	එම්.ඩී.ඒ. ජයසේකර	13,320.00	0.83	5,527.80
23	07-07-2011	1222	යූ.ඩී.ඩබ්.ඒ. ගුණවර්ධන	85,000.00	0.50	21,250.00
24	12-09-2011	1227	එස්.එම්.ඩී.සී.ඒ. සේනාරත්න	13,320.00	0.25	1,665.00
25	12-09-2011	1225	ජේ.ඒ.එස්.පී. ජයසිංහ	75,000.00	0.25	9,375.00
26	15-09-2011	1226	ඩී.කේ.සී. පහළගේ	75,000.00	0.25	9,375.00
						783,195.00

සටහන : දැනට ව්‍යාපෘතියේ සේවය කරන සේවකයින් වෙනුවෙන් පාරිතෝෂික ප්‍රතිපාදන සකස් කරනු ලැබඇති අතර, සේවය අවසන් කර ඇති අය ගණනය කිරීමේ දී නොසලකා හැර ඇත.

<u>උපලේඛනය 10</u>

ආපසු ගෙවිය යුතු තැන්පතු 2011

දිනය	නම	ලදුපත් අංකය	මුදල
18-08-2010	විමාර කන්ස්ට්‍රක්ෂන් (පෞද්.) සමාගම	61022	10,000.00
20-08-2010	සෙන්. මේරිස් කන්ට්‍රක්ෂන්	61003	10,000.00
23-08-2010	චමින්ද කන්ට්‍රක්ෂන්	61009	10,000.00
23-08-2010	පන්තිලා සිවිල් ඉංජිනියරින්	61010	10,000.00
23-08-2010	ෆර්නි ඩයිනමික් ඉංජිනියරින් (පෞද්.) සමාගම	61012	10,000.00
23-08-2010	ගාමිණී කන්ස්ට්‍රක්ෂන්	61015	10,000.00
25-08-2010	සූරිය බිල්ඩර්ස්	61019	10,000.00
25-08-2010	සුමනසේකර කන්ස්ට්‍රක්ෂන්	61021	10,000.00

දිනය	නම	ලදුපත් අංකය	මුදල
26-08-2010	ස්ටාර් කන්ස්ට්‍රක්ෂන් ඉංජිනියරින් (පෞද්.) සමාගම	61025	10,000.00
27-08-2010	ඉසුරු ඉංජිනියරින් සර්විස් (පෞද්.) සමාගම	61033	10,000.00
30-08-2010	ජී.ජී.සී. ඉන්ටර්නැෂනල් (පෞද්.) සමාගම	61036	10,000.00
30-08-2010	ආසිරි කන්ස්ට්‍රක්ෂන්	61039	10,000.00
17-08-2010	ආර්.එච්. ස්ටීල් බිල්ඩින්ස් සිස්ටම් (පෞද්.) සමාගම	61193	10,000.00
18-08-2010	එන්. ඇන්ඩ් ඒ ඉංජිනියරින් සර්විස් (පෞද්.) සමාගම	61199	10,000.00
28-04-2011	තෙෂාන් ඉංජිනියරින් (පෞද්.) සමාගම	61990	10,000.00
29-04-2011	විමාර කන්ස්ට්‍රක්ෂන් (පෞද්.) සමාගම	61992	10,000.00
02-05-2011	ආර්.එච්. ස්ටීල් බිල්ඩින්ස් සිස්ටම් (පෞද්.) සමාගම	61195	10,000.00
04-05-2011	ඒ.එස්.බී. කන්ස්ට්‍රක්ෂන්ස් (පෞද්.) සමාගම	61198	10,000.00
05-05-2011	ස්ටේට් ඉංජිනියරින් කෝපරේෂන්	62401	10,000.00
09-05-2011	ජී.ජී.සී. ඉන්ටර්නැෂනල් (පෞද්.) සමාගම	52403	10,000.00
11-05-2011	පන්තිලා සිවිල් ඉංජිනියරින්	62404	10,000.00
11-05-2011	ඉන්ඩස්ට්‍රියල් ඉන්ජිනියරින් එන්ටර්ප්‍රයිසස්	62407	10,000.00
12-05-2011	කේ.ඊ.එස්. ඉන්ජිනියරින් (පෞද්.) සමාගම	62408	10,000.00
23-05-2011	ඇන්තනි බිල්ඩර්ස්	62418	10,000.00
13-05-2011	අසේලාරච්චි කන්ස්ට්‍රක්ෂන් (පෞද්.) සමාගම	62411	10,000.00
19-05-2011	ගාමිණී කන්ස්ට්‍රක්ෂන්	62415	10,000.00
04-05-2011	සුබසිංහ කන්ස්ට්‍රක්ෂන්	62420	10,000.00
24-05-2011	වහිඩ් කන්ස්ට්‍රක්ෂන්	62422	10,000.00
25-05-2011	නිව් ලැන්ඩ් ඉන්ඩස්ට්‍රීස් (පෞද්.) සමාගම	62423	10,000.00
25-05-2011	ඇක්සස් ඉන්ටර්නැෂනල් (පෞද්.) සමාගම	62426	10,000.00
			300,000.00

උපලේඛනය 11

ප්‍රාග්ධන ප්‍රදානය සහ අතිරික්තය

	2011	2010
ප්‍රාග්ධන ප්‍රදානය	28,126,457.58	36,559,619.70
2009 අතිරික්තය	8,102.08	8,102.08
2010 අතිරික්තය	510.40	510.40
2011 අතිරික්තය	10,367,647.67	-
	38,502,717.73	**36,568,232.18**

ප්‍රාග්ධන ප්‍රදානය (සටහන 01)

	රු.
ආරම්භක ශේෂය	36,559,619.70
ජංගම නොවන වත්කම්වල පිරිවැය එකතුවීම	525,806.22
2011 ක්ෂයවීම	(15,682,013.11)
ප්‍රදානය	6,723,044.76
ශේෂපත්‍ර පරීදි	**28,126,457.58**

2011-12-31 දිනට කාර්ය සාධන ප්‍රකාශය පිළිබඳ සටහන්

සටහන 01

2011 වසරේ ප්‍රදානය	පිළිසරු	KOICA	එකතුව
ලැබුණු ප්‍රදාන	465,100,000.00	21,100,000.00	486,200,000.00
	465,100,000.00	21,100,000.00	**486,200,000.00**

සටහන 02

කොම්පෝස්ට් බඳුන් ආදායම	රු.
කොළඹ මහ නගර සභාව	2,411,975.00
පරිසර අමාත්‍යාංශය	70,025.00
ගම්පහ ප්‍රාදේශීය සභාව	637,500.00
හාලිඇල ප්‍රාදේශීය සභාව	63,750.00
කළුතර නගර සභාව	19,285.70
නිවාස සංවර්ධන ව්‍යාපෘතිය	573,750.00

කොම්පෝස්ට් බඳුන් ආදායම	රු.
කෑගල්ල නගර සභාව	60,000.00
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව	318,750.00
ප්‍රාදේශීය සභාව - අත්තනගල්ල	191,250.00
නගර සභාව - කෑගල්ල	3,750.00
පාදේශීය සභාව - වාරියපොල	127,500.00
අලුත්ගම	31,875.00
ප්‍රාදේශීය සභාව - කළුතර	76,500.00
කේ.බී. ගුණපාල	5,100.00
අලව්ව ප්‍රාදේශීය සභාව	127,500.00
වත්තල ප්‍රාදේශීය සභාව	255,000.00
යටිතල ව්‍යූහ සහ නිවාස	280,500.00
පළාත් පාලන දෙපාර්තුමේන්තු	399,750.00
අම්පාර නගර සභාව	399,075.00
ප්‍රාදේශීය සභාව - ජා ඇල	318,750.00
මධ්‍යම පරිසර අධිකාරිය 2010 සිට	1,891,651.80
ප්‍රාදේශීය සභාව - බියගම	382,500.00
	8,645,737.50

සටහන 03

ආපසු නොගෙවන තැන්පතු 2011

නම	දිනය	ලදුපත් අංකය	මුදල
ග්‍රීන් ටෙක්	04-01-2011	61970	2,500.00
තෙශාන් ඉංජිනියරින්	28-04-2011	61991	5,000.00
විමාර කන්ස්ට්‍රක්ෂන් (පුද්.) සමාගම	29-04-2011	61992	5,000.00
ආර්.එච්. ස්ටීල් බිල්ඩින් සිස්ටම් (පෞද්.) සමාගම	02-05-2011	61196	5,000.00
ඒ.එස්.බී. කන්ස්ට්‍රක්ෂන් (පෞද්.) සමාගම	04-05-2011	61199	5,000.00
ස්ටේට් ඉංජිනියරින් කෝපරේෂන්	05-05-2011	62000	5,000.00
ජී.ජී.සී. ඉන්ටර්නැෂනල් (පෞද්.) සමාගම	05-05-2011	62402	5,000.00
පන්තිලා සිවිල් ඉංජිනියරින්	11-05-2011	62405	5,000.00
ඉන්ඩස්ට්‍රියල් ඉංජිනියරින් එන්ටර්ප්‍රයිසස්	11-05-2011	62406	5,000.00
කේ.ඊ.එස්. ඉංජිනියරින් (පෞද.) සමාගම	12-05-2011	62409	5,000.00
අසේලාරච්චි කන්ස්ට්‍රක්ෂන් (පෞද්.) සමාගම	13-05-2011	62411	5,000.00
ගාමිණි කන්ස්ට්‍රක්ෂන්	19-05-2011	62416	5,000.00
ඇන්තනි බිල්ඩර්ස්	23-05-2011	62417	5,000.00
සුබසිංහ කන්ස්ට්‍රක්ෂන්	04-05-2011	62419	5,000.00
වහිඩ් කන්ස්ට්‍රකෂන්	24-05-2011	62421	5,000.00

නම	දිනය	ලදුපත් අංකය	මුදල
නිවී ලැන්ඩ් ඉන්ඩස්ට්‍රීස් (පෞද්.) සමාගම	25-05-2011	62424	5,000.00
ඇක්සස් ඉන්ටර්නැෂනල් (පෞද්.) සමාගම	25-05-2011	62425	5,000.00
තුඩාව ට්‍රේඩිං	30-12-2011	62989	2,500.00
ආර්.පී.සී. පොල්මර් (පෞද්.) සමාගම	30-12-2011	62990	2,500.00
වයම්බා පොයිලිමා	30-12-2011	62997	2,500.00
ජිනසේන ලිමිටඩ්	30-12-2011	62990	2,500.00
චාර්ලිස් සන්ස්	30-12-2011	62992	2,500.00
මෙලන් ඉන්ඩස්ට්‍රීස්	30-12-2011	62996	2,500.00
ලංකා ප්‍රොජෙක්ට්	30-12-2011	63001	2,500.00
කමියුනිකේෂන් ඇන්ඩ් බිස්නස් ඒකායුමනට් (පෞද්.) සමාගම	30-12-2011	62994	2,500.00
			102,500.00

සටහන 04

කොළොන්නාවේ දැනට ඇති කසළ රැඳවුම් අංගනය

ගෙවූ මුදල	62,297,456.57
(+) 2011-12-31 දිනට ගෙවිය යුතු රැඳවුම් ගාස්තුව	2,513,104.52
	64,810,561.09

සටහන 05

හික්කඩුව කොම්පෝස්ට් නිෂ්පාදන යන්ත්‍රාගාරය

ගෙවූ මුදල	82,729,485.74
(+) 2011-12-31 දිනට ගෙවිය යුතු රැඳවුම් ගාස්තුව	5,126,066.07
	87,855,551.81

සටහන 06

පළාත් පාලන ආයතන සඳහා සුළු පරිමාණ කොම්පෝස්ට් අංගන

පළාත් පාලන ආයතන වලට ගෙවූ මුදල	55,957,375.34
(+) රැඳවුම් ගාස්තු	5,599,542.02
	61,556,917.36
(-) ගෙවන ලද සක්‍රීයකරණ අත්තිකාරම්	(31,711,314.22)
	29,845,603.14

සටහන 07

මාළිගාවත්ත, දොම්පේ කසළ රඳවන සඳහා බිම් සැකසීමේ වැඩ

ගෙවූ මුදල	20,872,750.99
(+) 2011-12-31 දිනට ගෙවිය යුතු රැඳවුම් ගාස්තුව	1,669,688.38
	22,542.439.37
(-) 2011-12-31 දිනට අයකළ යුතු සක්‍රීයකරණ අත්තිකාරම්	3,785,234.94
	18,757,204.43

සටහන 08

ව්‍යාපෘතියේ වැටුප් පිරිවැය

කෙළින්ම ව්‍යාපෘතිය යටතේ	14,306,385.95
මුද්දර බද්ද	2,150.00
උපයන විට ගෙවීමේ බදු	57,563.00
ව්‍යාපෘති කාර්ය මණ්ඩල පාරිතෝෂික	783,195.00
මධ්‍යම පරිසර අධිකාරියෙන් බඳවා ගැනීම්	4,522,079.01
	19,671,372.96

සටහන 09

ක්ෂය කිරීම සඳහා ගණනය කිරීම

	ආරම්භක ශේෂය	ප්‍රමාණය	2011 ආරම්භක ශේෂයේ දී ක්ෂයවීම	2011 එකතුවීම් අනුව ක්ෂයවීම	2010-12-31 පිරිවැය එකතු වීමේ ක්ෂයවීම	2011 මුළු ක්ෂයවීම
රථවාහන	51,406,752.00	25%	12,851,688.00	-	133,162.34	12,984,850.34
ගෘහභාණ්ඩ	2,554,960.50	10%	255,496.05	3,810.16	17,158.42	276,464.63
ගොඩනැගිලි (ගරාජ්)	1,500,000.00	2.5%	37,500.00	-	-	37,500.00
උපකරණ	8,677,119.30	25%	2,169,279.43	53,541.82	74,139.43	2,296,960.68
රසායනාගාර උපකරණ	862,374.60	10%	86,237.46	-	-	86,237.46
	65,001,206.40		**15,400,200.94**	**57,351.98**	**224,460.19**	**15,682,013.11**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதிதிணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: ටීඑම්/ එල් / පිළිසරු/ එෆ්ඒ /2011

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2012 දෙසැම්බර් 19 දින

සභාපති,
මධ්‍යම පරිසර අධිකාරිය.

පිළිසරු ව්‍යාපෘතියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

පිළිසරු ව්‍යාපෘතියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

1.2 ව්‍යාපෘතියේ අරමුණු

(අ) සම්පත් සංරක්ෂණය සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තහවුරු කිරීම.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අදාල පුද්ගලයින්ගේ දැනීම හා දක්ෂතා වර්ධනය කිරීම.

(ඇ) ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහන් නිරීක්ෂණය කිරීම.

(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පහසුකම් සැපයීම.

(ඊ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැපයීම.

(උ) ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ බැංකු ක්‍රමයක් ස්ථාපිත කිරීම.

(ඌ) නිසි පරිදි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය නොකරන පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.

(එ) ඝන අපද්‍රව්‍ය කලමනාකරණය පහසුකරලීම අඳහා ජාතික ව්‍යුහයක් ස්ථාපිත කිරීම.

1.3 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම සහ ක්‍රියාත්මක කිරීම

පිළිසරු ව්‍යාපෘතිය මධ්‍යම පරිසර අධිකාරියේ ස්ථාපිත කර ඇති පිළිසරු ව්‍යාපෘති අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවනු ලබන්නේ පරිසර අමාත්‍යාංශයයි.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

1.4 **ව්‍යාපෘතියේ කාල සීමාව**

ව්‍යාපෘති යෝජනාව අනුව පිළිසරු ව්‍යාපෘතිය 2008 ජනවාරි 01 දිනෙන් ආරම්භ කර 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කිරීමට නියමිතව තිබූ නමුත් නියමිත කාලය තුල ව්‍යාපෘතිය නිමකර නොමැති බැවින් කැබිනට් පත්‍රිකා අංක 10/1905/432/008 හා අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 10/2010 මගින් ව්‍යාපෘති කාල සීමාව 2011 ජනවාරි 01 දින සිට වසර 03 ක කාල පරිච්ඡේදයක් සඳහා දීර්ඝ කිරීමටත් ඉදිරි තුන් වසරක කාලය තුල ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය ප්‍රතිපාදන (2008-2010) කාල සීමාව සඳහා අනුමත කරන ලද රුපියල් බිලියන 5.6 ක වැය සීමාව තුළ සලසා ගැනීමටත් නිර්දේශ කර තිබුණි. 2011 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තුගත මුදල රු. 712,400,000 කි.

1.5 **අරමුදල් සැලැස්ම**

වර්ෂ 06 ක් සඳහා මුළු ප්‍රතිපාදන අරමුදල් සැලැස්ම අනුව රු. බිලියන 5.6 කි. එය රු. බිලියන 2.675 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන්ද රු. බිලියන 3 ක මුදලක් 2008 අයවැය මඟින් හඳුන්වාදී ඇති "හරිත බද්ද " (Green Levy) මඟින්ද ලබා ගැනීමට අපේක්ෂිතය .

2. **මුල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් කළමනාකරන වගකීම**

මෙම මුල්‍ය ප්‍රකාශන පොදුවේ පිලිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

2.1 **විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මුල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් පොදුවේ පිලිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මාගේ විගණනය සිදු කරනු ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මුල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මුල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මුල්‍ය

ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ඉදිරිපත් කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2.2 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

2011 දෙසැම්බර් 31 දිනට උපලේඛන සමග වූ ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අනෙකුත් සම්බන්ධිත මූල්‍ය ප්‍රකාශනයන් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට විධි සහ පරිවයන්ට අනුකූලව පරීක්ෂා කරන ලද අතර පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු , වත්කම් , වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයන්ට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණයෙහිලා සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් වලට අදාල පොත්පත් සහ වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීමට හැකිවන පරිදි පද්ධති හා පාලනයන් ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය විසින් සපයන ලද අරමුදල් වලින් කරන ලද ව්‍යාපෘති වියදම් මූල්‍ය හා ගෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘති මෙහෙයුම් වලින් උද්ගත වන වත්කම් හා වගකීම් ආදිය දැක්වීම පිණිස ප්‍රමාණවත් ගිණුම් වාර්තා අඛණ්ඩ පදනමක් මත පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගනු ලැබූ වර්ගීකරණයට අනුකූලව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඈ) මූල්‍ය ප්‍රකාශන පොදු සම්මත ගණකාධිකරණ මූලධර්ම පදනම් කර ගෙන පිළියෙල කර තිබුණේද යන බව.

(ඉ) මෙම ව්‍යාපෘතිය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය, උපකරණ ආදිය ව්‍යාපෘතියේ කටයුතු කිරීමට උපයෝගි කර ගෙන ඇති බව.

2.3 **තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 4 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

3. **තත්ත්වාගණනය මතය**

මෙම වාර්තාවේ 4 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මුල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට පිළිසරු ව්‍යාපෘතියේ මුල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරන මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

4. **මුල්‍ය ප්‍රකාශන**

4.1 **මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

4.1.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිර්ක්ෂණය විය.

(අ) වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණු රු. 2,090,167 ක් වර්ෂය තුල නිරවුල් නොකර තිබියදී 2011 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශන වල ජංගම වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) අනුරාධපුර මාර්ගයක් ඉදිකිරීම සඳහා ව්‍යාපෘතියෙන් ලබාදී තිබු රු. 1,357,149 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල 2011 දෙසැම්බර් 29 වන විට පියවා තිබුන ද මුල්‍ය ප්‍රකාශන වල අයකර ගත යුතු අත්තිකාරම් ලෙස රු. 1,357,149 ක් ගිණුම් ගත කර තිබුණි.

(ඇ) ඉදිකිරීම් කොන්ත්‍රාත් 03 කට අදාළ රු. 3,380,352 ක් වූ රැඳවුම් මුදල් (Retention) මුල්‍ය ප්‍රකාශන වල ජංගම වගකීම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

4.1.2 නීති රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති, රීති රෙගුලාසි වලට යොමුව		අනුකූල නොවීම
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය		
(i)	මු:රෙ:371 (2) (ඇ)	ලබා ගත් අත්තිකාරම් කාර්යය නිම වූ වහාම පියවිය යුතු වුවද අවස්ථා 03 කදී ලබා දී තිබුණු රු. 611,690 ක අත්තිකාරම් මාස 02 සිට මාස 16 දක්වා කාලයක් පියවීම් සිදු කර නොතිබුණි.
(ii)	මු:රෙ :104(1)	කැබ් රථය අනතුරට පත් වීමෙන් සිදු වූ හානියෙන් රක්ෂණ ආවරණය කර ගත නොහැකි රු. 145,207 ක අලාභයට වගකිවයුතු නිලධාරීන් ගෙන් අයකරගෙන නොතිබුණි.

4.1.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

රු. 100,560,121 ක් වැය කර ඉදිකර තිබූ කොළොන්නාව කොම්පෝස්ට් අංගනය දෛනිකව කසල මේට්‍රික් ටොන් 35 කළමනාකරණය කිරීම අරමුණ වී තිබුණද මාස 07 තුල දෛනික ලැබී තිබූ ප්‍රමාණය මේට්‍රික් ටොන් 15 කි. ඒ අනුව ව්‍යාපෘති කාර්යයන් නිසි සැලසුමකට අනුව සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.

4.1.4 අරමුදල් ඌන උපයෝජනය

පිළිසරු ව්‍යාපෘතිය සඳහා සමාලෝචන වර්ෂයේ වෙන්කර තිබූ රු. මිලියන 712.4 ක ප්‍රතිපාදනයෙන් පරිසර අමාත්‍යාංශයට නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු මිලියන 72 ක් ද කොළඹ දිස්ත්‍රික්කයේ හයිලෙවල් මාර්ගය ප්‍රදේශය තුළ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමයක් පිහිටු වීම සඳහා රු මිලියන3.1ක් ද මු:රෙ 66 මහින් ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණි. පිළිසරු ව්‍යාපෘති කාර්යය මණ්ඩලය නොමැති බැවින් මෙම මුදල් ඉතිරි වූ බව ව්‍යාපෘතිය විසින් අමාත්‍යාංශය වෙත දන්වා තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක වී නොතිබුණි.

4.1.5 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් අත්තිකාරම් මුදල් නිෂ්කාර්යව පැවතුණි.

	අත්තිකාරම් දෙන ලද ප්‍රාදේශිය සභාව/ නගර සභාව	දෙන ලද අත්තිකාරම් මුදල	නිෂ්කාර්යව පැවති කාලය	වෙනත්
		රු.		
1.	පඬුවස් නුවර නගර සභාව	1,540,026	මාස 10	ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. 2011 අගෝස්තු 10 වන දින ආපසු ගෙවා තිබුණි.
2.	කාත්කන්කුඩි නගර සභාව	1,669,226	මාස 08	ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.
3.	ජා- ඇල නගර සභාව	1,707,865	මාස 09	ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

5. **සේවක මණ්ඩල කළමනාකරණය**

පහත කරුණු අනාවරණය විය.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට පිළිසරු ව්‍යාපෘතියට අනුමත කාර්ය මණ්ඩලය 52 ක් වූ අතර තත්‍ය කාර්යය මණ්ඩලය 35 ක් විය.සමාලෝචිත වර්ෂය තුළ පුරප්පාඩු 18 ක් පැවතුණි.

(ආ) 2011 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති කාර්ය මණ්ඩල වැටුප් වෙනුවෙන් රු. 25,000,000ක් වෙන්කර තිබුණි. ස්ථිර නිලධාරීන් 35 ක් හා කොන්ත්‍රාත් පදනමට සහ කෙටි කාලීන පදනමට බඳවා ගත් සේවකයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ මුළු වැටුප් වියදම රු. 23,301,809 ක් විය. ඒ අනුව මුළු මෙහෙයුම් වියදම් වලින් 45% ක් කාර්යය මණ්ඩල වැටුප් හා වේතන වෙනුවෙන් වැය කර තිබුණි.

6. (අ) අයවැය පාලනය

2011 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ ආදායම් වියදම් වලට අදාලව අයවැය ලේඛණයේ ඇස්තමේන්තුගත ආදායම් වියදම් හා තත්‍ය ආදායම් වියදම් පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i). සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදනය රු. මිලියන 712.4කි. මුල්‍ය ප්‍රකාශන අනුව තත්‍ය වියදම රු. මිලියන 486.2 කි. ඒ අනුව ඇස්තමේන්තුගත මුදල් සලකා බැලීමේදී ඌන උපයෝජිත මුදල රු. මිලියන 226.2 කි. එය මුළු ප්‍රතිපදනයෙන් 31.8 % ක් විය.

(ii). ක්‍රියාකාර් සැලැස්මට අනුව වෙන්කර ඇති ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාකාරකම් 13 ක 51% - 99.8 % ක පරාසයක ප්‍රතිපාදන ඉතිර් වී තිබු අතර ක්‍රියාකාරකම් 04 ක වෙන්කර ඇති ප්‍රතිපාදන වලින් රු.මිලියන 27ක් හෙවත් 100% ක ඉතිර් වීම් තිබුණි.ප්‍රතිපාදිත මුදල් ඉක්මවා ක්‍රියාකාරකම් 06 ක් වෙනුවෙන් රුපියල් මිලියන 28.7 ක් වැයකර තිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී මුල්‍ය පාලන කාරකයක් වශයෙන් ව්‍යාපෘති කටයුතු සඳහා දායක කරගෙන නොමැති බව විගණනයට නිර්ක්ෂණය විය.

(ආ) භෞතික කාර්යය සාධනය

(i). පිළිසරු ව්‍යාපෘතියේ මූලික අරමුණ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමය. ඉහත කාර්යය සපුරා ගැනීම සඳහා 2008 - 2010 තුන් අවුරුදු කාලපරිච්ඡේදය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් රුපියල් බිලියන 5.6 ක් වෙන් කර තිබු අතර 2011/2013 දක්වා තවත් තුන් අවුරුදු කාල සීමාවකට ඉහත ප්‍රතිපාදනය තුළම දිර්ඝ කර තිබුණි. වාර්ෂික ඇස්තමේන්තුව අනුව ප්‍රතිපාදිත මුදල් සහ සත්‍ය වියදම පහත පරිදි වේ.

	2008	2009	2010	2011
	රු.	රු.	රු.	රු.
ඒකාබද්ධ අරමුදලින් ප්‍රතිපාදිත මුදල	107,553,359	1,277,080,000	695,000,000	712,400,000
සත්‍ය මුදල	107,553,359	252,743,886	410,194,602	500,262,603
උපයෝජනය ප්‍රතිශතයක් ලෙස	100%	29%	59%	70%

2011 වර්ෂයේ දරණ ලද වියදම් තුල කොම්පෝස්ට් අංගන ඉදිකිරීම හා ඉඩම් පිරවුම් සඳහා රු. 204,145,931 ක්ද කුඩා පරිමාණ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති වෙනුවෙන් නගර සභා හා ප්‍රාදේශිය සභා වලට රු. 29,845,603 ක මුදලක් ද බිම් පිරවුම් ස්ථාපිතකිරීම සඳහා පිළිසරු ව්‍යාපෘතියේ මුල්‍ය සහාය මත ජාතික ඝන අපද්‍රව්‍ය කලමනාකරණ සහායක මධ්‍යස්ථානය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වෙනුවෙන් රු. 14,405,855 ක මුදලක් ද ලබා දි තිබුණි. භෞතික ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබුණි.

(ii). පිළිසරු ව්‍යාපෘතියේ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් යටතේ ක්‍රියාකාර් සැලැස්මට අනුව අපද්‍රව්‍ය බැංකු ක්‍රමය, දැනුවත් කිරීම්, අත්පත්‍රිකා, කසල වෙන් කිරීම පිළිබඳ ප්‍රචාරනය හා දැන්වීම්,අපද්‍රව අඩුකිරීම හා ප්‍රතිචක්‍රිකරන ක්‍රියාකාරකම් (waste Banking, Awareness, Material,propaganda & Advertising promote Segregation Systems,Waste reduction & recycling activities) ලෙස වර්ගීකරණය කර තිබු අතර ඒ සඳහා 2011 වර්ෂයේ පිළිසරු දැණුවත් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් ව්‍යාපෘතියේ ක්‍රියාකාර් සැලැස්මේ රු.100,000,000 ක් ප්‍රතිපාදනය කර තිබු අතර අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් යටතේ මුල්‍ය ප්‍රකාශන අනුව රු. 20,810,204 පමණක් වැය කර තිබුණි.ඒ අනුව රු:79,189,796 ක ප්‍රතිපාදනය මෙම කාර්යය සඳහා උපයෝගී කර නොතිබුණි.

(iii). වැයකර තිබු රු. 20,810,204 තුළ 2011 වර්ෂය තුළදී දැනුවත් කිරීමේ වැඩසටහන් 40 ක් පවත්වා තිබුණි.එම පවත්වන ලද වැඩසටහන් අතර ජාතික මට්ටමේ මාධ්‍යවේදීන් සඳහා පැවැත්වු වැඩමුළු සහ ක්ෂේත්‍ර වාර්කා, හෝටල් ගාස්තු හා මොබිටෙල් ඩොංගල් දිම, ගුවන් විදුලි ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම, පුවත්පත් දැන්වීම් පල කිරීම, යනාදිය සඳහා රු. 5,173,945 ක් වැය කර තිබුණි.

7. කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) කුඩා පරිමාණ කොම්පෝස්ට් ව්‍යාපෘති යටතේ ගලෙන් බිදුණු වැව ප්‍රාදේශිය සභාව වෙත රු. 1,280,663 ක් අත්තිකාරම් ලෙස ලබා දී දින 09 කට පසුව අධිකරණමය ක්‍රියාමාර්ගයක් මහින් මෙම ප්‍රාදේශිය සභාවේ දේපල තහනමට ගෙන සභාවේ ගිණුම් ද අත්හිටුවා තිබු අතර එම ලබාදුන් රු. 1,280,663 ක මුදල් විගණන දිනය වන විටත් ආපසු අයකරගෙන නොතිබුණි.

(ආ) කළුතර උතුර වෛද්‍ය රසායනාගාරයෙන් බැහැර කරන සායනික අපද්‍රව්‍ය කළුතර කොම්පෝස්ට් අංගනයට ගෙන තිබුණි. තවද ව්‍යාපෘති බිමේ ගොඩ ගැසී තිබු කසල ඉවත් කර පස්, වැලි දමා වැසීමට රු. 2,961,500 ක් කොන්ත්‍රාත් සමාගමට ගෙවා තිබුණි.

- තවද 2012 ජනවාරි 06 ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව අනුව කසල පස් දමා වසා නොතිබුණි.
- කොම්පෝස්ට් අංගනය තුළ ඉතිරිවන ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමට මාලමුල්ල ව්‍යාපෘතිය තවම ආරම්භ කර නොමැති අතර එම අපද්‍රව්‍ය නගර සභාවට අයත් යාබද ඉඩමට බැහැර කිරීම.

- මෙම කොම්පෝස්ට් අංගනය පළාත් පාලන ආයතන 04 කට අදලව කසල ප්‍රතිචක්‍රියකරණය පිණිස ඉදිකරනු ලැබුවත් මේ වන විටත් එයට ලබාගන්නේ කළුතර නගර සභාවේ හා කළුතර ප්‍රාදේශිය සභාවේ කසල පමණක් වන අතර ව්‍යාපෘතිය උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවීම.

- අපද්‍රව්‍ය වලින් බැහැර වන අපදියර ව්‍යාපෘති භූමියෙන් පිටතට ගලායෑම සිදු වේ.2010 වර්ෂයේ ක්ෂීරිතය (අපදියර) රැස් කරන ටැංකිවල උතුරායාම පිළිබඳ විමසීමේදී ඒවාට නිසි පිළියම් යොදන බවට පිළිතුරු ලබා දුන්නත් 2012 පෙබරවාරි මාසය වන විටත් එම ගැටලුව සාකච්ජා මට්ටමේ පැවතුණි.තවද ක්ෂීරිතය (අපදියර) රැස්කරන ටැංකිවල ධාරිතාව සැලසුම් කිරීමේදී එහි පරිසරික සාධක සැලකිල්ලට ලක් කර නොමැති බව නිරීක්ෂණය විය.

8. **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

2008 - 2010 තුන් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මේහි 2008,2009,2010 වර්ෂවල ක්‍රියාත්මක කිරීමට ඇස්තමේන්තු කර තිබු පහත සඳහන් කාර්යයන් විගණන අවස්ථාව (2012 සැප්තැම්බර් 11) දක්වා ඉටුකර නොතිබුණි.

(අ) මුල් ඇස්තමේන්තුවෙන් රු:මිලියන 1151 ක් වෙන් කර තිබු බිම් පිරවුම් 09 ක (Lands Fill Site Malamulla, Gonadikawatta,Oluvil, Pampaimadu,Karkaitheevu ,Petiyakanda, Wagawatta, Anuradhapura, Madirigiriya, Hikkaduwa.)ව්‍යාපෘති ස්ථාපිත කර නොතිබුණි.

(ආ) ගොනාධිකාවත්ත, ඔලුවිල්, පම්පායිමඩු, චේමිනානිවග (Gonadikawatta, Oluvil, Pampaimadu, chemnaniwaga) කොම්පෝස්ට් අංගන ස්ථාපිත කිරීම වෙනුවෙන් රු. මිලියන 1746 ක් ඇස්තමේන්තු කර තිබුණද එම කොම්පෝස්ට් අංගන ස්ථාපිත කර නොතිබුණි.

(ඇ) කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපෘති යටතේ නුවර එළිය ,හම්බන්තොට, පුත්තලම, මොණරාගල, මන්නාරම, කිලිනොච්චි, මුලතිව්, මඩකලපුව, අම්පාර හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කිරීමට යොජිතව තිබු ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) ක්‍රියාකාරී සැලැස්ම තුල ඇස්තමේන්තුගතව ඇති පිළිසරු ව්‍යාපෘතියේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම වෙනුවෙන් 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා රු. 2,729,013,395 ක් ප්‍රතිපාදන වෙන් කර තිබුණද වියදම් දරා තිබුණේ රු. 1,270,754,450 කි.

9. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය

(ඇ) අත්තිකාරම් පියවීම

(ඈ) ලේඛණ පැවැත්වීම

(ඉ) ඉදිකිරීම් කොන්ත්‍රාත්

(ඊ) සේවක කළමනාකරණය

ඒ.

එච්.ඒ.එස් සමරවීර

විගණකාධිපති